සුජීව ප්‍රසන්න ආරච්චි

හීන හතක් 2

SUJEEWA PRASANNA ARACHCHI

Sujeewa Prasanna Arachchi

පිදුම

අපරිමිත කරුණා ගුණයෙන්ද
උතුම් මිනිසත්කමින්ද
අනූන වූ... මගේ ජීවිතයේ හමු වූ
ආදරණීයම ජීවකයෙක් වූ
අප මිත්‍ර...

වෛද්‍ය ටී. එච්. තෙන්නකෝන්

මහතාට මේ කෘතිය
බැතිබරව පුදමි.

eLibrary.lk

ආවෙක් නෑ... ඒත් මම ඔයාගේ
ඇස් දෙකින් දෙවියෙක් දැක්කා...
ජීවිතේ දැකපු එකම දෙවියා ඒ ඔයාගේ
ඇස් දෙකින් දැකපු දෙවියා...
ඒ දෙවියා දිහා බලාගෙන ඒ දෙවියාගේ
පිහිටුරු බැනීමතෙක් වෙනවා ඇරෙන්න
මේ ජීවිතේ කරන්න වෙන දෙයක් මං
දන්නෑ... මං ඔයාව අඳනවා මවුවන්න...
අඳනවා... ජීවිතේ අමාරුම දුෂ්කරම
කාලෙක ඔයා මගේ අත් දෙකින් අල්ල ගත්තේ...
ඔයා කියන්නේ මං ඔයාට පිහිට
උනා කියලා... එහෙම කියනව නම් මං
ඒක පිළිගන්නම්... ඒත් බැනීමතෙක්
කොහොමද දෙවියෙකුට පිහිට වෙන්නේ...
මගේ හදවතම දේවාලයක්... ඒකේ වැඩ
ඉන්න එකම දෙවියා ඔයා... සදහටම...

මවුවන්න...
වුට්ටක් මං දිහා බලන්න...
මේ ඇස් දිහා බලන්න...
මොනාද ඔයාට පේන්නේ...
ඔයා කියයි මං අඩනවා කියලා...
නෑ රත්තරන්... මම අඩන්නේ නෑ...
ගෑණු අඩන්නේ බොරුවට...
ඇත්තට අඩන ගෑණු හරී අඩුයි...
මාත් බොරුවට අඩනවා...
ඔයා මට ආදරේ බව දැන දැනත්
මං අඩනවා...
මෙතනින් එහාට ජීවිතේ මොනවද ඕන...
ඔයා ඇරෙන්න මට මොනවත් එපා...
මට ඔයාගේ ආදරේ කියන්නේ
ජීවිතේ හැම දේම...
මගේ ජීවිතේම මවුවන්න අයියේ...
මාව ඔයාගේ දුවෙක් වගේ හදාගන්න...
මං මේ කකුල් දෙක ළඟ වැටිලා
ජීවිතේම දෙන්නම්...
මට මේ තාත්තිගෙනුයි දුවගෙනුයි
තොර ජීවිතයක් නෑ...
මම ජීවිතේ කවදාවත් දෙවියෝ දැකලා නෑ...
දෙවියෙක් මගේ ජීවිතේට

මුතු

Elegant talks.com

Elegantta

“

මිට වසර දහයකට
ඉස්සෙල්ලා ඔයාගේ
පොතක් මේ අතට ඇවිල්ල නම්
ඒකිනය මිට වඩා ගොඩක්
උස්සනයි... වච්චරයි
මට කියන්න තියෙන්නේ...

”

01

රවී මධුවන්නට කතා කළේ හදිස්සියේය.

“මචං මම...”

“මං උඹට ගන්නත් හිටියේ මචං... උඹ ඔය එයාර් පෝට් එකේද...”

ගුවන් තොටුපලේ නිවේදන පසුබිමින් ඇසෙද්දී මධුවන්න ඇසුවේය. ඒ හඬවල් ඔහුටද හොඳින් පුරුදුය.

“ඔව් මචං... වැඩ ටික වේලාසන ඉවර කරන්න ඕන මධූ... මං ලබන සෙනසුරාදා ලංකාවට එනවා...”

“නෑ... කොච්චර හොඳද මචං...”

“උඹවයි කෙල්ලවයි බලන්නමයි එන්නේ...”

"මං දන්නවා මචං..."

මධුවන්තගේ සිතට පුදුමාකාර සතුටක් දැනුණි.

"උඹට මොනාද ගේන්න ඕන..."

"ම..ට නම් මොනවත් එපා මචං... දුව එහෙදි කාපු කෑම වගයක් තියෙනවා... පුළුවන් නම් ඒ ටික අරන් වරෙන්..."

"මට එස් එම් එස් කරපං... මං අරන් එන්නම්..."

"උඹ ඇවිත් එහෙමම කැන්ඩි යනවද..."

රවීගේ ගෙවල් නුවරය.

"උඹව බලලම තමා යන්නේ... මාත් එක්ක සතියක් විතර නුවර ඉන්න යං... ගෙවල් පැත්තේ ගිහින් බත් ටිකක් එහෙම කාලා එමු..."

"කමක් නැද්ද මචං..."

"උඹට පිස්සුද... ගිහින් මොනා හරි කතා කරමු..."

"කතා කරන්නම ඕන මචං... ඇවිතුත් දැන් මාස එකහමාරක් වුණානේ..."

"ඒකනේ... භාෂිව මට හම්බ උනා... උඹට කතා කරන්න නම්බර් එකක් ඉල්ලනවා..."

"දෙන්නෙපා මචං..."

"නෑ... මං එයාට කිව්වා තීරණයක් ගන්න මං මධූවයි දුවයි හෙට සිංගප්පූරුවට ගෙනත් දෙන්නම් කියලා..."

"එතකොට... කතා නෑ නේද..."

"ම..."

"එයා හැදෙන ගෑණියෙක් නෙමේ මචං..."

"උඹ ගත්ත තීරණේ හරි... කාගෙන ටිකක් ඉඳපන්... මාත්

එනවනේ... මං මාසයක්ම නිවාඩු ගත්තා..."

"තෑන්කියු මචං..."

"මං උඹට සිකුරාදා ගන්නම්..."

"හොඳයි මචං..."

මධුවන්තගේ සිතට තරමක සැනසීමක් දැනුණි. ජීවිතයේ ප්‍රශ්න අවංකවම කතා කළ හැක්කේ ඔහුත් සමඟ පමණි.

"රවියත් ආවම මොනවා හරි කතා කරලා කරනවා... මේ යන ගමන තේරුමක් නෑ..."

ජීවිතය ඉක්මනටම පිළිවෙලක් කරගත යුතුය. නැතහොත් ජීවිතය මෙහෙමම ගිලා බසිනු ඇත.

මධුවන්ත ගෙනවිත් තබාගෙන උන් පෙති පාන් පෙති දෙකකට බටර් ටිකක් ගාගෙන තේකක් හදාගත්තේය. මේ ඔහුගේ රෑ කෑමය. ජීවිතයේ මේ ගෙවෙන දුක ගැන ඔහුට පසුතැවීමක් නැත. එහෙත් ජීවිතයත් මෙහෙමම දිගටම යා යුතු නැත.

* * * * * * * * * * * * *

මුතු කුකුල් මස් කෑල්ල පුංචි පුංචි කැලි වලට කඩා එය සාස්පානේ රත්කළ බටර් ටික මතට දැම්මාය... බටර් වලින් කුකුල් මස් ටික බැදෙද්දී ආවේ පුදුමාකාර සුවඳකි.

"ල..ලිතා..."

"පොඩි බේබි..."

"ම..ට බත් හැන්දකුත් දෙන්න ලලිතා..."

ලලිතා සිනාසී පීරිසියකට පිසූ සුදු බත් ටිකක් ඇයට දුන්නාය. මුතු බැදුණු කුකුල් මස් එකටම කුඩාවට කැපූ කැරට් ටිකකුත් ලීක්ස්

Elegantalks.com

ටිකකුත් දැම්මාය.

"ෆ්‍රයිඩ රයිස් එකක්ද හදන්නේ පොඩි බේබි..."

"ම්..."

හදන්නේ කාටදැයි ලලිතා දනී. ඇය සද්ද නොකර උන්නේ ඒකය. කැරට් ටිකත් බටර් වලින් බැදුණු පසු ඇය ඊටම බත් ටිකද එකතු කළාය.

"ආ පොඩි බේබි මේකෙන් චුට්ටකුත් දාන්න එතකොට රහයි..."

ලලිතා සෝස් බෝතලය ගෙන මුතු අතට දුන්නාය.

"සෝස් රහට ආසයි තමා..."

මුතු ෆ්‍රයිඩ රයිස් එකට සෝස් හැන්දකුත් එකතු කළාය. බත ලස්සන පාටකට ආවේය.

"මට බිත්තරේකුත් තම්බලා දෙන්න ලලිතා හොඳේ..."

"හා..."

"ලලිතා..."

"පොඩි බේබි..."

"අම්මා හොඳට ඇදගෙනද ගියේ... නැත්නම් නිකං ළඟට යනවා වගේද..."

"සායකුයි බ්ලවුස් එකකුයි ඇඳත් ගියේ... කියන්න දන්නෑ බේබි..."

"ඒයිද දන්නෑ මේද ඇත්ම..."

"ඇවිත් එහෙම්ම කාමරේ ඇලවෙනවා... පොඩි බේබිගේ කාමරේට මේ රෑ එන්නෑ..."

"ම්..."

මුතු ෆ්‍රයිඩ රයිස් එක ප්ලාවි පිඟානකට දමාගෙන කුස්සියටම වී

කල්පනා කළාය.

"ල..ලිතා..."

"පොඩි බේබි..."

"අක්කත් නෑ... පත්සලට ගිහින්... ඔයා ටිකත් දවස ඉල්ලං එනවද මධුවන්ත මහත්තයගෙන්..."

"හා..."

"මං කෑම කවන්නම් කියන්න..."

"හොඳයි බේබි..."

තමාට මේ වෙන්නේ මොනවාදැයි මුතු සිතුවාය. අද උදේ සිට කෙල්ලව නොබලා හිතට මොකක්ද වාගේය. ඒ තරම්ම ඇයට හිත බැඳී ඇත්තේ ඇයි...

ලලිතා යද්දී මධුවන්ත කෙල්ලව සෝදා තුවායේ ඔතාගෙන එමින් උන්නේය.

"අන්න ආවේ ඇවිත් අපිව බලන්න..."

කෙල්ල සිනාසෙන්නේ දඟලමිනි.

"පේනවා නේද දැඟලිල්ල ලලිතා... වතුරට ඔය..."

"පුංචි කාලේ එහෙමනේ මහත්තයා... බේබි කාලා නෑ නේද තාම..."

"නෑ ලලිතා... මං මේ ඇඟ හෝදලම මොනවා හරි හදන්න හිතුවේ..."

"පොඩි බේබි බබාට ෆ්‍රයිඩ රයිස් එකක් හැදුවා මහත්තයා... හරි සුවඳට ආවා..."

මධුවන්ත සිනාසුමෙන් අසරණවය.

"බේබි උඩ තියන් කවයි මහත්තයා..."

Elegant talks.com

"නංගී පව්..."

මහුට එහෙමම කියවිණි.

"මට සූට් එකක් දාලා දෙන්න මහත්තයා... කවලා ආයෙත් අන්දන්න එකකුත් දෙන්න... බේබි ආසයි ඔබාව නෝදන්න..."

මධුවන්ත කෙල්ලට රෑට අන්දන සිනිඳු කලිසමත් අත්දිග ටී ෂර්ට් එකත් දුන්නේය.

"ලලිතා..."

"මහත්තයා..."

"ඇන්ටිලා නැද්ද..."

"නෑ. එලියට ගිහිල්ලා..."

මධුවන්ත දුවට අන්දවා ඇගේ හාවාද ඇය අත තැබුවේය.

"එහෙනම් ලූට් නැන්දි එක්ක බයි කාලා එන්න... හොඳද මැණික..."

ලූට් නැන්දිට වද දෙන්න එපා... නොඳද..."

කෙල්ලට ආසය. "ඔයා හරි පුදුම එක්කෙනෙක් නංගී..." මධුවන්ත ඇයට පිවේ සිනෙනි.

* * * * * * * * * * * * *

ලලිතා රෑට ආවේ මුතු කෙල්ලව කාමරයේ තියාගෙන කවද්දීය. ඇය කෙල්ලව බිම ඉන්දවාගෙන කතන්දර කියමින් ඇගේ පුංචි මුතු කරඳු කෙල්ලට සෙල්ලම් කරන්න දෙමින් බත් කැව්වාය. කෙල්ල කවන කවන බත් කටක් පාසා මුතු දෙස බලා සිනාසෙයි. බිම පෙරළෙයි. සිනාසෙයි. මුතු මේ සියල්ල බලා උන්නේ ආශාවෙනි.

"පොඩි බේබි..."

"ලලිතා..."

"ලොකු නෝනා ආවා.. මහත්තයත් ආවා ඒ ගමන්ම..."

"උඩට එයිද ලලිතා..."

"එන එකක් නෑ... මං මේ දොර වහගෙනම යන්නම්..."

"හා ලලිතා..."

මුතු කෙල්ලට බත් කවමින් සිතුවේ අම්මාත් තාත්තාත් ගැනය. ඒ දෙන්නාගේ ජීවිත ගැන අද ඒ දෙන්නාවත් දන්නේ නැත. තාත්තාත් අම්මාත් ඒ දවස්වල මෙහෙම නැත. ඉඩම් කට්ටි කට්ටි විකුණා සල්ලි මිටි හිටින් ලැබෙද්දී දෙන්නාටම මොහවාදෝ විය.

අක්කා ප්‍රියමන්ත අයියා වැනි සාමාන්‍ය කොල්ලෙක් සමඟ යාළු වූයේ ගෙදර ජීවිතය ඇයටද අප්පිරියා වූ නිසා වන්නට ඇත. තාත්තාත් අම්මාත් දැන් ඒ දවස්වලටත් වඩා සල්ලි වලින් මත් වී ඇත.

අන්තිම කටද කෙල්ලට කවද්දී මුතුට පුදුම සතුටක් දැනුණි. තමා හැදූ ෆ්‍රයිඩ් රයිස් එකට කෙල්ල ආසය.

"මී.. ජෝ බොමු... බත්ඩි පිරුණද..."

කෙල්ල වතුර ජොක ජොක ගා බොමින් සිනාසුනාය. කෙල්ලගේ මුහුණ මැදින් ඇයට පෙනුණේ මධුවන්තවමය.

කෙල්ලව සෝදා ගෙනෙද්දීම ඇයට යංතම් ඇස් පියවෙන්නට විය. මුතු ඇඳ මත තබාගෙන කෙල්ලගේ ලූට් තට්ටම් වලට ක්‍රීම් ගා පවුඩර් දමා රෑට අඳින සූට් එක ඇන්දවූවාය.

එහෙම කර කර ඉඳිද්දී ඇයට අමුතුම අදහසක් පහළ විය. දැන් කොහොමත් කෙල්ලව කාමරයෙන් පිටතට රැගෙන යා නොහැක. කෙල්ලව මේ ගෙදරට ගෙන්නා ගත් එකට අම්මා කුමක් හෝ කියනා බව මුතු දනී. "අද ලූට් නැන්දි එක්ක නිදාගමු..."

මුතු කෙල්ලව වතට තබා ගත්තේ ආශාවෙනි. ටික වේලාවකින්ම කෙල්ලට මුතුගේ පපුව උඩදීම නින්ද ගියාය. ඇගේ පපුවෙන් එන රස්නයට ආශාවෙන් මුහුණ තබාගෙන ඇය සුවඳර නින්දකට පිවිසියාය.

Elegant Stalks.com

"අද තාත්ති පව්.. එයා තනියම..."

මුතුට දුක සිතුණි. අර පුංචි කාමරේ ඔහු නිදනවා ඇත්තේ කෙල්ලව ළං කරගෙන විය යුතුය.

"ඉඳලා ඉඳලා කෙල්ල නැති උනාම හරි පාළු හිතෙයි..."

මුතුට සිතුණි. එහෙත් කෙල්ලව දෙන්නට ඇයටද ලෝබය. අද රෑට කෙල්ල මේ ඇඳේ ඉන්නවානම් තුරුල් කරගෙන නිදාගත හැක.

ලලිතා රෑ නමයට පමණ ආවේ මුතුගේ කෑමද උඩට රැගෙනය.

"පොඩි බේබිට උඩට එන්න බැරි නිසා මං කෑම ටික උඩට අරගෙන ආවා... අනේ පව්... බඩ උඩම දුවට නින්ද ගිහින්... නේද පොඩි බේබි..."

"ඒකනේ... අද බත් ඔක්කොම කෑවා ලලිතා..."

"රස වැටිලා ඇති..."

"මි.. මෙයාලා නැත්නම් හැමදාම හදලා දෙනවා... අක්කලා ආවද..."

"තව නෑ..."

ඔවුන් දෙදෙනා අද කොහේ හෝ යන්නට ඇත.

"ලලිතා... දැන් මොකද කරන්නේ... අරගෙන යන්නත් බෑ..."

"ඒකනේ... තාම දෙන්නම සාලේ ඉන්නවා... මොකක්ද ලොකු කතාවක්..."

"නිදාගන්න ගියාම කියන්න..."

"මි හා..."

"ම..ධුවන්ත මහත්තයට කියන්න බබා නිදි කියලා..."

"මං කියන්නම්..."

කෙල්ල ළඟ නැතිවූ විට මධුවන්තට පාළුය. එහෙත් ඇය ඉන්නේ මුතු ළඟ නිසා ඔහුගේ හිතට සතුටක් දැනෙයි. "අම්මා කෙනෙක්ගේ උණුසුම නැති එකේ එහෙමවත් චුට්ටක් ඉඳපුදෙන්..." මධුවන්තට සිතුණි.

මුතු වචන දෙක තුනක් තමා සමඟ කතා නොකරන බව ඇත්තය. එහෙත් මේ ලෝකයේ ඔහු දුටු හොඳම යුවතිය ඇය යැයි මධුවන්තට සිතෙයි. "ඔයාව දැකපු පළවෙනි දවසේ ඔයා ගැන හරි ආදරයක් හිතුණා... ඒත් කොහොමද අත පොවන්නේ... ඒ දවස්වල මම ආතක් පාතක් නැති කොල්ලෙක්... රස්සාවක් නෑ ගෙයක් දොරක් නෑ..." මධුවන්ත සිතුවේය.

"එහෙම කෙනෙක් ලබන්න ගොඩක් පින් කරන්නෝන... ඒ පින නැති නිසා තමා මට භාෂිණී වගේ දුක්ම දෙන ගෑණියෙක් ලැබුණේ..."

ඔහුට හිතෙන්නේ එහෙමය.

"මහත්තයා..."

ලලිතා විත් කතා කළේ ඒ මොහොතේදීය.

"අද මහත්තයට පාළුයි නේද..."

"අනේ කමක් නෑ ලලිතා... දුව කෑවද..."

"බේබි හදපු ෆ්‍රයිඩ් රයිස් එක ඔක්කොම කෑවා... කාලා ඇඟ සෝදලා දැන් අන්න පොඩි බේබිගේ ඇඟ උඩට වෙලා නිදි..."

මධුවන්තට මැවී පෙනුණි. මධුවන්තට මුතු ගැන ඇතිවූයේ පුදුමාකාර ගෞරවයකි.

"නංගිට පින් ලලිතා..."

මධුවන්ත අවංකවම කීවේය.

"බබාට හරි ආදරෙයි... මහත්තයා බලන්න තිබ්බේ නිදාගෙන ඉන්න හැටි... පොඩි බේබිව බදාගෙන..."

Elegantt

"එයා එහෙම තමා නිදාගන්නේ.. හරි ආසයි බඩ උඩ නිදාගන්න..."

"මහත්තයා ලොකු නෝනලා පහළ ඉන්නවා... බබාව දැන්ම ගේන්න බෑ..."

"ක..ම..ක් නෑ ලලිතා..."

මධුවන්ත දෙනෙත් පියාගෙන ඒ රුව මවා ගත්තේය... "ඔයා මගේ දුවට එහෙම කරනවා කියලා හිතද්දීත් ඇස් දෙකට කඳුළු එනවා..." මධුවන්ත සිතුවේය.

02

කෙල්ලව බඩ උඩ තබාගෙන කල්පනා කරමින් සිටිද්දී මුතුටද එහෙමම ඇස් පියවිණි. ඇය ඇහැරුණේ හදිස්සියේ වාගේය. මුතු එහෙමම ඔරලෝසුව දෙස බැලුවාය.

"අ..නේ දෙයියනේ එකයි... දුව ගේනකම් බලාගෙනත් ඇති..."

මුතුට බැලුනේ කෙල්ල දෙසය. ඇය මේ මොනවත් නොදැන නිදිය. මුතු එහෙමම කෙල්ලව වඩා ගත්තාය. ඇගේ උරතලය බදාගෙන කෙල්ල සනීපයට නිදිය.

"පව්... බලාගෙන ඇති..."

මුතු පහළ බලද්දී කළුවරය. ඒක නොඳය. ඇය පරිස්සමින්

Elegantt
talks.com

කෙල්ලවද වඩාගෙන ප්‍රධාන දොරට පැත්තකින් වූ කුඩා දොර ඇරගෙන කොරිඩෝවට පිවිසියාය.

දොරකඩ නිමාවී ඔහු ඉන්නා කැල්ල පැත්තට එබෙද්දීම දුටු දෙයින් මුතුගේ සිත හිරිවැටිණි. ඔහු දොරකඩ පඩියේ බිම ඉඳගෙන කල්පනා කරමින් උන්නේය.

මුතු පය තැබුවේ හිමිහිටය. යංතම් කළුවරේ ඇය එද්දී මධුවන්තට පෙනුණේ රෑ අඳුර මැදින් සුරංගනාවියක් එනවා කියාය.

"අ..නේ නංගී රෑ ආවේ... මං හිතුවා දු..ව උඩම නිදාගනී කියලා..."

ඔහු කීවේ ගොත ගසමින් මෙනි. මධුවන්ත දුවව ගන්නට දැත් යැව්වේය.

"ඇහැරෙයි.. මං නි..ය..න්..න..ම්..."

ඇය ඔහුව පසු කරගෙනම පැමිණ ඇඳ මතින් දුවව තබා ඇයට පෙරෙව්වාය. ඊටත් පසු ඇය හිස ඔසවද්දී දුටුවේ ළඟම උන් ඔහුය. මුතුගේ පපුව අසාමාන්‍ය ලෙස කෑ ගසන්නට විය.

මෙහෙමම ඔහුව වැළඳගෙන මොහොතක් ඉන්නට හිතෙනා තරමය. හදවත ඒ තරමටම උණුව ගොස් තිබුණි. මධුවන්ත සිනාසුණේ අහිංසක ලෙසිනි.

"මේ..ක නැගිට්ටාම දෙ..න්..න... ඒකට ආ..ස..යි..."

මුතු අතේ ගුලි කරගෙන උන් විසිතුරු බෝල ඇල්ලූ මාලය ඔහුට පෑවාය. එය ඇගේ අත්ලෙන් ගනිද්දී මධුවන්තට ඒ සුන්දර සුරත දෙස ඉබේටම බැලිණි.

මුතු එහෙමම ඔහුගේ කාමරයෙන් පිටට ආවේ ලෝබකමිනි... මඟක් දුරක් එද්දීම ඇගේ දෑස් කඳුළින් තෙමී ගියේය. ඒ අහවල් දුකටදැයි කෙල්ල දැන උන්නේද නැත.

මධුවන්ත ඇදෙන් ඇලවූයේ කෙල්ලව සිපගනිමින්ය. අද කෙල්ල ළඟින් එන්නේ වෙනදා එන සුවඳ නොවේ. ඇගේ සුවඳය. මේ සිදුවන දේවල් මධුවන්තට පුදුමය... හිතට එන්නේ මහ පුදුමාකාර ලෝබ

හිතෙනා දේවල්ය. "ඔයා වගේ කෙනෙක් ජීවිතේ උන්නනම්... එහෙනම් ජීවිතේ කොච්චර ලස්සනද... ඒත් මොනවද මගෙ ජීවිතේට උනේ... අවුරුදු කුමාරි පපුවම හීරුවා... හිරිවැටිලා ගියා..." මධුවන්ත සිතුවේ වේදනාවෙනි.

මධුවන්තට නින්ද ගියේ නැත. ඔහු ඇය දී ගිය ලස්සන අරුමෝසම් මාලය අතේ තබාගෙන එය දිග අරිමින් කල්පනා කළේය.

අයියාගේ ජීවිතයේ තිබූ පින තමාගේ ජීවිතයේ නොවුණේ ඇයිදැයි මධුවන්ත සිතුවේය. "මං පතාගෙනම එන්නැත්තේ දුක් කන්දක් වෙන්න ඇති..."

මුතු ඉඳි ආප්ප ටිකක් බෙදාගෙන විත් කන්නට ඇඳ මතින් ඉඳගත්තේ ඔරලෝසුව දෙස බලාය. දැන් වේලාව එකහමාරය. කන්නට ගනිද්දීම ඇයට සිහිවූයේ මධුවන්තවය. ඇයට සිහිවන්නේම දුව රෑ ගෙන යද්දී ඔහු දොරකඩ පඩිය උඩ ඉඳගෙන උන් අයුරුය. "සමහර විට ඔයා කාලා නැතුවත් ඇති..." මුතු සිතුවේ වේදනාවෙනි. ඉඳි ආප්ප ටිකක් දමාගෙන ගොස් ඔහුට දෙන්නට තරම් ඇයට සිතුණි. එහෙත් ඇය ඒ හැඟීම් මැඩ ගත්තාය.

කටවල් දෙක තුනක් කද්දීම මුතුට ඇති විය. ඇය බෙදාගත් ඉඳි ආප්ප ටික එහෙමම වසා දමා වතුර එක බීගෙන බීගෙන ගියාය.

මුතු බැල්කනියට ආවේ පහළ ඇනෙක්ස් එක දෙස බලාගෙනමය. මේ බැල්කනියේ සිට බලද්දී පෙනෙන්නේ එහි බාගයකි.

"එයා කෝපි හදනවා..."

උඩට මිහිරි කෝපි සුවඳක් එද්දී මුතු සිතුවාය. ඒ තරම් මිහිරි කෝපි සුවඳක් ඇයට කෙදිනකවත් දැනී නැත. "සිංගප්පූරුවෙන් ගෙනාපු කෝපි වෙන්න ඇති..."

මේ මහ රෑත් නිදා නොගෙන ඔහු කෝපි බීබී ඉන්නේ ඇයි... "ඔයා මං එද්දිත් උන්නේ හිත හිත... දැන් නිදාගන්නෙපැයි..." මුතුට පුදුම ඒ ගැන නොවේ. ඔහු පසුපසම දුවන මේ හිත ගැනය.

අද ඒ ඇස්වලින් මුතු දැක්කේ ඔහු සිංගප්පූරුවේ යන්නට පෙර

ඒ ඇස්වල තිබූ දුක්බර බැල්මමය. "ඔයා ඉස්සරත් එහෙමයි... හරි පුදුම විදිහට මං දිහා බලාගෙන ඉන්නවා... මං ආදරේ කළේ ඒ බැල්මට... ඔයාගේ අහිංසක කමට... ඒ අහිංසක පාට තාම එහෙමමයි... ඔයා බලද්දී හිතෙන්නේ හරි ආදරෙන් බලනවා කියලා... ඇත්තටම එහෙමද මධුවන්ත..." මුතු සිතින් ඇසුවාය.

නිදාගන්නට ඇඳට වැටෙද්දී මුතුගේ සිතට පාළුවක් දැනුණි. කෙල්ලව ගෙනිව්වේ අපරාදේ යැයි ඇයට සිතුණි. "අනිත් දවසේ උදේ වෙනකල් තියාගන්නවා..." ඇය සිතාගත්තාය.

එහෙත්...

අසරණ තාත්තාටත් දුවටත් එහෙම බොරු සුරංගනා ලෝකයක් පෙන්වන්නේ ඇයි. ඔහු ජීවත් වන්නේ කෙල්ලව අමාරුවෙන් හදාගෙනය. එහෙම හදාගන්නා කෙල්ලව තමා ගෙනවිත් අරම විසිතුරු ලෝකයක් පෙන්නා ඇයට පිස්සු වට්ටවන්නේ ඇයි... "චුට්ට දවසකට මං එයාට අම්ම වගේ වෙලා මොකටද... නැති දවසකට කෙල්ල අඬයි... එයාව නලවගන්නත් බැරි වෙයි... එහෙම කරන්න නරකයි..." මුතු සිතුවාය.

ඔහු අර පුංචි කාමර කෑල්ලේ පොඩි ලිපක් තබාගෙන කෙල්ලට මොනවා හෝ හදා දෙන්නේ අමාරුවෙනි. ඒ චූටි කෑල්ලේ කෙල්ලව තබාගෙන කවද්දී ඔහු කියනා දේවල් උඩට ඇසෙයි. එහෙම දුක්බර ලෙස කෙල්ලව හදාගෙන ජීවත් වන ඔහුට මේ ජීවිතයට හුරු වන්නට දිය යුතු නොවේද...

"ඒ දුප්පත් තාත්තයි දුවයි ළඟ මට නවතින්න බෑ... ඒ දෙන්නට එයාලගේ පුංචි ලෝකේ පාඩුවේ ඉන්න දෙන්නෝන..."

මුතුගේ ඇස් කඳුළින් පෙඟී ගියේය.

"ඔයාලා දෙන්නා ළඟට වෙලා හරි අහිංසක ජීවිතයක් ගත කරන්න තියෙනව නම්... ජීවිතේ කොච්චර ලස්සන වෙයිද... ඔයාගේ ජීවිතේට සදාකාලික හෙවණක් ඕන... නවාතැනක් නෙමේ..."

කැගසා මේ හිතේ තියෙනා දුක කියන්නට හිතෙනා තරම්ය.

"කොහොමත් දවසක ඔයාලා දෙන්නා යයි... එදාට මටත් හරියට දුක හිතෙයි..."

ජීවිතයට මේ සිද්ධ වේගෙන යන්නේ මොනවාදැයි මුතු සිතුවාය.

"ඔයාලා දෙන්නට වඩා දවසක මං අසරණ වෙයි... ඒක මට දැනෙනවා..."

එදාට මේ ජීවිතයම අපරාදේ නොවේදැයි මුතුට සිතුණි.

* * * * * * * * * * * * *

මුතු නිම්මි ළඟින් වාඩි වූයේ ඇය සමඟ ටිකක් කතා කරන්නට සිතාගෙනය. කෙල්ලගේ මුහුණ දකිද්දී නිම්මිට ඇය ඉන්නා පීඩනය තේරුම් ගන්නට පුළුවන් විය.

"අද උදේ ඉඳලා තාත්තයි දුවයි ගෙදර නෑ..."

නිම්මි කීවේ නිකමටය.

"කො..හේ ගි..හි..න්..ද..."

"දන්නෑ චූටි... හිටියනං කෙල්ලව ගිහින් උස්සගෙන එනවා... මටත් පාළුයි..."

"මට ඊට වඩා ගොඩක් පාළුයි..." මුතු කීවේ සිතෙනි.

"අක්..කේ..."

"චූටි..."

"එ..යා මො..නා..ද හිතන් ඉන්නේ..."

නිම්මි දිග සුසුමක් හෙළා කෙල්ල දෙස බැලුවාය.

"අ..නේ දන්නෑ බං... මේ තත්වෙන් ඉදිද්දී ජීවිතේ පටන් ගන්න එකත් ලේසි නෑ..."

Freegan tales.com

"ම්..."

"ඇයි චූටි..."

"නෑ නිකං... පු..දු..ම..ත් හිතෙනවා එයා ඉන්න විදිහ දැක්කහම... අර චූටි කාමරේට වෙලා..."

"එ..ක කාලෙක එහෙමයි චූටි... නපුරු කාලේ ආවහම විෂ්ණු දෙයියන්ටත් බටකොළ කන්න උනාලු... කොල්ලා ඔය දුක මැද්දෙන්ම මොනා හරි කරගනී..."

"ම්.. එ..යා..ට ක..ව..දහරි හරියයි..."

"ඇයි උඹ ඒක හරි ලෝබකමින් වගේ කියන්නේ..." නිම්මි ඇසුවේ සිතෙනි.

"ඉතින් චූටි.."

නිම්මි මුතුගේ මුහුණ දෙස බලාගෙන ඇසුවාය.

"මං අක්කා එක්ක ටිකක් කතා කරන්න කියලා ආවේ..."

"ඇයි චූටි..."

"ල..බ..න ස..තියේ මෙහේ පාටියක්... අම්මා කිව්වද ඔයාට..."

"නෑ.. මොකටද..."

"කාංචනලගේ කට්ටියයි තව කට්ටියකුයි එනවලු..."

"ම්.. එහෙම ඒවා අම්මයි තාත්තයි මට කියන්නැනේ බං..."

නිම්මි කීවේ බිම බලාගෙනය.

"ඔයා මේ ලෝකෙන් ගැලවිලා ඉන්න එක සැනසීමක් අක්කේ... දුක් වෙන්නෙපා..."

"ම්... මට එහෙම දුකක් නෑ කෙල්ලේ... අයියා එක්ක ඔය රවුමක් ගහලා ආප්පයක් කාලා ආවත් මට සැපයි..."

මුතු ඇය දෙස බලාගෙනම උන්නාය.

"මා..ත් තීරණයක් ගත්තා අක්කේ..."

"මො..ක..ක්..ද චූටි..."

"මං හෙට අනිද්දට කියනවා... කාංචනව මැරි කරන්න බෑ කියලා..."

"එ..හෙ..ම කි..ව්..වය කියල මෙයාලා..."

"මං දන්නවා... ඒත් දෙයක් කරන්න කලින් කියන්න ඕනනේ... කරන දෙයක් ඊට පස්සේ කියනවා... මං කාංචනවත් හම්බවෙලා කියනවා..."

නිම්මි බලා උන්නේ කිසිවක් කියාගත නොහැකිවය.

"මෙ..යා..ලා ය..කා නටයි... නේද චූටි..."

"ම..ට කරන්න වෙන දෙයක් නෑ අක්කේ... සමහර විට මට මේ ගෙදරින් යන්නත් වෙයි..."

"උ..ඔ කො..හේ ය..න්..න..ද..."

"නොගියොත් මට කාංචන එක්ක යන්න වෙයි..."

නිම්මි බලා උන්නේ කෙල්ලට උත්තරයක් දී ගන්නට බැරුවය.

"මං මේ..ක ඔයාට කියන්නයි ආවේ..."

නිම්මි කෙල්ලගේ අතින් අල්ලා ගත්තේ ගැහෙමින් මෙනි.

"එ..ක..පා..ර තීරණයක් අරගෙන චූටි..."

"ඔයා කියන්නේ මට එහෙනම් කාංචන එක්ක යන්න කියලද..."

නිම්මි බිම බලාගත්තාය.

"සමහර විට ඔයාටත් මං කියන දේ තේරෙන්නේ නැතුව ඇති... ඔයාට ඒ දවස්වල මොනා දේ උනත් ආදරේ කරන්න කොල්ලෙක්

Elegant talks.com

හිටියා... ඔයා මේ ගෙවල් දෙවනත් වෙන්න කැගැහුවේ ඒකයි... අ..ද මං ඉ..න්..නේ ඒ ත..න්..වේ නෙමේ... මං තනිවෙලා..."

මුතු කීවේ අඬමිනි. නිම්මි පුදුමාකාර දුකකින් එහෙමම කෙල්ලව වැළඳ ගත්තාය.

"අ..නේ උඹ මං ගැන එහෙම හිතනවනේ..."

නිම්මි කීවේ මුතුගේ හිස පිරිමදිමින් අඬමින් මෙනි.

* * * * * * * * * * * *

මධුවන්ත දුවවද වඩාගෙන කොරිඩෝව දිගේ ආවේ නිම්මිත් මුතුත් නිවස ඉදිරිපිට වැරන්ඩාවේ කතා කරමින් ඉන්නා බව දැනගෙනය.

"අ..ක්..කේ..."

මධුවන්ත එනවා දැක මුතු නිම්මිට කතා කළාය. මධුවන්ත ඔවුන් ළඟට එන්නටත් පෙර කෙල්ල මධුවන්තගේ අතේ සිට දඟලන්නට වූවාය. ඇය ඔය දඟලන්නේ තමාව දැක බව මුතු දනී.

"වූ..ටි නැ..න්දිව දැකලද දඟලන්නේ... ආ සුදු නෝ..නි ම්..."

කෙල්ල මුතු දෙසට අත දිගු කරමින් කතා කරද්දී මුතුගේ පපුව උණු වී ගියේය.

"ඔය නංගි අතට එන්න..."

"එ..ත්..න..."

මුතු මධුවන්ත අතින් කෙල්ලව ගත්තේ බිමට නෙත් බර කරගෙනය. ඇය කෙල්ලව ගෙන එහෙමම ඔඩොක්කුවේ තබා ගත්තාය.

"අ..ක්..කේ... නෙට මේ මගේ යාළුවා රට ඉඳලා එ..නවා... මං

අ..ක්කට කිව්වේ රවී කියලා..."

"ඔයාව බලන්නම වෙන්න ඇති එන්නේ..."

"ආයෙත් ඔයා රට යන්නද..." මුතු සිතුවේ බියෙනි. එක අතකට ඔහු මොන දේ කර හෝ මේ ජීවිතයෙන් ගොඩ ආ යුතු නොවේද...

"ඔව් අක්කේ... එහෙදි රවියි මායි එකටමයි හිටියේ... මට එහෙදි පිහිට උනේ කොල්ලා විතරයි..."

"ඇවිත් මල්ලිවත් එක්කගෙනම ආයේ යයිද දන්නෑ නේද..."

මධුවන්ත බිම බලාගෙන සිනාසුණේය. මුතු ඒ මොහොතේදී යංතමට දෙනෙත් ඔසවා ඔහු දෙස බැලුවාය.

"මං මෙහෙමම නැගිටිනවා අක්කේ..."

මධුවන්ත කියද්දී පපුව හිරිවැටී ගියේ මුතුගේය.

"ඉතින් අක්කේ රවීලගේ ගෙවල් නුවර..."

"ම්..."

"ර..වී ආවම මා..ත් එයා එක්ක එහේ ය..නවා... සතියකට විතර..."

මුතුගේ දෙනෙත් එහෙමම බිමට බර විය.

"ඒක හොඳයි... ඔයත් මෙතන හිරවෙලා වගේනේ මල්ලියේ... කෙල්ලත් එක්ක ටිකක් ඇවිදලා එන්න පුළුවන්නේ..."

"ඔළුව ටිකක් පාදගෙන මොනවා හරි හිතන්නෝන අක්කේ..."

"ඇයි එයාව යවන්නේ..." මුතු සිතෙන් නිම්මිට බැණ්නාය.

"ඉතින් ගිහින් සතියක්ම ඉන්නවා..."

"එ..හෙම තමයි අක්කේ හිතුවේ..."

"මල්ලි මොනාහරි හිතාගෙනද ඉන්නේ..."

නිම්මි ඇසුවේ ඔහු දෙස බලාගෙනමය. මුතු කෙල්ලත් සමඟ

Elegant talks.com

සෙල්ලම් කරමින් ඊට කන් දීගෙන උන්නාය.

"දැ..න් මං ඇවිතුත් මාස දෙකක් වි..තර උනානේ අක්කේ.. පිළිවෙලක් කර ගන්නෙපැයි..."

"කරන්න දෙයක් තියේ නම් කියන්න මල්ලී..."

"මේ කට්ට මං කන්නම ඕන අක්කේ... අක්කල කරන්න පුළුවන් හැමදේම මට කළා..."

නිම්මිට බැලුනේ මුතු දෙසය. ඔහුත් සමඟ කතා කරද්දී ඇය ඉන්නේ බිම බලාගෙනය.

"මල්ලි බඳින්න ආයෙත්..."

නිම්මි කටට ආ දේ කීවාය. මධුවන්තගේ ඇස් බිමටම බර විය. මුතු ඔහු කියන්නේ මොනවාදැයි අසාගෙන උන්නේ පරිස්සමිනි.

"අනාථ වෙච්ච අපි දෙන්නව බලා ගන්න කවුද අක්කේ එන්නේ..."

ඒ කතාවට මුතුගේ දෙනෙත්වල කඳුළු පිරුණි. ඇය එහෙමම දෙනෙත් බර කරගෙන උන්නාය.

"ඒ.. ම..ල්ලි හිතන හැටිනේ..."

"මං මෙ..හෙ..ම..ම ඉන්නවා අක්කේ..."

ඇස් වල වූ කඳුළු දැන් දැන් වැටෙනැයි මුතුට බියක් දැනුණි.

"මං පා..න්දරම ය..නවා අක්කේ එහෙනම්... මං රෑට අයියටත් කියන්නම්..."

"මල්ලී එයාර් පෝට් යනවද..."

"නෑ අක්කේ රවී මෙහෙට එනවා කිව්වා... එහෙමම යනවා... යන්නම් නංගී..."

කෙල්ල සෙලවුනේ වත් නැත.

"දුවව මං අරන් එන්නම් මල්ලී..."

මධුවන්ත ගිය පසු නිම්මි බැලුවේ මුතු දෙසය.

"ඇයි චූටි..."

"මු..කු..ත් නෑ අ..ක්කේ..."

"උඹ අඬනවනේ..."

"නෑ..."

මුතු කෙල්ලව වඩාගෙන නැගිට්ටාය. "ඔයාවයි ඔයාගේ තාත්තවයි මට බලාගන්න තියෙනව නම්..." මුතු කෙල්ලව බදාගෙනම සිතුවාය.

Elegantalks.com

03

සතියක්ම

මධුවන්තත් දුවත් නෑ කියා සිතෙද්දී මුතුගේ පපුවට අසාමාන්‍ය පාළුවක් දැනෙයි. ඇය රෑ පුරා උන්නේ ඒ පාළුවෙනි. "එක අතකට ඔයාට බෑ මේ පුංචි කාමරේ හිරකාරයෙක් වගේ ඉන්න... මෙයාලා ඉන්න වෙලාවට ඔයා එළියට වත් බහින්නෑ... එහෙම කොහොමද ඉන්නේ..." මුතු සිතුවේ ඇත්තටම දුකෙනි.

ඔහු තුවර යන්නේ මොනවා හෝ හිතන්නට බව මුතු දනී. එහෙම සිතා ඔහු තීරණයක් ගනු ඇත. සමහර විට හෙට අනිද්දාම ඔහු මෙහෙන් යනු ඇත. ඒ ජීවිතය ඒ තරමටම නීරසය. මේ ගෙදරට ආවා කියා ඔහු බලාපොරොත්තු වූ රැකවරණය ලැබුණේ නැත.

කවුරුවත් ඔහුට උදව් කරන්නේ නැත. අඩුම ගණනේ මේ ගෙදරින් ඔහුට කෑම එකක් දෙන්නේ නැත. එහෙම තිබියදීත් ඔහු සියල්ල දරාගෙන ඉන්නේ තීරණයක් ගන්නා තුරු විය යුතුය.

මහ රෑ කෙල්ල එක දිගටම අඬන්නට විය. එය පුදුම ඇඬිල්ලකි. මුතුට වෙලාව බැලිණ. රෑ දොළහටත් ආසන්නය. ගෙදර සියල්ලන්ම නද නින්දේය.

කෙල්ල අද මේ තරම්ම අඬන්නේ ඇයි... වෙනදාට මෙහෙම රෑට ඇඬුවත් විනාඩියකින් දෙකකින් ඔහු කෙල්ලව නලවා ගනී.

මුතු බැල්කනියට වී ඒ ඇඬුම අසාගෙන ඉන්නේ අමාරුවෙනි. එය අඩුවෙන පාටක් නැත.

"හරි අ..ම්..මා.. හරී... මේ.. හා පැටියත් බලනවා... මේ..."

ඔහු කෙල්ලව නලවාගන්නට නොකියනා දෙයක් නැත. එහෙත් ඒ කිසිවකටත් කෙල්ල නැලවෙන්නේ නැත...

"අ..නේ මැණික... ඇයි මේ.. අපි කුක්කු බොං..මු..."

මුතුගේ දෑස් පෙඟී ගියේය. ඔහුට කොතරම් දුකදැයි ඇය දනී. මුතු ඇඳ උන් රෑ ඇඳුමට උඩින් ඕවර් කෝට් එක දමා ගත්තේ ඉවසන්නට බැරිම තැනය.

ඇය කාමරයේ දොරකඩට විත් මොහොතක් සිතුවාය. ඊටත් පසු ඇය එහෙමම පියගැට පෙළ බැස පහළට ගියාය. ගෙදර සියල්ලන්ම නිදිය...

මුතු දොර ඇරගෙන ඔහු ඉන්නා ඇනෙක්ස් එක පැත්තට ගියාය. කෙල්ල අඬන හඬ ළං ළංව ඇයට ඇසෙන්නට විය.

ඇය එබුණාය. ඔහු දුවව පපුවට තබාගෙන එහෙට මෙහෙට දුවන අයුරු දකිද්දී මුතුගේ දෑස් පැලීගෙන මෙන් කඳුළක් පිට විය.

ඇයට ඒ පැත්තට අඩිය තැබුණේ ඉබේටම මෙනි.

"හ..රි ම..ගේ අ..ම්..මි..යෝ හ..රී..."

මධුවන්ත කෙල්ලව පපුවට තබාගෙන හැරුණේය. දොරකඩ ළඟ උන් මුතුව ඔහු දැක්කේ එවිටය. ඒ ඇස්වල කඳුළු යැයි මුතුට

සිතුණි. "ඔයා පව්"

"ඇ..යි දු..වා අ..ඩ..න්..නේ..."

මුතු ඇසුවේ ගොත ගසමින් මෙනි.

"ද..න්..නෑ නංගි... එ..කපාර නැගිටලා අඬන්න ග..ත්..තා... හිනයක් දැකලා වෙන්න ඇති..."

ඔහු කිවේ අසරණවය.

"ම..ට දෙ..න්..න..."

මුතු දැනම පෑවාය. කෙල්ල මධුවන්තගේ අතින් මුතුගේ අතට ආවේ අඩාගත් ගමන්මය.

"හ..රි පැටියෝ... වී.. නාක ළමයිනේ අඬන්නේ... මගේ දුවා හොඳයි... අඬන්නෙපා පැටියෝ..."

පුදුමය... කෙල්ල මුතුගේ නැලවිල්ලට ඇඬීම නතර කළාය. එහෙත් ඇඬු ඇඬිල්ලට තාමත් කෙල්ලට ඉකි ගැසෙයි. මුතු ඉකි ගසන කෙල්ලව පපුවට තබාගෙන මධුවන්ත දෙස බැලුවාය.

මධුවන්ත මුතු දෙස බලා සිනාසුණේ අසරණවය.

"දු..වා..ට කි..රි හ..දලද..."

"ඔ.. ඔ..ව් නංගි... මං දුන්නා බිව්වේ නෑ..."

"දෙන්න..."

මුතු කෙල්ලවද රැගෙන ඇඳ වෙත ආවාය. මධුවන්ත කිරි එක ගෙන ඇය අද්දරටම ආවේය. මුතු කෙල්ලව ඇඟට තුරුල් කරගෙනම කිරි බෝතලය කෙල්ලගේ මුවට ළං කළාය. කෙල්ල තද පිපාසාවකින් උන්නාක් මෙන් කිරි එක බීගෙන බීගෙන යන්නට ගත්තාය.

මධුවන්ත ඒ දෙස බලා උන්නේ හූල්ලමින් මෙනි. "ඔයා වගේ අම්මා කෙනෙක් මගේ කෙල්ලට ඉන්න තිබ්බා..." ඔහු සිතුවේය. "ඔයා තනියම කෙල්ලව කොහොම හදන්නද... දුවට අම්මා කෙනෙක් ඉන්න ඕන... තාත්තා කෙනෙක්ට හැම දේම කරන්න බෑ..." මුතු

සිතුවේ කිරි බොන දුවගේ හිස දයාබර ලෙස පිරිමදිමිනි.

කිරි ටික බී හමාර වෙද්දී කෙල්ලට නින්ද ගියේය. මුතු පරිස්සමින් කෙල්ලගේ මුවින් කිරි බෝතලය මුදා ගත්තාය. ඇගේ සිතට තුනී සතුටක් දැනුණි.

ඇය කෙල්ලව පරිස්සමින් ඇඳ මත තබා පෙරෙව්වාය. ඇය හිස් කිරි බෝතලය ඔහු වෙත පෑවේ බිම බලාගෙනය.

ඇයට මොනවා කියන්නදැයි ඔහුට තේරෙන්නේ නැත.

"මං.. ටි..ක..ක් දුව ළඟ ඉ..න්නම් ආයෙත් ඇහැරුණොත්..."

මුතු දෙනෙත් බර කරගෙන කීවාය. මධුවන්ත හිස වැනුවේ අසරණවය. ඔහු හීටරය රත් කර කෝපි හදන්නට ගත්තේය. ටික වේලාවකින් අර එදා ආ කෝපි සුවඳ කාමරය පුරා විසිරෙන්නට විය.

"කෝ..පි ටි..ක..ක් බො..න්න නංගී..."

ඔහු කෝපි කෝප්පය ඇයට පෑවේ දෝතින්මය. එය ගනිද්දී මුතුට ඔහු දෙස බැලිණි. ඇය කෝපි උගුරක් බිව්වේ ඒ තරම්ම තිබහක් ඇතිවූ නිසාය. බිවූ රහම කෝපි උගුර එය යැයි මුතුට සිතුණි.

ඇයට දහසක් දේවල් ඔහුගෙන් අසන්නට සිතෙයි. මේ රෑ කවුරුවත් නැත. ඔහුත් තමාත් පමණකි. ඕනා නම් පාන්දර වන තෙක් කතා කර කර සිටිය හැක.

කෝපි එක රහයි කියා කියන්නට ඇයට සිතෙයි. මේ තරම් රහට කෝපි හදන්නේ කොහොමද කියා අසන්නට ඇයට සිතෙයි. හෙට නුවර යන්නේ කීයටදැයි අසන්නට සිතෙයි. ගිහින් එන්නේ කවදාදැයි අසන්නට සිතෙයි.

එහෙත් මුව ගොළුවී ඇත.

"දැ..න් නුවර ගියාම නංගිව හොයයි..."

ඔහු උගුරෙන් මෙන් කීවේය. මුතු ඔහු දෙස බැලුවේ දුකෙනි.

"මං.. ය..න්..න..ම්..."

මුතු නැගිට්ටාය. මධුවන්තට දුක සිතුණි. ඇය තව ටිකක් වෙලා

Vegan

උන්නා නම් කියා ඔහුට සිතුණි.

"නංගි..."

මුතු හැරුණාය.

"මී..."

ඇය කතා කළේ ඔහු දෙස නොබලාය. "මොනවා හරි කියන්න මධුවන්න..." ඇගේ පපුව කෑ ගසන්නට විය.

"මං.. උ..දේ ය..න..වා..."

"මී..."

මුතු එහෙමම ආවාය. ටික දුරක් එද්දීම ඇගේ ඇස්වල කඳුළු පිරුණි. ඇය එහෙමම විත් ඇඳට වැටුණාය. "මොනවද දෙයියනේ මේ වෙන්නේ..." ඇය තමාගෙන්ම ඇසුවාය.

දුව ඇයට නොලැබුණ හැටි පුදුමයැයි මධුවන්තට සිතුණි. ඇය ඇවිත් ගිය පසු කාමරයම සුවඳය. මධුවන්ත දුව ළඟින් ඇලවූයේ කාමරය පුරා විසිරුණු ඒ සුවඳ විඳිමිනි.

"ඔයාගේ ඇස් දිහා බලන් ඉන්නකොට ඔයා මොනවද කියනවා වගේ..." මධුවන්ත සිතුවේය. එහෙත් සුරංගනාවියක් මේ අනාථයාට කුමක් කියන්නද... "දුවට හරි ආදරෙයි.. ඒකයි..." මධුවන්ත එහෙම සිතුවේය.

හදවතට දැනෙන ලෝබකම දුකකි. හීනෙකින් වත් එහෙම ලැබීමක් මේ ජීවිතයේ නැත. තමාට නැතත් කෙල්ලට වත් එහෙම ලැබීමක් තියෙනවා නම් කියා මධුවන්තට සිතුණි. "මනුස්සකමට එයා ආවාම් මං මේ මොනවද හිතන්නේ..." මධුවන්ත තමාටම බැණ ගත්තේය.

* * * * * * * * *

නිම්මි උදේ තේ එක රැගෙන විත් ප්‍රියමන්ත ළඟින්ම ඇලවූවාය.

"කොල්ලා මොනවා හිතනවද දන්නෑ... මට ඌත් එක්ක කතා කරන්නවත් වෙන්නෑ..."

"ඒකා එහෙම හිතන්නෑ... අද නුවර යන්නනේ..."

"මං ටිකකින් යන්නම්... එහෙම යන එක හොඳයි... මේකටම හිරවෙලා ඉන්නකොට ඌට අමාරුයි.."

"කොල්ලෙක්නේ ප්‍රියා... අමාරු තමයි..."

නිම්මි ප්‍රියමන්ත දෙස බැලුවේ යමක් කියන්නටය.

"මේ කෙල්ලගේ ප්‍රශ්නෙට මොකක් කරන්නද මන්දන්නෑ ප්‍රියා... මට හරිම දුකයි ඊට වඩා බයයි..."

නිම්මි මුතු කියූ සියල්ල ප්‍රියමන්තට කීවාය.

"මේගොල්ලෝ කෙල්ලව මරයි..."

"ඔව්... ඒත් කෙල්ල කාංචනව බඳින්න කැමතිම නෑ..."

"එහෙම ලොකු අකමැත්තක් නංගිගේ තිබ්බේ නැනේ..."

"මි.. දැන් කැමතිම නෑ... බඳින්නෙම නෑ කියලා කියන්නේ..."

"ඒකට ලොකු හේතුවකුත් තියෙනවා..." නිම්මි කීවේ සිතෙනි.

"ඉතින් අපි මොකද කරන්නේ..."

"ඒක තමයි... මල්ලිගේ ප්‍රශ්නේ වගේම තමා මේකටත් උත්තර නෑ..."

"මුන් දෙන්නගේ ජීවිත අවුල් වෙලා තියෙද්දී අපිටත් සැනසීමක් නෑ..."

"මාත් කියන්නේ ඒකයි ප්‍රියා..."

නිම්මි දිග සුසුමක් හෙළා කීවාය.

"බලමුකෝ... මොනවා හරි වෙයිනේ..."

"ඌට හිතනවද දන්නෑ අපිත් අහක බලාගෙන ඉන්නවා කියලා..."

"හිතුවත් මොනා කරන්නද ප්‍රියා..."

"ඔන්න කොල්ලෙක් එක්ක යාළුවෙලා වත් උන්නනම් ඒකටවත් උදව් කරනවා..."

නිම්මි ප්‍රියමන්ත දෙස වෙනස්ම ලෙස බැලුවාය. "එහෙම දෙයක් වෙනව නම් ඔයාගේ මල්ලි එක්ක තමයි..." නිම්මි එසේ සිතුව මුත් කීවේ නැත.

කොල්ලා ඉන්න විදිහ දකිද්දී රවීගේ පපුව පැලෙන්නට විය. ඔහු මධුවන්තව වැළඳ ගත්තේ ආදරයෙනි. ඊටත් වඩා වේදනාවෙනි.

"අම්මා තාත්තා දැක්කා වගේ මචං උඹව දැක්කහම..."

රවී කෙල්ලව වඩා ගත්තේය.

"සිංගප්පූරුවේ මාමිව මතක නෑ පැටියට... ම්... මාමි පැටියට සෙල්ලම් බඩුත් ගෙනාවා..."

"මාමිට උම්මා දෙන්න පැටියෝ..."

කෙල්ලට රවීව යංතමට මතකය. ඇය ඔහුව වැළඳගෙන හාදුවක් දුන්නේ ඒ නිසාය.

"උ..ඕ මේ කාමරේද මචං ඉන්නේ..."

"ඔ..ව් මචං..."

ගේට්ටුවෙන් ඇතුල් වෙද්දී රවී හිතාගෙන උන්නේ කොල්ලා සැපට ඉන්නවා ඇති කියායි. එහෙත් මේ පුංචි කාමර කැල්ල දුටු පසු රවී බොහෝ දේවල් සිතා ගත්තේය.

"අයියයි අක්කයි පුළුවන් විදිහට උදව් කළා මචං... අක්ක වගේ නෙමේ ඇත්ටයි අත්කලුයි..."

"මට තේරෙනවා..."

"ඒත් ම..ට මේ ඇති මචං... අනාථ වෙලා ලංකාවට ආපු මට මේ කාමර කැල්ලත් මාළිගාවක්..."

රවී සිතන්නේ මොනවාදැයි දැනගෙන මධුවන්ත කීවේය.

"උ..ඔ කාල නෑ නේද..."

"නෑ මචං... ෆ්ලයිට් එකෙන් බැස්ස ගමන් දුවගෙන ආවේ..."

"මං උඹට කිරිබත් චුට්ටක් හැදුවා ලුණුමිරිස් එක්ක..."

"උ..ඔ මේ..ක ඇ..තුලේ උයාගෙනද කන්නේ..."

රවී පුදුමයෙන් ඇසුවේය.

"එ..හෙම කරදර කරන්න බෑනේ මචං... මට පුරුදු දේනේ..."

රට වෙනස් වූ එක විතරය. කොල්ලාගේ ජීවිතයේ දුක එහෙමමය. රවී පුදුමාකාර ආදරයකින් දුවාව සිපගත්තේය.

"කෙල්ල චුට්ටක් ලොකුත් වෙලා නේද මචං..."

"ම්... ඕන්නං වොෂ් එකක් දාගෙනම කමු මචං... මේ ඇඳුම් පිටින් නුවර යන්නත් බෑනේ..."

"දාගමු... උ..ඔ මේ කාමරේ මේ ඔක්කොම කරගෙන හිටපු එකයි පුදුම මචං..."

මධුවන්ත සිනාසුණේය. ජීවිතයේ අමාරු දවස්වලදී සමහර දුක් දුකක් යැයි සිතෙන්නේ නැත.

"මා..මී ෂෝයි පුතු.. ම්..."

"මා..මී..මා... ආ..වා..."

"ඔව් පැටියෝ... මාමි ආවා... අපි කුක්කු බයි කාලා මාමි එක්ක බෑම් යං..."

මධුවන්ත කිරිබත් පිඟානත් එැණු කපා අතේ හැදූ ලුණුමිරිසත් මේසය මතින් තැබුවේය. තේ ටිකක් හදන්නට හිටරය ගැසුවේය. ඒ අතරවාරයේ කිරිබත් කැල්ලක් බෙදාගෙන කෙල්ලටද කැව්වේය.

"කුක්කු බයි රහයි.. ම්..."

"ර..සා..යි..."

Kiganti.com

"අ..තේ ම..ගේ අ..මී..මා... කාලා මෝයි අදිමු හොඳේ..."

රවී නාගෙන සැහැල්ලු ඇඳුමක් දමාගෙන ආවේය. පුංචි නාන කාමරයෙන් පිටතට එද්දී ඔහු එක් දෙයක් සිතා ගත්තේය. "කොල්ලට ඒවිතේ හදා ගන්න ලොකු උදව්වක් කරන්නෝන්න..."

"ඛෙදාගනිං මචං..."

රවී පුංචි කිරිබතත් ලුණු මිරිස් දිසියත් දෙස බලා උන්නේ දුකෙනි. එහෙත් ඔහු ඒ දුක පෙන්නුවේ නැත.

"උඹ කාලද මචං..."

"මං කන්නම්... උඹ කාපංකෝ..."

රවී කිරිබත් කැලි දෙකක්ම ඛෙදාගෙන ඇඳ මත ඉදගත්තේය.

"අපි ඉස්සර රෑම් එකේදි හදාගත්ත කිරිබතම තමයි නේද..."

මධුවන්ත සිනාසුණේය.

"දැනුයි ලංකාවට ආවා කියලා දැනුණේ..."

ලුණුමිරිස් තලි තලි දමාගනිමින් කිරිබත් කමින් රවී කිවේය.

"තව කැල්ලක් කාපන් මචං..."

මධුවන්ත තව කිරිබත් කැල්ලක් රවීට බෙදුවේය.

"ම..ධූ..."

"ම..."

"වෙලාවකට මේ ජීවිතෙත් හොඳයි නේද ඛං..."

"වින්ද දුකට වඩා සැනසීයි මචං... මායි කෙල්ලයි ඔය මොනවා හරි හදාගෙන කනවා... කම්මැලිම හිතුණොත් කෙල්ලවත් අන්දවගෙන පාර්ට යනවා... ඔහොම තමයි මේ මාස දෙක ගෙවුනේ මචං..."

රවී මධුවන්ත කියනා දේ අසා උන්නේ දුකකින්ම නොවේ. සිංගප්පූරුවේදී කොල්ලා වින්ද දුක රවීට මතකය. අඩුම ගානේ ඒ දැවිල්ලවත් දැන් මධුවන්තට නැත.

"අපි කැන්ඩි ගිහින් මොනවා හරි හිතමු මචං... මටත් සිංගප්පූරුවෙම ඉඳලා එපාවෙලා... හිතුණොත් මාත් මෙහේ සෙට්ල් වෙනවා..."

"උ..ඔ..ත් ලංකාවේ ඉන්නවනම් හරි ශක්තියක් මචං..."

"බලමු... එහෙනං ඇඳගනිං..."

මධුවන්ත කෙල්ලව ඇඟ සෝදන්නට රැගෙන ගියේය. රවී නාන කාමරයේ දොරකඩට වී ඒ දෙස බලා උන්නේය. මතුපිටින් නොපෙනෙනවාට මධුවන්ත විඳින්නේ පුදුමාකාර දුකකැයි රවීට සිතුණි.

04

මුතු පහළටම වී උන්නේ තව ටිකකින් ඔහු යන බව දන්නා නිසාය. තාත්තාවත් දුවවත් සතියකට දකින්නට වෙන්නේ නැත. කෙල්ල පහළට වී උන්නේ යන්නට පෙර තාත්තාවත් දුවවත් දැක ගන්නටය.

අක්කාත් අයියාත් නම් ගියේ ඔහුගේ කාමරයට ගොස් පැයක් පමණ ඔහුත් සමඟ කතා කරමින් ඉඳය. ඒ තරම් සැහැල්ලුවකින් ඔහුත් සමඟ තමාට කතා කළ නොහැක්කේ ඇයිදැයි මුතු සිතුවාය.

මධුවන්ත දුවවත් වඩාගෙන රවීත් සමඟ එද්දී මුතු උන්නේ කොරිඩෝවේ වූ පුටුවකට බරවී සඟරාවක් කියවමිනි. ඔහු කොරිඩෝව කෙළවරින් ඇතුල් වූ බව කෙල්ලගේ ඇස් කොනකට දැනෙයි.

ඇයට දැස් ඒ දෙසට නොහරවා ඉන්නට බැරි විය. තාත්තාවත් දුවවත් දකිද්දී මුතුගේ පපුවම දුකකින් බර විය.

ඔහු නැවතුණේ ඇය ඉඳගෙන උන් පුටුව ළඟටම පැමිණය. මුතුට එහෙමම නැගිට්ට විණි.

"ම..චං මේ... මු..තු නංගී... මං නංගි ගැන එහෙදි උඹට කිව්වේ..."

මධුවන්ත මුතුව රවීට හඳුන්වා දුන්නේය. "ඔයා මොනවද මං ගැන එයාට කිව්වේ..." මුතු සිතුවාය.

"මං දන්නවා මචං නංගිව... අර උඹේ ඇල්බම් එකේ ලොකු පින්තූරයක් තියෙන්නේ..."

පපුව හිරිගෙන මෙන් ගියේය.

"නංගි මේ රවී... මාත් එක්ක සිංගප්පූරුවේදි ළඟින්ම හිටිය යාළුවා..."

කෙල්ල දැස් ඔසවා රවී දෙස බලා යංතමට සිනාසුණාය.

"චූ..ටි නැ..න්..දිට උ..ම්මා දෙන්..න... අපි යනවනේ දැන්..."

මුතු කෙල්ලව අතට ගත්තේ ලෝබකමිනි. ඇය කෙල්ලගේ පුංචි දෙකම්මුල් සිපගත්තේ දුකෙනි.

"බෑ..ම් යං..."

කෙල්ල කතා කරන්නේ තමාටත් එන ලෙස බව මුතු දනී... "මට ඔයාලා එක්ක එන්න බෑනේ මැණික..." ඇය කීවේ සිතෙනි.

"බු..දු ස..ර..ණයි..."

මුතු කෙල්ලව මධුවන්ත අතට දුන්නේ නෙත් බර කරගෙනය. රවී බෑග් රැගෙන වාහනය වෙත ගියේය.

"අ..පි ගිහින් එන්නම් නංගී..."

"ම්..."

"ටි..ක දවසක් ඉඳලා එන්නේ... අක්කටයි අයියටයි කියන්න ගියා කියලා... මං උදෙන් කිව්වා... ය..න්නං නංගී එහෙනම්..."

Elegantlk.com

මොනවාවත් නොකියවෙන්නේ ඇයි... මුතු සිතුවේ වේදනාවෙනි. ඇය මධුවන්තගේ අතේ උන් කෙල්ලට අත වැනුවාය. වාහනයට නැග්ග පසු මධුවන්තට මුතු දෙස බැලිණි. ඒ ඇස්වල මොනවාදෝ ලියවී ඇතිවාක් මෙනි. "දුවට එකතුවෙලා හිටියනේ... යද්දී දුක ඇති..." මධුවන්ත සිතුවේ එහෙමය.

වාහනය ගේට්ටුවෙන් පිටවූ පසු මුතුට දිග සුසුමක් පිට විය. ඒ සුසුම පිටවූයේ පපුව හාරාගෙන මෙනි.

"අද මේ ගෙදර කවදාවත් නැතුව පාළුයි..."

මුතුට සිතුණි. ඇය මධුවන්තගේ ඇනෙක්ස් කැල්ල දෙසට පිය මැන්නේ සාංකාවෙන් මෙනි.

"පොඩ්ඩි බේබි... මහත්තයයි බබයි ගියා නේද..."

ලලිතාද පැමිණ ඇසුවේ දුකෙන් මෙනි.

"දැන් ගියා ලලිතා..."

"ඉදලා ඉඳලා ගියාමත් පාළුයි නේද පොඩි බේබි..."

මුතු කතා නොකර හිස වැනුවාය.

"මගෙත් පාන්දර පොල් ටිකක් ගාලා ඉල්ලුවා..."

"පොල් ඇයි ලලිතා..."

"අර යාළු මහත්තයට කිරිබත් ටිකක් හදලා දෙන්න..."

ඔහු පුදුමාකාර කෙනෙකි. ඒ තරම් අහිංසක ලෙස යුතුකම් ඉටු කරන කොතෙකුට මේ තරම් දුකක් උරුම වූයේ ඇයි... "ඔයා පව්" ඇය කීවේ සිතෙනි.

"ලලිතා..."

"පොඩි බේබි..."

"මට තේකක් හදලා දෙන්න ලලිතා..."

"ඉ..නි..න් උදේට කෑවෙත් නැතේ..."

"බඩගිනි නෑ ලලිතා... තේකක් ඇති..."

ලලිතා මුතු දෙස වේදනාවෙන් මෙන් බැලුවාය. ටික දවසක ඉඳ ඇය ඉන්නේ මොකක්දෝ දුකකින් යැයි ලලිතාට සිතුණි.

* * * * * * * * * * *

රවී ආවේ කාගෝ ආයතනයේ වත්තල ප්‍රධාන කාර්යාලයෙන් වාහනයක්ද අරගෙනමය. මධුවන්තටද ලංකාවේ ප්‍රධාන කාර්යාලයේ රැකියාවකට යනවා නම් වාහනයක් ඉල්ලා ගත හැක. නැතහොත් කාගෝ ආයතනයේ ඩුබායි ශාඛාවේ රැකියාවක් ලබා ගත හැක. ඒ කිසිවක් කළ නොහැක්කේ දුව නිසාය.

"උඹට ඩ්‍රයිව් කරන්න අමාරු නම් මං ඩ්‍රයිව් කරන්නම් මචං..."

මධුවන්ත කීවේය. රවී සිනාසුණේය.

"ලංකාවේ පාරක වාහනයක් එළවන්නත් ආසයි මචං..."

මධුවන්ත කෙල්ලව ඔඩොක්කුවේ තබාගෙන රවී දෙස බලා උන්නේය.

"ම..ධූ..."

"මචං..."

"මු..තු නංගී මාර ලස්සනයිනේ මචං..."

මධුවන්තගේ මුව පුරා සුන්දර සිනහවක් පැතිර ගියේය.

"කෙල්ල ඒ වගේම හොඳයි මචං... සමහර දවස්වලට දුව්ව අරන් ගිහින් කවලා පොවලා නාවලා නිදි කරලා ගේන්නේ..."

රවී ඔහු දෙස බැලුවේය.

"කෙල්ලට ඉන්න තිබ්බේ එහෙම අම්මා කෙනෙක්..."

"ම්..."

"උඹට ඉන්නත් තිබ්බේ එහෙම ගෑණියෙක්..."

මධුවන්ත සිනාසුණේ අසරණවය.

"තව ටික දවසකින් මුතු නංගි මැරි කරනවා මචං... අන්කල් වගේම ප්‍රොපටි බිස්නස් කාරයෙක්ගේ පුතෙක්ව... මිනිහා මෙහේ එනවා යනවා..."

"මං නිකං කිව්වේ මචං... ඒ කෙල්ලව දැක්කහම මට ලෝබ හිතුණා..."

"මට ලෝබ හිතුනේ මීට අවුරුදු තුන හතරකට කලින්..." මධුවන්ත සිතුවේය.

"මේ මචං... නිදි..."

පපුව බදාගෙන කෙල්ල නිදාගෙන ඉන්නා අයුරු මධුවන්ත රවීට පෙන්වූවේය. රවීගේ පපුවද අසාමාන්‍ය දරු සෙනෙහසකින් පිරී ගියේය.

"කරඬත් කැවනේ... කෙල්ලට නිදිමත ඇති..."

මධුවන්ත ආසනයේ හරිබරි ගැසී කෙල්ලව සුව පහසු ලෙස පපුවට තබා ගත්තේය.

"ඉ..කි..න් මචං..."

රවී දිග කතාවකට මුල පිරුවේය. මධුවන්ත රවී දෙස බලා අසරණ සිනාවක් පෑවේය.

"උඹට ඔය ගෙදර ගොඩක් දවස් ඉන්න බෑ නේද..."

"අ..මා..රුයි මචං... ඒ ගෙදර ඉන්නේ අයියයි අක්කයි මුතු නංගියි විතරයි නම් පුළුවන්... ඒත් හැමෝම එයාලා වගේ නෑ..."

"ම..ට තේරෙනවා... එහෙනම් මුලින්ම ඉන්න තැනක් හදාගන්නෝන නේද..."

"ඔ..ව්.. ඒත් මචං..."

"කියපන් මචං..."

"මොකක් හරි හිතලම සෙට්ල් වෙන්නයි මං හිතුවේ..."

"ඒ.. කි..ව්..වේ..."

"තැනකට ඇඩ්වාන්ස් බැඳලා ආයෙත් තව තැනකට යන්න තරම් මුදලක් මං අතේ නෑ මචං... ජීවත් වෙන්නත් ක්‍රමයක් හදාගෙනම තමා තීරණයක් ගත්තෝන..."

"ම..ට උඹ කියන දේ තේරෙනවා... උඹට රස්සාවක් කරන්නම බැරි වෙයි... දුවා එක්ක නේද..."

"අම්මත් නැති කෙල්ලනේ මචං... මාත් නැති උනාම... රස්සාවක් කළොත් වෙලාවක් නෑ..."

කොල්ලා වැටී ඇති අසරණ තත්වය තේරෙන්නේ එහෙම සිතූ විටය.

"උ..ඹ මො..නවා හරි හිතුවද මචං..."

"මො..න..වත් අදහසක් නම් ආවේ නෑ මචං..."

"හිටපං.. අපි කල්පනා කරමු..."

"මට කො..හොමත් නැගිටින්න ඕන මචං... මේ කෙල්ල ලොකු වෙද්දී මං කෙල්ලට දුකක් දෙන්නෑ..."

"එහෙම උඹට දුක් විඳින්න වෙන්නෑ..."

වාහනය නුවර පාර දිගේ ඇදෙන්නට විය. රවී පමණක් නොව මධුවන්තත් නුවර පාර දෙපස දෙස බලා උන්නේ ආශාවෙනි. ඔහුද මේ රට දකින්නේ වසර ගණනාවකට පසුය.

"හාෂි..ට කො..හො..ම..ද මචං..."

ඒ ගැන සිහි කිරීම දුක බව දැන දැනත් මධුවන්ත ඇසුවේය. ඇය ගැන කියන්නට අනන්තවත් දේ රවී දැන උන්නේය. එහෙත් අමාරුවෙන් හිත හදාගෙන ඉන්නා කොල්ලාට ගින්දර දීම පවකි.

Elegantlk.com

"දැන් හාමි ගැන හිතන්නෙපා මචං... එයා හේදිලාම ගිහින්..."

මධුවන්තට බැලුනේ දුව දෙසය. එහෙම විනාශ වී ගියේ මේ දූගේ අම්මාය. ඔහුට දුක ඒකය.

"ගෙදර දැන් ඉන්නේ කවුද මචං..."

"අම්මයි මල්ලියි විතරනේ මධූ... අක්කා ඉතින් බැඳලා ගියානේ..."

"අපටත් ගෙයක් දොරක් කියලා දෙයක් තිබ්බනම් හොඳයි කියලා හිතෙන්නේ දැන් තමා මචං... අයියටත් නෑ මටත් නෑ..."

"උ..ඔ නැගිට්ටිනත් ඕන ඒකම තමා මධූ... කවදහරි උඹ ලස්සන ගෙයක් හදයි... ලස්සනට ජීවත් වෙයි..."

මධුවන්ත මවා ගත්තේය. ඔහුගේ සිත ලෝබකමකින් පිරී ගියේය.

"උඹ කරන දෙයක් දුවවත් ළඟ තියාගෙන කරන්න ඕන නේද..."

"එ..හෙම නම් හොඳයි මචං... බබාව බලා ගන්න කෙනෙක් ගත්තත් මම ඉන්න ඕන... කෙල්ල මං එක්ක ඇරෙන්න එහෙම ඉන්නවා දැක්කේ මුතු නංගී එක්ක විතරයි..."

මධුවන්ත කියද්දී රවී සිනාසුණේය.

"පුදුමයි..."

රවී කීවේය. "මටත් හරි පුදුමයි" මධුවන්තද සිතුවේය.

* * * * * * * * * * * *

තුවර උඩ පේරාදෙණියේ රවීගේ මහ ගෙදරට රවීත් මධුවන්තත් යද්දී එක දෙක පමණ විය. යද්දී රවීගේ අම්මා කෑම උයාගෙන බලා උන්නේය.

"මේ අම්මා මධුවන්ත... මං කිව්වේ මාත් එක්ක ඉන්නේ කියලා..."

"දන්නවා පුතේ... අ..නේ.. දරුවටත් එක්කගෙනම ආවද..."

"ඔව් අ..මමේ..."

"යං යං... උදේට කාලද මගෙ පුතේ..."

"ඔව් අම්මේ... උදේට මධූ කිරිබත් හදලා තිබ්බා..."

"මං කෑම හදලා තියෙන්නේ..."

"සුවඳ ආවා මඟටම.. නේද මධූ..."

රවී සිනාසී කීවේය. බාගෙට නිම කළ නිවස නිදහස් යැයි මධුවන්තට සිතුණි. මෙහෙම පුංචි ගෙදරකට වී ඉන්නට ඇත්නම් යැයි ඔහුට සිතුණි.

"තාම මොනවත් වැඩ ඉවර නෑ මචං... පුළු පුළුවන් විදිහට තමා කරගෙන යන්නේ..."

"මෙහෙමවත් කරගත්ත එක ලොකු දෙයක් මචං..."

"ළිඳට ගිහින් නාලම ඇවිත් කමු... අපි ජෝ නාමු සුදුමැණික... මි..."

කෙල්ල නිදිමතේ ඇඹරුණාය.

"බඩගිනිත් ඇති... උඹ නාගනිං මචං... මං කෙල්ලට අම්මගෙන් බත් ටිකක් ඉල්ලගෙන කවලම නාගන්නං..."

"වරෙන් යං..."

රවී කොල්ලාවද එක්කාගෙනම කුස්සියට ගියේය.

"කෝ අම්මේ මල්ලී..."

"රෑට හදන්න මාළු ටිකක් ගේන්න ටවුමට ගියා... දැන් එයි..."

රවීගේ අම්මා ඉන්නේ සතුටිනි. තමාටත් මෙහෙම අම්මා කෙනෙක් වත් උන්නා නම් කියා මධුවන්තට සිතුණි. දෙවය ජීවිතයට කොතරම් දේවල් අහිමි කරලාද... තව අහිමි කරන්නට දෙයක් නැති තරමට සියල්ල අහිමි කරලාය.

"අ..මමේ දුවට බත් ටිකක් ඕන..."

Elegantta.com

රවී කීවේය.

"අ..නේ බඩගිනින් ඇති නමා... ආච්චම්මා කවන්නද... මි..."

කෙල්ල ඇඟිරුණාය.

"කවන එක ටිකක් අමාරුයි අම්මේ... මං හිමිහිට කවන්නම්..."

මේ නාන්නාවන් දුවවන් තනිකළ හැනිටිය කවුදැයි අම්මා සිතුවාය.

"කප්පු මාළුව සුදට හැදුවේ පුතේ... මං මාළු කෑල්ලකුත් සෝදලා දෙන්නම්..."

"මේ මොනාද අම්මේ..."

"කිරි හොදි අපේ මිනිහට ඕනෙමනේ..."

මධුවන්න රවී දෙස බලා සිනාසුණේය.

"ඒ ඇති අම්මේ..."

"මං රෑට වෙනම බත් චුට්ටක් හදලා දෙන්නම්... ඔ..යා එනවා කියලා අපි දන්නෑ..නේ..."

එවර නම් කෙල්ල අම්මා සමඟ යංනමට සිනාසුණාය.

"බින්නරයක් වගේ බැදලා දෙන්නද පුතේ..."

"මේ ඇති අම්මේ..."

මධුවන්න කෑම පිඟානත් ගෙන කෙල්ලවත් වඩාගෙන මිදුලේ ඇවිද්දේය... වත්තේ නැන නැන වූ ගහකොළ දෙස කෙල්ල බලා උන්නේ ආශාවෙනි.

"අ..ර පැටියෝ ලේනත් ඇවිත්..."

කෙල්ල බෙල්ල දිගු කර බලයි. මධුවන්න කිරිහොඳින් මාළුත් කප්පුත් දමා ඇනූ බත් කටක් කවයි.

"පැටියටත් ලේනෙක් ඕ..න..ද..."

"හා..වා..."

"අපට ඕන හාවෙක්නේ නේ..ද..."

"හා..වා ෂෝ..යි..."

මධුවන්නට සිහිවූයේ මුතුවය. කෙල්ලට හාවා දුන්නේ ඇයය. "ඔයා ගැන මොනාද හිතෙනවා..." ඔහු සිතුවේය.

කප්පු මාළුවෙන් එන සුවඳ ඉවසාගෙන ඉන්නට තරම් බැරිය. කෙල්ල බත් ටික කන්නේ ආශාවෙනි. මධුවන්න ඇයට අන්දවා තිබූ කලිසමත් ටී ෂර්ට් එකත් ගලවා යට කලිසම පමණක් තිබබෙය.

"අ..ර මා..මී ජෝ නා..න..වා..."

වතුර ටික දකිද්දී මධුවන්නටද ආසය. ළිඳ තිබුණේ ළියැද්ද අද්දරය.

"මොකට් රටවල ගිහින් දුක් විඳිනවද කියලා හිතෙන්නේ මෙහෙම වතුර ටිකක් දාගන්නකොට මචං..."

රවී බාල්දිය අත නබාගෙන කීවේය. ළිදේ වතුර උතුරන්නාක් මෙනි. රවී කෙල්ලට පේන්නට සෙල්ලම් කළේය. මධුවන්න ඒ අවසරයෙන් කෙල්ලට බත් ටික කවා ගත්තේය.

"රහට තිබ්බාම කනවා මචං... මාමිට බන්ඩි ගෙඩිය පෙන්නන්න පැටියෝ..."

කෙල්ල බඩ ඉස්සුවාය. සුදු ජංගිය ඇදගෙන උන් කෙල්ලව රවී වඩා ගත්තේ වතුර පිටිනි.

Elegantbooks.com

05

තාත්තාටත් අම්මාටත් ඇත්තේ පුදුමාකාර රට ගායක් යැයි මුතුට සිතුණි. දෙන්නාම බැංකොක් යනවා යැයි කීවේ හවස ඇවිත්ය.

"කවදද අම්මලා එන්නේ..."

"තාත්තා කිව්වේ සතියක් විතර ඉන්නවා කියලා... ඔයාට කතා කළාට එන්නැනේ..."

මුතු කතා කළේ නැත. මොනවාවත් කරන්නට හිතේ නිදහසක් නැත. ඇත්තටම නැත.

"අම්මයි තාත්තයි ආවට පස්සේ මට ඔය දෙන්නා එක්ක ටිකක්

කතා කරන්නෝන..."

මුතු කීවේ ඇය දෙසවත් නොබලාය.

"මොං..කද පොඩි දුව..."

ඇය ඇසුවේ තරමක සැකයෙනි.

"මං ආවම කියන්නම්කෝ... දැන් අම්මලා යන්නකෝ..."

"මොකද... ඔයත් අක්කා වගේ නාඩගමක් නටන්නද යන්නේ... එහෙනං මේ දවස් ටිකේ ඒක හිතින් අයින් කරගන්න... ආයේ අමුතුවෙන් කතා කරන්න දෙයක් නෑ..."

මුතු කතා කළේ නැත.

"අරයා හිඟන්නෙක් එක්ක ජීවත් වෙන හැටි පේනවා නේද... තාත්තා අනුකම්පා කරලා මෙහේ ඉන්න දුන්නේ නැත්නම් ඉන්න තැනක් වත් නෑ... ඔයා ගැන ගන්න ඕන තීරණ අපි අරන් ඉවරයි... ඒ ඔයාගෙම හොඳට... ආයේ මොනවත් කතා කරන්න තියාගන්න එපා..."

අම්මාට කාංචන ගැන කියන්නටත් පෙර ඇය මෙහෙම කතා කරන්නේ කොහොමදැයි මුතු සිතුවාය.

"නිම්මි තමා ඔයාවත් නරක් කරන්නේ... එයාට ඕන එයා වැටුණ වලේ ඔයාවත් දාන්න..."

අක්කා එහෙම හීනෙකින් වත් සිතා නැති බව මුතු දනී. මේ ප්‍රශ්නයේදී පවා ඇය කීවේ ඉවසන ලෙසය.

"ඔයාට කාංචනව හොඳට ගැලපෙනවා... ඒ ගැන ආයේ හිතන්නෝන නෑ..."

මුතු උන්නේ කතා කර ගත නොහැකිවය.

"බැන්දට පස්සේ දෙන්නත් එක්ක සතුටින් ඉන්න... දෙන්න පුළුවන් හැමදේම තාත්තා දෙයි..."

Elegantlks.com

අම්මාත් තාත්තාත් සමඟ මේ ප්‍රශ්නය කතා කර තේරුමක් නැතැයි මුතු සිතුවාය. ගන්නා තීරණයක් දැනුම් දුන්නා නම් ඇතිය. එහෙත් ඊට පසු ඇතිවන තත්වයට මුහුණ දිය යුතුය.

* * * * * * * * * * *

"දෙන්නටම සතියක් එක විදිහට ඉන්න බෑ... සතියක් ගෙදර හිටියොත් අනිත් සතියේ රට..."

නිම්මි උඩට ආවේ එහෙම කියාගෙනය. අම්මාත් තාත්තාත් ගුවන් තොටුපළ බලා ගියේ දැන් ටිකකට කලිනි.

"සල්ලිවලින් කරන්න දෙයක් තියෙන්නත් එපැයි..."

"ඒකත් ඇත්ත... අපරාදේ කොල්ලයි දුවයිත් ගියානේ මේ සතියෙම..."

නිම්මි ඇසුවේ කෙල්ලගේ මුහුණ දෙස පරිස්සමින් බලාය.

"ඔයාලටත් කියන්නයි කිව්වා යනවා කියලා..."

"උඹට කියලද ගියේ..."

"ම්... එයාගේ යාළුවත් ආවා..."

"ඒකත් මාස දෙකක් අර කාමරේ අස්සේ හිරවෙලා උන්නනේ..." ඔහු ගිය පසු මේ තරම් පාළුවක් දැනේවී යැයි සිතුනේ නැත.

"අ..ක්..කේ..."

"ඇයි වුටි..."

"අ..යියට නිවාඩු නෑ..."

"ගන්න පුළුවන්... මෝ..කටද..."

නිම්මි ඇසුවේ සැකයෙන් මෙන් කෙල්ල දෙස බලාය.

"ගෙදරම ඉන්න පාළුයි..."

කෙල්ලගේ හිත නිම්මි වහා තේරුම් ගත්තාය.

"උඹට ඕනේ කොහේ හරි යන්නද..."

කොහෙවත් නොවේ. යන්නට ඕනා නුවරමය.

"මේගොල්ලෝ ඉදිද්දී නම් යන්න වෙන්නෑ..."

"ඒකනම් ඇත්ත... අපි නම් ඉතින් ඇවිදිනවා... උඹ ගෙදරටම කොටු වෙලානේ..."

"කංචනත් දුවගෙන එයි... මං තවත් හිරවෙනවා..."

"මං අයියට කියන්නම්..."

"මං කිව්වයි කියලා කියන්නෙපා හොඳේ..."

මුතු කීවේ බැගෑපත්වය.

"උඹට නුවරද යන්නෝන.. ම්..."

කෙල්ල කතා නොකර බිම බලාගත්තාය. නිම්මි නැගිට්ටේ කෙල්ලගේ හිස අතගාගෙනය.

"මං අයියට කියන්නම්... නිවාඩු ගන්න පුළුවන් නම් හෙට පාන්දරම යං... මෙයාලා ගෙදරට කතා කරයිද..."

"එහේ ගියාම මෙහේ සිහියක් නෑ..."

"ඉඳපංකෝ..."

නිම්මි එහෙමම නැගිට පහළට ගියාය. "මට මොනා වීගෙන එනවද කියලා මටම තේරෙන්නෑ... ඔයා දෙවෙනි පාරටත් මාව මත් කරලා මධුවන්ත..." මුතු කීවේ සිතෙනි.

කෙල්ලට නුවරම යන්නට හිත් දුන්නේ මධුවන්තත් ගියේ නුවරම බව දන්නා නිසාය. "නොබලා ඉන්න බැරුව ඇති..." නිම්මි සිතුවාය. එහෙත් මෙසේ කෙල්ල අලුතෙන් පපුව පුච්චා ගන්නා එකේ තේරුම කුමක්දැයි ඇය සිතුවාය. මුතුගෙත් කාංචනගේත් විවාහය කටේය. මධුවන්ත ඉන්නේ ප්‍රශ්න කන්දක් හිස මත තබාගෙනය. කොල්ලා මේ දඟලන්නේ ඒ ප්‍රශ්නවලින් ගොඩ එන්නටය. එහෙම එකේ දැන්

Elegantta

මේ කෙල්ල පපුව පුච්චා ගන්නේ ඇයි. "ඔහේ වෙන දෙයක් වෙච්චදෙන්..." නිමිමි සිතුවාය. මේ බාධක කිසිවක් නැත්නම් දෙන්නාගේම ජීවිතවල ඇති දුකට එකම පිළියම ඒ දෙන්නාගේ එකිවීමය. එහෙත් දෛවය මොහා කරන්නට සිතාගෙන ඉන්නවාදැයි දන්නේ නැත.

කොහොමත් කෙල්ල ඉන්නේ කාංචනව බඳින්න කැමැත්තෙන් නොවේ. මේ ජීවිතයත් දෛවයත් අතර සටනක් ඇති මොහොතකි. එවන් මොහොතක දෛවයටම සියල්ල බාර දී බලා ඉඳීම ස්වභාවික දෙයකි. කෙල්ලද සිතනවා ඇත්තේ එසේම විය යුතුය.

"ප්‍රියා..."

නිමිමි ප්‍රියමන්තගේ වතට බර වූවාය.

"ම්..."

"මේ දවස්වල ඔෆිස් එකේ වැඩද මහත්තයට ම්..."

"ඇයි එහෙම ඇහුවේ..."

"නෑ නිකං..."

"කියන්නකෝ..."

"දවස් දෙක තුනක් නිවාඩුවක් ගත්තොත් ප්‍රශ්නයක් වෙයිද..." ප්‍රියමන්ත කල්පනා කළේය.

"බැරි වෙන එකක් නෑ... ඇයි..."

"කාලෙක ඉඳන් ආසාවක් තිබ්බා ඔබෙක් ලැමබන්න කියලා මැලියාවට බාරයක් වෙන්නත්... මකල්ලටත් කොහේ හරි යන්න ආසයිලු... අම්මලා ඉන්න වෙලාවක ඔය ගමන් යන්නත් බෑනේ... ඒත් එයාලත් ඒව ඕය එමක්..."

"ම්..."

"අමාරු වෙයිද..."

"වැඩ දෙක තුනක් නම් තියෙනවා... මං රෑට කතා කරලා මොකක් හරි ලෑස්ති කරන්නම්... බැරි වෙන එකක් නෑ..."

"කෙල්ලත් පව්නේ... අපි කොහෙවත් එක්කං ගිහිනුත් නැනේ..."

"ඒකනම් ඇත්ත... කවදද යන්නෝන..."

"හෙට..."

"මරු ට්‍රිප් අක්කයි නංගියි දාගත්තේ... හෙට උදේ යන ගමන අද රෑ කියන්නේ..."

"මේගොල්ලෝ රට යනවා කියලා දන්නෑනේ ඔබා..."

නිමිමි තොදොල් වූවාය.

"ම්.. එහෙනම් ඇඳුම් ලෑස්ති කරගන්න... රවුමක් දාලා එමු... ආ.. එතකොට මේ අපේ එකත් ගියේ නුවරනේ..."

"ඔව් මල්ලිත් ගියේ නුවර තමයි... රවීලගේ ගෙදරනේ..."

"එහෙටත් ගිහින් එමු..."

"දැන්ම කියන්නෙපා... අපි නුවරට ගිහින්ම මල්ලිට කතා කරමු..."

"එහෙනම් ඇඳුම් ලෑස්ති කරගන්නකෝ... අම්මයි තාත්තයි නංගිව එක්ක ගියා කියලා කෑගහයිද දන්නෑ..."

"මගේ නංගිනේ... මම කොහේ හරි එක්කං ගියාම මොකද..."

නිමිමි උඩට දිව්වේ සතුටිනි. කෙල්ල ඉන්නේ ඇඳුම් අල්මාරිය ඇරගෙනමය.

"ආ.. උඹ ඇඳුම් ලෑස්ති කරන්නත් ගත්තද..."

නිමිමි ඇසුවේ සිනාසිය.

"මගේ මස්සිනා ගැන මං දන්නැද්ද... යං කිව්වා මන්ද..."

"නැතුව... මං කිව්වම බෑ කියනවද... හැබැයි ආවේ උඹ පව් කියලා කිව්වාම..."

Elegantlk.com

මුතුගේ සිතේ ප්‍රියමන්ත ගැන ඇතිවූයේ පුදුමාකාර ප්‍රසාදයකි. "ඔයත් හරි ඔයාගේ මල්ලිත් හරි... දෙන්නම එක වගේ අහිංසකයි..." මුතු සිතුවේ බීම බලාගෙනය.

"චූටි..."

"ම්..."

"මොකද වෙන්නේ නංගී..."

"ද..න්..නෑ අක්කේ..."

ඒ ටික කියද්දී කෙල්ලට ඇඬෙන්නට මෙන් ආවේය.

"කරන දෙයක් හිතලම කරන්න නංගී..."

"ඔයවෙන්නෙපා අක්කේ... මං ඔයාගේ මස්සිනාගේ ජීවිතයට ඇවිත් ඒ ජීවිතේ අවුල් කරන්නෑ... මං හිතලා ඔයාලා කවුරුවත් නොහිතන තීරණයක් ගත්තවා..."

"අ..නේ උඹ මොනාද කියන්නේ..."

"එයා ජීවිතේ ලස්සනට නැගිටින්න ඕන කෙනෙක්..."

"ඔව්.. ඒත් දවසක මධුවන්ත ළඟින් උඹ වගේ කෙල්ලෙකුත් ඉන්නෝන..."

නිමේ ඒ ටිකද කීවාය. මුතු ඇය දෙස බැලුවේ බොඳවූ දෙනෙතිනි.

"පාන්දරම යං... පහට ඒතර..."

"ම්..."

"රවීලගේ ගෙදරත් යන්... ගමේ ගෙදරකින් කන්නත් ආසයි..."

"ඒ අයියා නම් හරි හොඳයි වගේ..."

"නැත්නම් මේ අහිංසකයට පිහිට වෙයියෑ..."

"ම්..."

මුතු ඇඳුම් ලෑස්ති කළේ ආශාවෙනි. "අපි නුවරදී දැක්කාම ඔයාට පුදුම හිතෙයි..." මුතු සිතුවාය. ජීවිතය මත බලෙන් පැටවූ මේ කරදර නොවිනි නම් ජීවිතය කොතරම් නිදහස්දැයි මුතු සිතුවාය.

* * * * * * * * * * * *

කෙල්ල නිදා ගත්තේ රවීගේ අම්මා හදා දුන් ඉදි ආප්පත් පරිප්පුත් බිත්තරත් බඩ පිරෙන්නට කාය. රවීගේ අම්මා කෙල්ලටම කියා සුදුවට පරිප්පු ටිකක් හදා දුන්නාය. කෙල්ල ඒ පරිප්පු සමඟ ඉදි ආප්ප කෑවේ රස කරමිනි. "මටත් අම්මා කෙනෙක් උන්නනම් අද මගේ දුව්ව බලාගන්නවා..." කෙල්ලට ඉදි ආප්ප කවද්දී මධුවන්ත සිතුවේ දුකෙනි.

මධුවන්ත එළියේ මිදුලේ රවී ඉඳගෙන උන් බංකුවට බර වූයේ කෙල්ල නිදාගත් පසුය. නුවර පරිසරයේ සතීපය විඳගන්නට නම් මෙවැනි රැයක එළියේ සිටිය යුතුය. මිදුලට ආ විට සෑහෙන දුරක් යනතෙක් නිදහස් පරිසරයය. ඒ අවට වූයේ එතරම් උස් නොවූ කොබෝල්ලි ගස්ය. ඇට්ටේරියා ගස්ය.

"බලපං මචං සිංගප්පූරුවේ බිල්ඩින් දිහා බලන් ඉන්නවා වගේද කියලා... අහස මෙච්චර ලස්සනට දැක්කෙත් අවුරුදු ගාණකට පස්සේ..."

කන්දට උඩහින් පායා තිබූ සඳ දෙස මධුවන්තද ආශාවෙන් බැලුවේය.

"පෝය ළඟ ඇති නේද මචං..."

"මං හිතන්නේ... දවස් ගැන එච්චර වගක් නෑ මචං..."

මධුවන්ත කීවේ දුක්බර ලෙස සිනාසීය.

"දැන්ම කන්නෑ කියපු නිසා මං තේ ටිකක් හැදුවා..."

අම්මා පැමිණ තේ දෙකක් දෙද්දී අලුත් කහට සුවඳ මධුවන්ත

Elegantbooks.com

විත්දේ හාකාවෙනි.

"දේඛී ඉඳි හාප්ප ටික කෑවා නේද පුතේ..."

"ඔව් අම්මේ... ඔක්කොම කෑවා... සිංහල රහට හරි ආසයි..."

"මං උදේට කැකුළු කිරිබත් ටිකක් හදන්නම්..."

මධුවන්ත තේ උගුරක් බිව්වේ අලුත් කහට සුවඳ දරාගන්නට බැරි ලෙස ආ නිසාය.

"උඹ සිංගප්පූරුවෙන් ආවට පස්සේ රහට ප්ලේන්ටියක් බොන්නේ අද..."

රවී තේ බොමින් සිටියේය. ලියද්දේ ඔට එන සුළඟ සහට පුදුමකාර සහනයක් එක් කළේය.

"ආපු එකේ ටික දවසක් ඉඳලම යනවා මධූ... අම්මත් පව්..."

"උඹ ආවට පුදුම ආසාවකින් ඉන්නේ..."

"මටත් එයාර් පෝට් ජීවිතේ නිත්ත වෙලා මචං තියෙන්නේ..."

"ඒක දුකක් තමා..."

රවී මධුවන්ත දෙස බැලුවේය.

"ඉතින් මචං... මොනාද අපි කරන්නේ..."

"මේ රටෙත් දැන් ජීවත්වෙන එක ලේසි නෑ මචං... බඩු ඔක්කොම ගිනි ගණන්... කෙල්ලට දෙන්න පෙති පාත් එකක් ගන්නවා... ඒත රුපියල් එකසිය තිහයි... ඒකයි පිටී එකයි බටර් එකකුයි ගත්තහම රුපියල් දාහක් ගිහින්... හිතපංකෝ..."

"ම..ට තේරෙනවා... හම්බ කරන්නම ඕන..."

"නෙයක් දොරක් රස්සාවක් නැතුව ජීවිතේ පටන් ගන්න හිතන්නවත් බෑ..."

කොල්ලා වැටී ඇත්තේ කොතරම් අසරණ තත්වයකටදැයි රවී

තේරුම් ගත්තේය.

"බැඳිනකොට සිංගප්පූ ඩවර්කිං වීසා එක තිබ්බා... රස්සාව තිබ්බා... අපාට්මන්ට් එක තිබ්බා... ජීවිතේ බරක් දැනුණේ නෑ... ජීවිතේ ල් ඔක්කොම දාලා මුල ඉඳලා හිතන්න වෙයි කියලා හිතුවේ කෑගේ මචං..."

"එහෙම කියලා උඹ දැන් කඩා වැටෙන්නෙපා..."

"එ..හෙම නෑ මචං... මං මේ කෙල්ල ගැන හිතලා නෑනිවන්න ඕන..."

"උඹත් කවදා හරි සෙටිල් වෙන්නත් ඕන..."

"ඔණිෂේක් එක්ක සෙටිල් වෙන්න බෑ මචං... ඇරත් මං වගේ කසාද බැඳපු දරුවෙක් එක්ක ඉන්න ඕනිහෙක්ට... උඹට පුළුවන්..."

මධුවන්ත කිවේ සද එළිය විසිරුණු අහස දෙස බලාගෙනය.

"රුපියල් විසිනිස් දාහක්වත් මාසෙකට ඕන... නැත්නම් ජීවත් වෙන්න අමාරුයි..."

"උඹ මොනවත්ම හිතලා නැද්ද මධූ..."

"කෙල්ලටයි මටයි ඉන්න ප්‍රාව් ෆෙයක් අරගෙන ඒකේ මොකක් හරි පොඩි බිස්නස් එකක් කරන්නෝන... ඒක තමයි මචං මං දාහතේ හිතන්නේ..."

"උඹ හිතපං... උඹට අයිඩියා එකක් තියා... එහෙම උනොත් කරමු... මාත් උඹට උදව් කරන්නම්... සල්ලි දෙදා පාඩුවක් උනොත් මං උඹට දෙන්නම්..."

මධුවන්ත රවී දෙස බැලුවේ කෘතවේදීවය.

"ඒ වචනේ ඇති මචං... මං හිතන්නම්..."

"ජීවිතේ පටන් ගන්න අමාරුයි නමා මචං... ඒත් ගියර් එකට

Elegant

දැගහන්නකම් නමයි..."

"ම..ට දුක් විඳින්න පුළුවන් මචං..."

"ම... උඹ එක ඔප්පු කරලම පෙන්නුවා... උඹ හරි ඉවසීමෙන් දුක් විඳපු මිනිහෙක්..."

රවී කියේ මධුවන්තගේ උරහිසට සුරත නබාය.

"මේ අත් දෙකින් කරන්න පුළුවන් දෙයක් මං හිතන්නේ මචං..."

ඔහු සූදානම් වෙන්නේ කොහෙරම් රුදුරු දුකක් විඳින්නදැයි රවී දනී. එහෙම හිතන උන්ට කවදාවත් වරදින්නේද නැත.

"හිතන දෙයක් උඹ ඉක්මනට හිතපන්... උඹට ඔහොම ඉන්න බෑ..."

"ඔ..වී.. මාත් මේ දවස්වල නිදාගන්නෑ මචං... කෙල්ල ළඟ හැලවෙලා දහඅතේ හිතනවා..."

"යම්... කම්..."

රට රවීගේ අම්මා හදා තිබුණේ ඉදි ආප්පය. එයට කළුවට හැදූ පොල්සෝස් මාළුවකුත් මාළු ඇඹුල් තියලකුත් පරිප්පු තෙම්පරාදුවකුත් හදා තිබුණි.

"කන්න පුතේ... ඔය ගෙදර පිටි තම්බලා හදපු ඉදි ආප්ප..."

"ඒක නම් සුවඳ අම්මේ... මල්ලිත් කමු ඉතින්..."

මධුවන්ත කිවේ රවීගේ මල්ලි දෙස බලායි.

"ඔය කන්නම් අයියේ..."

"ඒතන්ට අම්මා මොහාද මල්ලි රට හදන්නේ..."

රවී ඇසුවේ මල්ලිගෙනි. ඔහු අම්මා දෙස බලා සිනාසුණේය.

"එයාට හොද්දක් හදලා පාත් බාගයක් දුන්නම ඇති... මාත් ඉනිත් පාත්ම කනවා..."

"මසක් මාළුවක් ගෙනත් හදන් කන්න අම්මේ..."

"හැදුවත් මං විතරයි අයියේ කන්නේ... අම්මා මස් කන්නෑනේ..."

"අක්කා එයාට මස් හදලා බත් එකක් ගෙනත් දෙනවා..."

"මං හෙට අක්කලගේ දිහා යනවා..."

"ගිහින් එන්න..."

ජීවිතයකට නෑයින් සහෝදරයන් සහෝදරියන් සිටීම සම්පතකි. නමාට කෝකටත් ඉන්නේ අර දුප්පත් අයියාය.

"මධූ..."

"මචං..."

"අයියලටත් දවසක එන්න කිව්වනම් කෑම ටිකක් දෙනවනේ... ආසත් ඇති..."

"අ..ම්..මට කරදරේ මචං..."

"පිස්සුද පුතේ... මේ ගෙවල් දොරවල් අනිත් දවස්වලට පාළුවට ගිහිල්ලා තියෙන්නේ..."

අයියාවත් අක්කාවත් මුතු නංගීවත් සිහිවී මධුවන්තට දුක සිතුණි.

එදා රෑ මධුවන්ත කෙල්ල ළඟින් ඇලවූයේ සනීපයෙනි. අද හිතට වෙනදා නැති සුවයක් දැනෙන්නේ මේ පරිසරය නිසාද නොවේනම් රවී ආ නිසාද කියා ඔහු දන්නේ නැත.

මධුවන්ත සැපට නිදන කෙල්ලගේ වත පිරිමැද්දේ ආදරයෙනි. "ඔයා ගැන හිතලම තාත්ති ජීවිතේ වෙනස් කරගන්නවා පැටියෝ..."

Elegantlks.com

06

පාන්දර ප්‍රියමන්තගේ කුඩා කාරයට මුතු නැග්ගේ ආසාවට කොට්ටයක්ද රැගෙනය.

"පොඩි එකෙක් වගේනේ..."

ප්‍රියන්ත කොට්ටය තුරුල් කරගෙන වාහනයට ගොඩ වූ කෙල්ල දෙස බලා සිටියේය. ටික දුරක් ගිය පසු නිමේ පසුපස හැරී කෙල්ල දෙස බැලුවාය. කෙල්ල කොට්ටයද තුරුල් කරගෙන කල්පනාවේය.

"නිදිමතද පුටි..."

"අ..නේ නෑ... මට රෑ නින්ද ගියෙත් නෑ... මං පාන්දර තුනේ ඉඳලා ඇහැරිලා..."

නිමේට කෙල්ල ගැන දුක සිතුණි. ඇය ආසඳ ජීවිතයෙන් අහිංසක සතුටක් විඳින්නටය. එනෙත් ඒ සතුට ඇගේ ජීවිතයෙන් සෑහෙන ඈතය.

"ප්‍රියා මඟට ගිහින් මල්ලිට ගමු හොඳේ..."

"තාම කෙල්ලයි කොල්ලයි නිදි ඇති..."

ප්‍රියමන්ත කීවේය. මුතුගේ හදවත පුරා ඒ රුව ඇදුනේය.

"අයියේ..."

"චූටී..."

"කොහෙන්ද උදේට කන්නේ..."

"ඔයාට බඩගිනිද..."

"බඩගින්නට නෙමේ ප්‍රියා... මඟින් කන්න තියෙන ආසාවට..."

"අපි අඹේපුස්සෙන් කමු..."

නුවර පාරට දවසේ ප්‍රථම හිරු රැස් ලස්සනට වැටී තිබුණි. දෙපස කුඹුරු මත වූ පිනි බිංදු ඒ අලුත් හිරු එළියෙන් දිළිසුණේ ලස්සනටය.

ප්‍රියමන්ත උදේට කන්නට නැවැත්වූයේ අඹේපුස්ස අවන්හලේය. එතැන් සිට පැය එකහමාරක පමණ ගමනක් නුවරට ඇත. දැන් වේලාව අටය. දහයාමාර වෙද්දී නුවරය.

මධුවන්තට ගන්නේ නිමේමය. මුතු ඇය දිහටම වී උන්නාය.

"ම..ල්..ලී.. මං අක්කා..."

"අ..ක්..කේ..."

"නුවරද මල්ලියේ ඉන්නේ..."

"ඔ..ව් අක්කේ... මේ රවීලගේ ගෙදර..."

"මොනාද ඔයා කරන්නේ..."

"මං... අක්කේ මේ දුවාට කවනවා... රවීලගේ අම්මා කිරිබත්

කදුලා දුන්නා..."

මුතු තිම්මියේ කට දෙසම බලා උන්නාය.

"ම..ල්ලි... අපිත් තව ටිකකින් නුවර..."

"අ..ක්..ක..ලා..."

මධුවන්ත ඇසුවේ පුදුමයෙනි.

"ඔ..ව් මායි අයියයි මුතුයි නුවර එනවා..."

"කො..ච්..චර නොඳද අක්කේ... ඉ..න්..න අක්කේ..."

මතු දුව ගොස් ඒ ආරංචිය රවීට කිවේය. දුරකථනය ගත්තේ රවිය.

"අක්කේ මං රවී..."

"කොහොමද මල්ලී... අපේ කොල්ලයි දුවයි නොඳට ඉන්නවා නේද..."

"ඉන්නවා ඉන්නවා අක්කේ... අක්කලා දැන් කොහෙද ඉන්නේ..."

"දැන් අඹේපුස්සේ මල්ලී..."

"දවල් කෑමට කෙළින්ම මේහෙට එන්න... කොහේවත් යන්නෙපා... මං අම්මට කෑම ලෑස්ති කරන්න කියන්නම්..."

"අ..තේ ම..ල්ලී කරදරයිනේ..."

"ඒස්සුද අක්කේ... අක්කල නුවරට ඇවිත් කෝල් එකක් ගන්න... මං පාර කියන්නම්..."

"නොඳයි මල්ලී..."

"ඉන්න මං මධුට දෙන්නම්..."

මධුවන්ත දුරකථනය ගත්තේය.

"එහාවා නේද අක්කේ..."

"එ..න්..න..ම එන්නම්... රවී මල්ලිත් කියනවනේ..."

"මෙහේ ලිඳෙන් නාලා රසට බත් කටක් කන්න පුළුවන් අක්කේ... රවීගේ අම්මා රහට උයනවා..."

"ම.. අපි එන්නම්... දුවා නොඳට ඉන්නවද..."

"ඔ..ව් අක්කේ... මේ කට දිනා බලන් ඉන්නවා..."

"එහෙනම් අපි නුවරට ඇවිත් ගන්නම් මල්ලී..."

"නොඳයි අක්කේ..."

මධුවන්තට පුදුමය. අක්කාත් අයියාත් මුතුත් මේ හදිස්සියේ නුවරට ආවේ ඇයි...

"මවං..."

රවී මධුවන්ත දෙස බලාගෙන කතා කළේය.

"මුතු නංගිත් එනවලු නේද..."

"ඔ..ව් මවං..."

"කෙල්ල අපි එද්දි හරි දුකෙන් බලන් හිටියේ... උඹ මොනවා කිව්වත් කෙල්ල මොනව හරි හිතනවා..."

මධුවන්ත කිසිවක් කීවේ නැත. ඇය දෙව්දුවක් වැනිය... එහෙම ඇය තමා වැනි අනාථයෙකු ගැන මොනවා හිතන්නද...

"මං අම්මට කිව්වා නොඳ ලන්ච් එකක් හදන්න කියලා... කිරිකොස් එහෙම හදලා... අම්මට හරි ආසයි..."

"එයාලට එහෙම කන්න ලැබෙන්නැ..."

"ඒකනේ... හෝටලයක නැවතිච්චදෙන්... මෙතන කෑම දෙමු... එක කාමරයයි තියෙන්නේ... පුළුවන් නම් ඉන්නත් පුළුවන් මවං... ඉන්නව නම් මං ආසයි..."

"ක..ර..ද..රයක් නැද්ද මවං..."

"ඒස්සුද මධු... අපේ උන්නේ... උඹගේ අයියා කියන්නේ මගෙන්

Elegant Books.com

අයියා..."

රවී එහෙම හිත හොඳ එකෙකි. මධුවන්ත මේ තරම් ඔහුට ආදරෙත් ඒකය.

නිම්මි මුතු දෙස බැලුවේ කෑම කා නිමාවූ පසුය.

"ගොඩක් කෑවේ නෑ... දවල්ට කන්න එපැයි නේද..."

නිම්මි සිනාසී කීවාය.

"න..ව..නි..න්..නෙ..ත් එහෙද..."

"ගිහින් බලමු චූටි... කමක් නැද්ද එහෙම..."

"හෝටල්වල නවතිනවට වඩා ගෙදරක නැවතුනා නම් ෂෝක්..."

නිම්මි කෙල්ලගේ හදවත ඇඳින්නාය.

"මං කොල්ලට කියන්නම්..."

මේ ජීවිත දෙක අතර මොනවා හෝ වෙතැයි නිම්මිට දැන් සිතෙයි. මොන ප්‍රශ්න ආවද එහෙම වෙනවා නම් හොඳය.

නුවර ගමන යොදා ගත්තේ අක්කාද... අයියාද.. නොවේ නම් මුතුද... මධුවන්ත දහ අතේ සිතුවේය. ඒ ඇස් දෙක දෙස බලද්දී මොනවද කියන්නාක් බඳුය. සිංගප්පූරුවට යන්නට ප්‍රථම ඇය ගැන හදවතේ ඇඳුණ පුංචි ආදර සිතුවම මධුවන්ත යළිත් සිහි කළේය... "මං ඔයා වගේ කෙනෙක් ගැන හිතන්නත් බය වුණා..." අදටත් එසේමය. ඇගේ ජීවිතය ගැට ගසා ඇත්තේ කොතරම් බලවත් අත්තකටදැයි මධුවන්ත දනී.

එහෙත් ඇය ගැන සිතද්දී හදවත පුරා පුංචි පහනක එළියක් විසිරෙන්නාක් බඳුය. අන්තිම දවසේ රෑ දුව අඬද්දී ඇය මහ රෑ දුවගෙන ආ අයුරු මධුවන්තට සිහි විය. එදා ලා රෝස පැහැ ගත් රෑ ඇඳුම ඇඳගෙන කාමර කැල්ලට ගොඩ වූ ඇයව ඔහු දැක්කේ සුරංගනාවියක් මෙනි.

ඒ සුරංගනාවිය ගැන මෙහෙම හිතන්නත් බයය. එහෙත් පපුව පුරා මුතු කැට ඇතිරුවාක් බඳුව ටික දවසක ඉඳ ඇය ගැන දිගටම

හිතෙයි.

"ලංකාවට ආවත් හරි ඔයා මාත් එක්ක වචන දෙකක් කතා කළේ නෑ..."

එහෙත් ඇය මුවින් කතා නොකර දහසක් දේ කියූවාක් වැනිය. එහෙම හැඟීමක් මධුවන්තට දැනෙයි.

"ඔයා මං දිහා බලන්නේ හරි පුදුම විදිහට... ගෑණු ළමයෙක් එහෙම බලද්දී පපුවට මොනාද වෙන්නේ කියලා මං තේරුම් ගත්තේ එතකොට... කසාද බැඳපු මිනිහෙක් වෙලත් මං කවදාවත් ඒ වගේ හැඟීමක් විඳලා නෑ... පුදුමයි..."

මධුවන්ත ඇයව දැන් බලන්නට ආසය. තව පැයකින් දෙකකින් ඇය එන බව ඔහු දනී. මේ නුවර ගමන මේ හදිස්සියේ යොදා ගත්තේ ඇය නම් ඇත්තටම හිතන්නට දෙයක් ඇත. "උඹ මොනවා කිව්වත් කෙල්ල මොනවා හරි හිතනවා..." රවී මොහොතකට පෙර කියූ කතාව මධුවන්තට සිහි විය. ඒ සඳ දෙව්දුව මේ හිඟන්නා ගැන මොනවා හිතන්නද...

ජීවිතය වැටී ඇත්තේ පල්ලමෙනුත් පල්ලමටය. යන්නට එන්නට පවා තැනක් නොමැතිව ඒ ගෙදරට හිඟමන් ඉල්ලාගෙන මෙන් ගිය තමා ගැන ඇය මොනවා හිතන්නද... කසාදෙත් කඩාගෙන දරුවෙකුත් එක්ක ලංකාවට ආපු මම මේ මොනවද හිතන්නේ... ඉන්න තැනක් නෑ... ජීවත් වෙන්න විදිහක් නෑ... අනාගතයක් නෑ... එහෙම මම මේ මොනාද හිතන බහුභූත..." ඔහු සිතුවේ තමාටම බණිමිනි.

එහෙත් ඒ දෑස සිහිවෙද්දී මේ මොනවත්ම නොහිතන්නේ ඇයි... ජීවිතයට මල් කරත්තයක් ආවා සේ සුවඳට තත්පරයක් ඉන්නට ආස නැත්තේ කවුද... එහෙත් ජීවිතය මිරිඟුවකි. සඳළුතලාවෙන් මහ පොළොවට බැස ජීවිතේ කුණු කාණු දිගේ යද්දී පවා මිනිස්සු හීන දකිති.

මධුවන්තට හිල්ලින... පුංචි සිදුරකින් හෝ අලුතෙන් ජීවිතය දෙස බලන්නට ආසය... දැක්කේ ජීවිතය නොවේ. නරකාදියය.

සිංගප්පූරුවේ පාරවල් පුරා අඬ අඬා ගිය මධුවන්තට ජීවිතය ලැබෙන්නේ නැත.

"කවදාවත් මම මං ගැන හිතන්නෑ... හිතන්නේ මගේ දුවා ගැන... එයයි ලස්සනට ජීවත් වෙන්න ඕන... මේ ජීවිතේ ආයේ සරසන්න කෙනෙක් මට ලැබෙන්නේ නෑ... දුවව ලොකු කරගෙන සැරසුවොත් මිසක්..."

මධුවන්ත ජීවිතය ගැන දැක්කේ එවන් හීනයකි. තමාගේ ජීවිතයේ ලස්සන දවස් සිංගප්පූරුවේ අවුරුදු කුමාරි පැහැර ගත්තා යැයි ඔහුට සිතුණි. හාමි.. හාමි.. හාමි... ඔයා මට මොනවද මේ කළේ... ඔහු අහන්නේ ඇයගෙනි...

මධුවන්ත දුවවද වඩාගෙන කුස්සියට ගියේය. රවීගේ අම්මා තවත් ගෑණු කෙනෙක් ගෙන්නාගෙන පුංචි මඟුල් ගෙදරකට මෙන් උයයි.

"අම්මට කරදරයක් වැටුණා..."

"අ..තේ පුතේ මේ මොනවද... අයියලාට මෙහෙම නවතින්න කියන්න පුළුවන්නම්... මං කෑම ටික හදලා දෙන්නම්..."

"මං අයියලට කියන්නම් අම්මේ..."

"මේ ගෙවල් දොරවල් හැමදාම පිරිලා තියෙනවනම් මං ආසයි... මායි පොඩි පුතයි වෙනදට ඉතින් තනියමනේ..."

"රවී දිගටම සිංගප්පූරුවේ ඉන්න එකක් නෑ අම්මේ..."

"අනේ පුතේ සල්ලි නැතත් කමක් නෑ... එයා ලංකාවේ ඉන්නවනම්... කන ටික වත් බඩට යන්නෑනේ..."

ඔය ටික කියද්දී ඇගේ ඇස්වල කදුළය.

"අයියා බැඳලා ඉන්න අක්කයි නංගියි හරි ආස වෙයි අම්මගේ කෑම කන්න..."

"මං හවසට බඩු ගෙනල්ලම රෑට උයන්නම්... අම්මිට බඩගිනිද...

ආ සත්තරං..."

රවීගේ අම්මා කෙල්ලගේ කකුල අතගාද්දී ඇය කිති කැවී ගොස් සිනාසුණාය.

"මං බලන් ඉන්නේ අපේ මිනිහා බැඳලා මෙහෙම දරුවෙක් හදනකං... එ..හෙදි මො..ක..ක් හරි තිබ්බද..."

ඇය ඇසුවේ රහසින් මෙනි.

"තිබ්බත් කරන්න දෙන්නෙපා අම්මේ... මේ මං විඳින දුක පේන්නැද්ද... මේ ගමේ නංගි කෙනෙක් හොයලා බන්දලා දෙන්න..."

මධුවන්ත කීවේ හූල්ලා මෙනි.

"ම..ට තේරෙනවා පුතේ... මාත් බයේ ඉන්නේ ඒකයි..."

"අම්මා හිමිහිට ළමයෙක්ව බලන්න..."

"බලලා කිව්වොත් කැමති වෙයිද..."

"මාත් කියන්නම්... මං හිතන්නේ මිනිහා ටිකක් ලැජ්ජයි..."

"අපේ නෑ වෙන ළමයි දෙතුන් දෙනෙක් නම් ඉන්නවා... බලන්න ඕන..."

"අපට ගැලපෙන්නේ අපිත් එක්ක වැටිලා ඉන්න ගෑණු අම්මේ... සරුංගල් නෙමේ..."

"සහතික ඇත්ත පුතේ... දැන් මේ දරුවත් එක්ක පුතා ජීවිතේ ඉතුරු ටික යන්නේ කොච්චර අමාරුවෙන්ද..."

"ම..ට මේවා කියලා දෙන්න අම්මෙක් තාත්තෙක් උන්නැනේ අම්මේ... තමන්ගේ අය නැති උනාම ගෑණියෙක් විරිත්තුවත් වයි වෙනවා..."

අම්මා හිස වැනුවේ කොල්ලා කියන දේ සහතික ඇත්ත නිසාය.

"අම්මා හොඳ අහිංසක ළමයෙක්ව බලන්න... රවී මොන දේ

Elegantlk.com

නැතත් මනුස්සකමට හරි ආදරෙයි... මට පිහිට උනේ සහෝදරයෙක් වගේ... සල්ලි දේපොළ නැතත් මේ ගෙදර වැටිලා ඉන්න කෙල්ලෙක් හොයන්න... මූ කැමති වෙයි... මං ඒක දන්නවා..."

"පුතා ඔහොම කිව්වට පස්සේ මගේ හිතට හරි නිදහසක් ආවා... මං එයා ගැන තීරණයක් ගන්න බයේ හිටියේ..."

"සිංගප්පූරුවේදී වැඩ කරද්දි ඉස්සර රවී රූම් එකට ඇවිත් කියන්නේ පොල් සම්බෝලයක් හදමුද මචං කියලා... මං හදලා දෙනවා උණු බත් එක්ක... බිම වාඩිවෙලා කන්නේ... අහිංසක කෙල්ලෙක් එක්කත් නොදට ඉදී..."

අම්මා පහත් වී ඇඳ උන් රෙද්දෙන් කඳුළු පිසදා ගත්තාය.

"ප්‍ර..ත..න් කියන්න... මං බලන්නම්..."

"මං කියන්නම් අම්මේ... මූ හොඳට පවුල් කයි... එහෙම එකා... අම්මා ඔන්දලා දිලා බලන්නකෝ..."

මධුවන්ත ඔය ටික කිවේ ඔහු රවීට ඒ තරමටම ආදරය කරන නිසාය... ඔහුත් මේ ජීවිත වාලුකාවේ තනිවී අසරණ වෙනවා දකින්නට මධුවන්ත කැමතිම නැත. තමාට වූ දේ තම පණ හා සමාන මිතුරාට වෙනවාට ඔහු කොහොමටවත් කැමති නැත.

07

පේරාදෙණියය හන්දියෙන් හරවා නුවරට ළං වෙද්දී මුතුගේ සිත පුරා මොකක්දෝ සතුටක් පැතිර ගියේය... "ඔයා මගෙන් ඈත් වෙනකොට කඩා වැටෙන හිත ඔයාට ළං වෙද්දී මෙච්චර සැනසෙන්නෙ කොහොමද..." මුතු සිතුවේ පේරාදෙණිය අවට පරිසරය දෙස බලාගෙනය.

"ප්‍රියා..."

"මි..."

"රවීලගේ ගෙදරට මොනවා හරි අරගෙන යං..."

"හිස් අතින් යන්න බෑ තමයි... අපි මොනාද අරන් යන්නේ..."

"ටවුමෙන් බලලා බඩු ටිකක් අරන් යං... සුපර් මාර්කට් එකකින්..."

Elegantt

"එහෙම හොඳයි.. නේද චූටි..."

"ඔ..ව් අයියේ..."

"මේකි මොන ලෝකෙද ඉන්නේ... අඹේපුස්සේ ඉඳලා කල්පනාව..."

ප්‍රියමන්ත කිවේ ආදරයෙනි. නිම්මි පිටුපස බලද්දී ඇය සිනාසුණාය. "උඹ හිතන්නේ මොනාද කියලා මං දන්නවා..."

නුවර නගරයට කිට්ටු වෙද්දී මුතු ආශාවෙන් වටපිට බැලුවාය... මෙහෙම එන්නට හිතුණ එක කෙතරම් හොඳදැයි ඇයට සිතුණි. "ඔයා නුවර එන්නැත්තේ මොනවා හරි හිතන්න හිතාගෙන වෙන්නැති... ඒත් දැන් ඔයාට නිදහසක් නෑ..." මුතු සිතුවාය.

"මි.. ඔය දෙන්න ගිහින් එන්න... මං මල්ලිට කතා කරල පාර අහගන්නම්..."

"යං ඔබා..."

නිම්මි බැස්සේ කෙල්ලගේ අතින් අල්ලාගෙනම වගේය.

"ෂෝක් නේ..."

"උඹට ආසද..."

"මි.. ආයේ කොහේ හරි යං හොඳේ..."

"අපි තුන්දෙනා විතරද..."

කෙල්ල බීම බලා ගත්තාය.

"හරි හරි යං ඉතින්... දැන්වත් ඒ කොල්ලා එක්ක වචන දෙක තුනක් කතා කරපං..."

"අ..නේ.. එයා ළඟට ආවම මෙලෝ දෙයක් කතා කරගන්න බෑ..."

"එච්චරටම ලව් කළාද..."

"මටත් පුදුම ඒකයි..." මුතු සිතුවාය. නිම්මි ගෙදරට ගෙනියන්නට

බඩු ගනිද්දී මුතු ගත්තේ දුවට ගෙන යන්නට පුංචි පුංචි දේවල්ය.

"දුවටද..."

"ම්.. රෑට මං ගාව ඉන්නේ..."

නිම්මි තනිවම සිනාසුණාය. තීරණයක් ගන්නට පුළුවන්නම් කෙල්ල මේ මොහොතේම තීරණයක් ගෙන හමාරය...

"මේවා අරන් ගිහින් රවී මල්ලි බනීද දන්නෑ..."

"බනී නම් තමා..."

"ඒත් කෙල්ලේ අත වන වනා යන්නත් බෑනේ... අපි ඉන්නකල් රහට කෑම ටිකත් හදලා දෙයි... මඟුල් ගේ වගේ..."

දුවාට ගත් බඩු ටික මුතු වෙනමම බෑගයක දමා ගත්තාය.

"සිංගප්පූරුවේ අම්මා කෙනෙක් ඉන්නවා... කෙල්ලට කියලා එක ජංගි කෑල්ලක් එවනවද..."

නිම්මි කීවාය.

"එවන්නැති එකම තමා හොඳ... හිත හදාගත්ත ටිකත් නැති කරගන්නවා..."

මුතු බැන්නාය.

"ඔය ගෑණිට කවදහරි මධුවන්තවයි දුවවයි ඕන වෙනවා... එදාට එයි දාගෙන..."

"ඒ.. ආ..වා..ම.."

මුතු ඇසුවේ උගුරෙන් මෙනි.

"නෑ මං නිකං කිව්වේ..."

"ආවොත් මධුවන්ත අයියා එයා එක්ක..."

"මං හිතන්නෑ චූටි..."

"ඕ..."

Elegant

ඒ කතාව මුතුගේ හිතට අලුත් බරක් එකතු කළාක් වැනිය.

"අහගන්නද ප්‍රියා..."

"ඔ..වී හරි... ටිකක් ඇතුළට යන්න ඕන..."

"ප්‍රි..ටී..ස..රම පැත්තක් නම් හෝක්..."

"ප්‍රිටිසර් පැත්තක් නමා චූටි... ආසද ඒ වගේ පැත්තක බැඳලා ඉන්න..."

කෙල්ල බිම බලාගෙන සිනාසුණාය. "ඔව් ආසයි... ඔයාගේ මල්ලී එක්ක..." ඇයට කියන්නට කටට ආවේ එයය.

"පොඩි ගෙයක් වෙන්න ඇති... අපිට නවතින්න පුළුවන් වෙයිද... ට නම් කමක් නෑ... බිම පැදුරක් දාගන්නත් මට නින්ද යනවා... අක්කටයි නංගිටයි නමා..."

නිම්මි ප්‍රියමන්නට ඇද කළාය.

"අපිට නම් පැදුරක් ඕනත් නෑ නේද අක්කේ..."

"ම්..."

"නත්වේ බලලා නවතින්න කිව්වොත් එහේ නවතිමු..."

"හෝටල්වල නම් වැඩක් නෑ අයියේ... ඔය දෙන්නා එක කාමරේකට යයි මං..."

"අ..නේ ඒකත් ඇත්තනේ... නේද ප්‍රියා..."

"ම්.. ඔය අපි ළඟින් නිදි නරවිඅමු..."

කෙල්ල නමට ආ කුණුහරුපය මුවේම තබා ගත්තාය. කෙල්ල කියන්නට හැදුවේ කුමක්දැයි නිම්මි දනී. ඇය අත දමා ඇගේ කකුල

"ඌ.. මේ පැත්ත හෝක්..නේ..."

"ම්..."

ලියදි අතරින් වාහනය යද්දී කෙල්ලෝ දෙන්නා හිල්ලුවාය.

"අපිත් කාලෙක මේ වගේ පැත්තක ඉඩමක් අරන් ගෙයක් හදමු... ආ ප්‍රියා... නුවරට ට්‍රාන්සර් එකක් ගමු..."

"එහෙමනම් කොච්චර හොඳද..."

"එ..න..කො..ට මං..."

කෙල්ල ඇසූ ප්‍රශ්නයට දෙන්නාටම උත්තර නැති විය.

"ඔයා චූටි ඔයාගේ ජීවිතේ ගැන හිතන්නම ඕන... හිතන දෙයක් කියන්න අපි ඔන උදව්වක් කරන්නම්... ඒත් මේ තියෙන තත්වේ..."

"මං දන්නවා අයියේ... මාත් හිතනවා..."

"ජීවිතේ හිතන්න ගොඩ කාලයක් නෑ චූටි..."

"ම්..."

කෙල්ලගේ හිත බර විය.

"ඔය දෙන්නා ගැනම මට දුකයි..."

"දෙන්නා කිව්වේ..."

"ඔයයි අපේ කොල්ලයි... උගේ ජීවිතෙත් කොහොම කොතනින් පටන් ගන්නද මන්දා..."

"අපි දෙන්නටම ජීවිතේ එකම තැනකින් පටන් ගන්න පුළුවන් නම්..." මුතු සිතුවාය.

"සමහර විට අපි නොදන්නම තැනකින් දෙන්නා ජීවිතේ පටන් ගනී..."

නිම්මි සැහෙන වෙලාවකට පසු කිවාය.

"අපේ එකා කොහොම හරි පිළිවෙලක් හදා ගනී... මට දුක මේ කෙල්ල ගැන..."

ප්‍රියමන්න ඇත්තම කිවේය.

"කෙල්ලව අඬවන්නෙපා ප්‍රියා..."

"අයියා කියන්නේ ඇත්ත අක්කේ..."

මුතු කීවේ අඬමිනි.

"ඔය ඉතින් අඬ අඬද මේ ගෙදරට යන්නේ..."

නිමේ කෙල්ලගේ පාදයක් පිරිමැද කීවාය.

* * * * * * * * * * * * *

වාහනය නිවස ඉදිරිපිට නවත්වද්දීම දුවවද වඩාගෙන දුවගෙන ආවේ මධුවන්තය. වීදුරුව අතරින් ඔහු දෙස බලා උන් මුතුගේ පපුවට අසාමාන්‍ය සතුටක් දැනුණි.

"එන්න අක්කේ... නංගී.. එන්න..."

කාරයේ දොර අද්දරට පැමිණ එය විවෘත කළේද මධුවන්තය.

"කඳු මැද්දේ ගේ තියෙන්නේ... මරු තැනක්නේ මල්ලී..."

"මටත් ආපු ගමන් හරි ආස හිතුණා අයියේ..."

මුතු නිමේ ළඟම ඉඳගෙන බැලුවේ ඔහු දෙසය.

"වුට් කිව්වා ගෙදර ඉන්නත් කම්මැලියි කියලා... අම්මයි තාත්තයිත් බැංකොක් ගියා... පස්සේ තමා අපි නුවර ආවේ..."

නිමේ කීවාය. "එහෙනම් ඔයා කියලයි නුවර ආවේ..." මධුවන්තට මුතු දෙස බැලිණි.

"මේ නංගිව දැකලා දැගලන්නේ..."

"දි.. දි.. ආ..වා..."

කෙල්ල මුතු දෙසට අත දිගු කරද්දී ඇයට වාවාගෙන ඉන්නට බැරිය. කෙල්ල දිදී කියන්නේ වුට් නැද්දි කියන එකටය. තවම එය කෙල්ලට ලස්සනට කියන්නට නොහැක.

"එ..න්..න..."

මුතු මධුවන්තගේ අතින් දුවව ගනිද්දී නිමේ බලා උන්නේ දෙන්නාගේ දෑස් දෙසය. "එක්කෙනෙක්ගේ නෙමේ දෙන්නගෙම ඇස් අමුතුයි..." නිමේ සිතුවාය.

"තාම මිදුලෙන්නේ... එන්න අක්කේ ගෙට... අයියේ වරෙන් බං..."

රවී දොරකඩට පැමිණ කතා කළේය.

"අපි ආවා මල්ලිලට කරදර කරන්න..."

"මාසයක් හරි ඉන්න අපට කරදරයක් නෑ අක්කේ... එන්න නංගී..."

රවී මුතු දෙසද බලා කීවේය. "කෙල්ලව මධුට හොඳට ගැලපෙනවා..." මුතුව දකිද්දී රවීට සිතුණි.

"මේ අපේ අම්මා අයියේ... අම්මේ මේ මධූගේ අයියයි අයියා බෑඳපු අක්කයි නංගියි..."

"අපි අම්මට වද දෙන්න ආවා..."

ප්‍රියමන්ත කීවේය.

"අනේ මොන වදයක්ද පුතේ... මහන්සිත් ඇතිනේ... මං තේ ටිකක් ලෑස්ති කරන්නම්..."

සාදා නිම නොකළද ගේ සිරියාවන්ත යැයි මුතුට සිතුණි. මහ මන්දිරයක නැති සැනසීමක් මේ කපරාරු නොකළ බිත්ති අතර ඇතැයි ඇයට සිතෙයි.

"ඉඳගන්න අයියේ... ඉතින්... අයියලට මෙහේ නවතින්න පුළුවන්නම් නවතින්න... නවතිනවනම් මං කැමතියි..."

රවී කීවේය.

"මේ එන ගමන් දෙන්නම කිව්වේ බිම උනත් නිදාගන්න පුළුවන් කියලා..."

Freeamtalks.com

ප්‍රියමන්ත කීවේය. මධුවන්තට බැලුණේ මුතු දෙසය. ඇය එහෙමම දෙනෙත් බිමට බර කළාය.

"අපි කොල්ලෝ ටික එළියේ නිදාගමු නංගිටයි අක්කටයි ඇතුළේ දෙමු..."

රවී කීවේය. නිමේ සිනාසුණාය.

"කවුද දැන් මෙතන කොල්ලෝ..."

නිමේ සිනාසී ඇසුවාය. මුතු සිනාසුණේ දුවාගේ පුංචි සිරුර බදාගෙනය. "හිනාවෙනකොට හරි ලස්සනයි... අදයි දැක්කේ කාලෙකට පස්සේ හිනාවෙනවා..." මධුවන්ත සිතුවේය.

"හ..රි හරි... එහෙම කරමු... මල්ලිලට කරදරයක් නෑ නේද..."

"පිස්සුද අක්කේ..."

මුතු කෙල්ලවද වඩාගෙන මිදුලට බැස්සාය.

"මගේ කුක්කි නැන්දිව හෙව්වද... මී.. මාව පැටියා දාලා ගියානේ... ඉතින් නැන්දි ඇඩුවා..."

මුතු කීවේ කෙල්ලව සිප ගනිමිනි.

"ඔෆ් ආ..වා..."

"ඔව් පැටියෝ ඔෆ් එකේ ආව නැන්දි පැටියව් බලන්න..."

"කොා..ක්..ක... කෝ..."

කෙල්ල කොබෝලීල ගස් දෙසට අත දිගු කරමින් කියයි.

"කොක්කෙක් ආවද... මී..."

"ඔයි දුන්නත්..."

"දවල්ට නැන්දි එක්ක ඔයි කමු හොඳේ.. මී..."

"අ..පි කැමැවි..."

"ඔව් සත්තරං නැන්දි පැටියට කැව්වේ..."

කෙල්ලගේ බඩත් මුහුණත් ආදරයෙන් සිප ගනිමින් මුතු කීවාය... හදවතට සතුටක් සැනසීමක් දැනෙත්තේ දැන් යැයි ඇයට සිතෙයි. පපුවේ සැනසීම ඇත්තේ මේ තාත්තාත් දුවත් ළඟද...

"නංගී... සව් දොදොල් කැල්ලක් කත්ත..."

එය රැගෙන ආවේ මධුවන්තය. කෙල්ලට දැන් තෙත් ඔසවත්තේ බැරිය. ඔහු ළඟය.

"ඊයේ ආපු වෙලේ ඉඳන් දිදී කිය කියා නංඹව මතක් කරනවා... රෑ නිදාගත්තත් දිදී කිය කිය නංගි දුන්න හාවා බදාගත..."

ඔහු එහෙම කියද්දී හදවතට කොතරම් සතීපයක් දැනෙනවාද...

"ආ.. නංගී..."

මුතු ඔහු ගෙනා සව් දොදොල් දිසියෙන් කැල්ලක් ගත්තාය. "දැන්වත් ඒ කොල්ලා එක්ක වචනයක් හිනාවෙලා කතා කරපං..." අක්කා එද්දී කියූ කතාව මුතුට සිහිවිය.

"පු..දුම සැනසීමක් දැනෙත්තේ ප්‍රියා..."

නිමේ ලෝඛකමින් කීවාය. ප්‍රියමන්ත ඇය දෙස බැලුවේ ආදරයෙනි.

"අපි මෙහෙම ගෙයක් හදන්න ගමු... බාගෙට ඉවර කරගෙන හරි යං.. මී..."

"ක..ම..ක් නැද්ද..."

"මටත් හිතෙනවා... අර ගෙදර අපිට ජීවිතයක් නෑ..."

ප්‍රියමන්ත ඇත්තම කීවේය.

"මහත්තයට සැනසීමක් නැති තැන නෝනට කොහෙද සැනසීමක්..."

නිමේ කීවේ දුකෙන් මෙනි. තේ අරගෙන ආවේ මධුවන්තය.

"රවීගේ අම්මා බරටම උයනවා... මං තේ අරන් ආවා..."

"ගොඩක් හදනවද මල්ලී..."

"මේ අම්මලා කන්න දෙන්න හරි ආසයි අක්කේ... උදේ කිරිබත් කන්දක් හදලා තිබ්බා..."

නිමිමිගේ දෑස් බිමට බර විය. ඇයට සිහිවූයේ ඇගේ අම්මාවය. ගෙදරට ආ කොල්ලාට බත් කටක් දෙන්නට එපා යැයි කීවේ ඇයය.

"මන්න මල්ලි කෙල්ල නමා කිව්වේ නුවර යං කියලා..."

නිමේ කිවාය.

"අපරාදේ දන්නවනම් අක්කලට අපිත් එක්කම එන්න තිබ්බා..."

"දැන් ආවනේ..."

"මං නංගිට තේ එක දීලා එන්නම්..."

"තේ එක ඔහොම තියලා කෙල්ලව එක්කං වරෙන්..."

ඔහු අතට ගත් තේක එහෙමම තැබුවේය. මුතු උන්නේ එළියේ බංකුවේ වාඩි වී දුවට කදු පෙන්නමිනි. ඇත සිට ඇය දෙස බලාදී හිතෙන්නේ ඒ තමාගේ දුවත් නෝනාත් ඉන්නා බවකි.

"නංගි තේ බොන්න යං..."

කෙල්ල හිස බර කරගෙන ඔහු පසුපස ආවාය.

"කොහොමද වුටි මේ පැත්ත..."

"මං හ..රි ආසයි..."

පිංතූ සිංහේ ප්‍රියමෙන්නටය.

"කිව්වහුවට ගියාම ලිද... අහින් වතුර ගන්න පුළුවන්... උල්පතින් වතුර උනුරනවා... කංගි දැක්කොත් දැන් නායි..."

ඔහු එහෙම කියද්දී මේ දැන් ඔහුත් සමඟ ගොස් නාන්නට හිතෙනා තරමිය.

"නංගි ඕනෙනම් යිහින් නාගන්න... අක්කයි මායි පස්සේ නාගන්නම්..."

"මං.. යි..වා..ට ක..ව..ලා නා..ග..න්..නම් අයියේ..."

"නේක බොන්න නංගී..."

මධුවන්න ඇගේ අතට තේක දුන්නේය.

"මෝ..නා..ද මල්ලියේ ඒ සුවඳ..."

"කටලට බදිනවා අක්කේ..."

"එ..න්..න..."

මධුවන්න මුතුගේ ඔඩොක්කුවේ උන් දුවාම දැන දිගු කර කතා කළාය. ඇය බැහැයැයි කියන්නට මෙන් මුතුවම වැළඳ ගත්තාය.

Elegantta

08

මුතු කෙල්ලව එක් අතකින් වඩාගෙන අනිත් අතින් හිස් පිඟාන රැගෙන විත් මධුවන්තට පෙනෙන්නම ටීපෝව මත තැබුවාය. "මං ඔක්කොම බත් ටික දුවාට කැව්වා..." ඇගේ ඇස් කියන්නේ එහෙම ආඩම්බර කතාවකි.

"ඔක්කොම බත් කෑවද නංගී..."

ඇය මුවින් කතා නොකර හිස වැනුවාය. දුව ජංගිය පිටින් ඇගේ වත බදාගෙන උන්නාය. මධුවන්ත බලද්දී කෙල්ල මොකක්දෝ මුවින් කර මුතුගේ උරහිසේ හිස සඟවා ගනී. යළින් හිස ඔසවයි. ඇය ඉන්නේ ඒ තරම් සතුටිනි.

"නංගි නානවා නම් යං... මං ළිඳ පෙත්තන්නම්... දුවාවත් ඒ ගමන් මට නාවතහැකි..."

මුතු කාමරයට ගියේ කෙල්ලවද වඩාගෙනමය. ප්‍රියමන්ත උන්නේ ගෙදර තිබූ එකම ඇඳේ ටිකක් ඇලවීය. නිම්මිද ඔහු ළඟින්ම ඇලවී උන්නාය.

"බත් ඔක්කොම ටික කෑවා... බඩ පෙත්තන්න කුක්කි..."

කෙල්ල බඩ නිම්මිට පෙන්නුවාය.

"අ..නේ චූටි නැන්දි හෝයිද අම්මියෝ..."

දුවා හයියෙන් සිනාසී මුතුගේ ගෙල බදාගනී.

"අයියට මහන්සිද..."

"සනීපෙට චූටි..."

ප්‍රියමන්ත ඇස් වසාගෙනම කීවේය.

"මං නාගන්න යන්නං අක්කේ... ඔයත් යං..."

"මං ඉතින් නැට්ටත් නාවගන්නෙපැයි.. උඹ පලයං..."

"මේ..."

කෙල්ල ඇය ළඟට ආවාය.

"නා..න්..න මො..ක..ක්..ද අදින්නේ... අ..රයත් ඉන්නවනේ..."

කෙල්ල කීවේ රහසින් මෙනි.

"රෙද්දක් ඇඳගෙන නාපං..."

"අ..නේ වැටුණොත්.. ඇඳලම නෑ..."

"දැක්කත් අර කොල්ලනේ... උඹ වල් නෑ..."

"ය..න්..න අනේ... කියනවකෝ... රෙද්දකුත් නැනේ..."

"හිටපං මං රවීගේ අම්මගෙන් ඉල්ලන් එන්නම්..."

"අ..ක්..කේ..."

Elegantlk.com

මධුවන්ත එළියේ සිට කතා කළේ ඒ මොහොතේදීය.

"එන්න මල්ලියේ..."

"මේ අ..ක්..කේ.. නංගිට ඇඳගන්න මං චිත්තයක් ගෙනාවා..."

නිම්මි සිනාබරව බැලුවේ කෙල්ල දෙසය.

"මේ තියෙන්නේ චූටි..."

මධුවන්ත ගිය පසු නිම්මි කෙල්ල ළඟටම ගියාය.

"ඒකගෙන් හිතේ මොනාද තියෙනවද කොහෙද..."

නිම්මි කියද්දී මුතු බිම බලාගෙනම උන්නාය.

"ම්.. ම්.. ඇඳගෙන පලයන්..."

මුතු දුවව නිම්මිට දී ඇඳුම් ගලවා චිත්තය ඇඳ ගත්තාය. කෙල්ලට ඇත්තේ කොතරම් හැඩ ඇඟක්දැයි පේන්නේ දැන්ය.

"දැන් අර කොල්ලට පිස්සු හැදෙයි..."

මුතු "හප්" කියා කියන්නට මෙන් කට ඇද කළාය.

"අපි යන් පැටියෝ ජෝ නාන්න..."

මුතු තුවායද අතට ගෙන දුවව ගත්තාය. මධුවන්ත දුවගේ ඇඳුම් තබාගෙන බලා උන්නේය. ඇයව දකිද්දී ඒ සුන්දර වත දෙස නොබලා ඉන්නට තරම් සනසා ගත් පිරිමි සිතක් මධුවන්තට නොවීය.

"ය..න් න..ංගී..."

ඔහු කලබල වූ සිත සන්සුන් කරගෙන මෙන් කීවේය. මුතුගේ මුවට ආ සිනහව ඇය තනිවම මහ පොළොවට පෑවාය.

දෙන්නා ළිඳට යන දෙස නිම්මි දුවගෙන විත් බලා උන්නේ කුස්සියේ සිටය.

"මොන පව්කාරියෙක් ඒ දරුවයි දුවවයි දාලා ගියාද දන්නෑ නේද දුවේ..."

එසේ කීවේ කුස්සියේ උන් රවීගේ අම්මාය.

"හැම ගෑණියෙක්ටම හොඳ මිනිහෙක්ගේ අගේ තේරෙන්නැනේ අම්මේ..."

"අ..නේ දුවේ දැක්ක වෙලාවේ ඉඳලා මට නම් ලෝබයි... මේ දරුවත් එක්කත් ඉන්න බැරි නම් කාත් එක්කවත් ඉන්න බෑ..."

"මල්ලිට කවදහරි හරියයි අම්මේ..."

"ඒක නම් ඇත්ත..."

නිම්මිට දෙන්නා දෙස බලාගෙන ඉඳිද්දී බොහෝ දේ සිතුණි.

* * * * * * * * * * *

ළිඳ දකිද්දී මුතුට ආසා සිතුණි. ඇය කෙල්ලව තුරුල් කරගෙන බැලුවේ මධුවන්ත දෙසය.

"බ..ලාගෙන නංගී ලි..ස්..සයි..."

ගල් පඩිය බහිද්දී ඔහු ඇගේ දෙපා දෙස බලමින් කීවේය. මුතු බැස්සේ පරිස්සමින් අඩි තියාය. දිය රෙද්දක් ඇන්දේ ජීවිතේ ප්‍රථම වතාවටය. එය කොයි වේලේ කඩාගෙන වැටේදැයි කෙල්ලට බයය.

"එයාව මේකට දාන්න නංගී... වතුර දෙකක් දාලා දුන්නාම සෙල්ලම් කර කර ඉන්නවා..."

මධුවන්ත ළිඳ ළඟ තිබූ ප්ලාස්ටික් බේසම තබා කීවේය. මුතු කෙල්ලව එයට දමා ළිඳ දෙස බැලුවාය. මධුවන්ත බාල්දිය ගෙන එයට වතුර දෙකක් දැම්මාය. ඔහු කීවා හරිය. කෙල්ල ආසාවෙන් අත් ගසමින් සෙල්ලම් කරයි.

දැන් ඔහු සිටිද්දී නාන්නේ කෙසේද... මුතු වතුර ටික ටික කෙල්ලගේ ඇඟට දමමින් සිතුවාය.

"නංගී.. ඔ..හො..ම ඉඳගන්..න.. මං වතුර ඇදලා දෙ..න්නම්... ඔයාට පුරුදු නෑ..."

Elegant Talks.com

මුතුගේ පපුව ඇතුලාන්තයේ මොනවදෝ පෙරලෙන්නට විය... ඇය කෙල්ල ළඟම තිබූ ගල් පඩිය උඩ ඉඳගත්තේ කිසිවක් සිතා ගන්නට බැරුවය. මධුවන්ත ඇඳ උන් සරම කැසපට ගසාගෙන වතුර බාල්දියක් ගත්තේය.

"ව..තු..ර ටි..කක් සීතලයි හොඳ..ද..ද..."

ඔහු වතුර බාල්දිය අත තබාගෙන කීවේය. මුතු දෙනෙත් ඔසවා ඔහු දෙස බැලුවේ අසරණවය.

"ඔ..න්..න දානවා..."

මධුවන්ත වතුර බාල්දිය ඇගේ හිසට දමද්දී මුතු දෑතින්ම මුහුණ වසා ගත්තාය. ඇස් පලාගෙන මෙන් කඳුළක් කඩාගෙන එනු ඇයට දැනුණි.

දෙවියනි... ඔහු මේ කරන්නේ මොනවාද... මුතුගේ දැසින් පිටතට පැන්න කඳුළක් හිස්ට වැටුණ ළිං වතුර හා එක්වී ගලා ගියේය. ඔහු ළිඳෙන් අදින වතුර එක ඇගේ හිසට දමන්නේ ලතාවකටය. ඉහළ සිට බලද්දී බිම බලාගෙන ඉන්න කෙල්ලගේ නළලතත් හිස් මුදුනත් පමණක් මධුවන්තට පෙනෙයි.

මුතුගේ ඇතුළු ළය දෙදරන්නාක් බඳුය. ඔහු වත් කෙනෙක් මේ ජීවිතයේ නොලැබෙනවානම් මේ ජීවිතය ඇත්තටම ජීවිතයක් නොවේයැයි සිතෙනා තරමටම මුතුගේ හදවත ආදරයෙන් කැක්කුම් දෙන්නට විය. ඒ කැක්කුම ඇත්තටම පුදුමාකාර කැක්කුමකි.

"සී..ත..ල..ද නංගී වතුර..."

ඔහු ඇසුවේ වතුර බාල්දිය අල්ලාගෙනය.

"ම්..."

"වතුර තුන හතරක් වැටුණාම සීතල යනවා..."

ඔහු වතුර අදිද්දී මුතු නෙත් ඔසවා බැලුවාය. අද ඔහු මෙහෙම කරන්නේ සිංගප්පූරුවේ සිට ඔහු ආ දා සිට වචනයක් වත් කතා නොකළ තමාටය.

මධුවන්ත වතුර එක ඇද අතට ගනිද්දී කෙල්ලට දෙනෙත් ගන්නට බැරි විය. ඒ දෙනෙත් එක්වූයේ ළඟ ළඟය... කෙල්ලගේ පපුව මොහොතකට නැවතිණ.

"ළිං ව..තු..ර නංගිට පුරුදු නැ..නේ ඇ..සුත් ර..තුවෙ..ලා..."

අනේ ඔහු සිතන්නේ එහෙමය. එහෙත් මේ දෙනෙත් තෙත්ව ඇත්තේ ළිං වතුරට නොවන බව ඔහුට කොහොම කියන්නද...

"කෝ.. ඔළුව පාත් කරන්..න..."

කෙල්ල එහෙමම හිස බර කළාය. "ඔයාගේ ඇස් වලට මොකද උනේ.. අඩලා වගේ..." මධුවන්ත සිතුවේ ලතාවකට ඒ හිසට වතුර වක්කරමිනි.

ඇයට පෙනෙන්නේ ඔහුගේ දෙපා පමණි. ඒ දෙපා වැළඳ වැඳ සමාව ඉල්ලන්නට හිතෙනා තරමිය. ඇය හැඬීම වාවාගෙන උන්නේ අමාරුවෙනි. මුතු කෙල්ලව දමා තිබූ බේසම ළඟට ගෙන ඇය සමඟ සෙල්ලම් කළාය. "ඔයාගේ තාත්තිව මට දෙන්න බැරිද..." ඇයට දුවගෙන් අසන්නට සිතෙන්නේ එයය...

ඔහු වතුර බාල්දි විසි පහක් පමණ ඇද ඇයට නෑවීවේය... අවසානයට වතුර බාල්දියක් ඇද මධුවන්ත එය පඩිය උඩ තැබුවේය.

"ආ නංගී... මේ තැම්පු එක ගාගන්න... මං එහෙන් එද්දී ගෙනාපු එකක්... ගාගෙන දුවාටත් ටිකක් ගානවද... මං දුට්ටිකින් එන්නම්..."

ඔහුට යන්නට එපා යැයි කියන්නට හිතෙනා තරමිය. මුතු සියල්ලටම පෙර තැම්පු ගෑවේ කෙල්ලගේ හිසේය.

"නා..ත්..නි පෝයි කුක්කි... ම්.. නැනද්දිටත් නෑවිවා... අපි තැම්පු ගාලා ඉමු..."

"දි..දී බබ..න්..."

කෙල්ල බබන් යැයි කියන්නේ සබන් වලටය. මුතු ඇයව වැළඳගෙන මෙන් සිනාසුණාය. ඔහු නාවද්දී නහ පටයේ ගැටය බුරුල් වී ඇති බව කෙල්ල දැක්කේ එවිටය. මුතු සිනාසී එය පපුවට

තද කර ගත්තාය. "ඔයා නාවද්දී රෙද්ද ගැලවුණා නම් තමා වැඩේ..." ඇය හුරතලයට සිතුවාය.

නිමේ ආවේ කෙල්ල මොනාද කරන්නේ කියා නිකම්ට බලන්නටය.

"අද ගමේ රන්මලී කෙනෙක් වගේ... ඇඟම එලියේ දාගෙන නාන්නේ..."

නිමේ විහිළු කළාය.

"අ..ද කො..ල්..ල..ට කියලා නා..ව..ග..ත්..නා නේ..ද..."

නිමේ ඇසුවේ රහසින් මෙනි. මුතු සිනාසුණේ බිම බලාගෙනය. වතුරට හිසකේ ඇලී තිබූ ඒ මුහුණ අද පුදුමාකාර ලෙස ලස්සනය.

"මං.. ඉ..හි..ත් කි..වවේ නෑ... එ..යා නෑ..වවේ..."

"උඹත් දිගෙන හිටියනේ..."

මුතු සිනාසුණාය.

"නැහැදම් හරියන් බට්ට... බෙහෙමේ බැහැගෙන..."

නිමේ දුවාගේ මුහුණ මිරිකා කීවාය.

"සබන් ගෑවද..."

"ම..."

"මේ පිට අතුල්ලන්නද පූච්චි..."

"අ..නේ ඔ..ට කුච්චි..."

කෙල්ල ඇඟරී ගොස් කීවාය. නිමේ කටට ආ කුණුහරුපය ගිල ගත්තාය.

"හරි හරි මං ගිහින් කොල්ලව් එවනවා... උඹට බයයිනේ..."

"ය..ත්..න අ..නේ..."

"යනවා යනවා..."

මුතු රෙද්ද මෑත් කර සුදු දෙපා වල සබන් ගෑවේ නිමේට ඇ

කරමිනි. කෙල්ලගේ හිතත් ඇති සතුට තිබ්බට තේරුම් යන නැක. එහෙම සතුටක් විඳිනවා ඇය දැක්කේ ඇත්තටම අදය.

මධුවන්ත එද්දී ඇය උන්නේ දෙපා එලියේ දාගෙනය. ඔහු පයියට ගොඩ වෙද්දී මුතු තොල් පට තද කරගෙන චීත්තය හෙම්බිට පහළට ඇම්මාය. "දැද්දී මං ඔක්කොම දැකලා ඉවරයි..." මධුවන්ත සිහින් සිනාසී කීවේය.

"ම.. කැ..ත්..ත..."

මධුවන්ත ඔහු ඇයට රැගෙන ආ මයියොක්කා පිරිසිය අතට දුන්නේය. කොච්චි සම්බෝල සමඟ ඇතු මයියොක්කා වලින් දුම් දමමින් තිබුණි. මුතු මයියොක්කා කැල්ලක් මුවට දමාගෙන බැලුවේ ඔහු දෙසය. මේ වගේ පුංචි අහිංසක ජීවිතයක් මට දෙත්තයැයි ඇගෙත් ඉල්ලත්තට හිමතනා තරම්ය.

"මං ඔත්ත වතුර දානවා..."

ඔහු එක පිට එක වතුර ඇදගෙන ඇගේ හිසට ඇම්මේය. ඇම්පු වලින් සේදුණු වරලසින් ආවේ ලස්සන දීප්තියකි.

ඔහු වතුර දමන අතරතුර ඇය රෙද්ද මඳක් බුරුල් කළාය. ඒ ඇඟේ ගා ගත් සබන් යත්නටය. මධුවන්ත එවර වතුර දැමුවේ හිසට නොවේ පපුවටය... මෙල්ල තන පටය තද කරගෙන මුව තද කර ගත්තාය. "තව චුට්ටෙන් රෙද්දත් අත ඇරෙනවා..." ඇය සිනාබරව සිතුවාය.

"ම.. දැන් පිහදගන්න..."

"මං.. දුවාව පිහදගෙන ගේ..න්..න..ම..."

මුතු කීවේ බිම බලාගෙනය. ඔහු ළිදෙන් උඩට යද්දී ඇය තුවාය පපුවට තබාගෙන බලා උන්නාය.

"තා..ත්..ති එහෙදි ඔයාගේ අර නපුරු අම්මිව නැව්වේ නෑ නේද.. ම..."

මුතු කෙල්ලව තුවායෙන් ඔතා ගනිමින් ඇසුවාය.

Elegantlk.com

"හෙටත් අපි තාත්තිට කියලා නාවගමු... ම්..."

"ජෝ.. දිදී..."

"ඔව් අම්මා කොණ්ඩේ ජෝ.. මේ..."

මුතු තෙත කොණ්ඩය කෙල්ලගේ මුහුණේ වැද්දුවාය. කෙල්ල සිනාසුණේ දඟලමිනි.

"නා..ත්..නි ෂෝයි... අපට මයියොක්කත් ගෙනත්..."

මුතු තුවාය ඇඳගෙන කෙල්ලවත් දෙපා මත තබාගෙන මයියොක්කා කෑවාය.

"පැටියට එපා.. බයි කෑවනේ අම්මි... ඒකයි... නැත්දට බඩගිනියි..."

අද හිතට දැනෙන සතුටේ තේරුම මොකක්දැයි මුතු සිතුවාය. ඇයට එක දෙයක් පමණක් පැහැදිලිය. ඒ සතුට කෙළවරේ ඉන්නේ ඔහුය...

09

බාගෙට බැන්ද ගඩොල් බිත්ති කෑලි තිබූ සාලයේ කෑම මේසය සූදානම්ව තිබුණි. පහළ ලියදි සිපගෙන එන සුළඟ හායි කියා ඇරුණු බිත්ති වලින් එහෙමම නිවසට කඩා වදියි.

රවීගේ අම්මා උණු උණුවේ බෑ සුදු කැකුළු හාලේ බත් බත්දේසිය ඔසවාගෙන විත් තැබුවේ දුම් දමද්දීය... කෑම මේසය දැක්කත් බඩ පිරෙනවා යැයි නිම්මිට සිතුණි.

"ඔන්න බෙදාගෙන කන්න අක්කේ... අපි බෙදන්නෑ..."

"කොහෙන් කන්න පටන් ගන්නද කියලා මල්ලි හිතුවේ..."

නිම්මි කීවේ ඇත්තමය. මුතුද සිනාබරව නිම්මි දෙස බැලුවාය.

Elegantlk.com

"මධූ... මේ කෙල්ල බෙදාගන්නෑනේ උඹ බෙදපං..."

රවී කීවේ මුතු ලැජ්ජාවෙන් මෙන් උන් නිසාය. පැයක් පමණ නෑව නිසාදෝ කෙල්ලගේ මුහුණ අද තවත් සුදුය.

"අම්මගේ කිරි කොස් එක හරි සුවඳයි..."

"මං ගමේම කෑම පුතේ හැදුවේ... දුවලට කැවෙන්නෑනේ ඉනින්..."

"අලයි පරිප්පුයි චිකනුයි බතුයි තමා අම්මේ ඉතිං..."

මුතු බලා උන්නේ ඔහු ලස්සනට බෙදන අයුරුය.

"ප්‍රියා ආසම දේ තියෙනවා... මේ හතු බැදුම..."

මධුවන්තට බැලුණේ මුතු දෙසය.

"මැ..ල්..ලුම් දා..න්..න..ද... මේ මයියොක්කා දළු මැල්ලුම්..."

ඔහු ඒ දෑස්වලට එබීගෙන මෙන් ඇසුවේය. මුතු හිමිහිට හිස වැනුවාය. නිම්මි මේ සියල්ල දැක දැකත් නොදැක්කා සේ උන්නාය.

"මේ බලන්නකෝ අම්මා මාළුත් බැදලා ගේනවා... මේ ඇතිනේ අම්මේ..."

අම්මා සිනාසුණේ රවී සමඟය.

"හොඳට කාපන් අයියේ... මධු නංගිටත් මේ මාළු පෙත්තක් දීපන් බං..."

මාළු පෙත්ත තවමත් උණුය. සියල්ල දමා මධුවන්ත කෑම එක ඇය ළඟ තැබුවේය. "ගොඩක් බෙදලා..." ඇය සිතුවාය.

"රෑට මොනාද අක්කටයි නංගිටයි කන්නෝන..."

රවී ඇසුවේ කෑම මේසයේ ඉඳගනිමිනි. මධුවන්තට ඉඳගන්නට පුටුවක් තිබ්බේ ඇය ළඟමය.

"මෙ..හෙම කාලා මල්ලී රෑට කන්න පුළුවන් වෙයිද දන්නෙන් නෑ..."

නිම්මි සිනාසී කීවාය. ඇය බත් නැතුවත් කිරි කොස් කයි. ඒ තරම්ම එය රසය.

"අ..ම්මේ..."

"අනේ මල්ලියේ අම්මට වද දෙන්නෙපා... අපි රෑට මොනා හරි පොඩ්ඩක් කමු..."

රවී සිනාසුණේය.

"අ..ම්මේ... රෑට පිට්ටු හදමුද..."

"අ..නේ එපා මල්ලී... අම්මට මහන්සියිනේ.. මේ බලන්න හදලා තියෙන දේවල්..."

"අ..නේ ඒක මොකක්ද පුතේ..."

"අක්කා කියන්නේ අපේ අම්මගේ ප්‍රියතම විනෝදාංශය උයලා කාටහරි කන්න දෙන එක... ඉස්සර මං ඉන්න කාලේ මේ ගෙදර හැටිමයි... මේ නුවරම මෙහේ..."

"රෑට උණුවෙන් පිට්ටු ටිකක් හදමු එහෙනම්... මේ දූලත් කැමති ඇතිනේ..."

මුතු රවීගේ අම්මා දෙස බලා සිනාසුණේ කුළුපගවය. මධුවන්ත ඇගෙන් අසන්නේ නැතුවම කිරිකොස් හැන්දක් බෙදුවේය. පසුව මයියොක්කා දළු මැල්ලුමෙන්ද හැන්දක් බෙදුවේය. කෙල්ල වැඩිපුරම කෑවේ ඒ දෙකත් සමඟය. මධුවන්ත බලාගෙනය.

"මෙහෙම හිටියට අක්කේ අපේ මධූට රහට උයන්න පුළුවන්... සිංගප්පූරුවෙදි රහට අපට උයලා දුන්නා..."

මධුවන්ත සිනාසුණේය.

"මොනාද මල්ලී අපේ මල්ලී හදන්නේ..."

"පොල් සම්බෝලයි බතුයි තමයි අක්කේ..."

මධුවන්ත සිනාසී කීවේය.

Piyanta.com

"ඇයි මචං... කරෝලත් අපි තෙල් දාන්නේ... දවසක් අපි එක්ක වැඩ කරන චීන කොල්ලෙක්ට ඒක කවලා උඹ හැමදාම එනවා ඒක කන්න... මධු ආවත් හරි තේකක් වත් රහට බිව්වේ නෑ..."

"ඔයත් සිංගප්පූරුවේ ඉඳලා ඔයාටත් වෙන්නේ ඕක තමයි මල්ලී..."

නිමේ කීවාය.

"හම්බවෙන්න ඉන්න කෙනා නොලැබී ගියාම අක්කේ ඒක වෙනවා... සිංගප්පූරුවෙයි මෙහෙයි කියලා වෙනසක් නෑ..."

රවී කීවේ මධුවන්ත දෙසම බලාය. මුතු නෙත් ඔසවා රවී දෙස බැලුවාය.

"ඒත් ඉතින් කවදහරි ලැබෙයි..."

රවී කීවේ මුතු දෙස යංතමට බලාය. කෙල්ල එහෙමම බිම බලාගත්තාය.

10

සැන්දෑවේ මාළිගාවට යන්නට කෙල්ලව ලෑස්ති කළේ මුතුය. ඇය කෙල්ලව සෝභාගෙන තුවායේ ඔතාගෙන ආවේ කෙල්ලට අත්දවන්නට ඇඳුමක් ඉල්ලා ගන්නටය. ඔහු දුවට අන්දවන්නට තෝරාගෙන දුන්නේ පුංචි නිල් පාට ඩෙනිම් කලිසමකුත් සුදු අත්නැති ටීෂර්ට් එකකුත්ය... ඒවා ඔහු සිංගප්පූරුවෙන් එද්දී ගෙනා ඇඳුම් විය යුතුය.

කෙල්ල ඇයට පුරුදු වී ඇත්තේ පුදුමාකාර ලෙසිනි.

"මං.. අ..න්..ඳ..න්..න..ද නංගී..."

මුතු කතා නොකරම ඔහුගේ අතින් කෙල්ලගේ ඇඳුම් ටික

Elegantalks.com

ගත්තාය...

"පා..පු දෙ..ක..ක්..."

මුතු ඇසුවේ බිම බලාගෙනය. මධුවන්ත ඇය දෙස බැලුවේ සිනාසීය. මධුවන්ත ගොස් බෑග් එකෙන් පුංචි සුදු සපත්තු පොදි දෙකක් රැගෙන දුන්නේය.

"මේකේ නංගි ඔඩි ක්ලෝනුයි ක්‍රීමුයි පවුඩරුයි තියෙනවා..."

ඔහු පුංචි රෝස පාට පෙට්ටියක් දුන්නේය. දූගේ වැඩ ඔදු ලස්සනට කරනවා යැයි ඇයට සිතුණි.

කෙල්ල මුතුගේ පපුව බදාගෙන මධුවන්ත හා සිනාසුණේය. ඔහු බලා උන්නේ දුකෙන්ද නැත්නම් සතුටකින්දැයි මුතු සිතුවාය.

මුතු කෙල්ලට අන්දවා ඇයද ඇඳ ගත්තාය. මුතු මාළිගාවට යන්නට ඇදගත්තේ සුදු සායත් බ්ලවුසයත්ය. ඇය කෙල්ලවත් වඩාගෙන ආවේ නිම්මිත් ප්‍රියමන්තත් උන් කාමරයටය.

"චුටි කෙල්ලව හදන්න ඉල්ල ගත්තද..."

ප්‍රියමන්ත අසද්දී මුතුගේ දෑස් සිනාබරව බර විය. "මට දුව විතරක් මදි... තාත්තිවත් ඕන..." කියන්නට සිතෙන්නේ එහෙමය.

"මල්ලිත් එනවා නේද..."

"නැතුව... මල්ලිව එක්කං යන්නැතුව කොහොමද..."

"මි.. යං..."

මුතු ඇගේ පුංචි සුදු ජැහැගත් හෑන්ඩ් බෑගය දමා ගත්තාය.

"එහෙනම් අසියලා ගිහින් එන්න... අපි රෑට සෙට්වෙමු..."

රවී මිදුලේදී කීවේය. කඳු උඩින් ලස්සනට ඉර බැසගෙන යමින් තිබුණි.

වාහනය පදවන්නට ගත්තේ මධුවන්තය. ප්‍රියමන්ත එහා අසුණට බර විය... මුතුත් නිම්මිත් නැග්ගේ පසුපසටය. "තාත්ති බෑම් එළවනවා අර... ෂෝයි තේ..." මුතු ඔහු දෙස ලෝඛකම්න් බලා සිනින් කීවාය

"අපි මාළිගාවටද අක්කේ කෙළින්ම යන්නේ..."

"අනේ ඔව් මල්ලියේ... මාළිගාවට ගිහින් ඉමු... බාරෙකුත් වෙන්න තියෙනවා..."

"මටත් තියෙනවා බාරයක් වෙන්න..." මුතු කීවේ සිතෙනි.

"අපි මාළිගාවට ගිහින් ටවුමේ රවුම් ගහමු... ටිකක් රෑ වෙලා යන්... නේද චූටි..."

කෙල්ල අක්කා දෙස බැලුවේ ප්‍රසංසාත්මකවය. මේ ජීවිතයේ සතුට ඇත්තේ කොතනකැයි තමාටත් වඩා ඇය දන්නා බව මුතු දනී.

"තා..ත්..තා බෑම්..."

මධුවන්ත වාහනය පදවද්දී කෙල්ල සතුටින් උඩ පනියි. මුතු ඇයව පපුවටම ගත්තාය.

"ම..ල්..ලී..."

"අ..ක්..කේ..."

"මේ ගෙදර නම් පුදුම ගෙයක් නේද මල්ලී... අ..නේ අපිටත් හිටියනම් එහෙම අම්මා කෙනෙක්..."

නිම්මි කීවේ ඇත්තටම හූල්ලමිනි.

"ගම්වල අම්මලා එහෙමයි අක්කේ... අද අපේ අම්මා හිටියනම් නේද අයියේ..."

කොල්ලෝ දෙන්නාගේම ඇස්වල කඳුළය.

"අම්මලා නැති උනාට අපි ඉන්නවනේ අයියටයි මල්ලිටයි..."

නිම්මි කීවේ දෙන්නාගේ මුහුණුවල දුක දැකය.

"අක්කලා දවස් දෙක තුනක් ඉඳලා නේද යන්නේ..."

"අපේ මහත්තයගෙන් තමා ඇප්රූ කරගන්න ඕන... ඉන්නවා නේද ප්‍රියා..."

Elegant

"මේ මිනිස්සුන්ට ගොඩක් වද දෙන්නත් බෑ නේද මල්ලි..."

"එ..නෙම නෑ අයියේ..."

"ඉන්න නම් ආසයි..."

"එයාලා ආසයි අයියේ අපි ඉන්නවට..."

කොළඹ නොයාම ඉන්නට හිතෙනා තරමට මුතු මේ ගමනට ආශාවෙන් උන්නාය. කොළඹ ගින්දර ගොඩකි.

"උඹත් කවදහරි කාර් එකක් ගනිං..."

මධුවන්ත වාහනය පදවන අපූරුව දැක ප්‍රියමන්ත කීවේය.

"කොල්ලට විසඳගන්න ඊට වඩා ප්‍රශ්න තියෙනවා ප්‍රියා..."

"ඒකත් ඇත්ත..."

"මං කොහොමහරි නැගිටිනවා අක්කේ..."

ඒ කතාවට නිම්මි බැලුවේ මුතු දෙසය. "ඔයා නැගිටින්නම ඕන... මෙහෙම ජීවත් වෙන්න ඔයාට අමාරුයි..." මුතු මේ සියල්ල කියන්නේ සිතෙනි. ඔහු ගැන මේ හිතින් හිතන දේවල් ඇත්තටම ඔහුට කියන්නට පුළුවන්නම් කියා මුතුට සිතුණි.

"උඹ මොනාද මල්ලී කරන්න හිතුවේ..."

"කෙල්ලටයි මටයි ඉන්න පොඩි ගේ පොඩ්ඩක් හොයා ගන්නෝන අයියේ... එතන ඉඳගෙන මොනවා හරි කරනවා..."

නිම්මිත් මුතුත් මූණට මූණ බලා ගත්තෝය.

"කෙල්ලව බලා ගන්නේ කොහොමද..."

ප්‍රියමන්ත එසේ අසද්දී මධුවන්තට බැලුණේ පසුපස අසුන දෙසය. කෙල්ල මුතුට තුරුල් වීගෙන ඉන්නා අයුරු දකිද්දී ඔහුගේ පපුවම පිරී ගියේය.

"ඔක්කොම උත්තර හොයා ගන්න ඕන තමා අයියේ..."

"අපි පුළුවන් උදව්වක් කරන්නම් මල්ලී..."

"අ..නේ මං දන්නවා අක්කේ... මට ඉන්නේ ඔයාලා විතරනේ..."

"අපටත් ඉන්නේ ඔයා විතරනේ..."

නිම්මි කීවේ හැඟීම්බරවය. වාහනය දළඳා වීදිය දිගේ උඩට ධාවනය වෙමින් තිබුණි. මුතු ආශාවෙන් නුවර නගරය දෙස බලා උන්නාය...

"මං දුවාව ගන්නද නංගී... ටිකක් දුර ඇවිදින්න එපැයි..."

දළඳා මාළිගාව පෙනන මානයේ වාහනය නවතා මධුවන්ත ඇසුවේය. නිම්මිති ප්‍රියමන්තත් මල් ගන්නට ගියෝය.

"මං.. ව..ඩං ය..න්..න..ම්..."

ඇය නෙත් බර කරගෙන කීවාය. ඔහු මොහොතක් ඒ මුහුණ දෙස බලාගෙන උන්නේය. වාහනයෙන් බැස දෙන්නාම මල් කඩ වෙත ආවේ එකටය. නිම්මි ඒ කපල් එක දෙස බලාගෙනම උන්නාය. "ලස්සන කපල් එකක්... පුංචි දුවෙකුත් ඉන්න ලස්සන පවුලක්..." ඇය යටි සිතින් සිතුවාය. එහෙත් ඇත්ත ජීවිතය මේ දකින සිතුවමට වඩා කොතරම් වෙනස්ද... දෙන්නාගේම ජීවිතවල ප්‍රශ්න පොකුරු පිටින්ය.

"චූටි..."

කතා කළේ ප්‍රියමන්තය.

"අයියේ..."

"මල් වට්ටියක් අරන් දෙන්නද..."

"හා..."

කෙල්ල ආශාවෙන් කීවාය.

"ඔයත් බාරයක් වෙනවද..."

ඔහු හිමිහිට ඇසුවේය.

"ම්.. වෙ..න..වා..."

නිම්මිත් ප්‍රියමන්තත් ඇය දෙස බලා අසරණ සිනහවක් පෑවෝය.

Freegamebooks.com

11

දළදා මාළිගාව අවට පරිසරය බැනිබරය. වැව දෙසින් හමා එන සුළඟ නිසා සිසිලයි. මුතුට බැලෙන්නේම ඔහු දෙසය. නුවර ආ එක කොතරම් හොඳදැයි ඇයට සිතෙයි.

"ප්‍රි...යා..."

"ම්..."

"පිට්පස්ස ටිකක් බලන්න..."

ප්‍රියමන්ත බැලුවේය. ඔහුගේ නෙතට හසුවූයේ මධුවන්නත් මුතුත් එකටම වාගේ එන අයුරුය.

"ම්..."

"හ..රි ල..ස්..ස..න කපල් එ..ක..ක් තේ..ද..."

නිමිමිගේ කතාවට ප්‍රියමන්ත පුදුමයෙන් මෙන් ඇය දෙස බලා උන්නේය.

"ඔව්ා දෙන්නගේ ඔළුවලට දාන්නෙපා බබා..."

නිමිමි කතා කළේ නැත. ඔහු එනෙම කියන්නේ කෙල්ල මධුවන්නට ආදරය කරන බව ඔහු නොදන්නා නිසාය.

දෙන්නාගේම ජීවිතවල ප්‍රශ්නය. කරදරය. ඒ ප්‍රශ්න වලට පිළිතුරු ළඟ නැත. ඇත්තේ දුරය. එහෙත් දෙවය දෙන්නාගේ ජීවිත ළඟම උන්නර දෙකක් තබා ඇත. දෙකක් නොව උන්නර එකක් තබා ඇත. දෙන්නාට එක්වන්නට පුළුවන් නම් ඒ ජීවිත දෙකේ ඇති ප්‍රශ්න පන්තරයටම පිළිතුරු ලැබේ. එහෙත් ඒ උන්නර වලට යාම හිතනා තරම් පහසු නැත. නිමිමි සිතුවේ ඒකය.

දුවා මුතුට හුරු වී ඇත්තේ පුදුමාකාර ලෙසිනි. තමාට වත් දුවා ඒ තරම් හුරු වී නැත. ඒ හුරුවීම පිටුපස ඇත්තේ කුමක්දැයි නිමිමි දනී. "නාත්තිට පැලෙන්න ආදරේ එකේ දුවාටත් ඒ වගේම ආදරේ ඇති..." නිමිමිට සිතුණි.

මධුවන්නට ආදරය කළා යැයි එදා මුතු කියද්දී නිමිමි සිතුවේ එය නොතේරෙන ලද බොළඳ කාලයේ හදවතේ ඇතිවූ ළාමක ආදරයක් වන්නට ඇතැයි කියාය. එහෙත් එය කොතරම් ගැඹුරු සෙනෙහසක්දැයි ඇයට නේරෙන්නේ දැන්ය.

කොහොමන් කෙල්ලෙක්ගේ හදවත ගිනි කන්දකි. උණු ලෝ දිය ලාවා ගලන ගිනි කන්දකි. ඒ හදවත වැඩි කාලයක් නිහඬව නිසලව තියෙන්නේ නැත. කොයි වේලේක හෝ එය පුපුරන බව නිමිමි දනී.

කාංචනගේත් කෙල්ලගේත් විවාහය අත ළඟය. කෙල්ල නිර්ණයක් ගන්නවා කීවාට ඇය අත නිර්ණයක් නැත. ඇත්තටම නැත.

Elegantta.com

සමහර විට දෛවය ජීවිතයට දෙන්නේ හදවත බලාපොරොත්තු වූ තීරණ නොවේ. බොහෝ විට එය පිළිගන්නට සිදු වෙයි. එහෙත් හදවත තීරණ ගන්නට පටන් ගත් විට දෛවය කුඩුපට්ටම් වී යයි. දෛවයේ තරු විසිවී යයි.

සමහර විට එහෙම තීරණයක් කෙල්ලගේ ජීවිතය පුපුරාගෙන එන්නටද බැරි නැත.

බලා ඉන්නවා ඇරෙන්නට කරන්නට දෙයක් නැත.

මාළිගාව වෙත පිය නඟන ගල් පඩියේදී මුතුට මධුවන්ත දෙස බැලිණි. ඔහු මේ වෙලාවේ සිතමින් ඉන්නේ මොනවාදැයි ඇය සිතුවාය. ඇත්තටම ඔහු සිතමින් ඉන්නේ දුවාවත් වඩාගෙන ඔහු ළඟින්ම ගල් පඩි නගින කෙල්ල ගැනය.

මධුවන්තට ඇය ගැන පුදුමය. මේ ඉන්නේ ශ්‍රී ලංකාවේ ජනප්‍රියම දේපොල ව්‍යාපාරිකයෙකුගේ බාල දුවය. ඇයව විවාහ කර දෙන්නේ අක්කර ගණන් ඉඩම් දෑවැද්දට දීය. ඇයව රැගෙන යන්නේ එවැනිම කෝටිපතියෙකුගේ පුතෙකි. රට වටා ඔවුන්ට ඇති ගෙවල් ගණන ඔවුන්වත් දන්නේ නැත. අද මෙහෙම තමාගේ අසරණ දුවව වඩාගෙන යන්නේ එහෙම කෙනාය.

"මොනාද දාගෙන හිතනවා... මූණ හරි දුක පාටයි..." මුතු සිතින් සිතුවාය. ඔය තරමට කල්පනා කරන්නේ මොනවාදැයි අසන්නට සිතෙනා තරමය. එහෙත් එසේ අසන්නට නොහැක. ඔහු ආ දා සිට මේ මුව ගොළුය. එහෙත් හදවත කෝච්චි එන්ජිමක් මෙන් ඔහු පසුපස දුවයි. ඒ බව ඔහු දන්නේ නැත. දුක ඒකය.

මුතු වඳිද්දී මධුවන්ත දුවව වඩා ගත්තේය. ඇය මල් වට්ටියේ වූ මල් එකින් එක මල් ආසනය මත තැබුවේ දෑස් අඩවන් කරගෙන සෑහෙන දෙයක් සිතමිනි. "ඔයා වගේ කෙල්ලෙක්ගේ ජීවිතේට නම් දුකක් වෙන්නෙපා..." මධුවන්ත සිතුවේ ඒ බරවූ දෑස දෙස බලාගෙනමය.

දෑස පියාගෙන වඳිමින් උන් මුතු තාත්තත් දුවත් දෙස බැලුවේ අඩවන් නෙහිනි. මොහොතකට කලින් වූ බාරය මුතු සිහි කළාය.

"ජීවිතේ පළවෙනි වතාවට බාරයක් උනේ... බලමු ඉෂ්ඨ වෙයිද කියලා..." ඇය සිතුවාය.

ඉදිරියෙන් ගියේ මධුවන්තත් ප්‍රියමන්තත්ය. දුව ඉන්නේ මධුවන්ත අතය. නිම්මි යන අතරතුර මුතුගේ අතකින් අල්ලා ගත්තාය.

"ඇයි චූටි..."

කෙල්ලගේ නිහඬතාවය අසාමාන්‍යය.

"නෑ අ..ක්..කේ මුකුත් නෑ..."

"ඔළුව බර කරගන්නෙපා..."

"ම්..."

"සමහර ප්‍රශ්නවලට උත්තර අපි ගාව නෑ චූටි..."

"දන්නවා අක්කේ... නිදහසේ ජීවිතේ ගැන තීරණ ගන්න පුළුවන් පවුලක ඉපදුනා නම් මං..."

"ගන්න තීරණේ මං දන්නවා..."

"මේ තාත්තයි දුවයි දැක්කම හරි ලෝබයි මට... එයාලා දෙන්නත් එක්ක ඉන්න තියේනම් කියලත් හිතෙනවා..."

නිම්මිට පුදුම නැත. සමහර විට කෙල්ල මාළිගාවට බාර වෙන්නට ඇත්තේද එයම විය යුතුය.

"අ..පි චූ..ටි මෙ..හෙ..ම..."

"ය..මු.. නේ..ද..."

"මං.. කිව්වේ චූටි..."

"මං දන්නවා අක්කේ... මේ හිනයක් දකිනවා විතරයි..."

"කොල්ලත් ඩිම් වෙලා වගේ ඉන්නේ... මට මූණ බැලුවාම පේනවා... ආදරයක් පපුවට වැටිච්ච එකෙක් නෙමේනේ..."

"මට ඉඩ දෙනව නම් ම..ම..."

කියන්නට ගිය දේ මුතු ගිල ගත්තාය.

"එයා මෙ..හෙම හිටපු දෙන්... මං ඇවිත් කරදර කරත්නෑ..."

මාළිගාවේ දොරකඩ ළඟදී මධුවන්ත දුවවද වඩාගෙන බැලුවේය. ඔහුගේ ඇස්වලට කෙළින්ම ලක්වූයේ ඇයවය. මුතු එහෙමෙම බිමට නෙත් බර කර ගත්තාය.

"තිබහයි ම..ල්ලි..."

"බේක් හවුස් එකට ගිහින් තේ බොමු..."

ඔවුන් එතනින් පාර පැන පා ගමනින්ම ක්වීන්ස් හෝටලයේ පිට කොරිඩෝව දිගේ ගොස් බේක් හවුස් එකට ගියෝය.

"ම..ට දෙ..න්..න..."

මුතු හෝටලයට ඇතුල් වෙද්දී ඔහුට ළංව කීවාය.

"ම්.. චූටි නැන්දි ගාවට යන්න... චූටි නැන්දිට උණු රෝල්ස් දෙන්නද..."

ඔහු අසද්දී ඇය හිස වැනුවේ බිම බලාගෙනය. මධුවන්ත හවස උණුවෙන් දමා තිබූ පැටිසුත් රෝල්සුත් ගෙන්වා ගත්තේය. මුතු පැටිස් එකක් ගෙන එය චූටි කැබලිවලට කඩා දුවාට කැව්වාය.

"මල්ලී සිංගප්පූරුවෙදි රෑට කන්නේ මොනාද..."

නිම්මි ඇසුවාය.

"ගොඩක් දවස්වලට අක්කේ මායි දුවයි ඇඳගෙන රවුමක් ගහනවා... අපාට්මන්ට් එකටම වෙලා ඉන්න පාළුයි... හැම තැනම ඉතින් ෆුඩ් කොට්ටේ... නූඩ්ල්ස් එකක් එහෙම ගත්තවා... උණුවෙන් දාලා දෙන්නේ... දුවටත් කවල මාත් කනවා... නැත්නම් ආනන්ද භවන් එකෙන් අපි ඉදිආප්ප කනවා... මෙහේ වගේ නෙමේ ඒ ඉදිආප්ප හරි ලොකුයි... තුනක් හොඳටම ඇති... කාලා ඉතින් දුවාවත් වඩාගෙන

පාර දිගේ එනවා... එද්දී නිදි ඉතින්..."

මුතු ඒ ජීවිතය මවා ගත්තාය.

"ඔය ඕන දෙයක් කන්නේ ඒ පුරුද්දට..."

මධුවන්ත කීවේ මුතු කෙල්ලට පැටිස් කවනා දෙස බලාගෙනය.

"සමහර දවස්වලට ඉතින් මොනවා හරි හදනවා... එතෙම හදන දවසට මං රවීටත් එන්න කියනවා... එතේ තියෙනවා මුස්තාෆා කියලා සුපර් මාර්කට් එකක්... ඒකේ අක්කේ කංකුං මිටිය පවා තියෙනවා... පොඩි හාල්මැස්සෝ එහෙමත් තියෙනවා... රවියා ආවම ඉතින් පින් දීදී කන්නේ..."

"ඔයත් එක්ක සිංගප්පූරුවට ගිහින් එහෙම ජීවත් වෙන්න තියෙනව නම්... ඔයාට ජොබ් එක කරන්න පුළුවන්... මං දවල්ට දුවාව බලාගෙන ඉන්නවා... අපි රෑට ෂොපිං යනවා... ඇවිදිනවා... ෂෝක්..." මුතු සිතුවාය. "ඒත් බෑනේ අර වල් කරත්තේ එහෙනේ..." මුතුට පසුව සිතුණි.

"ජීවත් වෙන්න සිංගප්පූරුව ෂෝක් අක්කේ... මට එක්කෙනෙක් සිංගප්පූරුව එපා කළානේ..."

මධුවන්ත බිඳුණු හඬින් කීවේය.

"අපි හිටියේ අයියේ සිංගප්පූරුවේ ලිට්ල් ඉන්ඩියා කියන පැත්තේ... ඒ පැත්තේ ඉන්දියන් කෝවිල් ඉන්දියන් රෙස්ටොරන්ට් හින්දි කැසට් කඩ පිරිලා... එහේ කෝවිල් අරන් යන්නේ රෝස මල් පෙති... හරි ලස්සනයි... රෑට ඒ පාර දිගේ ඇවිදගෙන යද්දී හිතට හරි නිදහසක් එනවා... මහන්සි දැනුණාම ඉන්දියන් හෝටලේකට ගිහින් හොඳ මසාලා ටී එකක් බොනවා... ඒක ටින් කිරි දාලා හදන්නේ... හරි රහයි... මං සිංගප්පූරුවට ගිය දවස්වල රෑ දොළහ විතර වෙනකල් ඔය පාරේ ඇවිදිනවා... පස්සේ ඒ නිදහස නැතිවුණා..."

ඒ දෙනුවත් දෙස බලන්නට පවා බැරි තරමය. මුතු සිතුවේ සිංගප්පූරු ජීවිතය ගැනය...

වාහනයට එද්දී තුනී පොදයක් ඇද වැටුණා. මුතු වාහනයට ගොඩ වූයේ කෙල්ලව පපුවේ ගහගෙන මෙනි. ඒ ඉරියව්වට කෙල්ලට ආසය. ඇය මුතුව බදාගෙන සිනාසුණාය.

"ආ..යි දි..දි..."

කෙල්ල කියද්දී මධුවන්ත සිනාසුණේය.

"ආයි බෑ... එළියේ ජෝ වැස්ස..."

මධුවන්ත වාහනය ගෙන පහළ දළඳා වීදියට දැම්මේය.

"ප්‍රියා ටවල් එකක් අරන් යන්ද..."

"ඔ..ඔ..."

"ඇයි අක්කේ ටවල් ගෙනත් නැද්ද..."

"අනේ නෑ මල්ලියේ... අමතක වෙලා... අපි අරන් එන්නම්... වුටි උණට මොනාද ඕන..."

"මං අරන් ආවේ ඔක්කොම..."

"මල්ලිට..."

"මාත් ගෙනාවා අක්කේ..."

නිමේත් ප්‍රියමන්තත් තිමි ඇඳුම් සාප්පුවක් ළඟින් බැස ගියෝය. යංතම් පොදයක් අවට වැටෙන් නිසා වාහනය ඇතුළත සීතලය.

"නි..දී..ද තෑගී..."

නිමේ කෙල්ලගේ ඇස් දෙස බැලුවාය.

"ත්..නෑ..."

තව මොනවා හෝ කතා කරන්න බැරි ඇයි... ඒ මුවින් වචනයක් අහන්නට කොතරම් ආසද...

"දුවා කාටවත් මේමහම ළංවෙලා නෑ නංගී... මං හි..තු..වේ දුවා පුරුදු මට විතරයි කියලා..."

ඔහු ඔහොම මොනවදෝ කියෙව්වේය. මුතු දෙතෙත් බර කරගෙන උන්නාය. මුතුගේ නැන්ඩ බැගයේ තිබූ ජංගම දුරකථනය නාද වූයේ එවිටම වාගේය. ඇමතුම් පැමිණ තිබුණේ පුරුදු අංකයකින් නොවේ... මුතු කෙල්ලව තුරුලේ තියාගෙනම දුරකථනය කණේ තබා ගත්තාය.

"හ..ලෝ..."

"මුතු ම..ම.. කාංචන..."

කෙල්ලගේ සර්වාංගයම ඇවිලිණ. මේ කතා කරන්නේ ඔහු ඔව දන්නවා නම් ඇමතුම් ගන්නේ නැත.

"කියන්..න..."

"කොහෙද ඉන්නේ..."

"මං.. මේ.. අ..ක්කලා එක්ක පන්සල් ආවා..."

"කීයටද එන්නේ..."

එහෙම අහද්දී මුතුගේ ලේ රත් වෙන්නට විය.

"අද එන්නෑ..."

ඇය ඒ ආ කේන්තියෙන්ම කීවාය.

"අද එන්නෑ... ඇයි..."

"ඉතින් එන්නෑ කියන්නේ එන්නෑ කියන එකට... අපි නවතිනවා..."

"කොහෙද ඉන්නේ..."

"අනුරාධපුරේ..."

කෙල්ල කටට ආ දේ කීවාය. කාංචනගේ හැටි ඇය දනී.

Freesanitalks.com

මේ කතා කරන්නේ කවුදැයි මධුවන්තට සිතා ගැනීම අපහසු නැත. මඟුන් සමඟ කෙල්ලු කතා කරන්නෙ කොතරම් අප්‍රසාදයකින්දැයි මධුවන්ත තේරුම් ගන්නේය.

"කාත් එක්කද ළිඳු ඔය ඉන්නේ..."

"මං කිව්වනේ... මගේ අක්කයි අයියයි එක්ක..."

"අන්කල්ලෙක්නවද මේ ගමන..."

"කේරම කියන්න... කාම දන්නෑ..."

"කවදද එන්නේ..."

"කියන්න බෑ... දවස් දෙක තුනක් ඉන්නවා..."

"ආ... එහෙනම් මේ ට්‍රිප් එකක් ගිහින් තියෙන්නේ..."

"ඔව් ඇයි..."

"මොකක්ද ඉන්න නෝට්ලේ... මං යේ ගන්නම්... මට බලන්න කියල ඇන්ටියි අන්කලුයි ගියේ..."

"අක්කා ඉන්නවනේ... එයානේ අවුරුදු විසි තුනක් මාව බලාගන්නේ..."

මධුවන්තට වාහනයේ ඉන්නට බැරි තරම්ය. එහෙන් ඇයව දමා පිටත යා නොහැක.

"මේ ඉන්නේ පන්සලේ... මං කියනවා..."

"නරි මං යේට ගන්නම්..."

ළුතු එහෙමම ජංගම දූරකථනය ක්‍රියා විරහිත කළාය. ළුළු දවසක සුන්දර සැහැල්ලුව ඔහු විනාශ කළා යැයි ළුතුට සිතුණි. "එයත් ඔක්කොම අහන් හිටියා... මාත් එයාගේ වයින් වගේ නපුරු ගෑණියෙක් කියලා හිතනවා ඇති..." ළුතු සිතුවාය.

මධුවන්තට මොනවා හෝ කිව යුතු යැයි හැඟුණද ඒ කුමක්දැයි

මතුට නේරෙන්නේ නැත. ඇය ඉන්නේ ෂේන්සියෙනි, දුකෙනි.

නිමල්ගේ ප්‍රියමන්නන් ආරෝ පැය බාගයකට පමණ පසුය. වාහනයට ගොඩ වෙද්දීම නිමල් කෙල්ලගේ ඇස්වල දිලී අඹුන්න දැක්කාය. "ළුහ් මොනාවා හරි කතා වෙලාද... ළිඳ එච්චර හොඳ නෑ..."

"ඔක්කොටම ඇදුම ඇදුම ගන්නා... ගිහින් බලමු..."

නිමල් කීවාය. ළුතුගේ ඇස් බරය.

"අ..ක්..ෂක්..."

ඇය කතා කළේ වාහනයේ අදිද්දීය.

"ළුටි..."

"දැ..හ් මේ කාංචන කතා කළා..."

"ඉතින්..."

"කොහෙද ඉන්නේ කියලා ඇහුවා... පන්සල් ගියා කිව්වම ඔයිබෝස් එකෙන් අරව මෙවා අහන්න ගත්තා... මං කිව්වා ඉන්නේ අනුරාධපුරේ අද එන්නෑ කියලා..."

නිමල්ට හීල්ලින.

"එහෙනම් අම්මටයි තාත්තටයි ගිනි ගෙඩිය දෙයි..."

"මං එයාට කිව්වා කේරම ළුළුවන් නම් කියන්න කියලා... එයාට බලාගන්න කියලනු ගියේ..."

"ළු.."

"මං කිව්වා අවුරුදු විසි තුනක් මාව බලාගන්න අක්කා ගාව ඉන්නේ කියලා..."

කෙල්ල ෂේන්සියටත් එක්ක කාංචනට සියල්ල කියන්නට ඇත.

"කමක් නෑ... ඒ ට්‍රක්නේ කොළඹ ගියාම බලමුකෝ ළුටි... දැන්

Elegant lks.com

ඔය ෆෝන් එක ඕෆ් කරලා සකුරින් ඉඳපං..."

"ම.. මං ඕෆ් කළා..."

මුතු අසරණව කිව්වා.

"වූරි..."

කතා කළේ ප්‍රියමන්තය.

"අයියේ..."

"මයා ඉන්නේ ටිකක් අමාරු තත්වෙක... හිතන තරම් ලේසියෙන් ඔය මැරේජ් එකෙන් පැනලා යන්න බෑ..."

"මං දැන්..නවා අයියේ..."

මධුවන්ත මේ කතාබහට සම්බන්ධ වූයේ නැත. ඇය දුක් විඳින බව පමණක් ඔහුට සිතෙයි. "එයා එහෙම දුක් විඳින්නෝන කෙල්ලෙක් නෙමේ..."

"අයියලා මේවා හිතන්නෙපා... මේවට පැටලෙන්නත් එපා... මං මොකක් හරි හිතන්නම්..."

"පැටලෙන්න නෙමේ වූරි ඇවිල්ලෙන්න උනත් මං ලැස්තියි... උඹයි මල්ලියි විතරයි මට ඉන්නේ... එකෙක් දුක් විඳිනවා මං ඇස දෙකින්ම දැක්කා... ඔයා දුක් විඳිනවා බලන් ඉන්න මං ආස නෑ..."

"කවි..දන්නේ ඔයාට මෙච්චරෙන් ඒ..ක..."

මුතු අඬමින් කිව්වා. මධුවන්තට ඇය දෙස බැලුවේ ඉමෝට්මය. ඇය දිහාවද තුරුළු කරගෙන අඬද්දී ඔහුට පුදුමාකාර වේදනාවක් දැනෙයි.

"ඇන් ඔය කතාව ඇති දියා..."

නිමේ කියවී කෙල්ල දිහාවම අඬාඩී යැයි බියෙනි. වාසනය කියසට එද්දී අවස් පහුවී තිබුණි. අද තුවරට තුනී සීතලක් ඇති ද

යකි. නිමේත් ප්‍රියමන්තත් බැස ගිය පසු මධුවන්ත ඇය ළඟට ආවේය.

"මං.. දැ..වාට කැ..ව්..ත්..නැ..මි තැංගී..."

මඳ කීවේ ඇය දුකින් ඉන්නා නිසාය.

"ම..ට ගෙ..නැ..ත් දෙ..ත්..න... කැ..විත්ත දෙයක්..."

ඇය කීවේ තෙමී ගිය දෙතුවත් කිමට බර කරගෙනය.

"අ..ර හද හාමි පැටියෝ... මෝඩි තේ... කුක්කිව් දොයිමතැ... මි..."

මධුවන්ත දොරකඩදී හැරී බැලුවේය. නිමේ ඒ මොහොතේ දොරකඩය.

"තැංගී ප..ව් අක්..කේ... ර..හස පොලීසියෙන් වගේ ප්‍රශ්න අහගෙන ගියේ... එයා තනිවෙලා..."

"මල්ලිත් අහගෙනද..."

"මි..."

"මෙත් හරි දුකයි..."

නිමේ මූල්ලා මෙත් කීවාය. ඇය පරිස්සමින් මධුවන්තගේ දෑස දෙස බැලුවාය. ඒ ඇස්වලද මොනවාද දෙයක් දිලිසෙයි...

"ආ.. උඹත් කුස්සියෙද..."

මධුවන්ත රවීව ඇක ඇසුවේය.

"අම්මා එක්ක කයියක් දාන් හිටියා මචං..."

"අපට රෑට ගොඩක් එපා අම්මේ... අම්මට මහන්සියි..."

"මේක මොකක්ද පුතේ... දුට කවන්න දෙයක්ද බැලුවේ..."

"ඔ..වී අම්මේ..."

"පැරිට්ට රෑට හිටවූ කවන්නෙපා බඩේ අමාරු එයි... මං සුදු

Elegantlk.com

බත් ටිකක් තිබ්බා... මේ අල හොදියි මාළුයි එක්ක කවමු..."

"මේකා මොනාද අම්මේ කියන්නේ..."

මධුවන්ත ඇසුවේ රවී දෙසද බලාය.

"සිංගප්පූරුවෙත් ඉඳලා ඇතිවෙලා කියන්නේ... යතවතම අපටත් එන්නවු..."

"අම්මලට එහේ ඉන්න අමාරුයි..."

"අපිටත් අමාරු එකේ නේද මධූ..."

"ආ පුතේ... ඉක්මනට කවන්න..."

අම්මා බත් ටික බෙදා දුන්නාය. මධුවන්ත එය ගෙන මිදුලට ආවේ දුවගෙන මෙනි. තව ටිකක් ප්‍රමාද වූ පසු කෙල්ලට කවතබා බොරුය.

"නිදිමතෙත් වගේද නංගී..."

"ම්..."

ඇය පිඟාන අතට ගනිමින් භූමිටි තැබුවාය.

12

කට්ටියම එළියේ පුටු වටේ තබාගෙන කතාවට වැටුණෝය. මිදුලට වැටී තිබූ එකම එළිය හඳ පාන පමණි. මිදුලේ ඉඳගත් විට සෑහෙන ඇතක් යනතෙක් යාය පෙනෙයි... ඇත කදු ඉහත්තාවල දැල්වූ විදුලි පහන්වල එළි දිස්වන්නේ සුන්දර ලෙසිනි.

තරමක සීතලක් තිබුණි. නුවර මේ සීතල ගතට සුවදායකය. එය නුවරඑළියේදී දැනෙන තරම් කටුක කටු අනින සීතලක් නොවේ.

තවමත් මුතුත් මධුවන්තත් මිදුලට ආවේ නැත. මුතු උන්නේ දුවව නිදි කරවමිනි. ඒ නිසාම මධුවන්තට අතනට යන්නට හිතක් තොවීය. අද දුවාගේ හැම වැඩක්ම බලා කළේ ඇයය. දැන් කාමරයට ඒ ඇයව නිදි කරවන්නේද ඇයමය.

Elegantalks.com

"ම්.. ම්... ම්... ම්... ම්..."

මොකක්දෝ ගීතයක තාලයට ඇය මුමුණයි. ඒ තාලයට එතනට වී දැස පියාගෙන ඉන්නට මධුවන්තටත් සිතෙයි.

මධුවන්ත කුස්සියට ගියේ අතරමං වූ ලෙසිනි.

"දුව නිදිද පුතේ..."

"නංගි නිදි කරනවා අම්මේ..."

"අම්මා වගේ දරුවගේ වැඩ කරන්නේ නේද..."

"ඒකනේ අම්මේ..."

මධුවන්ත කීවේ නෙත් බර කරගෙනය.

"මේ කට්ලට් අම්මේ එළියට ගෙනියන්නද..."

"අනේ ඔව් පුතේ... මේ පිට්ටු ටික ලිපේ... මං ගෙනියන්න හිටියේ..."

"මං ගිහින් දෙන්නම්..."

මධුවන්ත කුස්සියෙන් ගියේ පුංචි පිරිසියක්ද රැගෙනය. ඔහු කට්ලට් තුනක් පමණ පුංචි පිරිසියට දමා එයට සෝස් ටිකක් දැම්මේය. ඔහු ඒ පිරිසියද ගෙන කාමරයට එබුණේය. මද අඳුරේ දුවාව නිදි කරවමින් උන් මුතු දෙනෙත් එසවූයේ යංතමටය.

"නි..දි..ද නංගී..."

"ම්..."

"මං නංගිට කට්ලට් තුනක් ගෙනාවා... කොකාකෝලා එකකුත් අරන් එන්නම්..."

ඔහු කට්ලට් පිරිසිය ඇගේ අතටම දුන්නේය. මුතු කාමරයෙන් පිටවෙන මධුවන්ත දෙස බලා උන්නේ කැවෙන දෙනෙතිනි.

"කෝ වූට් මල්ලි..."

"දුව එක්ක අක්කේ... දැනුයි දුවා නිදාගත්තේ..."

මධුවන්ත කට්ලට් පිඟාන කුඩා ටීපෝව මතින් තැබුවෝය.

"ඉඳගනිං මධූ..."

"මං නංගිට කොකා කෝලා ටිකක් දීලා එන්නම්..."

මධුවන්ත වීදුරුවක් ගෙන කොකා කෝලා ටිකක් දමා ගත්තේය.

"අවුරුදු තුන හතරක් සිංගප්පූරුවේ හිටියා අයියේ... මධු බොනවා දැක්කේ එක දවසයි..."

රවී කීවේය.

"ඒකත් හාෂි නිසා..."

"මල්ලි තාම පොඩියි... එහෙම බොන්නෝන නෑ..."

"මධූට බොන්නත් බෑ..."

මධුවන්ත සිනාසුණා පමණි.

"අක්කටත් කෝක් ටිකක් දැම්මා..."

තුන්දෙනාම බලන් ඉන්නේ මධුවන්ත යන දෙසය.

"හාෂි කවදහරි මේ කොල්ලගේ කකුල් දෙක ළඟ වැඳ වැඳ අඬයි අක්කේ... මං අද කිව්වා කියලා හිතාගන්න... ඔය එයාව තියන් ඉන්න ඉන්දියන් කාරයා මෙයාව පාරට දාන්නේ කකුලෙන් ගහලා... තව අලුත් ඉන්දියන් කෙල්ලෙක් ආව ගමන් උෆට හාෂිව එපාම වෙනවා..."

රවී කීවේ නිම්මි දෙස බලාගෙනය.

"එයා මල්ලිගෙයි කෙල්ලගෙයි ජීවිතේට ආයේ එන්නෙම නැත්නම් හොඳයි රවී මල්ලි..."

"මධූ මහ පුදුම කොල්ලෙක්... එයාර් පෝට් එකේදිත් මේ ගැණිගෙන් ඇහුවා මං දැන් නවතින්නම් මේවා අමතක කරලා ජීවත් වෙමුද කියලා... මේකි කට ඇරියේ නෑ..."

Elegantkar.com

"මල්ලී ලොකු පවක් කරලා ඇති..."

"ඒත් මධූ නැගිටියි අයියේ... මට ඒක හිතෙනවා..."

රවී කීවේය... නිම්මිත් ප්‍රියමන්තත් හිස වැනුවේ තරමක සැනසීමකිනි.

මධුවන්ත යද්දී මුතු උන්නේ ඇඳ මත දෑත් දෙපා විහිදාගෙන නිදා උන් කෙල්ලට ලස්සනට ඇඳේ තබා පොරවා දෙපැත්තෙත් කොට්ට දෙකක්ද තබා ඇඳ මත ඉඳගෙනය.

ඇය කාමරයේ ඇරුණු බිත්තියෙන් නුවර අහස දෙස බලාගත්වනම උන්නාය. අර කොළඹ ගෙදර කාමරයේදී නොදැනුණු සැනසීමක් මේ කාමරයේදී දැනෙන්නේ කොහොමදැයි ඇය සිතුවාය.

කාමරයට ඇතුල් වූ මධුවන්තගේ දෑසට කෙළින්ම ලක් වූයේ මුතුගේ මුහුණය. මුතු දෑස් එහෙට මෙහෙට කර ඔහුගෙන් දෑස් වසා කර ගත්තාය.

"න..ංගී..."

ඔහු ළඟටම ආ බව මුතු දනී. පපුව පිපිරෙන්නට ආසන්න වූවාක් මෙනි. මේ අඩ අඳුරේ ඔහුව මෙහෙමම වැළඳ ගන්නට සිතෙනා තරම්ය.

"මං දු..වා ළඟ ඉන්නම්... නංගී ඕනනම් එළියට ය..න්..න..."

"මං... ඉ..න්..න..ම්..."

කෙල්ලට කියවුණේ උගුරෙන් මෙනි.

"මං කෝක් එකක් ගෙනාවා..."

එය ගෙනාපු එක හොඳය. ඒ තරමටම පිපාසය. උගුර කට වියලී ගොස් ඇත. මධුවන්තගේ අත ඇගේ හිස මතට ආවේ පුදුමාකාර ලෙසිනි. කෙල්ලගේ හිසම හිරි වැටිණි.

"මං දන්නවා දුකෙන් ඉ..න්නේ කියලා... කරන්න පුළුවන් දෙයක් තියේනම් කියන්න... මං.. ක..ර..න්..න..ම්..."

ඒ ටික ඔහුගේ මුවින් පිටවූයේ පුදුමාකාර දයාබර බවකිනි. මුතුගේ

දෙනෙත් එහෙමම තෙත් වීගෙන ගියේය. ඒ දෑසින් කඳුළු කැට දෙකක් පැන්නේ මධුවන්ත ඒ හිසින් සුරත ගනිද්දීම වාගේය.

මුතුගේ අත එසවිණි. එහෙත් ඉහළට එසවුණු සුරත හිරි වැටීගෙන මෙන් ගොස් යළිත් පහළට වැටිණ. "අ..නේ මධුවන්ත අයියේ මෙ..තනට වෙලා ටි..ක..ක් ඉන්න" එසේ කෑ ගසා කියන්නට හිතෙනා තරම් ආවේගයක් කෙල්ලගේ පපුවෙන් පැන ආවේය.

මධුවන්ත ගිය පසු මුතු තුනී අඳුරක් තිබූ කාමරයේ ඇඳ මත ඇලවී මොහොතක් දෑස් පියාගෙන උන්නාය. මේ ජීවිතය නම්... මේ අද දවස ජීවිතයේ සදාකාලික ඇත්ත නම්... ජීවිතය කොතරම් රසබරද... මේ පුංචි කාමර කැල්ලේ මේ පුංචි ඇඳේ ඉඳිද්දී මේ තරම් සැනසීමක් දැනෙන්නේ කෙසේද...

මුතු ඔහු ගෙනවිත් දුන් කට්ලට් පීරිසියෙන් කට්ලට් එකක් ගෙන මුව තබාගත්තාය. කොළඹදී කන කට්ලට් මෙන් නොවේ... ඒ කට්ලට් එකෙන් ආවේ කට දන ගම්මිරිස් රසක් සමඟ මුසුවූ පුදුම රසයකි. කට්ලට් එක තවමත් උණුය. මුතු ඔහු ගෙනවිත් තැබූ සීතල කොකා කෝලා වීදුරුව ගෙන ඉන් බාගයක්ම බීගෙන බීගෙන ගියේය. කට්ලටුත් කෝකා කෝලාත් මේ තරම් රස බව දන්නේ අදය.

කෙල්ල සනීපෙට නිදිය. මුතු ඇගේ චූටි තට්ටම් අතගෑවේ ආශාවෙනි. මේ ලේ කැටියාව දමා ඇය ගියා කියා සිතද්දීත් පුදුමය.

ජීවිතයේ බාල දේවල් වලින් මත් වූ විට එහෙමය. ඒ කාලයට කරනා කියනා දේවල් පවා දන්නේ නැත... අවසානයට ඒ වියරුවෙන් තනිවූයේ මේ තාත්තාත් දුවත්ය. මුතුට පුදුම ඒ තාත්තාත් දුවත් පස්සේ යන මේ අසරණ හිත ගැනය.

ලෝකයේ කොහේවත් නැති සැනසීමක් ඒ දෙන්නා ළඟ ඇතැයි මුතුට සිතෙයි... ඒ සැනසීම ඇය ඇත්තටම වින්දේ අදය...

මුතු නිදාගෙන උන් කෙල්ලගේ තුන් පැත්තෙන්ම කොට්ට තබා නැගිට්ටාය. හායි ගා ඇරුණු ගඩොල් බිත්ති නිසා එහා පැත්තට ගියද වෙනසක් නැත. මුතු ඒ කාමරයට එහා පැත්තේ වූ කුස්සියට ගියේ රවීගේ අම්මා සමඟ ටිකක් කතා කරන්නටය.

"මේ පිරිසියට වෙනම ටිකක් දාන්න අම්මේ... නංගිට දීගෙනම යන්න..."

කුස්සියේ ඔහු ඉන්නා බව මුතුට ඇසෙයි. දැන් ටික්කට පෙර කට්ලට් ගෙනවිත් දුන් ඔහු දැන් ගෙනවිත් දෙන්නට යන්නේ මොනවාද...

"පුතාට තිබ්බේ ඒ දුව වගේ ළමයෙක්ව බඳින්නනේ..."

රවීගේ අම්මා කියද්දී මුතු පපුවට අතක් තබාගෙන බිත්තියට බර වූවාය.

"එයා ගැන ඉස්සරත් හිතුවා අම්මේ... ඒත් එයාව කවදාවත් මට දෙන්නෑ..."

මධුවන්ත රවීගේ අම්මාට කියද්දී මුතුගේ පපුව හිර විය. ඇගේ පපුව කඩාගෙන මෙන් ගියේය. "අනේ දෙයියනේ ඔයා මේ මොනවද කියන්නේ..." මුතු කාමරයට දිව්වේ ඉකියක් මෙන් ඇඬුමක් පපුව ගස්සාගෙන මෙන් උඩට ආ නිසාය.

කාමරයට එද්දී ඇගේ ඇස්වල කඩා හැලෙන කඳුළු පොකුරක් විය... "දෙයියනේ ඉස්සර ඔයත් මං වගේ හිතුවද... ඇයි දෙයියනේ සිංගප්පූරු යන්න කලින් කිව්වේ නැත්තේ... කවුරු නොදුන්නත් මං දුප්පත් ඔයා එක්ක යන්න එනවනේ..." මුතු ඇස් මිරිකමින් මෙන් සිතුවාය.

"නං..ගී..."

ඔහු කාමරයේ දොරකඩ සිට කතා කරද්දී මුතු වේගයෙන් මුහුණ පිසදා ගත්තාය. කුස්සියේ වූ කතාව ඇය අසා උන් බව මධුවන්ත දන්නේ නැත. එහෙත් ඔහු මේ මොහොතේ ඇය දෙස බැලුවේ අර කතාව නිසා අලුත් වූ පපුවෙනි. ඒ ලෝබකමිනි.

"මේ බැදපු පොඩි මාළු නංගී... කන්නේ බලාගෙන... කටු තියෙනවා..."

මුතු නෙත් බර කරගෙන හිස වැනුවාය.

"තව කොකා කෝලා ටිකක් ගේන්නද..."

එයටද කෙල්ල හිස වැනුවාය. තුනී අන්ධකාරය නිසා ඒ තෙත් වූ ඇස් මධුවන්ත දැක්කේ නැත.

ඔහු ගිය පසු මුතු ඇඬුම් වාවාගෙන මෙන් නිදා උන් දුවගේ හිස පිරිමැද්දාය.

"ඔයාගේ තාත්තිව මට ලැබුණේ නැනේ... තාත්තිත් දිදී ගැන හිතුවලු... ඉතින් කියන්නෙපැයි නේද මැණික... ආවාම බලාගෙන ඉන්නවා... ඔයාගේ තාත්ති එහෙම බලා ඉඳිද්දී මාත් එයාට හරි ආදරේ උ..නා..."

දෛවය මේ කළේ මොනවාදැයි මුතු සිතුවාය. ගෙවුණු අවුරුදු තුන හතරට ජීවිතය එහෙමම කණපිට පෙරළිණි. අද ඔහු මේ දුවත් සමඟ මේ ජීවිතයේ තනි වී ඇත... තමා අවාසනාවන්ත කසාදයක් පාමුළට දක්කාගෙන ගොස් ඇත...

"ඔයාගේ තාත්තිට තාම මං ආදරෙයි... ගොඩාක් ආදරෙයි... ඒත් මං දැන් හරි අසරණයි... ඔයාගේ තාත්ති ගැන මං හොඳට දන්නවා... අපි එකතු උනොත් එයා මට හරි ආදරේ වෙයි... තාත්තිටයි මටයි ඔයාටයි හරි සතුටින් ජීවත් වෙන්න පුළුවන් වෙයි... ඒත් ඒ තීරණේ මං ගන්නේ කොහොමද... එහෙම තීරණයක් අරන් ඔයාවයි තාත්තිවයි තවත් අසරණ කරන්න මට බැහැ... එයා හරි අමාරුවෙන් ඔයාවත් හදාගෙන ජීවිතේට මූණ දෙන්න යන්නේ..."

නිම්මි කෙල්ලට කොකා කෝලාද ගෙන කාමරයට ආවේ එවිටය. මුතුගේ ඇස්වලට ළං වූ නිම්මි ඒ ඇස්වල වූ තෙතමනය දැක්කාය.

"අ..නේ අ..ක්..කේ..."

මුතු නිම්මිව වැළඳගෙන ඇඬුවේ බලාපොරොත්තු නොවූ ලෙසිනි. නිම්මි කෙල්ලගේ හිස අතගාමින් සිතුවේ මේ ඇයි කියාය.

"ඇ..යි වූ..ටි... ඇයි මේ..."

"අපට මෙහෙම වුණේ ඇයි අක්කේ..."

"කාටද... මොකාද උනේ..."

"ම..ටයි එයාටයි..."

"කිව්වේ චූටී... මට තේරෙන්නෑ... මොනාද උනේ..."

නිම්මි ඇගේ උරහිසයෙන් කෙල්ලව මුදාගෙන ඇසුවාය.

"ඇයි චූටී..."

"දුවව නියලා මං කුස්සිය පැත්තට ගියා... රවී අයියගේ අම්මා එක්ක ටිකක් කතා කරන්න..."

"ම්..."

"එනකොට..."

ඒ ඇතිවූ කතා බහ මුතු නිම්මිට කීවාය. නිම්මි කෙල්ල දෙස බලා උන්නේ පුදුමයෙන් මෙනි.

"ම..ල්ලී එ..හෙම කිව්වා..."

"ම්.. ම..ටත් හ..රි පුදුමයි..."

"ඒකට ඒ දවස්වල කියන්න බය හිතෙන්න ඇති... මගෙයි අයියගෙයි ප්‍රශ්නත් දන්නවනේ..."

"නොකියා ගිහින් එයා කරගත්ත දේ දැන් පේනවනේ..." මුතු ඔහුට බණින්නේ දුකටය.

"ජීවිතේ හැටි එහෙමයි චූටී... අපි පපන දේවල්ම වෙන්නෑ.. ඒත් උඹලා දෙන්නා පව්... ඒ ද..වස්වල එ..ක..තු උනානම් අද..."

"මං එයා එක්ක ගිහින් අක්කේ..."

"මං දන්..නවා... මං වෙලාවක අහන්නම්..."

"දැ..න් එපා අක්කේ... එයාව අවුල් කරන්නෙපා..."

"උඹ මෙහෙම කරනකොට ඒකා අවුල් වෙන්නෑ කියලද හිතන්නේ..." නිම්මි කීවේ සිතෙනි.

"මොකා කියන්නද කියලා මට තේරෙන්නෑ..."

"ම..ට..ත් තේරෙන්නෑ අක්කේ..."

"ම්.. යං එළියට... කෙල්ල ඇහැරෙන එකක් නෑ..."

"එ..ය..ත් බොරු..ව..ද..."

මුතු ඇසුවේ මුහුණ පිසදමමිනි.

"නෑ නෑ... උඹ බොන්නෑ... අයියයි රවීයි බොන්නේ..."

මුතු එළියට ආවේ මුහුණ පිසදාගෙන පුයර චුට්ටකුත් දාගෙනය. එහෙත් ඒ ඇස් ඇඳූ බව බලන කෙනෙක්ට පෙනෙයි.

"කට්ලට් එකක් කන්න නංගී..."

රවී කීවේය.

"මං කෑවා අයියේ..."

"වෙලාවක අක්කේ අපි ඔක්කොම යං සිංගප්පූ... ගිහින් අපේ අපාට්මන්ට් එකේ සතියක් විතර ඉඳලා එමු..."

පුදුමයකට මෙන් මුතුගේ දෙනෙත් හැරවුණේ මධුවන්ත දෙසටය.

"අක්කයි අයියයි නංගියි එහේ ආපු වෙලාවක බලලා ඔක්කොම කරලා දීපන් මචං..."

"ඇයි උඹ..."

"ඒ රටට මං ආයෙත් යන්නෑ මචං..."

මධුවන්ත කීවේය. මුතු දෙනෙත් බර කරගෙන සැනසුම් සුසුමක් හෙළුවාය. "යන්න එහේ ඔයාගේ කවුරුවත් නැනේ..." ඇය කීවේ සිතෙනි.

"කාලෙක ජීවිත පෙරළෙයි මධූ... නාෂිට අඩාගෙන කට්ටනායකින් බහින්න වෙයි... එදාට උඹ මේ දුවවත් අතින් අල්ලගෙන ලස්සන

Elegantta.com

නෝනා කෙනෙකුත් එක්ක කටුනායකින් සිංගප්පූ යන්න නංගි... නැද්ද අයියේ..."

ප්‍රියමන්ත හිස වැනුවේය.

"මල්ලී මෙහෙම ඉඳපුදෙන් රවී මල්ලී... ආයෙත් ඔය රටවලට යන්නෝන නෑ..."

"රවී අයියා කියපු කතාවත් නරකම නෑ..." මුතු ඇත අහස දෙස බලාගෙන සිතුවාය.

"නංගිගේ වෙඩින් එකට එහෙන් මොනා හරි ගෙනත් ඕනෙද... ඕනෙනම් කියන්න මං ගෙනත් දෙන්නම්..."

කෙල්ලට දුක හිතුණ බව නිම්මි දනී. මධුවන්තත් දනී. කරබාගෙන උන්නේ ඒකය.

"මං බදි..න්..නෑ අයියේ..."

මුතු නෙත් ඔසවන්නේ නැතුවම කීවාය. එහෙමම ඇගේ දෑස් තෙමී ගියේය... මොහොතක් කඳුළු හිර කරගෙන මෙන් උන් ඇය ඒවා පිට පනිද්දීම නැගිට්ටාය.

"දු..ව ඇහැරුණා ව..ගේ..."

කෙල්ල ගෙට දිව්වේ එහෙම කියාගෙනය. කට්ටියම මුහුණට මුහුණ බලාගත්තේ පුදුමයෙනි.

"ඇ..යි අක්කේ..."

"රවී මල්ලිට කිව්වට කමක් නෑ... නංගී ඒ මැරේජ් එකට හරි අකමැත්තෙන් ඉන්නේ... නංගිට ප්‍රොපෝස් කරලා තියෙන්නේ කෙල්ලට කොහෙත්ම ගැළපෙන්නේ නැති කෙනෙක්ව..."

රවී නිම්මි දෙස බලා මොනවද සිතුවේය. ඊටත් පසු දිග සුසුමක් හෙළුවේය.

"ගැළපෙන්නේ නැති අය එකතු වෙන එක තරම් දුකක් නවත් නෑ අක්කේ... මං ඒ දුක ඇස් දෙකින් දැක්කා..."

රවී කීවේ මධුවන්ත දෙස බලාය.

"ගැළපෙන අය වෙන්වෙලා ඉන්න එකත් ඒ තරම්ම දුකක්... බලන් ඉන්න අපටත් දුකක්..."

ඒ කවුදැයි රවී කීවේ නැත. එහෙත් රවී එහෙම කිව්වේ කා ගැන සිතාදැයි ඇය දනී.

"චූටිට කොහොමත් මේ ප්‍රශ්නේ බාරගන්නම වෙයි... අපට කෙල්ලව හොයා ගන්නවත් නැති වෙයි..."

ප්‍රියමන්ත කීවේ සෑහෙන වෙලාවකට පසුය.

"මටත් බය ඒකයි... ඔය හිටියට ඉන්නේ හරි ගින්දරේ..."

"මු..තුට අ..ක්..කේ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියද..."

නිම්මි මොහොතක් බිම බලාගෙන උන්නාය.

"නෑ.. ම..ල්ලී... ඒත් කෙල්ලන්ගේ හිත් කවුද දන්නේ... කාට ආදරේ කරනවද... මොනා හිතේ තියාගෙන ඉන්නවද කියලා..."

නිම්මි හූල්ලමින් මෙන් බැලුවේ මධුවන්ත දෙසය. ඔහු අසරණව බලා උන්නේය.

Piyanta.com

13

රෑ රවී කට්ටියට පුළු පුළුවන් හැටියට නිදාගන්නට ලෑස්ති කළේය. ඉස්සරහ කාමරයේ පුංචි ඇඳවල් දෙකම එකතු කර රවී එහි ප්‍රියමන්තටත් නිම්මිටත් මුතුටත් නිදා ගන්නට ලෑස්ති කළේය.

මුතු ඇය ළඟම දුවාව තබා ගත්තාය. කෙල්ල උණුසුමට ආසය.

"අයියා උඹට ඉඩ මදි වගේද..."

රවී ඇසුවේය. මධුවන්ත රවීගේ අම්මාගෙන් අලුත් කොට්ටයක් ඉල්ලාගෙන විත් මුතුට දුන්නේය.

"රෑට බිමට යන්න වෙයි වගේ මචං... මොනා කරන්නද වැට්ලා හිටියොත් අහුලලා තියපං..."

ප්‍රියමන්ත කියද්දී නිම්මි ඔහුට ගැසුවාය. මුතු උන්නේද සිනාසෙමිනි. මේ අත්දැකීම් සුන්දරය.

"දුව නිසා නංගිට හැරෙන්නවත් බෑ... මං ගත්නද නංගී..."

කෙල්ල ගත්තොත් පාඩුය.

"එ..හෙම ඉඳපුදෙන්..."

"පැලෙන්න ලව්... වචනයක් මූණ බලලා කතා කරන්නෑ... මේකිට පිස්සු..." නිම්මි ඇගේ වතට ඇන සිතින් කීවාය.

"එහෙනම් හඳ එළියේ හුළං වැදි වැදී නිදාගන්න... ජනේලේ පලු නෑ කියලා බයවෙන්නෙපා නංගී... හොරු එන්නෑ..."

රවී කීවේය.

"එ..හෙම සනීපයි අයියේ..."

"මොනාහරි ඕනනම් එහෙම කතා කරපං අයියේ..."

"මල්ලී කොහෙද නිදාගන්නේ..."

"මායි රවීයි සාලේ බිම නිදාගන්නවා අක්කේ..."

"අපට බිම නිදාගෙන පුරුදුයි අක්කේ... මධුයි මායි එයාර් පෝට් එකේ ඕන තරම් බිම නිදාගෙන ඇති..."

මධුවන්ත කාමරයෙන් ගියේ දුවත් මුතුත් දෙස තවත් වරක් බලාය.

"අද කොල්ලට පාඩු ඇති... දුව උඹ අරගෙනනේ..."

නිම්මි පොරවනය යට ගුලිවෙමින් කීවාය.

"හෝ..ක් නේ... බෝලේ වගේ නිදි..."

"ප්‍රියා..."

"ම්..."

"අපිටත් ඉස්සෙල්ලා දුවෙක්ම ලැබුණොත් හොඳයි නේද..."

Elegantaks.com

"මේකි වගේද..."

ප්‍රියමන්ත නිම්මිගේ වතට උඩින් හිස දමා කෙල්ලව අතගා ඇසුවේය.

"දුවලා නමා ෂෝක්..."

"මල්ලිමයි නේ..ද..."

නිම්මි ලෝඛකමින් කිවාය. "එයාම තමා... අරයා වගේ උනාතම කැනට ඉඳී..." මුතු සිතුවේ කේන්තියෙනි.

"මල්ලි පොඩි කාලෙත් මේ මූණම තමා... හරි අහිංසකයි..."

"අයියේ..."

"හූවි..."

"එ..යා.. එ..හෙ..දි මැ..රි ක..ර..න..කොං..ට ඇ..යි ගියේවත් නැ..ත්..තේ..."

නිම්මිද ප්‍රියමන්ත දෙස බැලුවාය.

"මැරි කරලා එනවා කිව්වනේ නංගී... ඒත් ආවේ කොල්ලා මේ කෙල්ලත් එක්ක..."

"එයාව නොඳැක්ක එකම හොඳයි..."

"ඒක මල්ලිගේ නරකම කාලයක්... මොනවද මොනවද උනා... ඉවරයි..."

මුතු කිසිවක් නොකියා කෙල්ලගේ මුහුණ ඇඟිලි තුඩු වලින් පිරිමැද්දාය. එහෙමම ඇය සැහෙන වෙලාවක් කළාය.

"ෂැ..ක්..කේ..."

නිම්මිට නින්ද ගොස්ය. ඇය ප්‍රියමන්තගේ ඇඟට අතක්ද දමාගෙන සැපට නිදිය.

"අ..ක්..කේ... අයියේ..."

නැත දෙන්නාම තද නින්දේය. මුතුට හිල්ලින. නින්ද අහලකවත් නැත. "ඔයාවත් නැගිටලා හිටියනම් අපට හද බල බල ඉන්න තිබ්බා..." මුතුම කෙල්ලට කිවාය.

* * * * * * * * * * * *

රවීටද වැටුණු හැටියේ නින්ද ගියේය. මධුවන්තට කොහොමත් අද නිදිමතක් නැත. ඇරත් දුව නැතුව කොහොමත් නින්ද යන්නේ නැත. කෙල්ල ඇය ළඟ නිසා ඔහුගේ හිතට බරක්ද නැත.

රවීගේ අම්මා තනිවම කුස්සිය අස් කරමින් උන්නාය. අම්මලා එහෙමය. මධුවන්තට ඇය ගැන ඇත්තටම දුක සිතුණි.

"අම්මා නාම වැඩනේ... පාන්දර ඉඳලා වැඩ..."

"හැමදාම මෙහෙම නැනේ පුතේ... වෙන දවස්වලට හයේ ඉඳලා පාඑයි... පොඩි පුතාටයි මටයි කතා කරන්න දේකුත් නෑ... ඉතින් වේලාසන කාලා නිදි... ගෙයක් දොරක් වුණාම මෙහෙම කලබලේට තියෙන්නෝන... පුතාට කෝපි ටිකක් හදලා දෙන්නද..."

"හිමීට බොමු අම්මේ..."

"අයියලට නිදා ගන්න ඇත්ද දන්නෑ පුතේ..."

"දැන් නිදිත් ඇති අම්මේ... සද්දයක් නෑ... දුවත් ඒ ඇදේ..."

රවීගේ අම්මා කෝපි හදන්නට ගත්තාය. මුතුත් අවදිව ඇහැයි මධුවන්තට නිකමට සිතුණි.

"කෝපි දෙකක්ම දෙන්න අම්මේ... නංගිට එහෙම ඇහැරිලා ඇති... දුවත් එක්ක ඉදිද්දී නින්ද යන්නේ පරක්කු වෙලා..."

"ඒක නම් ඇත්ත..."

"ම.. අපේ මිනිහා නම් නිදි ඇති... ඇහැරිලා හිටියොත් කියන්න

Elegantaksa

පුතේ... කෝපි හදලා තියෙන්නේ කියලා..."

"දාගෙන ගොරවනවා අම්මේ..."

මධුවන්ත කෝපි දෙකත් රැගෙන ආවේය. එළියේ සඳ එළිය එහෙමම නිවස තුළටම ගලා විත් තිබේ. මධුවන්ත කාමරයට ගියේ ඇය අවදිව ඇතැයි සිතූ සිතුවිල්ල හරිදැයි දැනගන්නට මෙනි.

යද්දී ඇය උන්නේ දුවගේ හිස අතගාමින් ඒ මුහුණ දෙසම බලාගෙන අවදිවය. ඇය අවදිව ඇතැයි තමාට සිතුණ එක පුදුම යැයි මධුවන්තට සිතුණි.

"නි..න්..ද ය..න් නැ..ද්ද නංගී..."

එකවරම ඔහු අසද්දී මුතුගේ දෑස් එසවිණි. ඔහුගේ දෑස්වල පැටලුණු දෑස් අන්ධකාරයේ පවා මුදා ගන්නට මුතුට අමාරු විය.

"එයත් එක්ක ඉන්නකොට එහෙම තමා... ටිකක් දඟලනවා..."

කෙල්ල කතා නැත. කතා කළ නොහැක. ඇගේ මුව ගොට්ට ඇත.

"ආ.. අම්මා කෝපි හදලා දුන්නා... නංගී නිදි නැතුව ඇති කියලා හිතිලා මං ඔයාටත් කෝපි එකක් ගෙනාවා..."

මද අදුරේම ඇය ළඟට ආ මධුවන්ත කෝපි එක ඇයට පෑවේය. මුතු එය ගත්තේ ඇඳ මත ඉඳගෙනය.

"බීලා නිදාගන්න... බුදු සරණයි..."

ඔහු එහෙම කියා ගියේය. මුතුට හීල්ලින. ඔහුත් තමාත් අතර ඇති දුරස්ත බව හද රිදවන තරමය. මුතු කෝපි එක තොල ගෑවේ බිත්ති කන්ඩිය ළඟට විත් රෑ අහස දෙස බලාගෙනය.

අද කොහොමත් නින්ද යන්නේ නැත. හිත ඒ තරමටම අවුල්ය. අවතැන්ය. හැම පැත්තකින්ම පෙනෙන්නේ ඔහුවය. ගිහින් ඔහුගෙන් සරණක් පිහිටක් ඉල්ලා ගන්නට හිතෙනා තරමය. එහෙත් ඔහුත් ඉන්නේ මේ ජීවිත කාන්තාරයේ තනි වීය. අසරණ වීය. එහෙම නියෙද්දී ඔහු තමාට කෙසේ පිහිට වෙන්නද...

මුතු යළින් පැමිණ දුව ළඟින් ඇලවූයේ ඇයව පපුවටම ළං කරගෙනය. එහෙම ළං කරගත් විට ඇය තවත් සුවසේ තුරුළු වෙයි. දුවලා එහෙමය. උණුසුමටම ගුලිවෙයි.

අද දුවාට දැනෙනවා ඇත්තේ වෙනස්ම උණුසුමකි. වෙනදා ඇයව තුරුල් කරගන්නේ ඔහුය. "ඔයාගේ තාත්ති පව්... ඔයාවත් හදාගෙන කොහොම ජීවත් වෙන්නද..." මුතු සිතින් දුවට කීවාය. එහෙත් මෙහෙම ඉඳ ඔහු කුමක් හෝ මාර්ගයක් පාදා ගනු ඇත. මාර්ගයක් නැත්තේ තමාටය.

* * * * * * * * * * * * *

මුතුට ඇහැරුණේ පාන්දර කෙල්ල ඇහැරී ඇගේ බඩ උඩ නගින විටය... ඇය මුතුගේ බඩ උඩ නගිමින් බසිමින් සෙල්ලමක් කරමින් උන්නාය.

"කු..ක්කි... ඇහැරුණාද... මී..."

"දි..දි කු..ක්..කු..."

මුතුගේ පපුව කඩාගෙන ගියේය. කෙල්ල පාන්දරම ඇහැරී ඇත්තේ බඩගින්නේය. ඇය එහෙමම නැගිට්ටාය.

"යං.. ඉන්න මැණික... දිදි ඇඳුමක් දාගෙන එන්නම්..."

මුතු ඇඳ උන් රෑ ඇඳුම ගලවා සරල ඇඳුමක් දා ගත්තාය. අයියාත් අක්කාත් ඇහැරෙන්නට හිතලාවත් නැතැයි මුතුට සිතුණි. දෙන්නාම තද නින්දේය.

"යං.. අපි කුක්කු හදාගෙන බොමු.. මී..."

යද්දී සාලේ නිදාගෙන උන්නේ රවී පමණි. මධුවන්ත උන්නේ නැත.

"තා..ත්..ති කෝ..."

Freetalks.com

මුතු කෙල්ලව සිප ඇසුවාය.

"නා..න්නි කුක්කු..."

කෙල්ල කියන්නේ නාත්නි කුක්කු හදන්නට ගිය බවය. කෙල්ල කීවා හරිය. මධුවන්ත උන්නේ කුස්සියේය.

"මං කිරි එක හදලා දෙන්නද පුතේ..."

"එපා අම්මේ.. ඔක කරන්නකෝ... එයාට අමුතුම විදිහකට කිරි එක ඕනේ..."

මුතු නොසිනාම කෙල්ලවත් රැගෙන කුස්සියට ගියාය.

"ආ.. මේ එන්නේ... දෙන්නම ඇහැරිලා..."

අම්මා කීවාය. මධුවන්ත හැරී බැලුවේ මුතු දෙසය.

"නංගිව පාන්දරම ඇහැරෙව්වද... එහෙම තමා... උදෙන්ම කිරි එක ඕනේ..."

දුව මධුවන්ත දෙස බලා සිනාසෙමින් යළිත් මුතුගේ පපුවේ හිස ගසා ගනිමින් අමුතුම සෙල්ලමක් කළාය.

"ඊයේ නින්ද ගියාද පොඩි දුවේ..."

රවීගේ අම්මා මුතුගෙන් ඇසුවේ ආදරයෙනි.

"ඔව් අ..ම්මේ... හොඳට නින්ද ගියා... හරි සනීපයි..."

"අනේ ඉතින් ඉඩත් මදි ඇති... අනිත් පාර එන්නකෝ... මං ඔක්කොම වේලාසන ලෑස්ති කරලා තියන්නම්..."

මුතු සිනාසුණාය. කෙල්ල සිරියාවන්තයැයි අම්මාට සිතුණා.

"මං පොවන්නද නංගී..."

කිරි බෝතලය හදා මධුවන්ත ඇසුවේය.

"මං.. පො..ව..න්..න..ම්..."

මුතු කිරි බෝතලය ඔහු අතින් ගනිද්දී ඉඹෙටම ඔහු දෙස බැලීණි.

"දැ.. දැ..න්..ම..ම ඇඟ සෝ..ද..න..වද..."

ඇය ඇසුවේ එය ඕනකමටම නොවේ. ඒ මොහොතේ ඇති වූ කලබලයෙන් මිදෙන්නටය.

"කිරි පොවල ටිකක් තියලා තමා ඇඟ සෝදන්නේ... උදෙන්ම සීතල ඇති..."

"මං වතුර ටිකක් උණු කරලා දෙන්නම්... උදෙන්ම වතුර සීතලයි පුතේ..."

මුතු කිරි බෝතලයත් ගෙන කෙල්ලව වඩාගෙන යන අයුරු මධුවන්ත බලා උන්නේ පුදුමයෙනි. මේ සිද්ධ වන්නේ කුමක්දැයි ඔහුට තවමත් සිතා ගන්නට නොහැක.

* * * * * * * * * * * * * * *

මුතු දුවවද තබාගෙන ළිඳ ළඟ බලා උන්නේ ඔහු උණු වතුර ගෙනෙන තුරුය. මුතු දුවට ගස්වල වූ කුරුල්ලන් මල් පෙන්වමින් පුදුමාකාර සැහැල්ලුවකින් උන්නාය. මේ ජීවිතය සදාකාලික නම් කියා ඇයට සිතුණ වාර අනන්තය. අප්‍රමාණය.

මුතු සුදු අරලියා මලක් කඩා කෙල්ලගේ කන්පෙති අතර ගැසුවාය. කෙල්ලද මලක් කඩා අතට ඉල්ලුවාය. මුතු දුන්නාය. දැන් ඇය හදන්නේ ඒ මල ඇගේ කන්පෙති අතර ගසන්නටය.

"අ..නේ දිදීට ගහන්න බෑ... නා..න්නිත් එනවා.. දිදීට ලැජ්ජයි..."

මුතු කෙල්ලගේ නිරුවත් බඩ සිප ගනිමින් කියයි.

"කුක්කි හෝයි දැන්... මගේ චූටි මල් කුමාරි..."

දුවගේ සිනා හඬ අවට පැතිරෙන්නේ කුරුළු නාදයක් මෙනි... උණු වතුර ගෙනවිත් දුන් මධුවන්ත ඒ සිනා හඬ අසා උන්නේ ආශාවෙනි. කෙල්ල මෙහෙම හිනා වෙන්නේ සතුට උතුරා යන විටදී

Elegantkaf.com

බව ඔහු දනී. ඒ සතුට ඇගේ සිතට දුන්නේ ඇයය. සමහර විට ඒ සතුට කෙල්ලට නමාට වත් දිය නොහැක.

මධුවන්ත දෙන්නා දෙසම බලාගෙන ළිං පඩියට බැස උණු වතුරත් සීතල වතුරත් දමා බේසම සකස් කළේය.

"මං දුවාව හෝදන්නම් නංගී... නංගිත් ඇඟ සෝදගන්න එන්න..."

මුතු බිම බලාගෙන පැමිණ කෙල්ලව බේසම මත තැබුවාය.

"දිදි ජෝ..."

"ම්.. දිදිත් ජෝ නාන්න ඇඳන් එන්නම්..."

අදත් ඇඟ සෝදන්නට වතුර ඇද දෙන්නේ ඔහුද... මුතු ළිං පඩිය උඩට නගිමින් සිතුවාය.

"ඇඟ සෝදගෙන ඇඳගනිං චූටි... අපි අද කොහේ හරි ඇවිදින්න යං..."

නිම්මි අදිමින් කීවාය.

"අක්කා ඇඟ සේදුවද..."

"ම්.. අපිට වතුර ඇදලා දෙන්න කෙනෙක් නැත්තේ ඉතින්..."

නිම්මිගේ කතාවට මුතු ඇයට රවමින් ගැසුවාය.

"ඉ..තින් මං ඇඳලා දෙන්න කිව්වයැ..."

"එ..ච්..චරටම ආදරේ ඇති නාවන්නේ... ම්.. ගිහින් ඉක්මනට වරෙන් බං..."

"අද කොහෙද යන්නේ..."

"ඔය කොහේ හරි ඇවිදිමු බං..."

කෙල්ල ඇස්වලින් අහන්නේ ඔහුත් එනවාද කියා බව නිම්මි දනී. පපුවට කැක්කුමක් ආ විට එහෙමය.

"මල්ලිත් එයි..."

"දුවා නැතුව පාළුයි අක්කේ..."

"දුවා නැතුවද දුවගේ තාත්ති නැතුවද..."

"යන්න අනේ..."

මුතු දිග සාය ඇඳගෙන තුවායද ඊට උඩින් ඇඳගෙන ගියේ නිම්මිට ගසාගෙනය. එහෙත් කොළඹ ගිය වනම ඒ සතුට බොඳව යයි.

"අ..න්..න චූටි නැන්දි එනවා..."

මධුවන්ත ඉහළ බලද්දී ඇයට ලැජ්ජය. කෙල්ල ආවේ තොල් පට තද කරගෙනය.

"දැ..න් අ..ම්මි ඔහොම ඉන්න හොඳේ... තාත්ති දිදිට වතුර ඇදලා දීලා එන්නම්..."

"දිදි.. ජෝ.. ෂෝයි..."

"ම්..."

ඇය ඉඳගත්තේ කෙල්ල ගාවින්මය.

මධුවන්ත වතුර එකක් ඇද බැලුවේ කෙල්ලගේ වත දෙසය. ඇය උන්නේ තොල් පට තද කරගෙන බිම බලාගෙනය.

"ඇඟ සෝදනවද එකපාර නානවද... ආ නංගි... උදෙන්ම නාන්න මේ වතුර ෂෝක්..."

ඔහු ඇසුවේය. ඇයත් සිනාගෙන ආවේ උදේම නාගන්නටය.

"නා..න්..න..ම්..."

උගුරෙන් මෙන් ඇය කීවාය. දැන් ඇයට පෙනෙන්නේ ඔහුගේ දෙපා පමණි.

"ඔ..න්..න දානවා... උදෙන්ම වතුර සීතලයි හොඳද... ටැප් වතුර වගේ නෙමේ..."

Elisanka.com

ඔහු වතුර හිසට දැම්මේ ටිකෙන් ටිකය. මුතු දෑතින් මුහුණ තද කරගෙන උන්නේ ඇස් කකියන නිසාය.

ඇස් දන්න ගත් විට ලේසි නැත. ඇස් මතුපිට මිරිස් ගෑවාක් වැනිය... එකතු වෙන්නට බැරි ජීවිතයකට මේ තරම් ළං වෙන්නට එපා යැයි කියන්නට මුතුට හිතෙනා තරම්ය... අනික් අතට තමාත් කරන්නේ එයම නොවේදැයි මුතුට සිතෙයි...

ළිඳෙන් වතුර උතුරා යයි. ළිඳෙන් උතුරන පිරිසිදු වතුර කොන්ක්‍රීට් ළිං කන්ඩිය මතුපිටින් පිටාර ගලා යයි. ඒවා ගලා යන්නේ මුතුගේ දෙපා උඩිනි. කෙල්ලගේ හිසට වතුර දමද්දී මධුවන්තට ඉඛේටම එදෙස බැලිණි. වම් පාදයේ ඇය පැළඳගෙන උන් හීන් රන් පාද සළඹ ලස්සනය.

"ම්.. ඉක්මනට ෂැම්පු ගා ගන්න... නැත්නම් සීතල හැදෙයි..."

ඔහු තවත් වතුර බාල්දියක් ඇගේ දෙපා පාමුල ඇද තබා කීවේය. මධුවන්ත දුවගේ රෝස පාට තුවාය ගෙන ඇයව තුවායෙන් ඔතා ගත්තේය.

"දි..දී..."

කෙල්ල පිහදාන්නට ආස නැත. මුතු ෂැම්පු බෝතලය අත තබාගෙන ඇය හා සිනාසුණාය.

"සීතල හැදෙනවනේ කුක්කි..."

මුතු සිනාසී කීවාය.

"කමක් නෑ... මෙහෙම ඉඳපුදෙන්... නංගී හිමිහිට සබන් ගාගන්නකෝ... මං එන්නම්..."

මුතු සීතල වතුර පොදකින් දෑස් තෙමා ගත්තාය. මේ ජීවිතය ගැන මේ දැන් තීරණයක් ගන්නට ඇයට සිතෙයි. ඒ තරමටම පසුව පලාගෙන එන තෘෂ්ණාව වැඩිය.

හෙට අනිද්දා වෙද්දී මේ ජීවිතය උඩ හොඳ ඩෙගාවක් නටන බව මුතු දනී. එයට ඉඩදී බලා උන්නොත් වෙන්නේ පසුවේ කෑ

වත් ඉතිරි කර නොගෙන කුඩු වන්නටය. කාංචන මේ පසුව උඩ ඇවිදින්නට දන්නා කෙනෙක් නොවේ. පසුවකට දුකක් නොදී හද මත ඇවිදින්නට හැම පිරිමියාම දන්නේ නැත. බොහෝ පිරිමි දන්නේ ගෑණුන්ගේ පපුව උඩ ගාල කඩාගෙන දුවන්නටය.

"ඔයාගේ තාත්තිට බඩ්ඩක් කියන්න පුළුවන්ද... ම් කුක්කි... ඔයාවයි මාවයි අරගෙන කොං..හේ හරි ඇතකට යන්න කියලා... ම්.. එතකොට දිදී හැමදාම කුක්කි ළඟ ඉන්නම්..."

කෙල්ල කිසිවක් නොදැන ආශාවෙන් වතුර ගසයි. සමහර විට මේ ප්‍රශ්නයේදී කාටවත්ම තමාට උදව් කරන්නට බැරි වෙනු ඇත.

14

මුතු කෑම මේසයට ආවේ ඩෙනිම් සායට සුදු ටී ෂර්ට් එක ඇඳගෙනය. එහෙම ඇඳගෙන එද්දී ඇයට එන්නේ තවත් ලාබාල පෙනුමකි. "දුවෙක් ඉන්න තාත්තා කෙනෙක් ඔයා දිහා මෙහෙම ලෝකකමින් බලන්නත් නරකයි..." මධුවන්ත තමාටම බැන ගනිමින් සිතුවේය.

මුතු කෑම මේසයෙන් ඉඳ ගනිද්දී මධුවන්ත ඇයට කැකුළු කිරිබත් කෑලි දෙකක් දමාම තිබුණි. අලුත් හාලේ කිරිබත් වලින් එන්නේ වෙනස්ම සුවඳකි.

"පුණුමිරිස් එක්ක කන්න... මං මිරිස් මාළුව ඉක්මනට අරගෙන එන්නම්..."

රවීගේ අම්මා එසේ කියා කුස්සියට දිව්වාය.

"ම.. අපි මෙහෙම ඉඳගෙන කමු..."

මධුවන්ත කෙල්ලව මේසය මත ඉන්දවාගෙන කිරිබත් කැව්වේය.

"දි..දී..."

කෙල්ල කෑ ගසයි. නිම්මිත් ප්‍රියමන්තත් ඒ දෙස බැලුවේ සිනාබරවය.

"දැන් හැමදාම දිදීව හොයයි..."

නිම්මි කීවාය. මධුවන්ත සිනාසුණේ එය ඇත්ත යැයි කියන්නට මෙනි.

මධුවන්ත කෙල්ලට කැව්වේ කෙසෙල් ගෙඩි පොඩි කර කිරිබත් සමඟ අනාය. ඔහු එහෙම දුවට අනා කවද්දී ඉන් කටක් ඉල්ලාගෙන කන්නට මුතුට සිතුණි.

"කාලා කොහෙද යන්නේ අයියේ..."

එසේ ඇසුවේ රවීය. ප්‍රියමන්ත සිනාසී බැලුවේ කෙල්ලෝ දෙන්නා දෙසය.

"ඔහේ රවුම් ගහමු කියන්නේ..."

"ලෝකාන්තේ පැත්තට ගියා නම් හරි... මෙතන ඉඳලා පැය දෙකක් යයි..."

"ඒ පැත්තට වැස්සද දන්නෑ නේද මචං..."

"මං හිතන්නෑ..."

"වැස්සත් මොකෝ මල්ලී අපි යන්..."

අම්මා උණුවෙන් බෑ මිරිස් මාළු ලොකු දිසියකට දමා රැගෙන ආවාය. එහි සුවඳ එද්දී කටට කෙළ ඉනුවේය. මධුවන්ත ඔනු ළඟ උන් මුතුට මිරිස් මාළු බෙදුවේය.

"මටත් ටිකක් දාන්න මල්ලී..."

නිම්මිද පිඟාන දිගු කළාය. මුතු නිම්මි දෙස බලද්දී ඇය කෙල්ලට ඇද කළාය.

"අ..මමේ..."

"පුතේ..."

"අපි දවල්ට මඟින් කන්නම් අම්මේ... එද්දී හවස් වෙයිනේ..."

"උයන්න කරදරයක් නෑ පුතේ..."

"අපි රෑට කමු අම්මේ... මඟින් කන්න පුළුවන්..."

"වේලාසන කිව්වනම් මං බත් මුල් හදලා දෙනවා..."

මුතු සිනාසී අම්මා දෙස බැලුවාය. රහ එහෙමය. මඟ නැවතී ගහක් යට ගලක් උඩ දිය ඇල්ලක් ළඟ බත් මුල් ලෙහාගෙන කද්දී රහය.

"එහෙනම් මං රෑට කෑම හදන්නම්..."

ප්‍රියමන්තගේ සාක්කුවේ තිබූ ජංගම දුරකථනය නාද වූයේ ඒත් සමඟය. ඔහු එයට පිළිතුරු දෙන්නට පෙර ඇමතුම කාගෙන්දැයි බැලුවේය.

"පිටරට කෝල් එකක්... කාගෙන්ද..."

ප්‍රියමන්ත කීවේය. මුතුටත් නිම්මිටත් එකිනෙකා දෙස බැලිණි. දෙන්නාටම ඉවෙන් මෙන් යමක් සිතුණි.

"හෙලෝ..."

ප්‍රියමන්තද කතා කළේ තරමක වකිතයකිනි.

"ප්‍රියමන්ත..."

කතා කරන්නේ අම්මා හෝ තාත්තා බව නිම්මි දනී. මුතුද දනී.

"කෝ ඔතන නිම්මි ඉන්නවද..."

"ඔ..ව්.. ඉ..න්..න ඇ..න්..ටී..."

ප්‍රියමන්ත දුරකථනය නිම්මිගේ අතට දුන්නේ ඇස් ලොකු කර

නළල රැළි කරගෙනය.

"නි..ම්..මි..."

"ආ.. අ..මමේ..."

"මොනවද ඔයයි ඔයාගේ මිනිහයි මේ කරන වැඩ... ආ..."

නිම්මි ප්‍රියමන්ත දෙස බැලුවේ අසරණවය.

"ඇ..යි අ..මමේ..."

"ඇයි අම්මේ කියලා අහන්නේ... කොහෙද ඔය ඉන්නේ..."

"මේ.. මායි නංගියි ප්‍රියයි මේ අනුරාධපුරේ ආවා..."

නිම්මි කීවේ අසරණවය. අක්කා පව් යැයි මුතුට සිතුණි. කාංචන ලස්සනට කේලම කියන්නට ඇත.

"අර ගෙවල් දොරවල් එහෙමම දාලා සංචාරේ නේද... ඔව් ඉතින් ඔයාට ගාණක් නැනේ... ඔයා ගොන් ගහක්නේ..."

නිම්මිගේ දෑස්වල කඳුළු පිරුණි.

"අ..පි වෙ..න රටකට ගියා නෙ..මේනේ අම්මේ... පන්සලටනේ ආවේ..."

"උඹයි උඹේ මිනිහයි මොන දිල්ලියක ගියත් කමක් නෑ... මොකටද නංගිවත් එක්කං ගියේ..."

"වු..ටී..ව ත..නි කරලා කොහොමද ය..න්..නේ... ඇරත් මං ඒකිගේ අක්කනේ... මං එක්ක ගමනක් ගියාම මොකද..."

"නිම්මි... මං ඔයාට කියලා තියෙනවා... ඔයාගේ මනස්ගාත නංගිට බෝ කරන්නෙපා කියලා... ම..ට එයාවත් පිළිවෙලකට හදාගන්න දෙනවා... නැත්නම් එයත් ඔයා වගේ හිඟන්නෙක් එක්ක යයි... අද හවස් වෙද්දි මුතුව ගෙදර ඇරලනවා... කෝටි ගණන් ගෙවල් දොරවල් දාලා මෙයාලා ගිහින්... ඇයි මිනිහා හම්බ කරපුවා

Elegant

නෙමේතේ... කැක්කුමක් නැතේ..."

නිමේ මේ සියල්ල ඉවසාගෙන උන්නාය. ඒ මේ පිට තැහැක් නිසාය.

"හ..රි මං එහෙම කරන්නම්..."

නිමේ දුරකථනය තැබුවේ එසේ කේන්තියෙන් කියාය. ඒත් සමඟම වාඟේ ඇයට ඇඬුණි. මධුවන්තත් මුතුත් ප්‍රියමන්තත් ඇය දෙස බලා උන්නේ අප්‍රමාණ වේදනාවකිනි. අම්මා ඒ පැත්තෙත් තුණු බැණුම් බණින්නට ඇත. ඇය එහෙමය.

"ම..ගේ අ..ම්..ම..නේ... ම..ට මෙ..හෙ..ම ක..තා ක..ර..ත්..නේ.. ඕක්..."

නිමේ ඇඬුවේ එහෙම කියමිනි. මුතු නැඟිට එහෙමම ඇය ළඟට ආවාය.

"මේ වැ..ඩේ කළේ කාංචන... ඊ..යේ ක..තා ක..ර..ද්දී ම..ට හිතු..ණා..."

"මේ වගේ පොඩි දේකට ඔව්වර අපහාස කරනවද..."

නිමේට දුක ඒකය. අම්මා හැම දේකටම බණින්නේ හිඟන්නෙක් බැන්දා කියාය.

"ප්‍රි..යා..."

නිමේ කඳුළු පිසදාගෙන හිස ඒසෙව්වාය.

"අ..පි කො..ළ..ඹ යං.. ක..ම..ක් නෑ..."

මුතුගේ පමණක් නොව මධුවන්තගේද පපුව දා ගියේය.

"දෙමව්පියන්ගෙන් උනත් මෙ..හෙ..ම අපහාස විඳින්න බෑ.. අපි යං..."

අම්මා නොසැහෙත්තව බණින්නට ඇත. ඇය බණින්නේ තමා ගැනත් කියා බව ප්‍රියමන්ත දනී. නිමේට මේ තරම් දුක ඒකය.

"දැ..න්..ම..ම ය..න..ව..ද..."

මුතු ඇසුවේ අඬමින් මෙනි. මධුවන්ත ඒ දැස් දෙස බලා උන්නේ දුවාව වඩාගෙනය. "දිදී අඬනවා... පව්..." ඔහු සිතින් දුවාට කීවේය.

"අපිට කො..හොම..ත් මෙ..හෙ..ම අත ප..ල්ලෙ..ත් වැටිලා වගේ ඉන්න බෑ වුටි... මං තීරණයක් ගත්තවා... උඹත් හිතපන්..."

නිමේ කීවේ කෑම මේසයෙන් නැඟිටිමිනි.

"ම..ල්..ලී..."

නිමේ කතා කළේ මධුවන්ත ළඟට ගොස්ය.

"අක්කේ..."

"ම..ල්ලී ඉඳලා එන්න... අපි යනවා... හිතන් ආවේ නම් දවස් තුන හතරක් ඉඳලා යන්න..."

"ද..ව..ල්..ට කෑ..ම ටි..ක..ක් කා..ලා යන් අක්කේ... හවස් වෙද්දී කොළඹට යන්න පුළුවන්නේ..."

"කමක් නෑ මල්ලී... පුළුවන් නම් මල්ලියේ මට එක උදව්වක් කරන්න..."

"මොකක්ද අක්කේ..."

මුතුද නිමේ දෙස බැලුවේ පුදුමයෙනි.

"ඔයා මහත්තයෝ ඒ ගෙදර වැ..ටි..ලා ඉ..න්..නෙ..පා... මොකක් හරි පිළිවෙලක් හදා ගන්න... අපිත් ඉක්මනට යනවා..."

මුතු තොල් පට තද කර ගත්තාය. අක්කා මෙහෙම කියන්නේ ඇත්තටම වේදනාවෙන් බව මුතු දනී. ඇයටද කරන්නට දෙයක් නැත.

"ම..ට තේ..රෙ..නවා අක්කේ..."

"ඔයා ඉන්න තැනකට මං තුන් වේලටම කෑම එක හදන් එන්නම්... ඒත් මෙහෙම වැටිලා ඉන්නෙපා... පුළුවන් ඉක්මනට නැඟිටින්න..."

Elegantlk.com

මධුවන්ත කෙල්ලවද වඩාගෙන හිස වැනුවේය.

"ප්‍රියා..."

"ම්..."

"යන් රවී මල්ලිටයි අම්මටයි කියලා එමු..."

"ය..න්..."

දෙන්නාම කුස්සියට ගිය පසු ඉතුරු වූයේ මධුවන්තත් මුතුත් පමණි.

"එ..න්..න..."

මුතු දෑතම පා කෙල්ලව ගත්තාය. ඇයට දුකය. හිතාගෙන උන්නේ කෙල්ලවත් තුරුල් කරගෙන ලෝකාන්තේ බලන්නට යන්නටය.

"අ..ක්..කා ඔය කිව්වට නංගිව දාලා ය..න්..නෑ... එ..යා දුකට ඔය කියවන්නේ..."

මධුවන්ත එහෙම කීවේ ඇය ඉන්නේ දුකෙන් බව දන්නා නිසාය.

"ජීවිතේ තීරණ ගන්නකොට හිතලා ගන්න නංගී... මේ මට පේන්නැද්ද..."

මුතු දෙනෙත් ඔසවා ඔහු දෙස බැලුවාය. ඒ ඇස් තෙතය. රවී පැමිණ මුතු ළඟ නැවතිණ.

"පුළුවන් කාලෙක නංගී සතියක් විතර නැවතිලා යන්න එන්න... දැන් ඕවා හිතන්නෙපා..."

රවී කීවේ ආදරයෙනි.

"අනේ හදිස්සියෙන් වගේ යද්දිත් දුකයි... ආයි දවසක පුතාලා එන්න..."

"ඉ..ක්..ම..න..ටම එනවා අම්මේ..."

නිම්මි කීවේ ඇස්වල කදුළු ගලද්දීය.

"අම්මේ... නංගිලා කැවෙත් නෑ... මේ කිරිබත් ටික ඉක්මනට කෙහෙල් කොළේක ඔතලා දෙන්න... මඟදිවත් කන්න..."

"හා.. මං ඔතන්නම්..."

"ඔයා මල්ලී අපිට මෙහෙම කන්න දුන්නා... ඔයාව ගෙනත් බත් කටක් දෙන්න අපිට විදිහක් නෑ..."

"අල්ලලා දාන්න අක්කේ... අපි කොළඹදී කොහෙද හරි සෙට්වෙමු... නැද්ද අයියේ..."

"නැතුව බං... කොළඹ එද්දී කෝල් එකක් දීපන් මල්ලි..."

"හොඳයි අයියේ..."

මුතු ඇඳුම් බෑගයද ගෙන ආවේ කෙල්ලවද වඩාගෙනය.

"අ..නේ.. දැන් දිදී නැතුව කෙල්ලට පාළු වෙයි..."

අම්මා කීවාය. මුතු කෙල්ලව ඉම්ඛේ තෙත කම්මුලෙනි.

"මං දවස් දෙක තුනක් ඉඳලා එන්නම් අයියේ..."

"ඒක හොඳයි..."

මුතු මිදුලට බැස්සේ රවීගේ අම්මාට වැඳය.

"දළඳා සමිඳු පිහිටයි... ආයේ එන්න පොඩි දුවේ..."

"හො..ඳයි අ..ම්මේ..."

මධුවන්ත වාහනය ළඟට ආවේ ඇයත් සමඟම වාගේය.

"ය..න්..න..ම්..."

කෙල්ල මධුවන්තට කීවේ ඇඬුම්බරවය. ඇය දුවව දී වාහනයට ගොඩ වූයේ ඇඟිලි තුඩු වලින් දෑස් තද කරගෙනය. මධුවන්ත දුවව වඩාගෙන බලා උන්නේය.

"දි..දී ගියා පැටියෝ..."

මධුවන්ත කෙල්ලට කීවේ ඇත්තටම දුකෙනි.

Elegantkade.com

15

මුතු හිර කරගෙන උන් ඇඳුම් පිට කළේ වාහනයේ යද්දීය. ප්‍රියමන්ත වාහනය ටිකකට පේරාදෙණියේ ගහක් යට නතර කළේය. මුතු පමණක් නොව නිම්මිද උන්නේ අඬමිනි.

"ඩු..ඊ.. අඬන්නෙපා ඩූටි..."

ප්‍රියමන්ත කීවේ ආදරයෙනි. කෙල්ලෝ දෙන්නා අඬන්නේ කාරණා රැසකට බව ප්‍රියමන්ත දනී.

"වෙන අම්මලා දකිද්දී තමා අපට ලැබුණේ මොන අම්මද්ද කියලා හිතෙන්නේ... පුදුමයි... එයාලා බැංකොක් සවාරි ගිහින් අපට පන්සලකට යන්නෙපාවූ... කුණු බැණුම් බණින්නේ..."

නිම්මි කීවේ අඬමිනි.

"කා..ලෙ..ක..ට පස්සේ සැනසිල්ලේ බත් කටක් කෑවේ ඊයේ විතරයි... අවුරුදු ගාණකට පස්සේ ඊයේ රෑ සැනසිල්ලේ නිදාගත්තා... අර ගඩොල් කාමරේ... ඒසී නෑ ෆෑන් නෑ ටීවී නෑ... ඒත් සැනසීම... ඒ..ක..ත් නැ..නි ක..ළා..."

මුතුද අඬමින් කීවාය. කෙල්ලට ඔක්කොටම වඩා තරහ අද කොළඹ යන්නට වූ එකය.

"අ..ද හ..ව..ස් වෙ..න්න කලින් නංගිව ගෙදර තියන්න කි..වි..වා... අරූට ඇවිත් කුදලගෙන යන්න වෙන්න ඇති..."

"මං උ..ත් එ..ක්..ක ය..න්..නෑ..."

ප්‍රියමන්ත දිග සුසුමක් හෙලුවේය.

"මේ ඔ..ක්..කො..ම කරන්නේ මං නිසා... ඔයාගේ අක්කා හිඟන මිනිහෙක්ව බැන්ද නිසා..."

ප්‍රියමන්ත කීවේය. නිම්මි තොල් පට නද කර ගන්නේ අමාරුවෙනි. ඇත්තටම අම්මාත් නාත්නාත් නමාගෙන් පළි ගන්නේ ඒ නිසාය.

"නෑ අ..යියේ... අක්කා ඔයාව බැන්ද නිසා එයා ජීවිතේම නිදහස්.. ඔය දෙන්නා වෙන ගෙදරකට ගිහින් ලස්සනට ජීවත් වෙයි... ම..ටයි දුක් විඳින්න වෙන්නේ..."

"එයාලා උඹව හෙට අනිද්දම කාංචනට දෙනවා... උ..ඹ..ත් මං ගිය පාරේම යයි කියලා එයාලට බයයි..."

"මං දන්නවා... මටත් ජීවිතයක් තියෙනවා කියලා එයාලා හිතන්නෑ... මාව පේන්නෙත් ඉඩමක් වගේ... ඉස්සෙල්ලා වෙන්දේසියේ දැම්මා... දැන් බයර් කෙනෙකුට දෙනවා... එ..ච්චයයි..."

ප්‍රියමන්ත වාහනය පේරාදෙණි හන්දියෙන් කොළඹ පාරට

Freeamuta.com

දැම්මේ ඇත්තටම දුකෙනි. පේරාදෙණිය හන්දියෙන් වමට ඇති පාර ලෝකාන්තයට යන පාරය.

"අ..ක්..කේ..."

"වූ..ටි..."

"එ..ක..පා..ර මා..ව..ත් දා..ලා ය..න්..නෙ..පා..."

එය දුප්පත් අහිංසක ඉල්ලීමකි. සහෝදරියකගේ දුක්බර ඉල්ලීමකි.

"උ..ඔ කියනව නම් ඉන්නම්... ඒත් මං අර කොල්ලව මේ ගෙදර තියාගන්නෑ... එයාලා ළඟදීම ඒකට ලොකු අඩව්වක් අල්ලනවා..."

මුතු බිම බලාගෙන හිස වැනුවාය.

"එ.. එ..යා කො..හේ කි..ය..ලා ය..න්..නද... නේ..ද අ..යියේ... දු..ව..ත් එ..ක්..ක..."

ඒ ටික කියද්දී මුතුගේ පපුව හෝස් හෝස් ගා ඇවිලිණි. ප්‍රියමන්ත හැරී පසුපස අසුණේ උන් මුතු දෙස බැලුවේය. මේ කෙල්ල ඔහු ගැන කතා කළ ප්‍රථම වතාවය.

"ය..න්න තැනක් නම් නෑ තමා චූටි... ඒත් ඒකා මො..ක..ක් හ..රි පිළිවෙලක් හදා ගනී... ඌටත් මේ දවස්වල පුදුම අපලයක් ඇති... නැත්නම් මෙච්චර කරදර..."

"ම..ල්ලි ගැන බයවෙන්නෙපා ප්‍රියා... කොල්ලා නැඟිටියි... ම..ට ඒක විශ්වාසයි..."

නිම්මි කීවාය. "මටත් ඒ ගැන විශ්වාසයි..." මුතුටද එසේ සිතුණි. මධුවන්ත කතා කළේ ඒ මොහොතේය.

"ම..ල්ලි... බලන්..න..."

ප්‍රියමන්ත දුරකථනය නිම්මි අතට දුන්නේය.

"ඇයි ම..ල්ලියේ..."

"දු..වා අ..ක්..කේ..."

"ඉ..නින්.. ඇයි කෙල්ලට..."

නිම්මි අසද්දී මුතු එහෙමම ඉදිරිපස අසුනට වේගයෙන් එබුණාය.

"දි..දී නෑ කියලා අ..ඬ..න..වා... නංගිට ෆෝන් එක ටිකකට දෙන්න අක්කේ..."

නිම්මිගේ පපුවම ඇවිලී ගියේය.

"දිදී නෑ කියලා දු..වා අඬනවලු..."

"අ..නේ..."

මුතු දුරකථනය ගත්තේ බඩ පපුව දාගෙන යද්දීය. කෙල්ල කෑ ගසන හඬ පසුබිමින් ඇසෙයි.

"නංගි..."

කතා කරන්නේ ඔහුය.

"මො..නා හරි කියන්න නංගී... එතකොට නැලවෙයි... එකපාර ගිය නිසා සාංකාව වගේ..."

"දු..වා..ගේ ක..ණට ති..ය..න්..න..කෝ..."

මධුවන්ත දුරකථනය කෙල්ලගේ කණට තිබ්බේය.

"දිදී..."

"ඇ..යි ම..ගේ අ..ම්..මි මේ... දිදී ඉ..ක්මනට එනවනේ..."

"දි..දී ගියා..."

කෙල්ල අඬද්දී මුතුගේ පපුව කඩා හැලෙයි.

"දිදී හාවෙක් ගේන්නනේ ගියේ කුක්කි... පැටියට ලස්සන හාවෙක් අරන් එ..න්නම්..."

"සු..දු හා..වා..."

"ඔව් අම්මි... සුදු හාවෙක් ගේන්නම්... අඬන්නෙපා... තාත්ති එක්ක බයි කාලා ඉ..න්න..."

Elegantlk.com

නිම්මිත් ප්‍රියමන්තත් මුහුණට මුහුණ බලාගෙන උත්තෝය.

"දිදී හාවා අරන් එන්නම් කුක්කී... බයි කනවා නේද... ම්..."

කෙල්ල ඇඬීම නතර කළාය.

"මගේ හොඳ කුක්කී... බයි කාලා තාත්ති එක්ක ජෝ නාත්ත හොඳේ... තාත්ති ෂෝයිනේ පැටියෝ..."

ඔය ටික කියද්දී මධුවන්ත දුරකථනය කණේ තබා ගත්තේය. ඔහුගේ පපුව ඇකිලීගෙන ගියේය.

"එ..හෙ..නම් දිදී අපට හාවෙක් අර..න් එ..න්..න... ටටා... බායි.. බුදු සරණයි..."

"ම්.. බු..දු ස..ර..ණයි..."

මුතු අවසන් වචන ටික කිවේ අඬමින් මෙනි.

"කෙල්ලට සාංකාව වගේ වෙන්න ඇති..."

නිම්මි කිවේ දුකෙනි.

"අ..ම්මා නැති කෙල්ලට ළං වෙලා මං ක..ළේ වැරැද්දක් අක්කේ..."

මුතු ඇත්තටම අසරණව කිවාය.

"එයයි දුවයි වෙනමම ජීවිතේකට පුරුදු වෙලා ඉන්නේ... මං කළේ වැරැද්දක්..."

"අම්මා නැති කෙල්ලනේ චූටි... ආදරයක් ලැබෙද්දී හරි ආසයි... ඒක ඔයාගේ වැරැද්දක් නෙමේ..."

ප්‍රියමන්ත කිවේ කෙල්ලගේ හිත සනසන්නටය. එහෙත් තමා කෙල්ලට ළං වුණා වැඩියැයි මුතුට දිගින් දිගටම සිතෙන්නට විය.

"දුවව දාලා යද්දී මටත් සාංකාව වගේ... කෙල්ලට සාංකාව නැදෙන එක පුදුමයක් නෙමේ..."

මුතු කිවේ ඇත්තටම අසරණවය. මේ දැන් හැරී ගොස් කෙල්ලට

නලවන්නට හිතෙනා තරම්ය.

"එයා එකපාර යයි අයියේ... එ..හෙ..ම ය..න්න දෙන්නත් එපා... කොහේ යන්නද..."

"ආවාම කතා කරලා බලනවා චූටි..."

"ලංකාවට ආපු එක මෝඩකමක් කියලත් කොල්ලට හිතෙනවා ඇති..."

නිම්මි කිවේ ඇත්තටම දුකෙනි. ප්‍රියමන්ත කතා කළේ නැත.

"අපිට කොල්ලට කිසිම පිහිටක් වෙන්න බැරි උනා..."

"අපේ තත්වේ මල්ලී දන්නවා..."

"සමහර විට මල්ලි ආයෙත් යයි... දුවවත් අරගෙන..."

"ගි..හි..න්..."

මුතු පිටුපස සිට ඇසුවේ එකවර ඇගේ පපුව හිරිගෙන මෙන් ගිය නිසාය.

"දන්නෑ චූටි... මෙහෙදි කොල්ලව ඕනවට වඩා හිරවුණා... සිංගප්පූරුවේදී මල්ලිට රස්සාව තිබ්බා... අපාට්මන්ට් එක තිබ්බා... අද ඒ මොනවත් නෑ... අර කාමර කෑල්ලේ ඉඳගෙන මොනා කරන්නද..."

අක්කා කියන්නේ ඇත්තය. සමහර විට ඔහු ඇත්තටම යළි සිංගප්පූරුවට යනු ඇත.

"දුවත් එක්ක අමාරුනේ... අක්කේ..."

"මෙහෙදි ඊට වඩා අමාරුයි චූටි... සිංගප්පූරුව කියන්නේ ලංකාවට වඩා ජීවත් වෙන්න පහසු රටක්... හැම දේම තියෙනවා..."

"ම්..."

ඔහුගේ ජීවිතය කොහොමත් දැන් හිරවී ඇත... ඔහුගේ පමණක් නොව තමාගේ ජීවිතයද හිරවී ඇත.

Elegantkatha.com

මේ කවුරුවත් නැති නන්නාඳුනන රටකදී ජීවිතයට මීට වඩා සැනසීමක් ලැබෙනු ඇත. ඒත් එවන් රටකට තමාව එක්කාගෙන යන්නේ කවුද...

* * * * * * * * * * *

මධුවන්ත දුවව නලවා ගත්තේ ඇත්තටම අමාරුවෙනි. රවී නුවර ගොස් එද්දී කෙල්ලට කතා කරන බෝනික්කෙක් රැගෙන ආවේය. කෙල්ල ටිකක් සතුටින් උන්නේ ඉන් පසුය.

මධුවන්තට පුදුම නැත. සිංගප්පූරුවෙන් ලංකාවට එද්දී ඔහුගේ සිතේ තිබූ ලොකුම බය දුවට හාෂිව මතක් වේයැයි කියාය. එහෙත් කෙල්ලට නිකමටවත් ඇයව මතක් වූයේ නැත. අම්මාව නැති වූ කලත් සතුටින් උන් කෙල්ලට මුතු නැතුව ඉඳිද්දී පාළුය.

ඇත්තටම මුතු දුවට පුදුමාකාර ලෙස ආදරේ බව මධුවන්ත දනී. ඒ ආදරේ ඇය වැනි යුවතියකගේ පපුවෙන් එන්නේ කොහොමද කියාවත් මධුවන්ත දන්නේ නැත.

"කෙල්ල බෝනික්කට ටිකක් නැලවුණා නේද මචං..."

"ඔව්... බෝනික්කව තුරුල් කරගෙනම නිදි..."

රවී මධුවන්ත ළඟින්ම ඉඳගත්තේ ඔහු දෙස බලාගෙනමය.

"මධූ..."

"මචං..."

"එතනත් ප්‍රශ්න ගොඩක් නේ..ද..."

"මාත් නොදන්නවා නෙමේ මචං.... අක්කා අයියව බැන්දට ඇත්ටයි අත්කලුයි ඉන්නේ පුදුම වෛරයකින්... පුළුවන් නම් දෙන්නව ඩිවෝස් කරලා... අක්කා අයියට පුදුම ආදරෙයි... ඒ නිසා ඔය පළිගන්නේ..."

"මට තේරෙනවා..."

"අරහෙන් මුතු නංගිගේ ප්‍රශ්නේ... කෙල්ලව අකමැත්තෙන් බන්දලා දෙන්න යන්නේ..."

"කෙල්ල කැමති වෙන කෙනෙකුට..."

රවී සිනාසී කීවේය.

"කා..ට..ද..."

මධුවන්ත ඇසුවේ පුදුමයෙනි.

"ඒවා වැඩක් නෑ... ඔය තත්වේ තියෙද්දී උඹට දිගටම ඔතන ඉන්නත් බෑ..."

"ටිකක් අමාරුයි මචං... කාමර කැල්ලක්වත් දැන් නොයා ගන්නවා... මේ තත්වෙට මාව ඇදලා දැම්මේ නාෂි මචං... මගේ ඔක්කොම නැති උනා..."

"උඹට ඕන නම් ආයේ සිංගප්පූ යන්න පුළුවන්..."

"හා..ෂි එ..ක්..ක ඉ..න්..න..."

"නෑ මං එහෙමම කියන්නෑ..."

"එයා එක්ක ආයෙත් ජීවිතයක් පටන් ගන්න බෑ මචං... ඇරත් කෙල්ලට උගන්නන්න ඕන..."

"උඹ ආයෙත් ටිකක් හිරවුණා... නේ..ද..."

"මී..."

මධුවන්ත ඇත්තටම අසරණය.

"අපි මධූ කෝකටත් එහෙන් ගෙයක් බලමු... පොඩි ගේ කැල්ලක්... ටික කාලෙකට කුලියට ගමු..."

"ලොකු ගෙයක් ඕන නෑ මචං... මටයි කෙල්ලටයිනේ..."

"ඔව්... අපි හෙට කොළඹ යන්... මේ නුවරට වෙලා ඉඳලා

Elegantbooks.com

ප්‍රශ්න විසඳන්න බෑ... මාත් එන්නම්..."

"එපා මචං... උඹ අම්මලා එක්ක ටික දවසක් ඉඳපන්... මං දිගා බලන්නම්..."

"උඹ මේ කෙල්ලවත් උස්සගෙන කොහොමද යෙදෙන්නේ..."

"මං කරගන්නම් මචං... මං ගෙයක් බැලුවට පස්සේ එරෙන්කෝ..."

"මේ... උඹ සල්ලි ගැන හිතන්නෙපා... මාත් සල්ලි ටිකක් දෙන්නම්..."

මධුවන්ත ඕම බලාගෙන හිස වැනුවේය. බුදු හාමුදුරුවන් කලාණ මිත්‍ර සම්පත කියා ඇත්තේ මේකටය.

"මොන දේ උනත් මධූ... මට අර කෙල්ල ගැන හරි දුකයි..."

"මුකු නංගි..."

"ම..."

"නංගි ගැන මටත් දුකයි මචං..."

"අපරාදේ... උඹට ලැබෙන්න තිබ්බේ එහෙම නොදැකෙල්ලෙක්ව..."

මධුවන්ත කතා කරේ නැත. ජීවිතයේ ලැබීම් ගැනම දැන් කතා පර දෝරුමක් නැත. ජීවිතයේ එකම ලැබීම නොලැබීමය.

16

කාංචන ආවේ රෑ හතට පමණය. මුකු ගෙදර පැමිණ ඉඳිද්දී ඔහුට කුරිරු සතුටක් ඇතුණි. කාංචන නිවසට පය තබද්දීම මුකු ඉඳගෙන උන් පුටුවෙන් නැගිට්ටාය. ඇය කාංචන ළඟට ආවේ දෑත් බැඳගෙනය.

"ලෝකේ පිරිමි වැඩ කියලා ජාතියක් තියෙනවා ගෑණු වැඩ කියලා තව ජාතියක් තියෙනවා... කේලම් කියන එක ගෑණු වැඩක්... ගෑණුන්ගෙනුත් වට්ටි අම්මලගේ වැඩක්... මං මගේ අක්කයි අයියයි එක්ක පන්සලකට ගියාම ඒක අම්මලාගේ කණේ නියන්න ඕනද..."

Elegantlks.com

මුතු ඇසුවේ වෙව්ලමිනි. කාංචන වලත්ත සිතහවක් පැමිණිය. කොහොමත් ඔහුගේ සිතහව එහෙමය.

"ට්‍රිප් එකේ ආතල් එක කැඩුවට තරහ ගියාද..."

කාංචන ඇසුවේ අර සිතහවෙන්මය. මුතුව වෙව්ලන්නට විය.

"පන්සල් යන්නේ ආතල් ගන්න නෙමේ... ජීවිතේ පාත්වෙලා තියෙන සෙතසුරු අපලයකින් බේරෙන්න..."

මුතු එහෙමම කිවාය.

"කොහොමත් ඔයා මගේ ජීවිතේට බලපෑම් කරන්න එපා... මං තාම මේ මැරේජ් එක ගැන තීරණයක් අරගෙන නෑ..."

කාංචන බලා උන්නේ කනාඩහකින් තොරවය.

"මෙහේ වෙඩින් එකට ඩේට්ස් දාගෙන... ඔයා තාම තීරණයක් අරන් නෑ..."

"ම්..වී නෑ තමා..."

"මොහන තීරණේ ගත්තත් මේ මැරේජ් එක වෙනවනේ... ඒත් මිනී හිතන්නෑ... වෙඩින් එක දවසේ උදේට හිතනවා..."

"එහෙම කෙල්ලෙක්ව බලෙන් වගේ මැරි කරන්න ලැජ්ජ නැද්ද..."

"පොඩ්ඩ මී..."

"සර්ස්..."

කාංචන සිහාසුළුණේය. මුතු අකමැතිම මේ සිතාවටය.

"ඒකක් හිතලා බලන්න... අපි අතර අණෙයාර් එකක් නෑ..."

"අණෙයාර් කන්නද මුතු... අණෙයාර් කියන්නේ නිකං මේ පෝ එහෙම වැඩක්..."

මුතු සිහාසුළුණාය.

"එහෙම පාට එහෙම එකක් වත් අපි අතර නෑ... ඉතින් ඒ

කරන්නේ කොහොමද..."

"ඒවා මං දන්නෑ... මොකද කියන්නේ අද රෑ ඩිනර් එකකට යන්ද... මොනා හරි බීලා ඔන තම් ගෝරියක් දාගමු..."

"මං කිව්වනේ... මං තාම තීරණයක් අරන් නෑ... සොරි..."

"ඔ..කේ... ඒක මතක ඇතුව ඔයාගේ අම්මටයි තාත්තටයි කියන්න... ඕ..කේ..."

"හොඳයි... දැන් මේකත් යන ගමන් කියන්න..."

"කේලමා..." මුතු උඩට ගියේ එසේ කියාගෙනමය. කාමරයට වී මේ සියල්ල අසාගෙන උන් නිම්මිත් මධුවන්තත් හිල්ලුවේ මුහුණට මුහුණ බලාගෙනය.

"අ..තේ මන්දා..."

නිම්මිට ඉඹෙටම කියවිණි.

* * * * * * * * * * * * *

මුතු මධුවන්තගේ දුරකථනයට ගත්තේ රෑ අටට විතරය. ඊට පෙර තුන් වතාවක්ම මුතු ඒ අංකයට ගෙන යළිත් ඇමතුම් විසන්ධි කළාය.

අවසානයට අය හිත තද කරගෙන මෙන් ඇමතුම ගත්තාය.

"හෙ..ලෝ..."

මධුවන්ත කතා කළාය.

"මං.. මං.. මු..තු..."

"හංහී..."

"ඊ.. දැව.. නි..දි..ද..."

කෙල්ල ඇසුවේ උගුරෙන් මෙනි.

Elegantta

"දවසෙම දිදීව හොයනවා... පස්සෙ රවියා නුවර ටවුමට ගිහිත් කතා කරන බෝනික්කෙක් අරන් ආවා... ඒකට තමා ටිකක් නැලවුණේ..."

ඔහුගේ හඬ ඇගේ පපුව පාරන තරම්ය.

"දැ..න් නි..දි..ද..."

"මේ.. ඉ..න්..නේ කට දිහා බලාගෙන... කාලා නිදි කිරා වැටෙනවා..."

"චු..ට්..ට..ක් ක..ණේ නි..ය..න්..න..."

මධුවන්ත කෙල්ලගේ කණ අද්දරට ජංගම දුරකථනය පෑවාය.

"කුක්කි... බයි කෑවද පැටියෝ..."

"දි..දී... කෝ..."

"දිදී එනවා අම්මියෝ... හාවා තාම හම්බ උනේ නෑනේ... එහෙනම් දොයියන්න..."

මධුවන්ත දුරකථනය කණේ තබා ගත්තේය.

"මාත් හෙට එනවා නංගී..."

මුතුට කතා කළ නොහැක. හදවත හඬයි. එහෙත් මුව ගොළුය.

"අද මෙහේ අම්මටත් හරි දුකයි... උය උයත් මතක් කළේ නංගිලව... එහෙනම් මං තියන්නම් නංගී... බුදු සරණයි..."

මුතු දුරකථනය පපුවේ තබාගෙන උන්නේ දිග සුසුමක් පපුවෙන් පිට කරමිනි.

"දි..දී කෝ..."

කෙල්ලගේ හඬ ඇයට ඇහෙන්නාක් බඳුය.

නිම්මි උඩට ආවේ ඒ මොහොතේදීය.

"ඇයි චූටි..."

"මං.. දුවාට ටිකක් කතා කළා..."

නිම්මි සිනාසුණාය. ඇය ඇඳ විට්ටමට බරවී මුතු දෙස බැලුවේ මොනවද හිතේ තියාගෙන මෙනි.

"චූටි..."

"ම්..."

"කාංචන නිකං ඉන්න එකක් නෑ..."

"මං දන්නවා..."

"අර දෙන්න දැන් බැංකොක් ඉඳලා එන්නේ දුම්මල වරම අතින් අරගෙන..."

"මාත් ඉන්නේ කතා කරන්න..."

"උඹ ඕවා කතා කරපු ගමන් බණින්නේ මටයි මගේ මිනිහටයි..."

මුතු අසරණව බිම බලා ගත්තාය. ඒ බව ඇයද දනී.

"ඒත් අක්කේ..."

"ඒවා හිතන්නෙපා... උඹ උඹේ ජීවිතේ ගැන හිතපන්..."

"මං කියනවා කාංචනව බදින්න බෑ කියලා..."

"කාංචන වගේ තව එකෙක්ව හොයලා දෙයි... එයාවත් බදින්න බෑ කියන්න බෑනේ... නේද..."

"ම..ට ක..ර..න්..න දෙය..ක් කියන්නකෝ..."

මුතු කීවේ අඬමින් අසරණවය.

"මේ මිනිහත් මාව අතාරින පාටක් නෑ..."

"ම්..."

"මෙයාලත් කෑගහගෙනම එනව නම් මං..."

"මො..නා..ද කරන්නේ..."

Elegantta

"මේ ගෙදරින් යනවා අක්කේ..."

"කොහෙද.. උඹට පිස්සුද..."

"යන්න තැනක් නෑ තමා..."

"ඒක නෙමේ උත්තරේ..."

"මගේ ප්‍රශ්නෙට උත්තර නෑ..."

නිම්මි මුතු දෙස තියුණු බැල්මක් හෙළුවාය. ඇය උඩට ආවේ මුතු සමඟ දෙයක් කතා කරන්නට හිතාගෙනමය.

"චූටි..."

"අක්කේ..."

"ජීවිතේ ප්‍රශ්න විසඳද්දී අවංක වෙයන් චූටි... බොරු කරලා වැඩක් නෑ..."

"කියන්න ඉතින්..."

"මේ ඔක්කොම කෙළවරේ ඉන්නේ මධුවන්ත නේද..."

නිම්මි ඇසුවේ මුතුගේ දෑස්වලට එබීගෙනය. මුතු එහෙමම ටික වේලාවක් බලාගෙන උන්නාය.

"ඔ..ව්.. එයා තමා..."

නිම්මි සුසුමක් පිට කළාය. පපුවම හිස් කළාය.

"මං අහන්නේ මධුවන්තට ඉස්සර කරපු ආදරේ ගැන නෙමේ.."

"ඉස්සරටත් වඩා අද මං එයාට ආදරෙයි... ගොං..ඩ..ක්..."

නිම්මි අහන්නටත් පෙර මුතු කීවාය.

"අ..ක්..කේ..."

"කියපන්..."

"මං දන්නවා එයත් මට ආදරෙයි..."

නිම්මි කතා කළේ නැත. ඒ ගැන දන්නේ කෙල්ලමය. ඒවා

දැනෙන්නේ ආදරය ඇති පපුවලටම පමණි.

"චූටි..."

"ම්..."

"එහෙනම් ඒකට ටිකක් නැඟිට්ටන්න දීපන්... ටික කාලයක්..."

"එ..තකං ම..ම..."

"එතකං උඹට බලන් ඉන්නම වෙනවා... ඒකා අසරණවෙලා ඉන්නේ..."

"එයාගේ ජීවිතේට මං ආවොත් මං එයාට අසරණ වෙන්න දෙන්නෑ..."

"ඒත් චූටි මේක පුදුම ලෝකයක්... ඒකට බරයි..."

මුතු හිල්ලුවාය. නිම්මි ඇගේ උරතලය මත සුරත නැඹුවාය.

"චූට්ටක් පපුව හිර කරගෙන ඉඳපන්..."

"ම්..."

"කොල්ලා ඉක්මනට නැඟිටියි... එදාට අපි කතා කරමු... ම්... ඇයි උඹ කල්පනා කරන්නේ..."

"ම..ට අ..ක්..කේ.. එයයි දුවයි ළඟට යන්නමයි හිතෙන්නේ.."

"චූටි... මේක කෙල්ලේ සෙල්ලමක් නෙමේ... ඌ අසරණයෙක්... අහිංසකයෙක්... දරුවෙක් එක්ක තනිවෙච්ච කොල්ලෙක්... ජීවිතේ පහසු නෑ..."

"ම..ට එ..යා..ව මේ පාරත් නැතිවෙයි..."

"මං ඉන්නවනේ..."

මුතු තොල් පට තද කරගෙන දෑසින් උනනා කඳුළුවලට ගලා යන්නට ඉඩ දුන්නාය.

"එයා හෙට එනවලු..."

Elegantbooks.com

"හෙ..ට..."

"ම්.."

"ඇයි ඒ..."

"අක්කා කිව්වනේ නවතින්න තැනක් හොයාගන්න කියලා... ඒක වෙන්න ඇති..."

"කොහොමත් කොල්ලට දැන් මෙහේ ඉන්න බෑ..."

"ම්.. එයා ගියදෙන්..."

"උඹට අවුරුද්දක් දෙකක් කට්ටි පනින්න පුළුවන්ද..."

"ලේසි වෙන්නෑ... ලබන මාසේ බන්දලා දෙන ගානට කතාව..."

"ඒකත් එහෙමද..."

"මං ඒක මොකක් හරි කරගන්නම්... අ..ක්කේ..."

"ම්..."

"එයාට..."

"ඉතින්..."

"මා..වත් අරගෙන සිංගප්පු යන්න බැරිද..."

නිම්මි දුකෙන් මෙන් සිනාසුණාය.

"ඒක ලේසි වෙන්නෑ කෙල්ලේ... ඇරත් මේවා ඔක්කොම දැනගනී... නේ..ද..."

"ම්.."

"අයියා හවස කියපු කතාවක් කියන්නද..."

"මොං..ක..ක්..ද..."

"ම..ට කතා කළා සිංගප්පු යන්න... මල්ලිවත් අරගෙන යන්ලු..."

"ඔ..ය තුත්දෙනාම ය..ත්..ත..."

"උඹව දාලා යන්න නෙමේ... නිකං කිව්වේ..."

"අනේ අක්කේ..."

"එ..හෙම වෙන්නෑ... අපි බලමු... කොල්ලට ටිකක් හැදෙන්න දෙමු..."

මුතු හිස වැනුවාය. කොහොමත් ඔහු නැගිටිය යුතුමය. දූගේ ජීවිතය වෙනුවෙන් වත් ඔහු නැගිටිය යුතුමය.

* * * * * * * * * * *

මධුවන්ත එළියට ආවේ දුව නිදාගත් පසුය. ඇඳ උන් කමිසයේ බොත්තම් දෙක තුනක් විවර කළ මධුවන්ත පැමිණ සිමෙන්ති පඩිය උඩ වාඩි වූවේය.

හිතන්නට බැරි තරමට පපුව බරය. එසේ කියා දැන් නොහිතා ඉන්නටද බැරිය. ප්‍රශ්න සියල්ලම ඇත්තේ කටේය.

අද නිම්මි අක්කා අරම කීවේ තමා ගැන තරහකින් නොවන බව මධුවන්ත දනී. ඇය එහෙම කීවේ අඬමිනි. වදිමිනි. "ඔයා මහත්තයෝ ඒ ගෙදර වැටිලා ඉන්නෙපා... මොකක් හරි පිළිවෙලක් හදා ගන්න... අපිත් යනවා..." ඒ වචන මධුවන්තට තවමත් ඇසෙන්නාක් බඳුය.

ඇය එහෙම කීවේ නොකියාම බැරි නිසා බව මධුවන්ත දනී. ඒ තරමටම ඇයව අසරණ කරන්නට මධුවන්තට සිතෙන්නේ නැත.

"එච්චරට ප්‍රශ්න නිසා මට එහෙම කිව්වේ... නැත්නම් කියන්නෑ..."

මධුවන්ත සිතුවේය.

"මහරගම කිට්ටුවෙන් වගේ පුංචි ගෙයක් හොයා ගන්න පුළුවන් වෙයි... කෙල්ලටයි මටයි නිදහසේ වැටිලා ඉන්න තිබ්බොත් ඇති... මොනවා කරන්නත් කලින් ඒක කරන්න ඕන..."

හෙට උදෙන්ම කොළඹ යනවා යැයි මධුවන්ත සිතා ගත්තේය.

Elegantta

රවී හැදුවේ මධුවන්තව කොළඹට බස්සන්නටය.

"එපා මචං ඉන්න ටිකේ ඉඳපන්... මං බස් එකේ යන්නම්..."

"මං ඉක්මනට එන්නම්..."

ජීවිතය තමාව වෙහෙසට පත් කරන්නේ වෙටටු දමමිනි. ඒ වෙටටුවලින් බේරීම පහසු නැත. පොඩ්ඩ වැරදුනොත් කැලිත් නැත. සමහරුන්ට ජීවිතය බෙදන්නේ එහෙමය. අරියාදුවට වගේය.

අද යද්දී මුතුගේ මුහුණේ වූ හැඟීම මධුවන්ත සිහි කළේය. තවමත් ඇය තමා හා හරියට වචනයක් කතා කරන්නේ නැත. එහෙත් ඒ ඇස් ගැටෙද්දී පපුවට දැනෙන්නේ පුදුමාකාර ලෙන්ගතුකමකි. වචන දාහකින් කියන්නට බැරි දෙයක් ඒ බැල්මක කැල්මක ලියා ඇතිවාක් මෙනි.

දුවා ඇයට අර තරම් සමීප වෙද්දී මධුවන්තට ලෝබකමක් නොදැනෙනවා නොවේ. මේ ජීවන කාන්තාරයේ තනිවූ තමාටත් දුවටත් එහෙමවත් කාරුණික වන අය නැත.

එහෙත් ජීවිතය ළඟ ඉඳ ඇත්ව යද්දී දුකය. පාළුය.

"දි..දී නෑ..."

එහෙම කියා දුව අඬන්නේ ඒකය. ටික දවසකින් ඇයව හොරු අරගෙන ගියාක් සේ වෙනු ඇත. ඇය කොතරම් අකමැති වුවද අන්තිමට ඒ කසාදය සිදුවනු ඇත.

"ප.වි... එයාගේ ජීවිතේම අදුරේ තියෙයි..."

මධුවන්තට එහෙම සිතෙයි. ඇය වැනි කෙනෙක් සමඟ ලස්සන ජීවිතයක් පටන් ගන්නා හැටි ඕනානම් මධුවන්තට පෙන්විය හැකිය. එතෙම ජීවිතය පටන් ගන්නට මධුවන්තටද ආසය. ජීවිතයේ ලස්සන බැඳීම්වලට ලෝකයෙන් පැලෙන්නේ ඒ බැඳීම් නැතුව ජීවිතයේ අනාථ වූ හදවත්මය.

17

මුතු ඇහැරුණේ පාන්දරමය. ඊයේ ඇය නිදා ගනිද්දීත් බොහෝ රෑ විය. දෛවය පපුව අඩියටම හිර කරන විට කිසිවෙකුට නිදාගත නොහැක. පාන්දරම ඇහැරී මුතු ඇඳ මතට වී කල්පනා කළාය. තව දවස් දෙක තුනකින් අම්මාත් තාත්තාත් ලංකාවට එන බව මුතු දනී. ඒ එන්නේ කෙළින්ම නමාව අල්ලා ගන්නටය. සමහර විට ඔවුන් බැංකොක් වලදීම මේ කසාදයට දිනද නීන්දු කරගෙන එනු ඇත.

තමාගේ කටේ සද්දයට බයවී කාංචන මේ කසාදය අත් නොහරින බව මුතු දනී. අවචර දේවල් කියද්දීත් කාංචන උන්නේ අර නොහොඬිනා හිනාවෙන්මය. ඒ හිනාට දැක මුතුගේ ධෛර්ය බිංදුවටම වැටිණ.

Elegantlks.com

අනාගතය ගැන තීරණයක් ගන්නට මේ වෙලාව නොවේ, අත්තා කීවා හරිය. දැන් උදාවී ඇත්තේ මේ ජීවිතය ගැන තීරණයක් ගත යුතු කාලයය.

මුතු ගොස් අල්මාරිය ඇරියාය. ඇඳුමක් නෝරා එය ඇඳ ගිය නැඹුරු ඇය කාමරය පුරා එහේ මෙහේ සරමින් මොහොතක් උන්නාය.

කාංචනව බඳින්නේ නැත්නම් මේ ගෙදරද සිටිය නොහැක. අම්මාත් තාත්තාත් බැංකොක් සිට ආ පසු මේ කතාව කියන්නට මුතු සිතාගෙන උන්නාය.

එහෙත් එතැන් සිට තත්වය හිතාගන්නට වත් බැරි ලෙස වෙනස් වන බව මුතු දනී. අම්මාත් තාත්තාත් කෙසේ හෝ කාංචනව නමැති බන්දා දෙනු ඇත. මේ මාළිගා වලින් එළියට බහින්නට වෙන්නේ එදාටය.

මුතු නාගෙන එද්දී පාන්දර හයය. අද දවසම ඇවිදින්නට ඇත.

නිමේ ආවේ මුතු කුවාය වන දවටාගෙන නාන කාමරයේ එද්දීය.

"උ..දෙන්ම නාගෙන වුටි..."

"වැ..ඩ දෙක තුනකට යන්න අක්කේ..."

නිමේ කෙල්ල දෙස බලා උන්නේ පුදුමයෙන් මෙනි.

"වැ..ඩ දෙ..ක තු..න..ක් කි..විවේ වුටි..."

"මේගොල්ලෝ ලංකාවට එන්න කලින් මට කරන්න වැඩ ටිකක් තියෙනවා අක්කේ..."

නිමේ මුතුගේ සීතල බාහුව අල්ලා ගත්තාය.

"ක..ර..න්..න හිතන් ඉන්න දෙයක් කියපන් කෙල්ලේ..."

මුතු අසරණව සිනාසුණාය.

"ජීවිතේ ප්‍රශ්න වලට උත්තර නෑ අක්කේ... උත්තර හොයන්න ඕන..."

"ඉ..කින් උ..ඔ මේ යන්නේ..."

මුතු හිස ඔසවා නිමේ දෙස බැලුවාය.

"අක්කා මොනවත් හිතන්නෙපා... ඒත් ඔයා වුටිටක් මගේ ප්‍රශ්නෙන් ඈත්වෙලා ඉන්න... නැත්නම් මගේ ප්‍රශ්නවල කුණු ටිකක් වැවෙන්නේ ඔයාගෙයි ඔයාගේ අහිංසක මහත්තයාගෙයි ඇහේ..."

නිමේගේ ඇස්වල කඳුළය.

"ඒ..න් වුටි..."

"මට පුංචි සටනක් කරන්න වෙනවා... ඒ සටන අද හෙටම මට පටන් ගන්නත් වෙනවා... අඳේ කරන්නේ නැති තාප්පයක් මගේ ජීවිතෙක් එක්ක ජීවත් වෙනවට වඩා සටනක් කරලා මැරෙන එක හැපක්..."

මුතු කීවේ පහත් හඬිනි.

"කො..හෙ..ද යන්නේ වත් කියපන්..."

"ම..ගේ පාස්පෝට් එක අලුත් කරගන්න ඕන... නව දෙකුත් දෙනෙක්ව හම්බවෙන්නත් ඕන..."

"පා..ස්..පෝට් එක අලුත් කරගන්න... ඒ කියන්නේ වුටි..."

"කොහේවත් යන්න හැමේ අක්කේ... ඒත් ඕන වෙයි..."

නිමේට කිසිවක් සිනාගත නොහැක.

"උදේ මල්ලිත් කතා කළා... කොළඹ එනවා කියලා..."

"එයාටත් ජීවිතේ ලොකු සටනක් කරන්න වෙයි අක්කේ... ලෝ..ඛ ඩ..ට..න..ක් පව්... නනියම දුක් විඳියි... ඒක ලේසි නෑ..."

මුතු දිග සුසුමක් හෙළා කීවාය.

"ඉ..ඩ..ක් කිව්වා නම් එයාට උදව් කරනවා... අ..ම්..මි ගෙ..නේ එයාගේ දුව ගාවවත් ඉන්නවා... ඒත්.. මා..ත් හිරවෙලා..."

Elegantlk.com

"අයියයි මායිත් රෑ වෙනකල් කතා කළා... උඹලා දෙන්නා ගැනම..."

"අපි දෙන්නා දෙවිදිහක අනාථයෝ දෙන්නෙක්..."

මුතු ඇදුම් වතට දමා ගනිමින් කිවාය. කෙල්ල අද වෙනදාට වඩා හොඳ ඇදුමක් අඳියි.

"අයියයි ඔයයි මේ ප්‍රශ්නවලින් ටිකක් ඇන්වෙලාම ඉන්න..."

"එ..හෙ..ම ක..ර..න්..නේ කො..හොං..ම..ද චූටි.. උ..ඹලා දෙ..න්..නා විනරනේ අපට ඉන්නේ..."

"ජීවිතේ එහෙම දේවල් වෙනවා අක්කේ..."

මුතු ඇඳගෙන නිමා වන තුරුම නිම්මි ඇය ළඟට වී උන්නාය. මුතු හැන්ඩ් බෑගයද දමාගෙන නිම්මි දෙස බැලුවාය.

"අ..ක්..කේ..."

"චූටි..."

"රූ..පි..ය..ල් පන්දාහක් විතර තියේද..."

එහෙම අහද්දි නිම්මිගේ පපුව හැරීගෙන ගියේය.

"නි..යෙ..නවා චූ..ටි.. මං දෙන්නම්..."

කාමරයෙන් යද්දී නිම්මි මුතු දෙස බලාගෙනම උන්නාය. කෙල්ලෝ දෙන්නා පහළට ආවේ එකටම වාගේය.

"පාස්පෝට් අලුත් කරනවලු... තීරණයක් ගන්නවලු... සටනක් කරනවලු... අනේ මන්දා ප්‍රියා කෙල්ල මොනවා කරන්න යනවද කියලා..."

කාමරයට ආ නිම්මි අඳිමින් උන් ප්‍රියමන්තට කිවේ අඬමින් මෙනි.

"එයාටත් ජීවිතේ ගැන හිතන්න දෙන්න නිම්මී..."

"ම... හිතලා කොහෙන් නවතියිද දන්නෑ මුන් දෙන්නා... ඒං

රුපියල් පන්දාහක් ගන්නවා නොදේ... කෙල්ල ඉල්ලනවා..."

"පව්..."

ප්‍රියමන්ත කීවේ ඇත්තටම දුකෙනි. මුතු නිම්මි එන තෙක් දොරකඩ උන්නාය.

"හ..වස් වෙන්න කලින් වරෙන් චූටි..."

"ම... අ..ක්කේ..."

"ඇයි..."

"අද මධුවන්න ආවාම..."

"ඉතින්..."

"කෑම ටික මෙහෙන් දෙන්න... දුවන් නැන්නම් බඩගින්නේ... ලේනට කියන්න..."

"මං කියන්නම්..."

"මං යන්නම්..."

නිම්මි ගියේ ත්‍රීවීලරයකය. ගෙදර වාහන තියෙද්දී ඇය ත්‍රී වීලරයක ගියේ ඇයිදැයි නිම්මි සිතුවාය.

මධුවන්තවත් දුවවත් බස් එකේ යවන්නට රවීට දුකය. මධුවන්න කෙල්ලවත් අන්දාගෙන එද්දී අම්මාත් රවීත් බලා උන්නේ ඇත්තටම දුකෙනි.

"අ..නේ උදේට කෑවෙත් නෑ... මං පුතේ මේ පාන් චූටිටත් හැදුවා බඩගිනි ආවොත් කවන්න මගදී..."

මෙහෙමම ගිහින් මධුවන්තට කොළඹ බස්සා එනවායැයි රවී සිතා ගත්තේය.

"මං ගිහින් එන්නම් අම්මේ එහෙනම්... රවී යන්න කලින් එන්නම් අම්මේ..."

"පුතා හිටියත් නැතත් පුතා එන්න..."

Elegantaks.com

මධුවන්ත කෙල්ලව බිම තබා අම්මාට දණ ඔබා වැන්දේය.

"ආච්චම්මට සාදු කියන්න පුතු..."

කෙල්ල බිම පෙරළෙද්දී අම්මාගේ පපුව ඇත්තටම කඩාගෙන ගියේය.

"අ..නේ... මගේ චූටි මැණිකට දෙවි පිහිටයි..."

මධුවන්ත රවී දෙස බැලුවේය.

"මචං ම..ම..."

"යන් මචං... මං උඹව බස්සන්නම්..."

"මං මචං බස් එකේ යන්නම්..."

"පිස්සුද මධූ... මේ කෙල්ලත් එක්ක බස්වල යන්න බෑ... මටත් කොළඹ යන්න ඕන... හවස එනවනේ... මං මධූව බස්සලා එන්නම් අම්මේ..."

"හොඳයි..."

මධුවන්ත වාහනයට ගොඩ වූයේ අම්මා දෙස තවත් වරක් බලාය.

"හිටියනම් ඉවරනේ මචං..."

"යන් බං... උඹව මෙහෙම අරින්න පුළුවන්ද... කයියක් දාගෙන යන්..."

කෙල්ල අම්මාට අත වැනුවාය. මධුවන්ත ඇයව උකුල මත තබා ගත්තේ සුව පහසු ලෙසිනි. බස් රියේ ගියා නම් ඇත්තටම අමාරුය. ඒත් ජීවිතයේ ඉන්නා දෙතුන් දෙනාට වුව මේ තරම් වද දෙන්නට හිත් දෙන්නේම නැත.

"මචං... ගිය ගමන් ගෙයක් හොයපං මචං... දුවව අක්කා ගාව තියලා ගිහින් හරි ගෙයක් බලපං..."

"එ..හෙම තමා මචං හිතන් ඉන්නේ..."

"කරන දෙයක් ඊට පස්සේ හිතමු... උඹට එහේ ඉන්න බෑ..."

"ගෙයක් හොයාගන්න පුළුවන් වෙයි මචං..."

"මාත් මචං හිතුණොත් මේ ගමන ගිහින් ඉක්මනට එනවා... එහෙම උනොත් ඇවිත් මොනවා හරි කරමු... මී..."

ගැටඹේ පන්සල ළඟදී මධුවන්ත පඬුරු දාන්නට බැස්සේ කෙල්ලවත් වඩාගෙනමය.

"බඩගිනිද මගේ අම්මිට..."

"නා..ත්ති බඩ..."

කෙල්ල බඩ පෙන්නන්නේ බඩගිනි වූ විටය. මධුවන්තගේ පමණක් නොව රවීගේද පපුව උණු විය.

"අම්මා සැන්ඩ්විචස් හදලා දුන්න නිසා හොඳයි... අපි පාන් කමු අම්මියෝ..."

බිත්තරත් බටරුත් එකට මිශ්‍ර කර තනා තිබූ පාන් පෙති කෙල්ල කෑවේ ආශාවෙනි.

"ම..ධූ..."

"මචං..."

"භාෂි සිංගප්පූරුවේ නැත්නම් මචං..."

මධුවන්ත රවී දෙස මොහොතක් බලා උන්නේය.

"ඒත් දුවව අරන් ගිහින් කොහොමද මචං මං රස්සාවක් කරන්නේ..."

"ඒ..ක..ත් ඇත්ත..."

"සිංගප්පූ ගමනක් ගැන මං හිතන්නෑ මචං... මං මේ රටේ නැගිටිනවා..."

"ඔ..ව් මේ අපේ රටනේ නේද මචං..."

"ම්... පිටරටක දරුවෝ හැදෙද්දී දුකයි..."

රෑ සැහෙන වෙලා යන තුරු හිස වැනුවේය.

"උඹ ලංකාවේ සෙට්ල් වෙන්න හිනපං... මාත් එන්නම්... මේ මළ ඉලව් සිංගප්පූ රස්සාවක් නිසා ඔළුව දුවන්නෙම එහෙට..."

"මගේ ජීවිතේ කඩා වැටුණේ සිංගප්පූරුවෙදි... ඒ රටට ආදේ යන්න හිතෙන්නෑ මචං..."

මධුවන්න ඇන්නම කීවේය.

ජීවිතයට උන්නර නැත. උන්නර නිකම් ලැබෙන්නේද නැත. ඒවා සොයා ජීවිතය පීරිය යුතුය. මධුවන්න දැන් එය තේරුම් ගෙ උන්නේය. කොල්ලාට නොතේරෙන එකම දේ කොහෙන් පටන් ගන්නද කියාය.

එහෙත් කොහනකින් හෝ පටන් ගත යුතුය. නැතහොත් අනුලාගන්නට වෙන්නේ නමාගේන් කෙල්ලගේත් ජීවිතයේ සුන්බුන්ය. කුඩුය. .

"මධු... ප්‍රංචි බිස්නස් එකක් ගැන හිනපන්..."

"උදේ රෑ හිතනවා මචං.... පොටක් පෑදෙයි..."

"උඹ දකයා... උඹට පොටක් පෑදෙයි... දෙයියෝ උනත් එහෙම උඹට කරන එකක් නෑ..."

"මොනවා හරි කරලා නැගිටිමොන් මචං මේ කෙල්ලගේ වාසනාව... කෙල්ල ලොකු වෙද්දි පොඩි හරි ගේ කැල්ලක් හදා ගන්න හරි ආසයි... කෙල්ලම නොඳ ඉස්කෝලෙකට දාගන්නත් ආසයි..."

කොල්ලාගේ මේ අනිංසක හිනවලට උදව් නොකරනවාහේ අවියත් පඬා නොද නැත.

"ළං වැටිච්ච වැරිල්ලට ටිකක් හොල්මන් වෙලා මචං උන්නේ.. ඒත් දැන් එහෙමම ඉඳලා බෑ... ගැණියෙක් ජීවිතේට කරපු විහාරෙ ජීවිතේම යට කරන්න බෑ..."

"කවදහරි උඹ නැගිටලා ඉදිරිදී හාමිටම දුක හිතෙයි..."

"එයාගේ දුකෙන් මට වැඩක් නෑ..."

මධුවන්න කීවේ කළකිරීමෙනි. දැනට සිනිය යුත්තේ ජීවිතයේ නතුවූ බාල ගැණියෙක් ගැන නොවේ.

"මාව කොළඹට දාලා පලයන් මචං... අම්මා පව්..."

මධුවන්න සැහෙන වෙලාවකට පසු කීවේය. කොළඹින් බහින්න සැහෙන දෙයක් කරන්නට සිනාගෙනය.

18

අනුෂ්කාට කෙල්ලව දකිද්දීම මොකක්දෝ සිතුණි. කෙල්ල වෙනදා එන්නේ වාහනයේය. අද පැමිණ ඇත්තේ ත්‍රීවීලරයේය. මූණත් එච්චරම නොඳ නැත.

"මු..තු..."

"උඹව බලලා යන්න ආවා..."

මුතු කිවේ ත්‍රීවීලරයෙන් බසිද්දීමය.

"ඇ..යි කෙ..ල්ලේ..."

අනුෂ්කා ඇසුවේ කෙල්ලගේ අතින් අල්ලාගෙනමය.

"නෑ... අ..නූ... මු..කු..ත් නෑ..."

"උඹේ මූණත් එක්ක අමුතුයි..."

අනුෂ්කා කීවාය. මුතු සිනාසුණේ අසරණවය.

"ය..න් උඩට..."

"උ..ඔට අද වැඩක්ද..."

"ම..ට මො..න වැඩද කෙල්ලේ... ඇයි..."

"මා..ත් එ..ක්ක ටුට්ටක් එළියට යන්න වරෙන්..."

"හුව... හිටපන් මං චේන්ජ් එකක් දාගෙන එන්නම්..."

මුතු ඇඳ මත වාඩි වූවාය. අනුෂ්කා අල්මාරිය ඇර ඇඳුමක් තෝරමින් බැලුවේ කෙල්ල දෙසය. මොනවා හෝ ලොකු දෙයක් වූ බවක් ඒ මුහුණේ ඇත.

"මං පටස් ගාල එන්නම්... උඹට තේ එකක්..."

"නෑ... අපි මඟින් බොමු... ඇඳගෙන වරෙන්කෝ..."

"ම්..."

මුතු ඇඳ මතට වී හිතුවේ තමාගේ ජීවිතය ගැනය. ජීවිතයේ ප්‍රශ්නවලට උත්තර සොයාගෙන යාම අමාරුය. එහෙත් එසේ නොකර ජීවිතයට ලැබෙන උත්තර සමඟ ජීවත් වීම ඊට වඩා අමාරුය.

අක්කාගේ ඔළුවට හැම දෙයක්ම දාන්නට නොහැක. ඇය ඉන්නේද ලේසි පාසු ප්‍රශ්නයක නොවේ. කොයි මොහොතක හෝ ඇයත් ප්‍රියමන්තත් ඇඳුම් ටිකද ගෙන ගෙදරින් යනු ඇත.

"හ..රි කෙ..ල්ලේ යං... අද අම්මත් නෑ..."

"ගෙදර වහල දාල යන්න පුළුවන්ද..."

"නෑ කෙල්ලේ... පුංචි ඉන්නවා... මං කියලා එන්නම්..."

කෙල්ලෝ දෙන්නා මුලින්ම ගියේ රාජගිරියේ මැක්ඩොනල්ඩ් අවන් හලටය. අනුෂ්කා බන් දෙකකුත් අඹ බීම දෙකකුත් ගෙන පැමිණ ඉද ගත්තාය.

Elegantkaar.com

"ප්‍රශ්නේ මොකක්ද කියපන් මුතු..."

"මා..ව හි..රවෙලා අ..නූ..."

ඒ ටික කියද්දී කෙල්ලගේ ඇස්වල කඳුළය. මුතු අඬමින් සියල්ල කීවාය. අනුෂ්කා කෙල්ලගේ අත පිරිමැද්දේ ඇත්තටම දුකෙනි.

"ම..ට තේ..රෙ..න..වා... මෙතන අඬන්නෙපා කෙල්ලේ... කඳුළු පිහදගනිං..."

මුතු නෙත් බිමට බර කරගෙන අත වූ සුදු ටිෂූ එක නෙතට තබා තෙතමාත්තු කර ගත්තාය.

"උඹ මොනාද කරන්න හිතන් ඉන්නේ..."

මුතු නෙත් එසෙව්වාය.

"මේක බීලා ඉඳපං... උඹ කාලත් නෑ නේද..."

"මේ ඇති..."

අනුෂ්කා මුතු දෙසම බලාගෙන උන්නාය. කෙල්ලගේ මේ දුක පිටුපස තවත් කතාවක් ඇතැයි ඇයට නිකමට සිතුණි.

"මුතු..."

"ම..."

"මං ප්‍රශ්නයක් අහන්න උඹ ඇත්තම කියනවද..."

"ප්‍රෝ..මි..ස් ම..ට බොරු කරන්න දෙයක් නෑ අනූ..."

"මං දන්නවා..."

"ම..."

"එ..දා ආපු මධුවන්ත අයියා අර දුවාගේ තා..ත්..තා..."

"ඉ..හි..න්..."

"එ..ය..ත් මේ ප්‍රශ්නේ කොහක ඉන්නවද..."

මුතු සෑහෙන වෙලාවක් බිම බලාගෙන උන්නාය.

"එයා ඉන්නේ ප්‍රශ්නේ කොහක නෙ..මේ අ..නූ..."

"එහෙනම්..."

"ම..ගේ හි..තේ කෝ..න..ක..."

අනුෂ්කා දිග සුසුමක් පිට කළාය.

"ඒක උ..ඔ අවංකවම කිව්ව එක නොදයි..."

"දු..වා ම..ට ප..ණ ව..ගේ... ඊයේ පෙරේදා අපි උන්නේ නුවර... කෙල්ල මං ගාවමයි... අම්මට ව..ගේ ම..ට ආ..දරෙයි..."

"ඉ..හි..න්..."

"ඒ තාත්තයි දුවයි පපුව පුරාම අනූ..."

මුතුගේ නෙත් අගකින් කඳුළක් විසි විය.

"එ..දා ම..ට තේ..රු..ණා..."

"මං උඹට ඇත්තම කියන්නද..."

"ම්..."

"මධුවන්ත අයියා සිංගප්පූරු යන්න කලින්..."

"ඉතින්..."

"මං හි..හි..න් එයාට ආදරේ කළා... ම..ගේ ෆස්ට් ලව් එක.. එයා..."

"අ..නේ දෙයියනේ..."

"ඒත් එයා හිටපු ගමන් සිංගප්පූ ගියා.. එහෙදි මැරි කළා... අපි ගොඩාක් ඇත උන්නේ..."

"ම්..."

"ඒත් එ..යත් මට යන්න කලින් ආදරේ කරලා තියෙනවා... මං ගැ..න හිතලා තියෙනවා... ඒත් බයට කියලා නෑ... ප්‍රියමන්ත අයියගෙයි

Elegantlk.com

අක්කගෙයි මැරේජ් එකට අම්මයි තාත්තයි ඒ දවස්වල පරල වෙලාමත් උන්නේ... බයට එයත් හිතේ තද කරගෙන ඉඳලා..."

"මේ ජීවිතේ එ..හෙම දේවල් වෙනවා මුතු..."

"ම්.. කවුද හිතුවේ එයා ආයෙත් මෙ..හෙම හිතට එයි කියලා.."

"ආදරේ එහෙමයි... කන්දකින් වත් වහලා තියන්න බෑ... උල්පතක් වගේ කන්ද පලාගෙන පැදෙනවා..."

"ඔ..ව්.. දැ..න් පපුව පලාගෙන එ..න..වා... ඒ දෙන්නා ළඟ වැටිලා ජීවත් වෙන්නමයි හිත අනූ... ජීවිතේ සතුට තියෙන්නේ ඒ අහිංසක තාත්තයි දුයි ළඟ..."

මුතු පපුව හාරාගෙන මෙන් එද්දී කීවාය.

"හ්..ම්.. දැන් මො..කද කරන්නේ..."

"ම..ට පි..හි..ට වෙ..ය..න් අ..නූ..."

අනුෂ්කා කෙල්ලගේ දැතින්ම අල්ලා ගත්තාය.

"අ..නේ උ..ඔ..ට පිහිට නොවී ඉන්නවද... ඒත් අපි මො..හාද දැන් කරන්නේ..."

"ම..ටත් හිතාගත්නම බෑ අ..නූ... මධුවන්ත අයියා දැනට ඉන්නේ අපේ යෙදර වූට් කාමර කැල්ලක... අක්කා වැදලා වගේ අම්මගෙනුයි තාත්තගෙනුයි ඉල්ල ගත්තේ..."

"ම්..."

"එයත් වුල් ජීවිතේම මුල ඉඳල පටන් ගන්න ඕන... අර දුවාවත් සඳහෙන..."

"අයියට ලේසි නෑ..."

"ම්... එක්කො එයාට පිහිට වෙන්න ඕන... නැත්නම්..."

"එයාට ජීවිතේ හදාගන්න දීලා අයිත් වෙන්න ඕන.. නේ..ද..."

"ඔ..ව්.. ඒ ජීවිතේ එක්ක සෙල්ලම් කරන්න බෑ... ජීවිත දෙකක් එනන..."

මුතු ලේ රහ වූ උගුරට අඹ බීම උගුරක් ගත්තාය. සීතල අඹ බීම උගුර පහළට ගියේ උගුර තෙමාගෙන මෙනි.

"මං අද ගෙදරින් ආවේ පාස්පෝට් එක අලුත් කරන්නත් එක්ක..."

"පා..ස්..පෝ..ට් එක..."

"ඔ..ව්..."

"ඒ ඇයි කෙ..ල්..ලේ..."

"අ..නේ මන්දා අනූ... හිතෙනවා එහෙම කරන්න.. මට ගැලවීමක්ම නැනේ.. කාංචනව බඳින්නම උනොත්..."

"ඇන්ටියි අන්කලුයි උඹව මරයි එහෙම නොකළොත්..."

"ඔ..ව් දැන් බැංකොක් ගිහින් ඉන්නේ... ආවාම මං කියන්න ඉන්නේ..."

"එ..කපාර කෙල්ලේ..."

"මං වෙ..න මො..නවා ක..ර..න්..න..ද... තව අවුරුද්දක් දෙකක්වත් නිදහසේ ඉන්න පුළුවන්නම්..."

"කොල්ලා නැගිටිනකම් බලන් ඉන්නද..."

"ම්..."

"ඒත් අයියා මේ මොනවත් දන්නෑනේ මුතු..."

"ද..න්..නෑ න..ම් ත..මා..."

"අයියා එයාගේ ජීවිතේ මොන තීරණ ගනීද කියලා අපි දන්නැනේ කෙල්ලේ..."

"තා..ම එය..ත් එක්ක මං ක..තා කරලවත් නෑ හරියට... ඒත්..."

Elephantlake.com

"ඇයි..."

"එයාටත් තේරෙන්න ඕන අනූ..."

"මේ අහපන් කෙල්ලේ... මාත් පිට ඉඳන් උඹ දිහා බලන නිසා මං දන්නේ... උඹ දිහා බලද්දී හිතෙන්නේ උඹ රාජ කුමාරියෙක් කියලා... ඒ වගේම මධුවන්ත අයියටත් හිතෙනවා... දුප්පත්කමට අසරණකමට වඩා දෙයක් නෑ... එයා වැටිලා ඉන්නේ... දුවෙක් එක්ක තනිවෙලා ඉන්නේ... ජීවිතේ අනාථ වෙලා ඉන්නේ... එහෙම ඉද්දී උඹ වගේ කෙල්ලෙක් එයාගේ ජීවිතේට එනවා කියලා හීනෙකින් වත් හිතනවද... ඒවා වෙන්නේ සුරංගනා කතා වල..."

"ඒත් මං..."

"ඔ..ව් උඹ එහෙම හිතනවා... ඒත් ඇත්ත ඊට වඩා කටුකයි... ඒ ඇත්තට මූණ දෙන්න අද උඹටත් බෑ... අර දුප්පත් නාත්තටත් බෑ..."

"උඹ කියන්නේ ම..ට කාංචන..ව..."

"මං දන්නවා උඹට එයාව මැරි කරන්න බෑ කියලා... ඒත් මධුවන්ත අයියගේ ජීවිතේට ළං වෙන එක ඊට වඩා අමාරුයි... ගොඩක් අමාරුයි..."

මුතු අනුෂ්කා දෙස බලාගෙනම උන්නාය. ඇය කියනා දේ මුතුට නොතේරෙනවා නොවේ. එහෙත් මේ පපුවේ ඇති අහිංසක ප්‍රාර්ථනාවලට එසේ එහෙමම මිය යන්නට දෙන්නේ කෙසේද...

ජීවිතයේ දෙවන වතාවටත් ප්‍රථම ප්‍රේමයට මිය යන්නට දෙන්නේ කෙසේද... ඒ ආදරය පව් යැයි මුතුට සිතෙයි.

"මෝ..නවා හරි දෙයක් කරන්න හිතන් ඉන්නව නම් කියපන් මුතු... අපි ඒ ගැන කතා කරමු..."

"මං දෙ..ය..ක් හි..ත..න් ඉ..න්..නවා ත..මා අ..නූ..."

"ඉතින් කියපන්..."

"අ..ද එළියට බැස්සෙත් එහෙම හිතාගෙන තමා..."

"පාරේ උත්තර නැනේ කෙල්ලේ... කියපන්..."

"ම..ට බැරිද අ..නූ එයා එක්ක රටකට යන්න... දුවවත් අරගෙන... ම්.. මේ ඔක්කොම දා..ලා..."

අනුෂ්කා සැහෙන වේලාවක් සිතුවාය.

"සිං..ග..ප්පූරුව..ට..ම..."

"කො..හෙට හරි..."

"ම..ට දු..වා..ව බලන් ඉ..න්න පුළුවන්... එයාට රස්සාවක් කරන්න පුළුවන්..."

"ඌ..ඔ ඒකද අ..ද පාස්පෝට් අලුත් කරන්න ආවේ..."

"ම්..."

මුතු අසරණ ලෙස හූමිටි තැබුවාය.

"ගෙ..ද..ර ත..ත්..වේ කො..හොම වෙයිද මුතු..."

"දන්නෑ කෙල්ලේ... ඒත් එයාලා මං ගැන හිතන්නෑ... මගේ හිතේ තියෙන ඒවා එයාලට කියන්න බෑනේ..."

"පිස්සුද... ඒවා නිකමට වත් අඟවන්නෙපා..."

"ඔ..ව් එයාට බරයි..."

මුතු හිස් දෑසින් පාර දෙස බලාගෙන උන්නාය.

"මු..තු..."

"ම්..."

"ඌ..ඔ මෙ..හෙම කරපන්..."

"කොහොමද..."

"අම්මටයි තාත්තටයි කියපන් කාංචනව මැරි කරන්න බෑ කියලා...

Elegantlk.com

නැත්නම් කියපන් දැන්මම මැරි කරන්න බෑ කියලා..."

"කියන්න ඉන්නේ එහෙම නමා අනූ... ඒත් එයාලා ඒක අහන්නෑ.. ක..නා කරන්න එපා කියලා තියෙන්නේ..."

"ඒත් එහෙම කියපන්..."

"ආව ගමන්ම කියනවා... ඒත් ඊට පස්සේ..."

"ඊට පස්සේ ගන්න තීරණයක් ගනිං..."

"එ..න..කොට මධුවන්න..."

"දැ..න්..මම ඒ අහිංසකයට මේවා කියන්නෙපා මුතු..."

"මි..."

"එ..යා..ව ම..ට ආයෙත් නැ..තිවෙයි..ද..."

මුතු ඇසුවේ අඬමින් මෙනි.

"උ..ඔ එ..වි..ව..රටම ආදරේද කෙල්ලේ..."

"මි... හිතාගන්නවත් බෑ අනූ... පපුවම බරයි... මා..ව හේරුම් ගනි..න්.."

"ම..ට තේරෙනවා..."

"ම..ට ඒ දෙන්නගෙම ජීවිතේ සරසන්න පුළුවන්... එයාලා ගා..ව වැටිලා ඉන්න ම..ට ලැබෙනව නම්..."

"උ..ඔ මෙ..හෙම හිතනවා කියලා ද..න්නවනම් ඒකා පැලෙයි මුතු..."

"එ..යා මේ මො..න..ව..ත් දන්නෑ..."

"එයාට කියලා උඹට එයා ළඟට යන්න බැරි උනොත් ඒක මය ඇන් විඳින වේදනාවටත් වඩා වැඩි වේදනාවක් වේවි..."

"මි... මං ඒක දන්නවා... ක..නා නොකර ඉන්නේ ඒකයි..."

මුතු පාර දෙස බලාගෙන හිතුවේ ඔහු ගැනය. අද ඔහු දුවවත් රැගෙන කොළඹ එන බව මුතු දනී. දැන්ම ගොස් කෙල්ලව වුට්ටක් වඩා ගන්නට මුතුට ආසය.

"මේ ජීවිතේ කොහොමත් එයත් එක්ක ඇරෙන්න වෙන කෙනෙක් එක්ක ගෙවෙන්නෑ අනූ..."

"ඒත් ටිකක් ඉවසන්න වෙනවනේ මුතු... උඹ ඉන්න තත්වෙත් අවුල්... එයා ඉන්න තත්වෙත් අවුල්..."

"අපි දෙන්න එකතු උනොත් ඒ පවුල් දෙකම නිරවුල්..."

මුතු කීවේ මෘදු හඬිණි. බැරෑරුම් හඬිණි. පපුවට තේරෙන දෙයක් ඇත. හදවත එහෙම කියන්නේ පිස්සුවටම නොවේ.

"මධුවන්ත අයියා උඹට උඹ තරම්ම ආදරෙයි කියලා කොහොමද දන්නේ..."

"මං ද..න්..නවා අ..නූ... මං එයාව දන්නවා..."

"ඒ..ක..ත් එ..හෙ..ම..ද... උඹ හිතලා තීරණයක් ගනිං කෙල්ලේ.. ඔන උදව්වක් මං කරන්නම්..."

සැබෑය. ජීවිතය ගැන තීරණ ගත යුත්තේ නමාය. මේ සියල්ල ඔහුත් සමඟ තනිවී කතා කළ හැකි නම්... එසේ නම් මේ පපුව සැහෙන්න නිදහස් වෙනු ඇත.

එහෙත් එය කරන්නේ කෙසේද... මේ සියල්ල මෙහෙමම ඔහුට කියන්නේ කෙසේද...

Elegantkade.com

19

රවී මධුවන්තව ඇරලවා නුවර ගියේ හිතකින් නොවේ. ඇත්තටම දුකිනි. කොල්ලා ඉන්නේ ජීවිතයේ මොන තරම් අමාරු අවස්ථාවකදැයි රවී දැන උන්නේය.

"මං ඉක්මනට කොළඹ එනවා මධූ..."

"හොඳයි මචං..."

"උඹ එහෙනම් ගෙයක් හොයපං..."

"ම..."

"මොනම වෙලාවකවත් උඹ තනිවෙලා කියලා හිතන්නෙපා.. මං උඹට ඉන්නවා..."

"ඒ වචනේ ඇති මචං... මාම්ට උම්මා දෙන්න පැටියෝ..."

කෙල්ල රවීව බදාගෙන උම්මා දුන්නාය. රවීගේ දෙනෙත් තෙත් විය.

යළින් පුංචි කාමර කැල්ලට එද්දී මධුවන්තට දුකය.

"සුදු අම්මිට බඩගිනිද... ආ පැටියෝ..."

"නා..ත්..නි බඩ මේ..."

කෙල්ල බඩ පෙන්වන්නේ බඩගිනි වූ විටය.

"නාත්ති ඉක්මනට පැටියට කෑම හදලා දෙන්නම්... බෝතික්කිව දොයි කරන්නකෝ..."

මධුවන්ත කෙල්ලගේ හිස අතගා නැගිට්ටේය. දැන් පාඨය. අද ගෙදර කවුරුවත්ම පෙනෙන්නට නැත.

නිම්මි ආවේ මධුවන්ත නූඩ්ල්ස් ටිකක් හදන්නට ගනිද්දීමය. දවස් තුන හතරක් රසට බත් කෑ කෙල්ලට දැන් නූඩ්ල්ස් දෙන්නට ඔහුට දුකය. එහෙත් කරන්නට දෙයක් නැත. ජීවිතය මෙහෙමය.

"ම..ල්ලී... දැන්ද ආවේ... ඇහුණෙවත් නෑ..."

"අ..ක්කේ.. රවී ඇවිත් බැස්සුවා... මං හිතුවා අක්කලා ගෙදර නෑ කියලා..."

"අයියා නම් වැඩට ගියා... කෙල්ලත් උදෙන්ම කොහෙද ගියා..."

මුතුව සිහිවී මධුවන්තගේ දෙනෙත් බර විය.

"නංගිව හරියට හෙව්වා..."

"කෙල්ලත් හිටියේ හරි දුකෙන්... රෑට කෑවෙත් නෑ..."

"රෑ නංගී දූට කතා කළා..."

"ම.. මට කිව්වා..."

"නංගී හරි පුදුම කෙනෙක්..."

මධුවන්ත කීවේ බරවූ හදිනි.

Elegantlk.com

"චූටි කෙල්ලට හරි ආදරෙයි..."

"මං දන්නවා අක්කේ... මගේ දුප්පත් කෙල්ලට එහෙම ආදරේ කරන එකත් පිනක්..."

"කෙල්ල බයෙන් හිටියේ... කෙල්ලට පුරුදු වෙලා ඔයාට අමාරු වෙයි කියලා..."

"එ..හෙම නෑ අක්කේ... දුවාත් හරි ආදරෙයි නංගිට... එයාගේ අම්මටවත් එහෙම ආදරේ නෑ..."

"ම්... කන්න හදන්නෙපා මල්ලී... ලලිතා උයනවා... මං කිව්වා දුවාටත් බත් ටිකක් හදන්න කියලා... මං අද දුවාට කවන්නම්..."

මධුවන්ත හීටරය ගැසුවේය. තිම්මි කෙල්ල ළඟම ඉඳගත්තාය.

"ම..ල්ලී..."

"අක්කේ..."

"මං අරම කිව්වට මා එක්ක තරහද..."

"මොං..ක..ක්ද අක්කේ..."

"මං ම..ල්ලිට කි..ව්වේ නෑ..න..ක් හොයාගන්න කියලා... පස්සේ කෙල්ලත් කිව්වා එහෙම කිව්ව එක හොඳ නෑ කියලා..."

"ඔයාලා තුන්දෙනා ගැන මේ පපුවෙන් කවදාවත් අහිතක් හිතන්නෑ අක්කේ... මං හැමදේම දන්නවා... මට තේරෙනවා..."

"ඒත් මට හරි දුකයි... ඔයා ලංකාවට ආවේ මේ වගේ දෙයක් බලාපොරොත්තුවෙන් නෙමේ..."

"මට මගේ අය ඉන්නවා කියලා පපුවට දැනෙනවා අක්කේ... මට ඒ ඇති... ඔයා මේවා හිතන්නෙපා..."

"ඇ..ත්..ත..ටම හිතන්නෙපා මහත්තයෝ... මං ඇත්තටම අසරණයි..."

මධුවන්තගේ හිත කිරි ගැසිණි.

"අපි ඔක්කොගෙම ජීවිතවලට හොඳ දවසක් එයි අක්කේ... මට නංගි ගැනත් හරි දුකයි..."

"ම්.. ඔ..ය අද ත්‍රීවිල් එකක ගියා... වැඩ දෙක තුනකට යනවා කියලා... මොනවද ලොකු දෙයක් හිත හිත ගියේ..."

"කිව්වේ අක්කේ..."

"පාස්පෝට්ටුත් අලුත් කරගන්න කියලා ගියේ..."

"පා..ස්..පෝ..ට් අලුත් කරගන්න..."

"ම්... කෙ..ල්ල..ගේ හිතේ මොනවා හරි තියෙනවා..."

මධුවන්තට දිග සුසුමක් පිට විය.

"නංගි... ර..ට දාල ය..න්..න... මේ කෙල්ල..."

"දන්නෑ මල්ලී..."

"එයා දිහා බලද්දී මොනවද හිතෙනවා තමයි. හරි අසරණ පාටයි මේ දවස්වල මූණ..." මධුවන්ත සිතුවේය.

"ම..ල්ලී..."

"අක්කේ..."

"ඇත්තටම සිංගප්පූරුව ජීවත් වෙන්න හොඳද..."

"ජීවත් වෙන්න ඒ තරම් හොඳ රටක් නෑ අක්කේ... හරිම පහසුයි... මේ රට වගේ නෙමේ... එක්කෙනෙක් මට ඒ රට එපා කළා... නැත්නම් හරි නිදහස් රට..."

"ඊයේ අයියත් කිව්වා..."

"මොං..ක..ක්..ද..."

"අපිත් යන්ද කියලා ඇහුවා... අපට මෙහේ ගොඩ කාලයක් ඉන්න බැනේ ම..ල්ලී..."

Elegantkade.com

ම.. ඒත් අක්කේ.. මු..කු..."

"කෙල්ලන් ජීවිතේ මොන තීරණ ගනීද දන්නෑ මල්ලී..." ජීවිතවලට වෙන දේ නිතාගත්තවත් නොහැක.

"නැ..න්..දි එක්ක ඔහින් බයි කමු.. ම..."

"සු..දු බ..යි..යා..."

"ඔව් පැටියෝ... සුදු බයියා කමු... එ..න්..න..."

නිමේ කෙල්ලව වඩා ගත්තේ පපුව ඇවිලී යද්දීය.

"ම..ල්ලී... වොෂ් එකක් දාගෙන එන්න කෑම කන්..න..."

"නෙ..දයි අක්කේ..."

නිමේ දුවවත් රැගෙන ගිය පසු මධුවන්ත එතෙමම මොහොතක් ඇදේ වැතිරුණේය. ඔහු සිතුවේ මුතු ගැනය. ඇය මේ හදිස්සිම පාස්පෝට් අලුත් කරන්නේ රට යන්නද...

* * * * * * * * * * *

හාමිනී කවුනායක ජාතයන්තර ගුවන් තොටුපලෙන් බැස්ස විගසම හත්තේ රවීටය. ඔහු නිවාඩුවකට ලංකාවට පැමිණ ඇති බව ඇය කාගෝ අයතනයෙන් දැන ගත්තාය. ඇය ආවේ රවීගේ ලංකාවේ ඥාතීන් දුරකථන ඔස්සේ දැනුවත්කරමය.

හාමිනී ලංකාවට ආවේ හදිස්සියේමය. ඇය හා සම්බන්ධයක් පැත්ථ ඉන්දියන් ජාතිකයා හදිස්සියේම ඉන්දියාවට ගියේ ඔහුගේ වැදගත් උත්සවයකට යැයි කියාය. ඒ ගමනට තමාවත් එක්කගෙන යන්නැයි කියා ඔහු ඒ දේ කළේ නැත.

"ආ යූ මැඩ්..."

එය කියූ පසු ඔහු ඇහුවේ එහෙමය. හාමිනී කෙටි කිහිපදක් ගෙන ලංකාවට ආවේ ඒ කාලයේදීය.

කවුනායකින් බේරිලීම අඟට සිහිවූයේ මධුවන්තවය. මොකක්හ් හේතුවක් නිසා මේ ආ ගමනේදී මධුවත් දුවවත් බලා යා යුතුයැයි ඇඟට සිතුණා.

"රවී මං..."

කටහඬින්ම රවී හාමිනීව හඳුනා ගත්තේය.

"හාමී... මේ.. ලංකාවේ නැ..මියෝ එ..කකින්..."

"ඔ..ව් මං දැන් මේ ෆ්ලයිට් එකෙන් බැහැලා වික්‍රමයි... එයාර් පෝට් එකේ ඉඳලා කතා කරන්නේ..."

"ඔ..යා ලංකාවට ආවා..."

"ඔ..ව් ඇයි.. මේ මහෙත් රටනේ..."

"පුදුමයි ඔයාට ඒක මතක තිබිලා..."

රවී කීවේ ඇත්තටමය. තමාගේ කියතා සැමියාත් දරුවත් අමතක වූ ගෑණිට රට මතක තිබීම පුදුමය.

"හරි හරි... ඔයා මට ඕන දෙයක් කියන්න... ඔයා ඉතින් මධුගේ පැත්තෙනේ..."

"හා..මි... මං මගේ යාළුවගේ පැත්ත ගත්තා නෙමේ... මං ගත්තේ සාධාරණ පැත්ත..."

"මදෑ... ලංකාවට බැහැලු ගමන් ඔයාට ගත්තා..."

"හරි හරි... මොකවද ඇත් කෙරෙන්න ඕන... මං ඉන්නේ නම් ඔවර හාමී... මධු රියේ පෙරේදා හිටියේ මං ගාව..."

හාමිනී මොහොතක් කතා නොකර උන්නාය.

"දැ..ව් ස..නී..පෙ..න්..ද..."

ඇය මෙතෙම අහද්දී ඇත්තටම රවීට ලැජ්ජය. හැම ගැණියෙක්ටම ඉගෙදර ඉඳුන් අම්මා කෙනෙක් විය නොහැක. ඇත්ත ඒකය.

Elegantta.com

"ම..ධූ කෙල්ලව ඇහැක් වගේ බලා ගන්නවා කියලා ඔයා දන්නවනේ හාමි... කෙල්ල සනීපෙන් ඉන්නවා..."

"ම්.. එ..යාලා කො..හෙ..ද..."

හාමි ඇසුවාය. රවී කල්පනා කළේය. ඔහුත් දුවත් අර ගෙදර ඉන්නවා කීම අමාරුය. එහෙත් නොකියාත් බැරිය.

"ඇයි රවී..."

"හාමි..."

"මී..."

"ඔයා හිතනවද මධූව හම්බවෙන එක හොඳයි කියලා..."

"ම..ට දුවව බලන්න ඕන..."

"මධූ උදේ කොළඹ ගියේ... දැන් කොහාටද ගියාද දන්නෑ..."

"ඇයි රවී බොරු කියන්නේ... මධූ ඉන්නේ නිම්මිලගේ දිහානේ..."

"එ..හේ තමා හිටියේ හාමි... ඒත් දැන් මධූ ඉන්නේ රූම් එකක් අරගෙන..."

"ඇයි ඒ..."

"කොල්ලා එහෙමනේ... කාටවත් කරදරයක් කරන මිනිහෙක් නෙමේනේ හාමි..."

"මට මධූගේ නම්බර් එක දෙන්න..."

"ඌ ෆෝන් එකක් අරන් නෑ හාමි... ඔයා මට රෑ වෙලා ගන්න... මධූ මට කතා කරයි..."

"මං ඉන්න ආවේ නෑ රවී... සතියක් ඉඳලා යන්න ආවේ... දුවට බඩු වගයක් ගෙනාවා... බලලා දීලා යන්න ඕන..."

"සිංගප්පූරු රට ටෝයිස්ද..."

"මී..."

"කෙල්ලට ඕන ඒවා නෙමේ හාමි... ආදරේ..."

හාමිනී කතා කළේ නැත.

"කමක් නෑ... ඔයා හවස කතා කරන්නකෝ... කොහෙද ඉන්නේ..."

"ඇන්ටිලා ඉන්නවනේ ගල්කිස්සේ... එහේ ඉන්නේ..."

"හරි.. ඔයා හවස ගන්න..."

හාමි දුරකථනය තබා ආගමන විගමන කවුන්ටරයෙන් මෑත්ව බැගේජ් අංශයට ආවාය. "සිංගප්පූරුවෙන් ආපු මිනිහා කාමර කෑල්ලක් අරන්දූ ඉන්නේ..." හාමි සිතුවේ කුරිරු ලෙසිනි. අර තරම් ජීවිතය කඩා වැටුණ පසු එහෙමවත් ජීවත් වීම කොතරම් දුෂ්කරදැයි ඇය නොදනී.

* * * * * * * * * *

රවී මධුවන්තට ගත්තේ හාමි කතා කළ ගමන්ම වාගේය.

"මධූ..."

"මවං..."

"දැ..න් හාමි ක..තා කළා..."

"හා..."

"හාමි දැන් ලංකාවට ඇවිත්..."

"ලංකාවට ඇවිත්..."

"ඔ..ව්.. එයාර් පෝට් එකේ ඉඳලා මට ගත්තේ... ආපු ගමන්දූ..."

"ම..ට මේ රටෙත් ඉන්න දෙන්නැද්ද බං... ඉන්න තැනකට වෙලා ඉන්න තිබ්බනේ..."

"සතියක නිවාඩුවකටලු ආවේ..."

"ෂුවර් එකටම ප්‍රේමවන්තයා කොහේ හරි ගිහින් ඇති... වතාවකුත් ඌ ඇමරිකා ගිහින් මෙයා නයි මිරිස් ගාගෙන වගේ උන්නේ..."

"වෙන්න ඇති... උඹ කොහෙද ඉන්නේ කියලා ඇහුවා..."

"උ..ඹ මං මෙ..හේ කි..ව්වද..."

"මං කිව්වා උඹ කාමරයක් අරන් ඉන්නේ කියලා... මට කියනවා බොරු කියන්න එපාලු..."

"මං කොහේ උන්නත් මොකද මචං..."

"දුවට තෑගි ගෙනාවලු දීලා බලලා යන්න ඕනලු..."

"බලපං ඉතින්... ම..ට කෙ..ල්..ලව නිස්කලංකේ හදාගන්න දෙන්නෑනේ..."

"අ..ප..ට මො..න..වත් කියන්න බෑනේ මචං... ඒ අම්මනේ..."

"මේ කෙල්ලට අම්මා කෙනෙක් කවදාවත් හිටියේ නෑ මචං..."

"හරි.. දැන් මට ආයෙත් ගනී... මං මොකද කියන්නේ..."

"ම..ට තේරෙන්නෑ මචං... දුවව බලන්නත් ඔන... මං ඉන්න තැනකට එක්කං එන්නම් කියපන්... ඉචරනේ..."

"ඔව් එහෙම හොඳයි... මාත් කැමති නෑ ඔය ගෙදරට හාමි එනවට... ගල්කිස්සේ ඇන්ටි කෙනෙක් ගාවලු ඉන්නේ..."

"මං දන්නවා එහේ... ඉන්න වෙලාවක් අහගනිං... මං එක්කං යන්නම්..."

"ම..ධූ..."

"ඇයි මචං..."

"මේ ගෑණිව තියාගත්ත බැරිද..."

"හාමි සරුංගලයක් මචං... තුල තියාගතැකි... සරුංගලේ උඩ..."

මධුවන්ත කීවේ එපමණකි.

රවී කතා කළ පසු මධුවන්තගේ මුවින් දිග සුසුමක් පිට විය. හාමි හදිස්සියේම ලංකාවට ආවේ ඇයි... ආ හැටියේම ඇයට දුව්ව දකින්නට ඕනා වුයේ ඇයි...

"ම..ල්ලී... යං බ..ත් ක..න්..න..."

නිම්මි පැමිණ කතා කළේ එවිටය.

"ඇයි මල්ලී..."

මධුවන්ත සිනාසුණේය.

"දුවා කෝ අක්කේ..."

"කාලා නාවද්දීම නිදිමතේ... මං පස්සේ අපේ ඇදේ නිදිකළා..."

"බත් කෑවම එහෙමයි..."

මධුවන්ත නිම්මි පසුපසම ඇවිදගෙන ආවේය.

"අක්කේ..."

"ඇයි මල්ලී..."

"හාමි..."

"ඉ..තින්..."

"නෑ... ලංකාවට ඇවිත්... දැන් රවී කිව්වේ..."

"ලංකාවට ඇවිත්... එයා මොනාට දැන් මෙහේ එන්නද..."

"නිවාඩුවකට ඇවිත්... දැන් දුවාව බලන්න ඕනලු..."

නිම්මිට සුසුමක් පිට විය.

"ම..ල්ලී එයාව හ..ම්..බ..වෙ..න..ව..ද..."

"ම.. අම්මනේ නේද..."

"ඔ..ව් න..ම..ට... මං ඒත් මෙ..හෙට ගෙන්නන්නෑ... එයා ඉන්න

Elegantlk.com

තැනකට ගිහින් දුවව පෙන්නලා ගේනවා..."

නිමේ කිසිවක් කීවේ නැත. හාෂිණී ලංකාවට ආවේ නිකමටම නොවෙතැයි නිමේට සිතුණි.

මුතු ආ ඇදුම් පිටින්ම ඇඳට බරවූවාය. හිතේ එකලාසයක් නැති වූ විට ගතවද කෙඩෙත්තුය. ජීවිතයේ ප්‍රශ්නවලට උත්තර කොහේවත් නැත. මුතු එක් දින සේවාව යටතේ අවුත් කර ගත් ගමන් බලපත්‍රය දෙස බලා එය හෑන්ඩ් බෑගයට දැම්මාය.

"පාස්පෝට් හදාගත්තා කියලා මං කොහේ යන්නද... කාත් එක්ක යන්නද..."

මුතු සිතුවේ අසරණවය. වෙලාවකට පපුව හාරාගෙන එන ආත්මානුකම්පාව දරාගන්නට පවා අමාරුය.

"ඔයාට ඔයාගේ ජීවිතේ ක්ලියර් කර ගන්න ටික කාලයක් යයි... ඔයා දුවවත් බලාගෙන හැමදේම කරන්න ඕන... ඒ අමාරුව මං දන්නවා... එහෙම ඔයාගෙන් මං පිහිටක් ඉල්ලගෙන යන්නේ කොහොමද..."

මුතු දිග සුසුමක් හෙළුවාය. අම්මාත් තාත්තාත් සිකුරාදා රෑ එන බව මුතු දනී. සෙතසුරාදා උදේම දෙන්නා දුම්මල වරම අතට ගනු ඇත.

නිකමට වත් රට හැර යන කතාවක් ඔවුන් හා කිව නොහැක. එසේ වුවහොත් තමාව හිර කරන බව මුතු දනී.

"ඔය දෙන්නා ඔයාලගේ පොඩි දුව ගැන හිතන්නෙත්නම් මාත් එක්ක යනවා... දරුවන්ටත් ආස ජීවිතයක් තියෙනවා කියලා ඔයාලා කවදහරි තේරුම් ගනී..."

මුතු එසේ සිතා හිත හදා ගත්තාය. එහෙත් මේ ගෙවල් දොරවල් හැරදා යන්නේ කොහාටද... තමාව බාර ගන්නේ කවුද...

නිමේ උඩට ආවේ කෙල්ල ආ බව දැනගෙනය. ආ ඇදුමෙන්ම ඇඳට වී ඇය කල්පනා කරනු දකිද්දී නිමේගේ හිතට වකිතයක්

ඇතුණි.

"වූ..ටී..."

මුතු අසරණ පාටට සිනාසුණාය.

"මං බයෙන් හිටියේ... හත අට වෙනකම් කොහෙද ඉයේ... ෆෝන් එකත් වහලා දාලා..."

"පා..ස්..පෝට් එක ලැබෙද්දී හයත් පහුවුණා..."

නිමේට හීල්ලින.

"හිතන් ඉන්නේ මොනාද කියලවත් කියපන් කෙල්ලේ..."

ඇනට මේ ජීවිතයේ කියන්නට දෙයක් නැත.

"අ..ක්..කේ..."

"ම්..."

"එ..යා ආව..ද..."

"ම..ල්ලිද..."

"ඔ..ව්..."

"දුවා..."

"දවල් මං කෙල්ලට බත් කවලා අපේ කාමරේ නිදි කෙරෙව්වා... පව්..."

"ම්.. පව් තමා... ඇ..න් කෝ..."

"තාත්තයි දුවයි කාමරේ ඇති..."

නිමේ දෙනෙත් එසෙව්වාය.

"වූටී..."

"ඇයි අක්කේ..."

"අරකි ඇවිත්..."

නිම්මි කියන්නේ කා ගැනදැයි මුතුට එකවර සිතාගත නොහැකි විය.

"අ..ර..කි කිව්වේ..."

"හාෂිණි..."

මුතුගේ පපුව මොහොතකට සෙලවිණි.

"ඒකි මො..ක..ට..ද දැ..න් මෙ..හේ ආවේ... මේ කොල්ලගෙයි දූගෙයි ජීවිතේ ආයෙත් කාලා යන්නද..."

කෙල්ල ඔහොම කියන බව නිම්මි දැනගෙන උන්නාය.

"නිවාඩුවකට ඇවිත්ලු..."

"ම..ධු..ව..න්..ත අයියට ක..තා ක..ර..ල..ද..."

මුතු ඇසුවේ සැකයෙනි. ඊටත් වඩා බයෙනි.

"කොල්ලට කතා කරල නෑ... රවීට කතා කරලා... මල්ලිව හම්බවෙන්න ඕන කියලා..."

"එ..යා මො..ක..ට..ද දැ..න් ම..ධු..ව..න්..තව හ..මි..බ වෙන්..නේ..."

කෙල්ලගේ වචන තුළ වූ අසරණ බව නිම්මි දැක්කාය.

"දුවව බලන්නෝන කියලා කියලා තියෙන්නේ... අනේ මත්දැන්නෑ චූටි..."

"දැ..න් එ..යා මේ..හේ එ..න..වා..."

"මෙහෙට ගෙන්න ග..න්..නෑලු... එයා ඉන්න තැනකට දුවව ගිහින් පෙත්තනවලු..."

"මොකටද ඒකිගේ පාමුළට යන්නේ... එයා කවුද මේ මිනිහව එහෙම ගෙන්න ගන්න..."

"ඒත් නිතියෙන් ඒ එයාගෙත් දුවනේ චූටි..."

"එයා ඒ..ක..ට..ම ඇවිත් තියෙන්නේ අ..ක්කේ..."

"මල්ලී වැඩි විස්තරයක් කිව්වේ නෑ චූටි..."

හාෂිණි යළිත් ලංකාවට ආවේ ඇයි... මධුවන්ත ලංකාවට ආ පසු ඇයට මධුවන්තගේ අගය දැනුණාවත්ද... ඔහු වැනි පිරිමියෙක්ගෙන් සදහටම ඈත් වීමට ගැණියෙක්ට කොහොමත් හිත හදා ගන්නට අමාරුය.

"එයාලා සාමදාන වෙන්නද අක්කේ යන්නේ..."

"ඒ ගැණි ලංකාවට ආවයි කියලා මල්ලි ඒකිත් එක්ක සාමදාන වෙන්න යනවයෑ චූටි... කොල්ලා විඳපු දුක් ඌට අමතක වෙනවද..."

"ඒ..හෙ..ම..ලු..නේ..."

"කො..හොම..ද..."

"බැඳපු අය කොච්චර උනත් ආදරේ එයාලටමලුනේ..."

නිම්මි සිනාසුණාය.

"ඔ..ව් ඒ ආදරෙන් හිටපු දෙන්නෙක් නම්... හාෂිණි කවදාවත් මේකා එක්ක ආදරෙන් උන් නෑ..."

මුතුට දිග සුසුමක් පිට විය.

"ඔය ගැණි ලංකාවේ හිටියනම් හරි... එතකොට මධුවන්ත අයියට පුළුවන් ආයෙත් සිංගප්පූරු යන්න..."

"ඌ..ඔ..වත් අ..රගෙනද.. මී..."

නිම්මි එය කෙල්ලගේ මූණටම ඇසුවාය. මුතු බිම බලාගෙන මොහොතක් කතා නොකර උන්නාය.

"ඇ..යි ඒ ව..ගේ දෙ..ය..ක් උනොත් ඒක හොඳ නැද්ද..."

ආදරේ කරන්නට ගත් විට කෙල්ලන් නොහිතන දෙයක් නැත.

"ජීවිතේ ප්‍රශ්න එච්චර ලේසියෙන් විසඳෙන්නෑ චූටි..."

"ඒත් සාගරේක ප්‍රශ්න පොඩි උත්තරේකින් විසඳෙනවා අක්කේ.. උත්තර දැන දැනත් දුක් විඳින්න වෙන එකයි දුක..."

"හැ..ම ප්‍රශ්නෙකටම මල්ලි ගාව උත්තර නෑ වුට්..."

මුතු සිනාසුණාය.

"එයා ගාවත් නෑ මං ගාවත් නෑ... ඒත්..."

"ඇයි..."

"අපි එකතු උනොත් ජීවිත තුනක ප්‍රශ්නවලට උත්තර තියෙනවා..."

නිම්මි මුතුගේ උරතලයට සුරත තැබුවේ කරුණාබරවය.

"අ..ක්..කේ..."

"ම්..."

"එ..යා..ට මං හරි ආදරෙයි අක්කේ..."

කෙල්ල කීවේ අඬමිනි. මෙහෙම කියන්නේ ඒ තරම් කැක්කුමකින් ඒ පපුව උණුවෙන නිසා බව නිම්මි දනී.

"මං ඒ..ක ද..න්..න..වා වුට්..."

"මා..යි වැර..දි..."

"ඇයි..."

"කා එක්කවත් නෙමේ කතා කරන්න තිබ්බේ..."

"එහෙනම්..."

"මධුවන්ත එක්ක... මං හරකියෙක්... ආව දවසේ ඉඳලා කතා නොකර උන්නා... ඇ..න් වචනයක් කතා කරන්න ලැජ්ජයි..."

නිම්මි එවර නම් සැහැල්ලුවෙන් සිනාසුණාය.

"ඒක නම් ඇත්ත... උඹට කතා කරන්න තිබ්බේ ඒකා එක්කම තමා... මං හිතුවා නුවරදී නාව ගන්නකොටවත් කතා කරන්න ඇති කියලා..."

"එ..යා ක..තා ක..ළා... මං ගො..ඒ උ..නා..."

"උඹ හිතනවා ඇති තියෙන මහත්තත්තකම කියලා..."

"එ..යා දන්නවා එහෙම නෑ කියලා..."

ගෑණියෙක්ට පිරිමියෙක් ගැන එහෙම ලේසියෙන් විශ්වාසයක් එන්නේ නැත. ආ පසු එහෙම ලේසියෙන් පපුවෙන් යන්නේද නැත. ආදරය සායමක් නොවේ. කහටකි. පැල්ලම් නොයන.

"වෙලාවක කතා කරලා බලපං... ඒත් වුට්..."

"ඇයි..."

"ඔ..ය ත..ර..ම්..ම ආදරයක් පෙන්නලා ඒකව පිස්සු වට්ටන්නෙපා..."

"ආදරේ පෙන්නන්න ඕන නෑ අක්කේ... ඒක දැනෙනවා..."

"ම්..."

නිම්මි කෙල්ලගේ කතාවට විරුද්ධ නොවූයේ එය දන්නා නිසාය.

"කොහොමත් මේ දේවල් එයා දැනගන්න ඕන... ඒක මට නුවරදී තේරුණේ..."

"ප්‍රශ්න ගැන හිතන්න ගියාම එරෙනවා වගේ වුට්..."

"ඒත් ගොඩ එන්නත් එපැයි අක්කේ..."

"ම්..."

"අර ගෑණි ළඟට යනවට නම් මං පොඩ්ඩක්වත් ආස නෑ... මහ ලොකු දරු කැක්කුම... කෙල්ල අතටවත් යන එකක් නෑ..."

"ම්.. අතට එන්නේ උඹේනේ... අදත් ගේ පුරා හොයනවා..."

"මං රෑට ගෙන්න ගන්නවා..."

"තාත්තවත් ගෙත්ත ගත්ත නම් හරිනේ..."

නිම්මි කීවේ විහිළුවට නොවේ.

20

භාෂිණී ලංකාවට ආ එක ගැන මේ තරම් හිතන්නේ කුමකටදැයි මුතු සිතුවාය. ඔහු ලංකාවට ආවේ ඇයව සම්පූර්ණයෙන්ම හදවතින් ඇත් කරය. එහෙම ආ පසු යළිත් ඇය සමඟ සමාදානයක් ගැන හිතන්නට හේතුවක් නැත.

එහෙත් ළිදට වැටුණු මිනිසා හදන්නේ ළිං කටින්ම ගොඩ එන්නටය. ළිඳේ වැටුණු මිනිසා පිදුරු ගහෙත් එල්ලෙනවායැයි කතාවක් ඇත. එහෙම එකේ ගැලවුණු කසාද යළිත් නයි වෙන්නටද බැරිකමක් නැත.

කොහොමත් දෙන්නා තවමත් නීතියෙන් දික්කසාද වී නැත. එහෙම එකේ කොයි වේලේ ඔය කසාදය පුටුටු වේදැයි දන්නේ නැත.

"අයාවයි දරුවවයි දාලා ඔය ගැණි ළඟට ආයෙත් මේකට යනවද... දරුවට ආදරයක් තියෙනවනම් වෙන මිනිහෙක් එක්ක යනවයැ..."

මුතුගේ හිත කියන්නට විය.

"ඔය ඇවිත් තියෙන්නේ හොඳකට නෙමේ... ඇඩි ඉහින් රත්තරන් කට්ටිය වගේ මිනිහනේ... ආයෙත් පවුල් කමු කිව්වොත් කඩී..."

පපුවට ආගන්තුක වේදනාවක් ආවාක් වැනිය. ඒ වේදනාව මේ තරම් අමිහිරට දැනෙන්නේ ඒ ජීවිතයක් සමඟ පැවලි පැවලී හිතන්නට යන නිසාද... මුතුට තේරුම්ගත් නැත. ඇත්තටම නැත.

"ඒත් එයා ගැනයි දරුවා ගැනයි මං මෙහෙම හිතනවා කියලා එයා දන්නෑ..."

හිතට කහඹිලියා ගැවුණු සේය. ඔහුට කතා කරන්නට පුළුවන් නම් දහ පාරක් කතා කර හමාරය. එනෙත් සිංහප්පුරුවේ සිට ඔහු අද දක්වා හරියට වචනයක් කතා කර නැත. එහෙම එකේ දැන් කොහොම කතා කරන්නද...

"ඉන්නම ආවද දන්නෑ... එහෙම වුණොත් දිගටම දුවට බලන්න ඕන කිය කියා එයි... කරපු වැරදිවලට සමාව දෙන්නම් කියලා මෙයත් ඒ ගැණි එක්ක එකතු වෙයි..."

මධුවන්තගේ ජීවිතයත් සමඟ එකට තබා හැම විටම හිතන්නට යන්නේ කුමකටදැයි මුතු සිතුවාය.

"එයා හිතන්නේ එයාගෙයි දරුවගෙයි ජීවිතේ ගැන... එයා ඉන්න තත්වේ හැටියට එයා මොන තීරණයක් ගනීද කියලා කියන්න බෑ- සමහර විට භාෂිණී කතා කළොත් ආයෙත් සිංහප්පුරුවට උනත් යන්න බැරි නෑ..."

එසේ වුවහොත් ඔහු ගැන මේ තරම් සිතන මේ හදවත පවිය. කාටවත් තමා ගැන අමුතු කැක්කුමක් නැත.

"මං මගේ ජීවිතේ ගැන හිතනවා කියලා හැමවෙලේම හිතන්නේ එයාගෙයි දූගෙයි ජීවිතේ ගැන..."

හිනාමතා එසේ සිතන්නේ නැත. හිතන්නේ ඔහු ගැනය. හිත දුවන්නේ ඒ නාන්නාත් දුවත් පසුපසය. එය නවත්වන්නට මේ හිත සූදානම් නැත.

"එයත් එක්ක පැයක් කතා කරන්න ලැබුණනම් එයා මොනාද හිතන්නේ කියලා දැනගන්න තිබ්බා... ඒත් කොහොම කතා කරන්නද..."

මුතු රෑ දහයට පමණ පහළට ගියේ ඈ එද්දී දුවාට ගත් සුදු බෝල හාවාද රැගෙනය. සනීප වූල් රෙද්දකින් මසා තිබූ හාවාව කෙල්ල දැක්කොත් ආසා වෙනු ඇත.

අද ගෙදර නිස්කලංකය. අම්මාත් තාත්තාත් ආ පසු මේ ගෙදර මේ නිවන නැත. මහ රෑ වනතුරු වාහන එයි යයි. නානාප්‍රකාර කටටිය පැමිණ මහ රෑ වන තුරු ඉඳියි. එහෙත් අද ඒ කලබලය ගෙදර නැත.

මුතු කුස්සියට යද්දී ලලිතා උන්නේ කුස්සිය අස් කරමිනි.

"මධුවන්ත මහත්තයා කන්න ආවද ලලිතා..."

"දුවව නිදි කර කර තේ හිටියේ බේබි... පස්සේ ගිහින් දුන්නා... නිදාගත්තෙත් ඇන්ද කොහෙද..."

"තේ ටිකක් බොමු ලලිතා... හරි තිබහයි..."

"මං හදන්නම්..."

මුතු හාවාද තුරුල් කරගෙන ඇනෙක්ස් එක පැත්තට ගියේ දහසක් දේ සිතමිනි. ඒ පැත්තට යද්දී දුටු දෙයින් කෙල්ලගේ හිතම කීරි ගැසිණි. තාත්තත් දුවත් දෙන්නාම බීමය. ඔහු රෙද්දක් බීම දමා දුවව නිදි කරවා ඒ ළඟම ඉඳගෙන ඇගේ හිස අතගාමින් උන්නේය. දොරකඩ එහෙම බීම ඉඳගෙන ඉන්නා ඔහු දකිද්දී ඇගේ පපුවම ඇකිලී ගියාක් බඳු විය.

"නං..ගී..."

මධුවන්ත මුතුව දැක්කේ හදිස්සියේය. හැමදාමත් මෙන්ම අද ද ඔහුව නෙත ගැටෙද්දී සිනාසෙන්නට අමතක විය.

"මේ.. හා..වා ගෙ..නා..වා..."

මුතු කීවේ බීම බලාගෙනය.

"දිදී කෝ කියලා අහ අහා හිටියේ... හාවා නැතත් නංගිව දැක්කනම් ඇති... දැන් නිදාගත්තේ... ඇදේ නිදා ගන්න බෑ කියලා මේ බීමට ආවා..."

එතනම බීම ඉඳගෙන ඉන්නට මුතුට ආසය.

"මං.. ඇ..දෙ..න් ති..ය..න්..න..ම්.. බි..ම සීතලයි..."

මුතු ඔහුගේ දෙපා උඩින් පැන කෙල්ලව ගත්තාය. නිදි බේරෙන මුහුණ ඇය දෙතුන් වරක්ම සිප ගත්තාය.

කෙල්ලව ඇඳ මත තබා පොරවා ඇය මොහොතක් ඒ මුහුණ දෙස බලා උන්නාය. මධුවන්ත නැගිට ඇඳ අද්දරට ආවේ ඒ මොහොතේදීය. ඇගේ පපුව පිපිරෙන ගාණය.

"නං..ගී..."

ඔහු කතා කරන්නේ වෙනස් හඬකිනි.

"ම්.."

ඇගේ හඬ ඇසෙන නොඇසෙන ගාණය.

"අ..ක්..කා කි..වි..වා නං..ගි පා..ස්පෝ..ට් හ..ද..න්..න ගි..යා කිය..ලා..."

මුතු බීම බලාගෙන හිස වැනුවාය.

"ත..නිය..ම..ම ර..ට..ක..ට ය..න්..න..ද හ..ද..න්..නේ..."

කෙල්ල කතා නැත.

"එ..හෙ..ම පිටරටක තනියම ජීවත් වෙන්න අමාරුයි නංගී..."

දෙන්නට පිළිතුරක් නැත.

"ත..ම..න්..ගේ කෙ..නෙ..ක් ඉ..න්..න..වනම් පුළුවන්... නැතුව අමාරුයි..."

මුතු කෙල්ලගේ පුංචි දෙපා පිරිමදිමින් බලා උන්නාය. වදනක් පිට නොවන්නේ ඇයි... පපුව හිරවී ගොස් ඇත්තේ ඇයි...

"එකපාර තීරණ ගන්නෙපා... මා..ත් එ..හෙ..ම ග..ත්..තා... අන්තිමට ජීවිතේ නතර උනේ නන්නත්තාර වෙලා... තාම නැගිටගන්න අමාරුයි..."

භාෂිණී ඇවිත් නේදැයි අසන්නට මුතුට සිතෙයි. ඒත් කොහොම අසන්නද...

"අ..ප..රා..දේ මං සිංගප්පූරුවේ හිටියනම් මං නංගිට එහෙට එන්න උදව් කරනවා... එ..හෙම උනානම් ඇත්තටම මං උදව් කරනවා..."

එවර කෙල්ලගේ දෑස් එසවිණි. "දැන් උදව් කරන්න බැරිද..." වැනි කතාවක් ඒ ඇස්වල විය.

"මො..නවා කළත් පරිස්සමින්..."

ඔහු කීවේ මෘදුවය. කරුණාවෙනි.

"දි..දී දු..න්..නා කි..ය..න්..න..."

ඇය හාවම කෙල්ලගේ කොට්ටය ළඟ තබා නැගිට්ටාය.

මුතු වසා තිබූ කෑම එක දැක්කේ යද්දීය. තවම ඔහු කෑම කා නැත. ලලිතා අතේ තේ එකක්වත් එවනවායැයි ඇය සිතා ගත්තාය.

* * * * * * * * * * * *

මධුවන්ත දුවව ලස්සනට අන්දවා ගත්තේ භාෂිණීට පෙන්වන්නටම නොවේ. එහෙත් සිංගප්පූරුවේ සිට රැගෙන ආ කෙල්ල

දුක් විඳිනවා යැයි ඇයට පෙන්වන්නට මධුවන්ත කැමති නැත. ඇරත් මේ ජීවිතයේ පුංචි පුංචි තනිවීමක් ඇරෙන්නට මහ දුකක් නැත.

දුව භාෂිණීව දැක කොහොම ප්‍රතිචාර දක්වාවිදැයි මධුවන්තට තේරෙන්නේ නැත. කෙල්ල ආදරේ ඇයට ආදරේ අයටය. ඒ අය අතරින් ඉස්සරහින්ම ඉන්නේ මුතුය. අද උදේ පාන්දර ඇහැරුණු මොහොතේ සිට කෙල්ල ඉන්නේ "දිදී ගෙනාපු හාවා" කියමින් මුතු ගෙන ආ හාවාව තුරුල් කරගෙනය.

කෙල්ලව සරසා ගත්තාට මධුවන්ත මහ ලොකුවට හැඩ වෙන්නට ගියේ නැත. මේ හදවතේ නැති ගෑණියෙක් සමඟ දැන් ජීවිතයක් නැත. මේ යන්නේද දුවව පෙන්නා ඒ හිසරදය ඉක්මනට ඉවර කරගන්න ඕනා නිසාය.

මුතු ඉන්නේ ගෙඋයනේ කොන්ක්‍රීට් ගල් ඇල්ලූ පාරේ ඇවිදිමිනි. ඔහුත් දුවත් භාෂිණීව හමුවන්නට යන බව ඇය දනී. එය ඇසූ මොහොතේ සිට මුතුට කාමරයට වී ඉන්නට බැරි විය.

"නංගී..."

මධුවන්ත කතා කළේ කෙල්ලව වඩාගෙන ඇය ළඟ නැවතීය.

"දි..දී හා..වා..."

කෙල්ල අත් ගසයි. මුතු බැලුවේ ඇය දෙස පමණි.

"හාවා ෂෝයි කුක්කි..."

"අ..පි කු..ක්..කු පෙ..ව්..වා.. හාවා බීලා..."

මුතුගේ පපුවේ ඇති ගින්දර නිවෙන්නේ මේ හුරතල් කතාවටය.

"දූගේ අම්ම ඇවිත්නේ නංගී..."

මධුවන්ත කීවේය. "එයා අම්මෙක්යෑ..." මුතුගේ කටට එන්නේ එහෙම කතාය. "එයා ආව ගමන් දුවවත් අන්දගෙන යන්න ඕනද... පාඩුවේ හිටියනම් ඉවරනේ..."

"යුතුකමක් විදිහට පෙන්නලා එනවා... එයත් කළොත් කරන්නේ තේරුමක් නැති වැඩක්... දුවටයි මටයි නිදහසේ ඉන්න දෙන්නෙම

Elegantlk.com

නෑ..."

"ඇති යන්නම් ගෑණි ගැන තේරෙනවා..." මුතු සිතින් කීවාය.

"දිදිට උම්මා දෙන්න පැටියෝ..."

කෙල්ල මුතුව බදාගෙනම උම්මා දුන්නාය.

"ගි..හි..න් එ..න්නම් නංගී..."

ඔහු ත්‍රීවීලරයට ගොඩ වෙනු මුතු බලාගෙන උන්නාය. අද ඔහු මේ ගමන යනවාට ඇය කැමතිම නැත. එහෙත් ඔහුටත් කරන්නට දෙයක් නැත. බැඳීම් හදාගත් විට කොහොමත් වදයය.

ත්‍රීවීලරයේ යන අතරතුර මධුවන්ත සිතුවේ මුතු ගැනය. ඒ මුහුණ මේ දවස්වල බලන්නට බැරිය. ඒ තරම් අසරණ පාටය. කෙල්ල බලද්දී මොනවාදෝ කියන්නාක් බඳුය. ඇය ඉන්නේ ඇත්තටම අවුල් වීය. ඒ පීඩනයෙන් මිදීම පහසු නැත. ඇයට පිහිටක් වෙන්නට පුළුවන් නම් හොඳය. එහෙත් මේ ජීවිතය ගැන පවා තේරුමක් නැතුව සිටිද්දී නවත් ජීවිතයකට කොහොම පිහිට වෙන්නද... ඇරත් තමා වැනි දුප්පත් අනාථයෙකු ඇය වැනි කෙනෙකුට කොහොම පිහිට වෙන්නද...

* * * * * * * * * * *

මධුවන්ත ගියේ ගල්කිස්සේ භාෂිණිගේ මායා ඇන්ටිගේ ගෙදරටය. භාෂිණිට ලංකාවේ මධුවන්ත දන්නා තරමට ඉන්නා එකම නෑයා මායා ඇන්ටිය. භාෂිණි ඇයව තුන් හතර පාරක්ම සිංගප්පූරුවට ගෙන්නා ගත්තාය.

මධුවන්ත ත්‍රීවීලරයෙන් බැස කෙල්ලව වඩා ගත්තේය. කෙල්ලගේ මුහුණ දකිද්දී මධුවන්තට දුකය. මේ ඉන්නේ දූගේ අම්මාය. අම්මලා දුවලාව බඩේ බොක්කේ බැඳගෙන හදනවා විනා දුවලාව පැයකට බලා රට යන සිරිතක් නැත.

"එ..න්..න මධුවන්ත..."

මායා දොරකඩටම පැමිණ කතා කළාය. මධුවන්ත ඇය හා

සිනාසුණේ ආගන්තුකවය.

"දුව දැන් ලොකුයිනේ... නේ..ද..."

ඇය දුවව අල්ලන්නට යද්දී කෙල්ල ඇකිලී අහක බැලුවාය.

"අපිට දැන් පුරුදු නැනේ ඉතින්..."

මධුවන්තට ඉඳගන්නට වත් හිතුණේ නැත.

"ඇන්ටි භාෂිට එන්න කියනවද..."

"මං කියන්නම්..."

හිතට දැනෙන්නෙ හිස් කාලකණ්ණි හැඟීමකි. ජීවිතයෙන් ඇත් කළ බැඳීම්වලට යළින් නිකමටවත් ළං වෙද්දී එනෙමය. එන්නේ මූසල හැඟීමකි.

භාෂිණි ආවේ කිසි දෙයක් නොවුණා සේ සිනාසෙමිනි. ඇය උන්නාටත් වඩා පාට වැටී ලස්සන වී ඇත. "ඇයි දැන් නිදහස් කිරිල්ලිනේ..." ඒ අතින් දුකට වැටුණේ තමාවය.

"මෙහේ මතක තිබ්බද..."

භාෂිණි ඇසුවේ අසන්නට දෙයක් නැති කමටය.

"මැරිලා ඉපදුනේ නැනේ භාෂි... මොකද හදිස්සියේ ආවේ..."

"නිකං... එ..න්..න පැටියෝ.. අම්මි පැටියට සෙල්ලම් බඩු ගොඩක් ගෙනාවා..."

භාෂිණි දෑතම පෑවාය. කෙල්ල මධුවන්තව වැරෙන් වැළඳගෙන උන්නාය. කෙල්ල මේ දේ කරන බව මධුවන්ත දනී.

"ය..න්..න කුක්කි... අම්මි පුතුව බලන්නනේ ආවේ.. ය..න්..න..."

"තා..ත්..ති යං... තා..ත්..ති යං..."

කෙල්ල කෙදිරි ගාන්නට විය.

"කාලෙකින් ඔයාව හම්බුනේ නැනේ... යන්න කුක්කි... අම්මි පුතුට සෙල්ලම් බඩු ගෙනත්..."

Freeanks.com

මධුවන්ත බලෙන් මෙන් කෙල්ලව භාෂිණිගේ උකුලේ තැබුවේය. කෙල්ල එහෙමම මූණ බෙරි කරගෙන අඬන්නට ගත්තාය.

"තා..ත්..ති ඕ..න... තා..ත්ති ඕන..."

"හරි පැටියෝ... අපි උඩට යං... සෙල්ලම් බඩු බලන්..න..."

භාෂිණි බලෙන්ම මෙන් කෙල්ලව උඩට ගෙන ගියාය. කෙල්ලගේ ඇඳුම් හඬ ගේ දෙවනත් කරමින් ඇසෙන්නට විය.

"බොං..ත්..න මධුවන්ත..."

මායා දොඩම් එකක් ගෙනවිත් මධුවන්තට දුන්නාය.

"අ..න්කල් නැද්ද ඇන්ටි..."

"මේ දවස්වල ට්‍රින්කෝ ගිහින්... හෙට එයි..."

"දුව අඬනවා නේද... භාෂිට දැන් පුරුදු නෑ..."

"ඔව්... මං ඇවිල්ලත් මාස දෙකක් විතර වෙනවනේ..."

"අ..තේ මන්දා... මං භාෂි කරන හැමදේම අනුමත කරත්තේ නම් නෑ මධුවන්ත..."

"දැන් ඒවා කතා කරලා වැඩක් නෑ ඇන්ටි..."

"ඒත් මධුවන්ත කතා කරලා බලන්න..."

මධුවන්ත අසරණ ලෙස සිනාසුණේය.

"අපිට එකට ඉන්න බෑ ඇන්ටි... ඒක දුකක්... වෙන්වෙලා ඉන්න තරමට හොඳයි..."

"ඒත් මේ දරුවා..."

"මං දුවාට එයාගේ අම්මා ඇරෙන්න අනිත් හැමදේම දෙනවා..."

මධුවන්ත දිග සුසුමක් හෙලා කීවේය.

"මධුවන්ත දැන් මොනාද කරන්නේ..."

"මං තාම ආවා විතරනේ ඇන්ටි... තාම මේ වැඩ පිළිවෙලක්

කරගෙන යනවා... එකපාර ලංකාවට ඇවිත් සෙට්ල් වෙන්න අමාරුයි..."

"ම..ට තේරෙනවා..."

භාෂිණි දුවව වඩාගෙන පහළට ආවාය. කෙල්ලගේ මුහුණ පුරා කඳුළු පාරවල්ය.

"ත...තා..ත්..ති ඕ..නා..."

කෙල්ල කෑ ගසාගෙන අඬමින් මධුවන්තගේ අතට පැන්නාය. "නාත්තගෙම දූ තමයි..." භාෂි සිතින් කීවාය.

"මට දු..ව..ට ක..තා කරන්නවත් විදිහක් නැනේ..."

භාෂිණි මේ චෝදනා කරන්නේ තමාට බව මධුවන්ත දනී.

"සොරි භාෂි... මට කතා කරන්න එපා..."

භාෂිණි කතා කළේ නැත.

"කොහොමද ඔයාට..."

මධුවන්ත ඇසුවේ කෙල්ලව තුරුල් කරගෙනය. තවම කෙල්ලගේ පපුවෙන් ඉකියක් එයි.

"හොඳයි..."

"අ..පා..ට්..ම..න්ට් එක දුන්නද..."

"ඔ..ව්..."

"දැන් භාෂි ඉන්නේ..."

ඇය කතා නැත. "කියන්නවත් බැරි තැනක වෙන්න ඇති උඹ ඉන්නේ..." මධුවන්ත සිතින් කීවේය.

"ම්... මෙතන ඩොලර් පන්දාහක් තියෙනවා... දූගේ වියදමට තියාගන්න..."

මධුවන්ත භාෂි දිගු කළ සිංගප්පූරු ඩොලර් මිටිය දෙස බලාගෙන උන්නේ අසූචි ගොඩක් දෙස බලන්නාක් බඳු පිළිකුලෙනි.

Elegantlks.com

"හාමි මිය බල්ලි නියාගන්න... මේ කෙල්ලට කවල පොවල උස්සනට තියන්න මට දුලුවන්..."

"හොට බීම ඇතිලන් මේ ඕනිහගේ මහන්සන්නකම" හාෂිණී හිතුවේ එහෙමයි.

"මං අනේ බල්ලි නියෙනවා..."

"ඒකද නාම අනුන්ගේ අගුපිලක ඉන්නේ..."

මධුවන්න එහෙමම දුවවද ගෙන නැගිට්ටෙය.

"ඔයා හාමි මගෙයි කෙල්ලගෙයි ජීවිතවලට කරපු දේට මේකොමඩන් ඉන්න එක ගැන සතුටු වෙන්න... මගේ ජීවිතේම නන්නන්නාර කරලා දැන් ඔයා මොනාද මේ කතා කරන්නේ... දැන් දුවම බැලුවනේ.. අපි යන්නද..."

මධුවන්න යන්නට පය නැහුවේය.

"මේ බෑග් දෙකත් අරන් යන්න..."

"කෝ දෙන්න... ඒත් අම්මෙක් නැති දරුවට විසිතුරු කෙල්ලේ බඩු වලින් වැඩක් නෑ හාෂි... මං යනවා..."

මධුවන්න එහෙමම ගොස් ට්‍රොලියට හොඩ දීලා "ඔයාගේ අම්මා හැදෙන ගැණියෙක් නෙමේ..." මධුවන්න කෙල්ලව තුරුල් කරගෙන සිතුවේය.

මධුවන්නට දුකක් දැනුණේ නැත. ඒත් මෙහෙම අම්මලා ගැන මධුවන්නට පුදුමය. කෙල්ල ලොකු පවක් කරන්නට ඇත. හොඳ අම්මා කෙනෙක් නොලැබුණේ ඒකය.

මධුවන්නට සිහිවූයේ තුතුවය. දුවා ඇය ඉදිරිදී බලා ඉන්නට ඇත්තය. කෙල්ල මේ තරම් ඇයට ආදරේ ඒකය. පුංචි දරුවෙක්ගේ පුංච ආදරය පපුවටම දැනෙයි.

"මේ ආත්මේ ජීවත් වෙන්න නව ගොඩක් දවස් තියෙනවා... ඔයා වගේ අම්මා කෙනෙක් දුට ලැබෙනව නම් මේ ආත්මෙම ජීවිතේ

ගොඩ..."

ඇයට වටින්නේ දුව විතරක් නොවේ. එහෙම කෙනෙක් ළඟ මේ ජීවිතයම නතර කරගන්නට වෙලාවකට ආශාවක් එයි. එහෙත් පපුව එහෙම සිනෙන සින ගැනම මධුවන්නට දුකක් දැනෙයි.

"එයාගේ ජීවිතෙත් මොනාද වෙන්න යනවා... හිහාගන්න බෑ... එයා මොනවද කියන්න හදනවා... ඒත් කියාගන්න බැහැ... වෙලාවක අහන්න හිතෙනවා..."

කෙල්ලට අඬලාම නින්ද ගොසිනි. නිදාතෙන ඉඳිද්දීත් කෙල්ලගේ පපුව ගැස්සෙයි.

"ගෙනල්ලා තියෙන සෙල්ලම් බඩු වල හැටි... දුවෙක්ට සෙල්ලම් බඩුවක් වත් නෝරන්න දන්නෑ..."

ඒත් කෙල්ල මුහු ගෙන ආ හාවාට පුදුම ආදරේය. නිදාගන්නෙත් එව බදාගෙනය.

"ඔයා එකපාරටම හොර අරන් ගියා වගේ නැතිවෙයි... මට එහෙම හිතෙනවා... එහෙම දවසක දුවාටයි මටයි හරි පාළු හිතෙයි..."

මධුවන්න සිතුවේ කෙල්ල පපුවට නබාගෙනය. හෙට සිට කරන්නට වැඩ දහසක් ඇත. ඉන්නට තැනක් සොයා ගත යුතුය. ඇදක් පුංචි කබඩ් එකක් මේසයක් ලිපක් ආදිය ගත යුතුය. ජීවිතය පටන් ගන්නට වෙන්නේ එහෙමය. "ඒකද නාම අනුන්ගේ අගුපිලක ඉන්නේ..." හාෂිණී කියූ කතාව සිහිවිය.

"නෑ.. ආයේ උඹට එහෙම කතා කරන්න මං ඉඩ තියන්නෑ... මං නැගිටිනවා... ඉ..ක්මනටම මං නැගිටිනවා... උඹට පුදුම හිතෙන විදිහට මං නැගිටිනවා..."

මධුවන්න දැඩිව සිතා ගත්තේය. අධිෂ්ඨාන කර ගත්තේය.

"අද උඹට මං හිඟහන්නෙක් වගේ පේනවා ඇති. කමක් නෑ... එහෙම හිතාගනියන්... ඒත් මං මේකෙන නතර වෙන්නෑ..."

Piyanta.com

මධුවන්තගේ කමිස සාක්කුවේ වූ ජංගම දුරකථනය නාද වූයේ ඒ මොහොතේය. එහි වූ අංකය මධුවන්ත නොදන්නා අංකයකි.

"හෙ..ලෝ..."

මධුවන්ත කතා කළේය. ඔහුට ගත්තේ මුතුය. එහෙත් මධුවන්ත කතා කරද්දී එකවරම මුතුට කතා කරගන්නට බැරි විය.

"හෙ..ලෝ..."

මධුවන්ත යළිත් කතා කළේය.

"මං.. මං මු..තු..."

මධුවන්තට පුදුම සිතුණි. ඇය මේ හදිස්සියේ කතා කළේ ඇයි...

"දැ..වා ඉ..න්..න..ව..ද..."

"මං මේ එන ගමන් නංගී... කෙල්ල මේ අඬලම නිදි..."

"ඇ..යි ඇ..ඩුවේ..."

මුතු ඇසුවේ උගුරින් මෙනි.

"එයා ගාවට ගියේම නෑ නංගී... මාව බදාගෙන කෙල්ල ඇඬුවා... බලෙන් වගේ අතට ගත්තා... කෙල්ල කෑ ගගහ ඇඬුවා... මේ ඉකි ගගහ නිදි..."

මුතුගේ සිතට සතුටක් දැනුණි. ඇය මේ හදිස්සියේ කතා කළෙත් ඒකය. ඇයට කතා නොකරම ඉන්නට බැරි විය. ඇය මධුවන්තට ගත්තේ අසහනයෙනි.

"මං.. ළ..යා..ට කෑ..ම ලෑස්ති කරලා තියෙන්..නේ.. මොනවත් කවන්නෙපා..."

"මං ඉක්මනට එන්නම්..."

මුතු දුරකථනය තැබුවාය. දුරකථනය අතේ තබාගෙන මධුවන්ත දහ අතේ සිතුවේය. මේ තරම් කැක්කුමක් ඇයට එන හැටි පුදුමය.

මධුවන්තට කතා කළ පසු මුතුගේ සිතට සහනයක් දැනුණි.

"එයා ගිය ගමන්ම වගේ එනවා... ටික වෙලාවයි ඒකි ගාව ඉඳලා නියෙන්නේ... දුවත් අඬලා... හොඳ වැඩේ..." මුතු දිගටම සිතුවාය.

"ඒත් මේ කැක්කුම කවදද ඉවර වෙන්නේ... එයයි දුවයි පැත්තක... මං නවත් පැත්තක... මේ ආදරේ ආයෙත් අපතේ යයි..."

මුතු සිතුවේ දුකෙනි. ඒ තාත්තත් දුවත් ළඟට යන පරක්කුව විකරය. ඒ දෙන්නගේ ජීවිත දෙකට මේ ජීවිතය එකතු වෙන එක විකරය. එතන හැදෙන්නේ ලස්සන පවුලකි.

"මට එයාට හැම දෙයක්ම කරලා දෙන්න පුළුවන්... එයාට එකකොට ජීවිතේ නැගිටින්න පුළුවන්..."

මුතු ගේ පුරා යමින් සිතුවාය. තීරණයක් ගන්නවා නම් ගත යුත්තේ ඒ දෙන්නා ළඟට යන්නට බලාගෙනමද... ඒ ඇරෙන්නට මේ ජීවිතයට විසඳුමක් නැද්ද...

"අන්තිමට මොනවත් නොවී මට කාංචන එක්ක යන්න වෙයි..."

එසේ වුවහොත් මේ ආත්මයේ ජීවිතයක් නැත. නැත්තටම නැත.

"ඔයා එක්ක ජීවත් වෙන්න තව ආත්මයක් බලන් ඉන්න මට බෑ..."

මුතු දිග සුසුමක් හෙළා සිතුවාය.

"කොහොමත් එයා එක්ක කතා කරන්නම වෙනවා... ඒත් එහෙම කතාවකට කොහොමද එයාව එකතු කරගත්තේ..."

මුතු දිගටම සිතුවාය.

"මේ මොනවත් නොහිතා එයා අනාගතේ මොනාද කරන්නේ කියලවත් මට අහන්න බැරිද..."

කළ යුතු හොඳම දේ ඒකයි. එහෙම ඔහු සමඟ නිස්කලංකේ කතා කළ හැක. ඔහු ඊයේ රෑද තමා සමඟ කතා කරන්නට ආවේය. කරබාගෙන ආවේ තමාය.

Elegantlk.com

21

මුතු රෑ කෙල්ලව ඇය ළඟ නිදි කරවා ගත්තේ රෑට ඔහු ළඟට යන්නට සිතාගෙනමය. මේ ගෙදර මෙහෙම වැඩ කළ හැක්කේ අද පමණි. හෙට දෙන්නාම බැංකොක් සිට එයි. ඒ ආ පසු මෙහෙම දුවාව වත් උඩට ගන්නට නොහැක.

මුතු කෙල්ලව හිමිහිට ඇඳ මත තබා බැල්කනියට පිවිස පහළ බැලුවාය. ඔහුගේ හැල හොල්මනක් නැත. දුවත් නැති වූ විට ඔහුට පාළුය.

"බේ..බී..."

ලලිතා පැමිණ කතා කළාය.

"ම..."

"මෝ..නාහරි ඕනෙද..."

"නෑ ලලිතා..."

"එහෙනම් මං නිදාගත්තද..."

"මධුවන්ත මහත්තයා බබා ගැන ඇහුවද ලලිතා..."

ලලිතා සිනාසුණාය.

"අද එච්චර කාලත් නෑ... මං යද්දී කාමරේ ඉඳගෙන කල්පනා කර කර ඉන්නවා... දුව නිදිද කියලා ඇහුවා..."

"ම්... මං බලලා ගෙනියන්නම්... ලලිතා නිදාගන්න..."

මුතු කෙල්ල ළඟ ඉඳගෙන ඇය දෙස බලාගෙනම උන්නාය.

"ඉඳලා ඉඳලා කතා කළාම ඔයාගේ තාත්ති දිදි ගැන මොනා හිතයිද දන්නෑ.. නේ..ද..."

මුතු කෙල්ලගෙන් අහන්නේ සිතෙනි.

"ඔයාගේ තාත්තා එහෙම නෑ... එයා එක්ක කතා කරන්න හරි ලේසියි... මං ඒක දන්නවා... ඒත් මුළු ජීවිතේම ගැනම කොහොම මං කතා කරන්නද..."

මුතුට තේරෙන්නේ නැත. එහෙත් ඔහු ඇර වෙන කාත් සමඟ කතා කළද තේරුමක් නැත. මුතු ඇඟ සෝදාගෙන විත් සැහැල්ලු සායකුත් බ්ලවුසයකුත් ඇඳ ගත්තාය. ඊටත් පසු දුවා ළඟට වී තව මොහොතක් උන්නාය.

"සමහර විට මට මොනවත් කතා කරගන්න බැරි වෙයි... එයා ළඟදි හරියට ගොළු වෙනවා..."

මුතු එහෙමම පහත් වී කෙල්ලව වඩා ගත්තාය. ඇයට ගොස් ඇත්තේ හොඳ නින්දකි. නිදිමත බේරෙන ඒ මුහුණ දකිද්දී දුකය.

සාලයෙන් යද්දී මුතු වෙලාව බැලුවාය. දැන් දොළහට කිට්ටුය. ඔහු තවමත් අවදිව ඉන්නා බව ඇයට විශ්වාසය.

අවට මහ වැස්සය. වහිනා බවවත් දන්නේ දැන්ය. හිත ඇත්තේ වෙන කොහෙදකය. මුතු කොරිඩෝව දිගේ කෙල්ලව රැගෙන ආවේ

Elleanta.com

පපුවේ හංගාගෙන මෙනි. යද්දී ඔහු හීටරය ගසා කෝපි හදන්නට යමින් උන්නේය.

"බඩට හරියට කෑමක් නොකා තේ බීලා හරියනවද..."

හිනින් ඇය ඔහුට බැණ්නාය. මේ මධුවන්ත ජීවිතයට පුරුදු වූ හැටිය. සමහර දවස්වල ඔහුගේ කුසට වැටී තිබුණේම කෝපි දෙක තුනක් පමණි. ජීවිතවල අමාරු කාලයේදී එහෙමය. ඒ අමාරු දවස් පන්නා ගැනීම සිතනා තරම් පහසු නැත.

"ආ.. නංගී දුවාව ගෙනාවද... මං හිතුවා උඩම නිදාගනී කියලා..."

ඔහු කීවේය. "මටත් තේකක් හදන්නකෝ..." එසේ කියන්නට මුතුට සිතෙයි. වැටෙමින් තිබූ වැස්ස අතරින් විශාල හෙණයක් ළඟක පුපුරා ගියේය. ඒ හඬට මුතු ගැස්සුණාය. ඇය දුවව ඇද මත තබා පෙරෙව්වාය.

"නංගී..."

"මි..."

"කෝපි එකක් නංගිටත්..."

"මි..."

"නා හදන්න..." කියා කියන්නට බැරි ඇයි... කට ගොළු වෙලාද... මුතු තමාටම බැණ ගත්තාය.

"අද ටිකක් මූණ හොඳ නෑ නේද නංගී..."

"ම..කෑ..වේ..ත් ටි..ක..යි..."

මුතු අමාරුවෙන් කීවාය.

"ඒයා දරුවගෙයි මගෙයි ජීවිතේට කළොත් කරන්නේ මිස්සුවක්..."

"ඇ..යි ඇ..ඳු..වේ..."

"මට තේරෙන දේ දුවාටත් තේරෙනවා ඇති නංගී..."

කෝපි සුවඳ කාමරය පුරා පැතිරෙයි. මධුවන්ත තවමත් හඳන්නේ සිංගප්පූරුවේ සිට එද්දී ගෙනා කෝපිය. ඒවා ගත්තේ සිංගප්පූරු ප්ලාසා නම් සුපර් මාර්කට් එකෙනි.

"සුවඳයි නේ..."

මුතු ඇඳ මත ඉඳගෙන ඒ සුවඳ විඳිද්දී ඔහු ඇසුවේය. ඇය කෙල්ලගේ තට්ටමට ගසමින් ඇය නිදි කරන නියාවක් පෙන්නුවාය. ඇත්ත කතාව එය නොවේ. ඇයට අද යමක් කතා කර ගන්නට නොහැක.

"ආ.. මේක කාලම කෝපි එක බොන්න..."

ඔහු බෑගයේ තිබූ රට චොකලට් බාර් එකක් ගෙන දුන්නේය. රස වේෆස් සමඟ චොකලට් මුසු කර හදා තිබූ ඒ චොකලට් බාර් එක අතට ගනිද්දීම ඇගේ කටට කෙළ ඉනුවේය. ඇය හෙමින් හෙමින් එහි කවරය ගැලෙව්වාය. චොකලට් දැවටූ බාර් එක උඩින් ආමන්ඩ ඇට දමා තිබුණි. ඉන් එන්නේ පුදුමාකාර සුවඳකි.

"ඕක හරි රහයි... කාලා බලන්න රහ නම් තව දහයක් විතර දෙන්නම්... දුවත් ආසම කෑම..."

මුතු ඉන් කැල්ලක් කෑවාය. ජීවිතයේ කෑ රසම චොකලට් වේෆස් රස එන්නේ දැන්ය. ඇගේ දෙතෙත් එසවිණි.

"ර..හයි නේ..."

උත්තර දුන්නේ නැත. ඒත් ඒ ඇස් කීවේ රහ බවය.

"ආ..."

පුංචි කෝප්පයකට කෝපි දමා මධුවන්ත දුන්නේය. මෙහෙම ඉඳගෙන ටිකක් කතා කරමු යැයි කියන්නට සිතෙනා තරමය. එහෙත් මධුවන්තගේ උගුර සිරවී ඇත.

"ත..ව එක..ක් දෙන්නද..."

චොකලට් බාර් එක කා අවසාන වෙද්දී මධුවන්ත ඇසුවේය.

"ප..ච්.. දු..වා..ට තිය..න්..න..."

Elegantta

"මං රවීට කියලත් ගෙන්න ගත්තා..."

මධුවන්ත ඒ වොකලට් බාර් දහයක් පමණ පුංචි බෑගයක දමා ඇය ළඟ තැබුවේය. හාත්පස් වැස්ස නිසා කාමරය තුළ සීතලය. මුතු කෝපි කෝප්පයේ රවුම් දාරය දිගේ ඇඟිලි තුඩු ගෙන යමින් කල්පනා කළාය.

"ම..ධු..ව..න්..ත අ..යි..යේ..."

මුතු කතා කරන්නට ගත්තේ උගුරින් මෙනි. මධුවන්ත ඇය දෙස බැලුවේ ගැස්සී මෙනි. පපුව ළඟ මොනවාද පුපුරා ගියා සේය. ළය හිරි වැටිණි.

"නංගී..."

ඔහු කතා කළේ ඇය කතා කළාටත් වඩා ගොරෝද හඬකිනි.

"ම.. ම..ට ටි..ක..ක් ක..තා ක..ර..න්..න ඕ..න..."

මධුවන්ත ඇය දෙස බලාගෙනම උන්නේය. පපුව වෙව්ලාගෙන මෙන් ගියේ එළියේ සිට ආ වැහි සුළඟටද... නොවේනම් වෙන දෙයකටද...

"කි..ය..න්..න නංගී..."

මුතු කෝපි එක මේසය මත තබා නැගිට්ටාය. මධුවන්ත උන්නේ ඇඳ අද්දරම සිටගෙනය. ඇය ඔහුගේ දෙපා පාමුල වැටුණේ නොසිතූ මොහොතකය.

"ම.. ම..ට ස..මා..වෙ..න්..න අ..යියේ..."

මුතු අඬමින් කීවේ ඔහුගේ දෙපා පාමුල හිස ඔබාගෙන මෙනි. මධුවන්ත එහෙමම ඇයව දෙඋරින් අල්ලා නැගිට්ටවූයේ වෙව්ලන දෑතෙනි.

"නං..ගි මෝ..නාට ම..ගෙ..න් ස..මාව ඉල්ලන්..නද... නංගී මේ මට මොන වරදක් කළාටද... ම..ගේ දරුවට මෙච්චර ආදරෙන් ඉන්න නංගී..."

"ම.. ම.. මං.. අයියා එ..ක්ක ක..තා කළේ නෑ..."

මධුවන්ත සිනාසුණේ ඇයව ඇඳ මතින් ඉන්දවන ගමන්ය.

"වෙලාවකට නංගී කතා කරන අයට වඩා කතා නොකරන අය කතා කරනවා..."

බොඳ වූ දෑස් එසවිණි. මුතුට ඒ ඇතිය. "මං දන්නවා ඔයාට මං කතා කළා... ඔයා ඒක අහගෙන උන්නා..."

"ඉ..තින් නංගී කියන්න..."

මධුවන්ත ඇඳේ මෙහා කොනින් ඉඳගත්තේය. කෙල්ල දැන් මැදය. දෙන්නා දෙපැත්තේය.

"මං ප්‍ර..ශ්..නෙක ඉ..න්නේ..."

"මං දන්නවා... අඩුම ගානේ මට නංගිගේ ප්‍රශ්නෙවත් කියන්න... එළි වෙනකල් කොච්චර වෙලා තියෙනවද..."

"නිදිමත නෑ..."

මධුවන්තගේ මුවේ ඇඳුනේ තුනී සිනහවකි.

"මට නින්ද යන්නෑ නංගී..."

"තා..ම භා..ෂි..ණී ගැ..න අයියා හිතනවද..."

"ම..ම..."

"ම්..."

"නෑ නංගී... මේ රෑ නිදි මරාගෙන හිතන්නේ එයා ගැන නෙමේ... ඒත් එයා අද ජරා කතාවක් කිව්වා... ඒක මට හරියට වැදුණා..."

"මෝ..නාද කි..ව්වේ..."

මධුවන්ත පැත්තක තිබූ කෝපි එක ඇය අතට දුන්නේය.

"මට සල්ලි වගයක් දික් කළා... මං හිතන්නේ ලක්ෂ පහක් විතර... දූගේ වියදමට කියලා... මං ඒ වෙලාවේ කිව්වා මට කෙල්ලට කවල පොවලා ලස්සනට නියන්න පුළුවන් කියලා..."

"ම්..."

"ඒකද අගුපිලක වැට්ලා ඉන්නේ කියලා ඇහුවා..."

මුතුට ඒ ඇස් පෙනෙයි. ඔහු ඒවා කියන්නේ පුදුමාකාර දුකකිනි. "උඹට කවදාවත් බෑ මේ අහිංසක මිනිහව තේරුම් ගන්න... කවදාවත් බෑ..." මුතු සිතුවාය.

"ම..ට හරියට දුක හිතුණා... කොහොම හරි නැගිට්ටිනවා කියලා මං අද හිතාගත්තා... මෙහෙම ඉන්න අන්තිම දවස් ටික මේ නංගී... වැටෙන්න නරකයි... නැගිට්ටින්න ඕන..."

"ඔව්.. ඔයාට ඒක කරන්න පුළුවන්..." මුතු සිතින් කීවාය.

"මං හිත හිත හිට්ටේ ඒකයි... මගේ මේ වහන්තරා කතා ඕන නෑ නංගී... ඉතින්..."

"ඔයාගේ ජීවිතේ නැතුව මගේ ජීවිතේ ගැන කතා කරන්න දෙයක් නෑ අයියේ..." මුතුට කියන්නට සිතෙන්නේ එහෙමය.

"මො..නාද හිතාගෙන ඉ..න්නේ..."

මුතු බිම බලාගෙන ඇසුවාය. "ඇයි මගේ ජීවිතේ ගැනම අහන්නේ..." මධුවන්ත සිතින් සිතුවේය.

"හි..ත..නවා නංගී..."

මධුවන්ත උගුරෙන් මෙන් කීවේය.

හිතෙනා දෙයක් ඇන්මම කියන්න යැයි මුතුට සිතෙයි. එක ජීවිතයක තීරණ මත එල්ලී හිතද්දී එහෙමය.

"මං.. දෙයක් අහන්..න..ද..."

මුතු කතා කළේ පුදුමාකාර බරකිනි. මධුවන්ත බලා උන්නේ ඇය දෙසමය.

"අ..හ..න්..න නංගී..."

"මං.. උ..ද..ව්..ව..ක් ඉ..ල්..ලු..වොත් ක..ර..න..ව..ද ම..ට..."

"ඕ..න දෙ..ය..ක් කියන්න නංගී... මං ක..රලා දෙ..න්..න..ම්..."

"ම.. ම..ට..."

නැත. එය ඇසිය යුතු නැත. අමාරුවෙන් ජීවිතය එක්කාසු කරගෙන ජීවත් වන අහිංසකයාගේ ජීවිතය අවුල් කළ යුතු නැත. ඇත්තටම එය පාපයකි.

තීරණයක් නොගෙන කතා කිරීම තේරුමක් නැත.

"ම..ට මේ කසාදෙට අහුවෙන්න බෑ අයි..යේ..."

කෙල්ලගේ ඇස්වල කඳුළුය. එනෙම අඬද්දී ඇය දෙස බලා සිටිය නොහැක.

"අ..ඬ..න්..නෙ..පා නංගී..."

"ම..ට කි..ය..න්..න කෙ..නෙ..ක් නෑ.. අ..ම්..මයි තාත්තයි හෙට එ..නවා... ඒ ආවාම..."

මුතු තොල් පට තද කර ගත්තාය.

"නංගි... මො..නා..ද හිතුවේ..."

"හිතෙන්නේ ඔයා ගැන විතරයි..." මුතුට කියන්නට හිතෙන්නේ එහෙමය.

"මං.. ගෙ..දර හි..ටි..යො..ත් මා..ව..."

"මට තේරෙනවා..."

"මං ගෙදරින් යනවා... ම..ට වෙ..න විසඳුමක් නෑ..."

"එ..හෙ..ම නංගී..."

"ඇයි භාෂිණීව දාලා සිංගප්පූරුවෙන් ආවේ... වෙ..න කරන්න දෙයක් නැති නිසා..නේ නේ..ද..."

"ඔ..ව්..."

"ම..ට..ත් වෙ..න විසඳුමක් නෑ..."

Elegant talks.com

මධුවන්ත ඇය දෙස බලා උත්තේ අසරණවය.

"පා..ස්..පෝට අ..ලු..ත් ක..රේ නංගී..."

මුතු තෙවුණු දැස් පියන් එසවූයේ එවිටය.

"ර..ට..ක..ට හ..රි ය..ත්..න..."

"න..නිය..ම..."

"මා..ව එ..ක්..කං ය..ත්..න කෙනෙක් ඉ..ති..ත් නෑ..නේ..."

ඒ වචන එකිත් එක ගෙන බැලුවා නම් කෙල්ල කියත්තට යත්තේ කුමක්දැයි හඳුනා ගැනීම අපහසු නැත.

"නංගී මොං..නා..ද හිතුවේ..."

"මට හි..ර..ණය..ක් ග..ත්..න..ම වෙ..නව..නේ... කාංචන වගේ කෙනෙක් එ..ක්ක ජීවත් වෙ..ත්..න හි..ත..ත්..නවත් බෑ..."

එහෙනම් ජීවත් වෙත්න පුළුවන් කාත් එක්කදැයි අහත්තට මධුවන්තට සිතුණි.

"අ..යියේ..."

"මේ..."

"සිංග..ප්පූරුවේ..."

"ඉ..සි..ත්..."

"ජී..වි..ත් වෙ..ත්..න පැ..හැදුද..."

මධුවන්ත ඇය දෙස බලා උත්තේ පුදුමයෙනි. "ඔයාවත් එක්කලඟ හෝ ඒ සිංගප්පූරු යත්ත හිතෙනවා ඔහොම කියද්දී..." මධුවන්ත සිතුවේය.

"අයියේ අයියේ... මොං..නා..ද හිතුවේ..."

ඇය ඇහුවේ බඳු සිතූ දේ ඇත ගත්තාක් මෙනි.

"නංගීට තනියම ඉඳිත් බෑ... ඔයා තනිවෙයි... නංගී හාමිණි වගේ මෝරපු ගැණියෙක් නොවේ..."

මධුවන්ත ඇත්තම කීවේය.

"එ..න..කොං..ට..."

"අ..සරාදේ... මං ඉ..ත්..න..කොට නංගී කැ..ඩා කළොත..මි..."

"එ..හෙ..නං..."

මධුවන්ත එවර කතා කළේ නැත. ඔහු වසිමින් හිඳු මහා අතෝරාව දෙස මොහොතක් බලා උත්තේය.

"මං..ට ය..ත්..න උදව් කරනවද..."

"මී..."

"දැ..න්..."

එයාට කොහොම උත්තර දෙත්තද...

"මං..ට ගොඩ දවසක් නෑ මං..ධුවන්ත අයියේ..."

"මං දැ..ත්..න..වා..."

"එයාලා හොටෙල් පවා බුක් කරගෙන ඉ..ත්තේ..."

"මේ ඔ..ක්..කොං..ම දාලා නංගී..."

"මං..ට මේ දේපොළ වැඩක් නෑ... එ..ක පාරක් උත්සාහ කරනවා ජීවිතේ බේරගත්න... නැති උනොත් මං..."

මුතු කටට ආ දේ කීවේ නැත. මධුවන්ත ඇය දෙස බලාගෙනම උත්තේය. ඒ මුහුණ මලක් වැනිය. ඒ ජීවිතය අපතේ යනවා කියා හිතද්දීත් මොකක්දෝ වෙයි.

"හි..මි..හිට හි..ත..න..ව..ද..."

මුතු කීම බලාගෙන කීවාය. ඇය හිතත්නට කියා කියන්නේ මොනවාද...

"මං ය..ත්..න..මි..."

"නංගී..."

Elegant Talks.com

මධුවන්ත කතා කළේ කෙල්ල නැගිට යන්නට හදද්දීය.

"ම..."

"මං රවී එක්කත් කතා කරන්නම්..."

"ම.. ඒත්... තනියම රටකට ය..න්..න..ත් බෑ..."

කෙල්ල ගියේ ඒ වචන ටික කියාය. මධුවන්ත බලා උන්නේ ගල් ගැසී මෙනි. ඇය කියූ ඒ කතාවේ තේරුම කුමක්ද...

උඩට හා පසු මුතුගේ පපුවට සහනයක් දැනුණි.

"එයා එක්ක කතා කරපු පැය බාගෙට කන්දක බර අඩු වුණා..."

ඇයට සිතුණි. තමා කියූ දේවලින් ඔහු මොනවා සිතුවාදැයි මුතු සිතුවාය.

"දවසක එයාට ඇත්තම කියනවා... එතකොටවත් මෝඩයා තේරුම් යනී..."

මුතු ඇඳේ පෙරළෙමින් සිතුවාය. මහ වැසි තවත් ඇද වැටෙන්නට වූයේ හදවත් දෙකක් දෙපසක ඇහැරවා තබාය.

"දිදී තාත්තිට ඒ මොනාද කිව්වේ පැටියෝ... තාත්තිට මොනවත් තේරුම් යන්න බෑ..."

මධුවන්ත කෙල්ල ළඟින් ඇලවී ඇගේ පුංචි අතක් අල්ලාගෙන සිතුවේය.

"එයා මොනාහරි කියන්න ගියා... ඒත් කිව්වේ නෑ..."

ඇය මොහොතකට කලින් මේ ඇඳ පාමුල දණ ගබා සමාව ඉල්ලූ අපූරු මධුවන්තට සිහි විය. ලංකාවට හා දා සිට කතා නොකර උන් කෙල්ලූ අද කතා කළේ මේ ජීවිත කාලයේම කතා කළ කෙනෙක් මෙන්ය. මධුවන්තට පුදුමත් ඒකය.

"අපි දෙන්නා තනියම සිංගප්පූරුවේ දුක් විඳින දවස්වල දිදී අපට කතා කළා නම්... එහෙනම් තාත්ති දිදීව එහෙට ගෙන්න ගන්නවා... ඒත් ඌ..න් මොං..තවා කරන්නද..."

ඒත් ඇය ඒ උදව්ව ඉල්ලුවේ තමාගෙත්මය. මධුවන්තට පුදුමත් ඒකය.

"එයා වගේ කෙනෙක් මගේ ජීවිතෙත් උදව්වක් ඉල්ලනවා කියලා හිතද්දීත් පුදුමයි..."

මධුවන්ත මාස ගණනාවකට පසුව සිංගප්පූරුවේ ගෙවූ කාලය සිහි කළේය. මුළු ලෝකයම අමතක කර පුංචි ලෝකයක් හදාගෙන නිස්කලංකේ ජීවත් වන්නට සිංගප්පූරුව තරම් හොඳ රටක් තවත් නැත.

"ඒත් අපි ගිහින් එකට ජීවත් වෙන්නේ කොහොමද... එයා ව..ගේ..."

පපුව හිරවෙන්නේ ඔතනදීය.

"තාත්ති ගොඩක් දේවල් හිතන්න ඕන... අපි දෙන්නත් තනිවෙලා ඉන්නේ... ලංකාවට ආවේ අම්මි කරන දේවල් බලන් ඉන්න බැරි නිසා... ඒත් තාම තාත්තිට එයාර් පෝට් එකෙන් බැස්සට පස්සේ මොනවත් කරගන්න බැරි උනා... අපි තාම එදා උන්න තැනමයි..."

සිංගප්පූරුවෙන් පුංචි අපාට්මන්ට් නිවසක් සොයා ගැනීම ඉතා පහසුය. රස්සාව කොහොමත් ඇත. සිංගප්පූරුවේ ජීවත් වන්නට වීසා ලබා ගැනීමද අපහසු නැත.

ඒ සියල්ල තිබියදී සිංගප්පූරුවේ චැන්ගි ගුවන් තොටුපළින් පිටව ආවේ ජීවිතය අලුතින් පටන් ගන්නටය.

එහෙත් ජීවිතය තවමත් එතැනමය.

"මොනාද හිතාගෙන ඉන්නේ..."

ඇය එහෙම ප්‍රශ්නයක් ඇසූ බව මධුවන්තට මතකය. "ඇයි එයා මගේ ජීවිතේ ගැන කතා කරන්නේ... මේ දුප්පත් තාත්තයි දුවයි ගැන එයා වගේ කෙනෙක් හිතනවා කියලා හිතද්දීත් පුදුමයි..."

Elegantalks.com

22

මධුවන්ත රවීට ගත්තේ පාන්දරමය. මහ වැසි වැටුණ පෙරදා රෑයේ පැයක්වත් ඇහැ පියවුණේ නැත. වැහි සීතලට කෙල්ල තවමත් නිදිය. මධුවන්ත නැගිට්ටේ කෙල්ලට පොරවාය.

"ම..ධූ..."

"උඹ වැඩක්ද මචං..."

"නෑ මචං... මේ නිකං අම්මා එක්ක කතා කර කර හිටියේ... අම්මා ඉදි ආප්ප හදනවා... උඹවත් මතක් කළා..."

"ඉදි ආප්ප ටිකක් කන්න තිබ්බනම් හොඳයි තමා..."

එහෙම කියද්දී රවීගේ පපුව උණු විය.

"මං හෙට කොළඹ එද්දී උඹට බත් එකක් හද්දගෙන එන්නම්..."

මධුවන්ත සිනාසුණේය.

"මචං..."

"මධූ..."

"මං චුට්ටක් උඹත් එක්ක කතා කරන්න ඕන මචං..."

"ඇ..යි මධූ... ඉතින් කියපන්..."

මධුවන්ත මොහොතක් නිහඬව උන්නේය.

"මචං.. නංගී... මුතු නංගී..."

"ඉතින්..."

"රෑ මාත් එක්ක කතා කළා..."

"නෑ..."

"නංගී ලංකාවට ආවට පස්සේ ඔය කතා කළාමයි මචං..."

"ඉතින්... මො..නාද කෙල්ල කිව්වේ..."

මධුවන්ත දිග සුසුමක් හෙළුවේය.

"තාමත් ඒ කියපු දේවල් හිතාගන්න බෑ මචං..."

"ඇයි මධූ..."

මධුවන්ත ඇය කියූ සියල්ලම රවීට කිවේය. ජීවිතයේ ඉන්නා විශ්වාසවන්තම මිතුරෙකුට එසේ කීවාට කමක් නැත.

"මුතු නංගී මොනා හරි ලොකු දෙයක් හිතේ තියන් ඉන්නවා ඇති..."

"ම..ට..ත් එ..හෙම හිතෙනවා මචං..."

"කෙල්ල අහන්නේ උඹට ආයෙත් සිංගප්පූරු යන්න බැරිද කියලා කෙල්ලටත් යන්න..."

Elegantlks.com

"ඔ..ව් ඒ..ත් මචං..."

"හැ..ම ප්‍රශ්නෙකටම උත්තර හොයන්න යන්නෙපා මධූ..."

"ම..ට මොනවත් තේරෙන්නෑ මචං... මං කුණාටුවකනේ ඉන්නේ..."

"කුණාටුවල ඉන්නකොට හිතපු නැති ගොඩබිම් වලට නැව් පාවෙනවා මධූ..."

මධුවන්ත කතා කළේ නැත. කොහොමත් හිතන්නට මහා දෙයක් පපුවේ ඉතිරි වී ඇත.

"මධූ..."

"මචං..."

"කෙල්ලට මුතු නංගී වගේ අම්මෙකුයි... උඹට ඒ වගේ කෙල්ලෙකුයි ලැබෙනවනම්..."

"ප්‍රශ්නේ එච්චර දුර ගෙනියන්නෙපා මචං... කෙල්ල එහෙම දෙයක් අදහස් කළේ නෑ..."

"උඹට මං හැමදාම හරකා කිව්වේ ඒකනේ... උඹ ගෑණු ගැන දන්නෑ..."

"ඔ..ව් මං ද..න්..නෑ... ඒකනේ මෙහෙම වුණේ..."

මධුවන්ත කීවේ අසරණවය.

"මධූ... කෝකටත් උඹ සතියක් දෙකක් ඔහොම ඉඳපං..."

"කිව්වේ මචං..."

"මෙහේ සෙට්ල් වෙන්න කවදත් පුළුවන්නේ... එකපාර ගෙවල් හොයන්න යන්නෙපා..."

"ඒත් මචං..."

"කියන දේ අහපං... උඹට ඔහේ ඉන්න අමාරු නම් මෙහේ

ඇවිත් හිටපං..."

"කමක් නෑ මචං... මං ඉන්නම්..."

"කෙල්ල උඹත් එක්ක හිමිහිට කතා කරයි..."

"ඒත් එහෙමය කියලා මචං... මම ම..ගේ ජීවිතේ ගැ..න..."

"ඇයි කෙල්ල උඹත් එක්කම මේවා කතා කළේ... මී.. කෙල්ල සල්ලි ටිකක් ගත්තා රටකට ගියා... උඹ වටේ කැරකෙන්න ඕනේ නැනේ..."

"ම..ට..ත් පු..දු..ම ඒකයි මචං..."

"මධූ... අසරණයා වගේ හිතන්න යන්නෙපා... අර පට්ට වේසි තමා උඹව කෑවේ... අඩමානෙට හිතන්නෙපා මධූ..."

රවී බණින්නේ ආදරයට බව මධුවන්ත දනී.

"හිටපං මං එනකං..."

"මී..."

"මේ දවස් ටිකේ උඹත් පැත්තකට වෙලා හිටපං..."

"මො..නා..ද මචං..."

"තැනකට යන්න තියෙන්නේ එක පාරක් නෙමේ මධූ... මං ඉක්මනට එන්නම්... හාෂි මට කතා කළා... එයා අලි වංශෙන් හිතන් ඉන්නේ... මං දෙකක් කිව්වා එයාට..."

"එයා හැදෙන ගෑණියෙක් නෙමේ මචං..."

"නෑ මධූ... හාෂි උඹට හදපු ගෑණියෙක් නෙමේ... උඹට හදපු ගෑණියෙක් ඇති..."

රවී දුරකථනය තිබ්බේ එහෙම කියාය.

"දුවවත් හදාගෙන තනියම ජීවත් වෙන්න හිත හදාගෙන ලංකාවට ආපු මට මේ මොනවද දැන් වෙන්නේ... මුතු ගැන ඒ තරම්

Elegant

දුරට හිතන්නේ මොකටද... මේ අනාථ වෙච්ච දරුවෙක් ඉන්න තාත්තගෙන් එයා අනාගතයක් පතන්නෑ... රවීට පිස්සු... නංගී ඉල්ලුවේ උදව්වක්..."

මධුවන්ත ඇත්තටම සිතුවේ එහෙමය. මේ කේඩෑරිව ඉපල්ව ඉරිතලා ගිය ජීවිත පොකුණ මත සුදු නෙළුම් පිපෙන්නේ කෙසේද... ඇරත් ඒ වැනි මලක් කොහොමත් පිපෙන්නේ නැත.

"එයා වෙනුවෙන් දෙයක් කරලා දෙන්න පුළුවන්නම් කරලා දෙනවා... එයාට සිංගප්පූරු යන්නම ඕන නම් එහේ එයාට පරිස්සමින් ඉන්න විදිහක් හදලා දෙනවා... එයත් කිව්වේ ඒකයි..."

එසේ නොමැතිව දැන් මේ ගිනිගත් ජීවිත කුඩුව වටේ පාට පාට රැළි එල්ලාගෙන පිස්සු නැටීමේ තේරුමක් නැත.

"දි..දී හා..වා..."

දුව නැගිට්ටේ එසේ කෑ ගසාගෙනමය. මධුවන්තගේ පපුව ගැස්සිණ.

"ඒත් එයා දුවට මෙච්චර ආදරේ ඇයි... මගේ තනිවෙච්ච අහිංසක කෙල්ලට..."

"තා..ත්..ති දි..දීගේ හා..වා..."

මධුවන්ත දුව වඩා ගත්තේ කොට්ටය අද්දර තිබූ ඇය දුන් හාවාද රැගෙනමය.

"මේ ඉන්නේ දිදී දුන්න හාවා..."

"ඈ..ඩ ය..න්..."

කෙල්ල යං කියන්නේ මුතු ළඟටය.

"දිදී බාම් ගිහින්... ආවම යං අම්මියෝ... කුක්කු බොමු..."

මධුවන්ත කෙල්ලව වඩාගෙනම කෙල්ලගේ කිරි එක හැදුවේය. ඊටත් පසු ඇයව ඔඩොක්කුවේ තබාගෙන කිරි එක කටට ළං කළේය.

"හා..ව්..ට ක..ක්..කු..."

"මං දෙන්නම්... කුක්කි බොන්නකෝ..."

මධුවන්ත කෙල්ලගේ හිසකේ පිරිමදිමින් සිතුවේ මේ ජීවිතය මතට වැටුණු මුතුපට ගැන මේ තරම්ම හිතන්නේ ඇයිද කියාය.

* * * * * * * * * * * *

මුතු ඇඳට වී සිතුවේ ඊයේ රෑ තමා අතින් කියවුණු දේවල්ය. ඒ ගැන පසුතැවීමක් ඇගේ පපුවේ නොවීය.

"කියන්න පුළුවන්කමක් තිබ්බා නම් පපුවේ තියෙන හැම දේම කියනවා... ඒත් එයා ඉන්න තත්වේ හැටියට එහෙම කරන්න බෑ... තීරණයක් නොගෙන එයාගේ ජීවිතේ කරකවලා අතාරින්න බෑ..."

ඒත් තීරණය ගත යුත්තේත් ඔහුය.

"එයා මේ පපුවේ තියෙන මොනවත් නොදැන එයා කොහොමද එහෙම හිතන්නේ... එයා තාත්තා කෙනෙක්... දුවෙක්ගේ ජීවිතයකුත් එයාගේ අතේ... හරියට ඉන්න හිටින්න තැනක් නැතුව රස්සාවක් නැතුව එයත් හිරවෙලා ඉන්නේ..."

තමාවත් එක්කාගෙනම සිංගප්පූරු ගියා නම් ජීවිත දෙකක ප්‍රශ්න වලට විසඳුම් ලැබෙයි. එහෙත් එය ඔහුට කියන්නේ කෙසේද...

"හැමදේටම කලින් එයාට කියන්නෝන මේ පපුවේ තියෙන ආදරේ..."

කියන්නට අමාරුම එයය.

"එයාට තේරුම් ගන්න බැරි ඇයි..."

මුතු අනිත් අතට සිතුවාය.

"එයා මේ පවුල එක්ක නියලා මං ගැන හිතනවා ඇති... එදත් කිව්වේ මං ගැන හිතන්න වත් බයවුණා කියලා..."

Elegantlk.com

මුතු සිතුවේ මධුවන්ත රවීගේ අම්මා සමඟ කියූ කතාව ගැනය. එය ඇය අසා උන්නේ රහසිනි.

"කොහොමත් එයා හිතයි..."

මේ හදවතට දැනෙන දේ ඒ පපුවට නොදැනෙනවා නම් ඇත්තටම පුදුමය. පපුවේ මෙලවෙන්නේ ඒ තරම්ම ගින්දරකි.

"ඇයි චූටි..."

නිම්මි පැමිණ ඇඳ මතින් වාඩි වී ඇසුවේ කෙල්ලගේ සුදු දෙපා මත සුරත තබාය.

"අ..ක්..කේ..."

"මි..."

"මං ඊයේ..."

"ඉතින්..."

"ම..ධු..ව..න්..ත අයියත් එ..ක්ක ක..තා කළා..."

"ඊයේ..."

"මි.. රෑ... දුවව තියන්න ගියාම..."

නිම්මි කෙල්ල දෙසම බලා උන්නාය. "මොනවා උනාද දන්නෑ..." ඇය සිතුවාය.

"ඉ..තින්..."

"හිතේ තිබ්බ ලොකු බරක් නිදහස් වුණා... මං ඔයාගේ මස්සිනාගේ කකුල් දෙක අල්ලලා වැඳලා සමාව ඉල්ලුවා..."

නිම්මිට පුදුම නැත. ගෑණු එහෙමය. ගෑණු පපුවේ හිර වූ දේවල් එළියට එද්දී සුනාමිය වගේය.

"උඹ කවදහරි එ..හෙම කරයි කියලා මං දැනං හිටියා..."

"එයා වගේ කෙනෙක් එක්ක තරහ වෙලා ඉන්න බෑ..."

"උඹ තරහ නැනේ... පැලෙන්න ලව්නේ...."

නිම්මි කීවේ ඇත්තටමය.

"මොනාද කෙල්ලේ කිව්වේ..."

"මො..නා කියවුණාද දන්නෑ අක්කේ..."

"ඇයි චූටි..."

"එයා ප..ව්..."

"ඇයි..."

"මං උදව්වක් ඉල්ලුවා... සිංගප්පූ යන්න..."

"කො..ල්..ල..ට..ත් ය..න්..න ක..තා කළාද..."

නිම්මි ඇසුවාය.

"එ..කපාර ඇහුවේ නෑ... ඒත්..."

"ඇයි..."

"මං කිව්වා තනියම යන්න බෑ කියලා..."

"කොල්ලා අන්ද මන්ද වෙන්න ඇති..."

"ඒ මෝඩයාට හැමදේම කියන්න ඕනද ඉතින්... එකපාරකුත් ගියා අව්වර ආදරේ කරද්දී..."

නිම්මි සිනාසුණේ දුක්බරවය.

"අ..ද රෑ දැන් අම්මයි තාත්තයි ආවාම..."

"කොහොමත් මට යන්නම වෙනවා අක්කේ... මේ ගේ දාලා..."

නිම්මිට හිල්ලින.

"ඔයයි අයියයි කියයි ඉවසන්න කියලා... පරිස්සමින් තීරණ ගන්න කියලා... තව ටිකක් හිතන්න කියලා... ඒවා ඔක්කොම තේරුමක් නෑ... ඇරත් අක්කේ..."

"මි..."

Elegantta.com

"මං ජීවිතේ තීරණ ගන්න බයත් නෑ..."

"හොඳ ගොඩබිමක් පේනකොට නැව් හරවන්න කවුද බය වුට්..." නිම්මි කීවාය. මුතු නිම්මි දෙසම බලාගෙන උන්නාය.

"අක්කේ..."

"මී..."

"මං ය..න..වා..."

මුතු එක හිතින් කීවාය.

"ර..ට..."

"මී..."

"තනියම..."

"නෑ..."

"එහෙනම්..."

"මං දන්නවා... එයා එයි..."

"එ..හෙ..ම කිව්..ව..ද..."

"ජීවිතේ සමහර දේවල් ගැන එහෙම විශ්වාසයක් එනවනේ අක්කේ..."

"එ..හෙ..නම් ඇයි ඒ ගැන..."

"එයත් එක්ක කතා කරන්න ඕන... හැ..ම දේම කියන්න ඕන... මං ඔයාගෙන් එක උදව්වක් ඉල්ලනවා..."

"කියපන්..."

"මට උදව් කරන්න... මං දන්නවා මට සතුට ලැබෙනවා කියලා... වෙන මොන දේ නැතත්..."

නිම්මි කෙල්ලව අධෛර්යමත් කළේ නැත. එහෙත් ඇයට මේ

කෙල්ල ගැන පුදුමය. ආදරය පපුවේ මේ තරම් කැපුම් පහරක් ඇති කරනවාද...

"ඒ තාත්තයි දුවයි එක්ක ජීවිතේ ගෙවනවා කියලා මං තීරණය කරලා ඉවරයි..."

"මං උ..ඹ..ට මොනවත් කියන්නෑ වුට්..."

"ඔයාට කියන්න බෑ... ඒ මල්ලිගේ අයියවනේ ඔයා බැන්දේ... ඔයා දන්නවා මේ අයියලා මල්ලිලා ගාව මොන දේ නැතත් මනුස්සකම තියෙනවා කියලා..."

"ඔ..ව්.. මං සතුටින් ඉන්නේ ඒකනේ..."

"ඒ සතුට මටත් දෙන්න... ලෝකේ කොහේ හරි මුල්ලකට වෙලා හරි මං ඒ දෙන්නා එක්ක ජීවත් වෙනවා..."

මුතු දෑස් බොඳව යද්දී කීවාය.

"ම..ල්ලී මේ මොනවත් දන්නෑ වුට්..."

"එයාට මං කියනවා..."

"කොල්ලා පුදුම වෙයි..."

"ඔයාලා නොදන්න දෙයක් තියෙනවා අක්කේ..."

"මො..ක..ක්..ද..."

"එයා මට හරි ආදරෙයි... ඒක දන්නේ මම... එයාගේ දුවට වගේ එයා මට ආදරෙයි..."

මුතු කීවේ අඬමින් මෙනි.

Elegantlk.com

23

මුතු මධුවන්තගේ ජංගම දුරකථනයට ගත්තේ ඇඳේ ඉඳගෙනමය. මධුවන්ත දුරකථනය ගත්තේ දුවාව වඩාගෙනමය.

"නං..ගී..."

"දු..වා කෑ..ව..ද..."

"මේ කවනවා නංගී..."

කෙල්ල කතා කළේ මොනවා හෝ කියන්නට බව මධුවන්ත දනී.

"නං..ගී..."

"අ..ක්..කා දුව..ව අ..ද බලාගන්නම් කි..වි..ව..."

"ඔව් නංගී..."

"ම..ට අ..ද ටි..ක..ක් අයියා එක්ක ක..තා ක..ර..න්..න ඕ..න...

ගෙදර බෑ..."

"මං නංගී..."

"අ.නුෂ්කලගේ ගෙදර ක..තා කරන්න පුළුවන්... අ..යියා රාජගිරියේ මැක්ඩොනල්ඩ් එක ගාව ඉ..න්..න..ව..ද... දහයට වි..තර..."

"මං ඉ..න්..න..ම් නංගී..."

මධුවන්ත කීවේ උගුර සිරවී යද්දීය.

"මං එ..හෙ..න..ම් ය..න්..නම් නංගී..."

"ම්..."

මධුවන්ත එහෙමම බැලුවේ කෙල්ල දෙසය. මේ වෙන දේවල් අදහන්නට පවා අමාරුය.

"දි..දී තා..ත්..නිට මොනාද කියන්න යන්නේ..."

මධුවන්තගේ ළය ඇතුලාන්තයෙන් ගැහෙන්නට විය. නිම්මි මධුවන්ත ඉන්නා කාමර කෑල්ලට ආවේ ඒ මොහොතේය.

නිම්මිට කොල්ලා දෙස බලද්දීම වෙනස තේරුණි.

"ඇයි ම..ල්ලි..."

"නෑ අක්කේ නංගී..."

"ටි..ක..ක් කෙ..ල්ල එ..ක්..ක ක..තා ක..ර..න්..න..."

නිම්මි බිම බලාගෙන කිව්වාය.

"කෙල්ල ඉන්නේ මොකක් හරි තීරණයක් අරගෙන..."

"ඒත් අ..ක්..කේ මං..."

"ඒ නි..ර..ණේ ඔයාටම කියන්න ඕ..න ඇ..නි..."

"ම..ට තේ..රෙ..න්නෑ අ..ක්කේ..."

"ටි..ක..ක් කෙල්ල කියන දේ අහන්නකෝ..."

"ම්..."

Elegantalks.com

මධුවන්ත කෙල්ලව සෝදනු නිම්මි බලාගෙන උන්නාය.

"අද නැන්දි එක්ක ඉමු... මී..."

නිම්මි කෙල්ලව වඩාගත්තේ මධුවන්ත කෙල්ල සෝදා අලුත් ඇදුමක් ඇන්දවූ පසුය.

"මට නව ඇඳුම් දෙක තුනක් දෙන්න මල්ලී... අපි දවල්ට බයි කාලා නාමු.. මී..."

නිම්මි යන්නට පෙර යළින් මධුවන්ත දෙස බැලුවාය.

"ම..ල්ලි..."

"අක්කේ..."

"මොං..න දේ උනත් කෙල්ල කියන්නේ ඇත්ත... ඒකිට කියන්න ලොකු කතාවක් තියෙනවා..."

"මං.. නං..ගී ගැන දන්නවා අක්කේ..."

නිම්මි උඩට ආවේ කෙල්ලවද වඩාගෙනමය. අදින්නට ඇඳුමක් නෝරමින් උන් මුතු එහෙමම කෙල්ලව වඩා ගත්තාය.

"ම..ගේ කු..ක්..කි..."

මුතු කෙල්ලව සිපගත්තේ පුදුමාකාර ආදරයකිනි.

"එයා මං කියන දේට කැමති උනොත් මේ කෙල්ලගේ ජීවිතෙත් මං ආදරෙන් පුරවනවා අක්කේ..."

"ම්... සමහර විට උඹ ඇත්තටම හරි ඇති..."

"නැමදේම තියෙන්නේ මේකිගේ නාත්තිගේ අතේ..."

"උඹ කතා කළොත් මල්ලී එනවා..."

"මා..ත් ද..න්..නවා අක්කේ... මී නැන්දි ගාව අදට ඉන්න..."

"චූටි..."

"ම..."

"මේවා කොල්ලට කිව්වට පස්සේ ආයේ ඒ පපුව හරවන්න බෑ..."

"මං දන්නවා අක්කේ..."

මුතු කීවේ සුසුමක් හෙළාය.

* * * * * * * * * * * *

මධුවන්ත නිවසින් පිටවූයේ නමයාමාරටය. ඔහු යනවා උඩ සිට මුතු බලාගෙනය. මුතු සෑහෙන වේලාවක් ඔහු දෙස බලා උන්නාය.

"මේ කෙල්ල ඔයාට මෙච්චරම ආදරේ කරනවයි කියලා ඔයා දන්නෙවත් නැතුව ඇති..."

මුතු සිතුවේ හූල්ලමිනි.

"ඔයා වගේ කෙනෙක් එක්ක ගන්න යන මේ තීරණේ ගැන මට බයක් දැනෙන්නේ නෑ... පුදුමයි..."

මුතු පහළට එමින් සිතුවාය. ඇය පහළ සාලයේ සෙල්ලම් කරන දුව දෙස මොහොතක් බලා උන්නාය.

"මං ය..නවා අක්කේ..."

"මී.. මං හිතින් බාරෙකුත් උනා නොදම දෙයක් වෙන්න කියලා..."

"අපි සිංගප්පූරු ගියොත්..."

"ඉතින්..."

"අයියයි ඔයයි එනවා නේද අපිව බලන්න..."

නිම්මි සිනාසුණේ දැස් තෙත්ව යද්දිය.

"එ..නවා... දෙ..න්..න ඉන්නත් යනවනේ..."

"ජීවිතේ පටන් ගන්න මේ තීරණේ ගන්නම වෙනවා අක්කේ..."

"මී.. පලයංකෝ... කොල්ලා බලන් ඇති..."

වත්තට වේගයෙන් ඇතුල් වූ වාහනය බ්‍රේක් ගැසුවේ පළාතම දෙවනත් කරමිනි. මුතු ගැස්සී මිදුල දෙස බැලුවාය.

"කාංචන..."

මුතුට ඉබේටම කියවිණි. කාංචන වාහනය පණ ගන්වා තිබියදීම නිවසට ගොඩ වූයේ මුතු හැරෙන්නටත් ප්‍රථමය.

මුතු කාංචන දෙස බැලුවේ හෑන්ඩ් බෑගය කරට දමාගෙනමය.

"කො..හේ ය..න්..නද මු..තු..."

"මගේ සැනසීම හොයාගෙන..." මුතුට කියන්නට කටට ආවේ ඒ වචනය.

"ග..ම..න..ක් ය..න්..න..."

"ඒ ගමන කැන්සල් කරන්න... යන්න වෙන ගමනක් තියෙනවා..."

"කොහෙද..."

මුතු ඇවිලෙමින් ඇසුවාය.

"නගින්නකෝ වාහනේට... යන ගමන් කියන්නම්..."

මුතුට බැලුනේ නිම්මි දෙසය.

"ජීවිතේ යන වැදගත්ම ගමන උඹට නතර කරන්න බෑ... මං මේ ගමන යන්නම ඕන..." මුතු සිතුවාය.

"ලේට් වෙනවා... යන්..."

කාංචන කීවේ නැති කලබලයක් මවමිනි.

"සොරි... මට එන්න විදිහක් නෑ... මං අපොයිමන්ට් එකකට යන්නේ..."

මුතු කීවේ බිම බලාගෙනය.

"ඉතින් ඒක කැන්සල් කරන්න... දැන් යං..."

"සොරි... මං යන්නම ඕන..."

"මුතු..."

කාංචන කතා කළේ තරමක් ආවේගයෙනි.

"වැදගත් මිනිහෙක් උනාම කියන දෙයක් තේරුම් ගන්න උත්සාහ කරන්ඩ... මට එන්න විදිහක් නෑ..."

"එ..හෙ..ම..ද..."

"ඔ..ව්.. වෙන වෙලාවක ඔය ගමන දාගන්න..."

"හරි බලමු..."

කාංචන ගියේ දැවෙමිනි. මුතු පපුව හිස් කළේ කාංචනගේ වාහනය ගේට්ටුවෙන් පිටතට ගිය පසුය.

"හමුදා පාලනයකට යටත් වෙලා වගේනේ... මේ මිනිහා එක්කද අක්කේ පවුල් කන්නේ... මූ මාව කයි..."

"දැ..න් යන ගමන පලයන්... මොකේද යන්නේ..."

"මං සේනට කිව්වා ත්‍රීවිල් එකක් ගේන්න කියලා..."

"ම්.. පරිස්සමින්..."

මුතු ත්‍රීවීලරයට ගොඩ වූයේ අහල පහළක කාංචනගේ වාහනය ඇද්දැයි බලාය. කාංචන ගියේ කේන්තියෙන් බව මුතු දනී. ඔහු මේ සියල්ලම අම්මාගේත් තාත්තාගේත් කණේ තබන බව මුතු දනී.

කොහොමත් දෙන්නාම අද රෑ එන්නේ දුම්මල වරම අතින් ගෙනය. මේ ජීවිතට විසඳුමක් තිබිය යුත්තේ ඒ නිසාය.

"හිතේ තියෙන දේවල් එයාට කිව්වට පස්සේ මොනවා උනත් කමක් නෑ..."

මුතුට සිතුණි. දෙවන වතාවටත් මේ ආදරය පපුවේ හිර කරගෙන දුක් විඳිය නොහැක.

"කොහාටද පුංචි නෝනා යන්නේ..."

"රාජගිරියට යන්..."

මුතු යන ත්‍රීවීලරය පිටුපස කාංචනගේ වාහනය එන බව මුතු දැක්කේ නැත. කාංචන වාහනය පදවාගෙන ආවේ ත්‍රීවීලරයට සෑහෙන

Elegant talks.com

පිටුපසිනි. "බලමු උඹේ මහ ලොකු අපොයිමන්ට් එක මොකක්ද කියලා..." කාංචන සිතුවේ මුතු යන ත්‍රීවීලරය වෙතම දෙනෙත් තබාගෙනය.

* * * * * * * * * * * * *

මධුවන්ත රාජගිරියේ මැක්ඩොනල්ඩ් අවන්හල වෙතට ආවේ පැය බාගයකට කලිනි. ජීවිතයේ මේ උදාවන මොහොත ගැන මධුවන්තට තවම පුදුමය. "මට අයියා එක්ක ටිකක් කතා කරන්න ඕන..." ඇය කියූ වචන මධුවන්තට ඇසෙන්නාක් වැනිය.

ඒ තරම් පෞද්ගලිකව තමාව හමුවී මේ කෙල්ලට කතා කරන්නට ඇත්තේ මොනවාද... මේ ආත්මයේදී තවත් කෙනෙක් සමඟ මෙහෙම කතා කරන්නට යෙදේ යැයි මධුවන්ත සිතුවේ නැත.

දෛවය කොහොමත් කරන්නේ පුදුමාකාර දේවල්ය. ජීවිතය යනු මේ දෛවයට මුහුණ දීමය.

"එයා කොහොම දෙයක් මට කියන්න යනවද කියලා මට හිතාගන්න බෑ... මොන දේ හරි කියන්න එයා මාව තෝර ගත්තේ ඇයි..."

ඒ සියල්ලටම පිළිතුරු තව ටිකකින් ලැබෙන බව මධුවන්ත දනී.

"එයා වගේ කෙනෙක් ගැන කොහොම හිතන්නද... සිංගප්පූරුවේ ඉඳලා ආපු දවසේ ඉඳලා වචනයක් කතා කළේ නෑ... දැන් එකපාර මෙහෙම කතා කරන්නේ ඇයි..."

මධුවන්තට සිහිවූයේ අදින් වසර තුන හතරකට පෙර සිංගප්පූරුවට යන්නට ප්‍රථම උන් පුංචි කෙල්ලවය. ඒ දවස්වල ඇය ගැන සිතුවේ රහසේ දුටු මලක් ගැන සිතනා ලෙසිනි.

"ඒ දවස්වල එයා ගැන හරියට හිතුණා... ඒත් කතා කරන්නවත් මට බය හිතුණා... වෙඩින් එක දවස්වල එයා දිහා බලද්දී පපුවට

මොනාද උනා..."

අද තමාව මේ හමුවන්නට එන්නේ ඒ මලමද... මධුවන්තට පුදුමය. එහෙම කුමාරිකාවක් මේ හිඟාන්නාව හමුවන්නට එනවා කියා හිතද්දීත් පුදුමය.

"ඊයේ රෑත් එයා මොනවද කියන්න ගියා... ඒත් කිව්වේ නෑ... අද හම්බවෙමු කිව්වේ ඒක කියන්නද..."

මේ මොහොතට කොහොම මුහුණ දෙන්නදැයි මධුවන්තට තේරෙන්නේ නැත. මධුවන්ත මැක්ඩොනල්ඩ් අවන්හල ඉදිරිපිටට වී පාර දෙස බලා උන්නේ මේවා සිතමිනි.

ත්‍රීවීලරය මැක්ඩොනල්ඩ් අවන්හල දෙසට හරවද්දී කාංචන වාහනයේ වේගය බාල කළේය.

"අපොයිමන්ට් එක තියෙන්නේ එහෙනම් මැක්ඩොනල්ඩ් එකේ... බලමු උඹ කාවද හම්බවෙන්නේ කියලා..."

කාංචන වාහනය නැවැත්වූයේ පාරේ එහා පැත්තේය. ඔහු වාහනයේ ඉඳගෙනම ත්‍රීවීලරය දෙස බලා උන්නේය.

මුතු ත්‍රීවීලරයෙන් බැස ආවේ මධුවන්ත දෙස බලාගෙනමය. "පව් ඔයාගේ මූණ හරි අසරණ පාටයි... ඒත් මේක අපි දෙන්නම වෙනුවෙන් කරන දෙයක් මහත්තයෝ... තේරුම් ගන්න..." මුතු කීවේ සිතිනි.

මේ මල් කුමරිය එන්නේ තමාව හමුවන්නයැයි මධුවන්තට සිතාගන්නට වත් නොහැක.

"චු..ට්..ට..ක් පර..ක්කු උ..නා..."

මුතු කීවේ ඔහු දෙස බලාගෙනමය. මධුවන්ත සිනාසුණේය.

"අ..පි ය..න්..ද අයියේ..."

"ය..න් නංගී..."

කාංචන සියල්ලම බලාගෙනය. එහෙත් ඔහු ඇතට මධුවන්තව ඇඳින්නේ නැත.

Elegantta

"උඹ එහෙනම් ආවේ මේකට... කොල්ලව ත්‍රීවීල් එකට නග්ගගන්න... දැන් බලමු යන්නේ කොහෙද කියලා..."

කාංචන අවි කණ්ණාඩිය පැළඳ ගන්නේය. කාංචන මධුවන්තව දැක තිබුණේ එක් වතාවකි. මේ වෙලාවේ ඔහුගේ හිනට මධුවන්නගේ රෑව සිහි වූයේම නැත.

"මෙච්චර වාහන තියෙන ගෙදර ඉන්න උඹ මේ ගමන ආවේ ත්‍රීවීල් එකේ... උඹ එහෙනම් ලොකු පිම්මක් පනින්නයි යන්නේ බලමු මුතු... මං උඹව ලේසියෙන් අත්අරින්නෑ..."

ත්‍රීවීලරය ගියේ පාර්ලිමේන්තු පාර හරහා මාලබේ. දෙසටය. කාංචන එහෙමම වාහනය එය පිටුපස පැදවූවේය.

මුතු මධුවන්න දෙස බැලුවේ නොල් පට තද කරගෙනය. "ඔයාට අපරාදේ හාමිණී වගේ කෙනෙක්ව ලැබුණේ... ඔයා මෝරපු මිනිහෙක් නෙමේ..." ඔයා මේ වෙලාවේ ඉන්නෙන් බයවෙලා වගේ..." මුතු සිතුවාය.

"රෑ අයියා කෑනා කළේ නෑ..."

"කෑනා කළා නංගී... මං උදේ කෑනා කළා... ඒ අම්මා අපිව හොක් කරනවල..."

"ආයෙත් යන්නත් ආසයි..."

"තිවාඩු වෙලාවක යමු නංගී..."

"ආයේ කොහේ යන්නද..."

දුකු සිංහේ ඇල්ලා මෙනි.

"අන්තුප්‍රී ඇන්ටියි රෑ එනවද..."

"මේ... එනවා..."

යුද්ධය ඇරඹෙන්නේ ඉන් පසුය.

"ගෙයක් බලනවා කිව්වා නේද..."

මධුවන්න කිම බලාගෙන හිස වැනුවේය.

"නෑ..ම ඔළුවේ එකලාසයක් නෑ නංගී..."

"ඔයා තීරණයක් නොගෙන උන්න එක නොදයි..." මුතු සිතුවාය.

"අ..ර..යා ක..ව..ද්..ද ය..න්..නේ..."

මුතු එකවරම ඇසුවාය.

"ක..ටු..ද..."

"හාමිණී කි..ය..න්..නේ... එයා..."

මුතු කීවේ අහක බලාගෙනය. "මං ඔය නම්බන් මනස් කරන්න කැමති නෑ..."

"ද..න්..නෑ නංගී... මං අහන්න ගියේ නෑ..."

"ආයිත් දුවව බලන්නෝන කියයි..."

"මං යි..න්..නෑ..."

ඔහු ළඟින් මෙහෙම ඉදගෙන යනවා කියා හිතද්දීත් පුදුමය.

කාංචන වාහනය පැදවූයේ විමසිල්ලෙනි.

"මාලබේ පැත්තට යන්නේ.. මොකා එක්කද මෙයා මේ යන්නේ.. කොහාටද..."

පාරේ වූ ආරක්ෂක ශුර පොළකින් කාංචන ආ වාහනය නැවැත්වූයේ ඒ මොහොතේදීය.

කාංචන වාහනය නතර කළේ වේගයෙන් මාලබේ දෙසට යන ත්‍රීවීලරය දෙස බලාය.

"අපට අයි ඩී එක දෙන්න..."

කාංචන කලබලයෙන් හැඳුනුම්පත රැගෙන හමුදා නිලධාරියාට දුන්නේය.

"කරුණාකරලා වාහනේ පිටිපස්ස ඇරලා පෙන්නන්න..."

"මට හදිස්සියි..."

"සොරි... වාහනේ බලන්න ඕන..."

Elegantlk.com

"වෝ එකත් ඉවරයි... දැන් වෙක් කරන්නේ බම්බුවටද..." කාංචන බැස්සේ සිතින් මුමුණමිනි.

මාලබේ නගරයට ටිකක් ඉදිරියෙන් වූ සල්මල් මාවතට ත්‍රීවීලරය හැරවිණි. කාංචන වාහනය වේගයෙන් ඉදිරියට පැදෙව්වේය. එහෙත් කඩුවෙල දක්වා ගියද ඔහුට මුතු ගිය ත්‍රීවීලරය හමුවූයේ නැත.

"උඹ එහෙනම් මට මිස් උනා... බලමු... උඹ ආයෙත් එන්න ඕන මේ පාරෙනේ..."

කාංචන සිතුවේ කේන්තියෙනි. ඔහු මුතුගේ ජංගම දුරකථනයට ගත්තේය. මුතු දුරකථනය ගෙන බැලුවේ එහි සටහන්ව තිබූ අංකයය. ඇය එය ක්‍රියා විරහිත කළේ මධුවන්ත බලා සිටිද්දීමය.

"පට්ට බැල්ලි... ෆෝන් එක වැහුවා... උඹව මං තියන්නෑ..."

කාංචන වෙව්ලමින් සිතුවේය. ඔහු සිතාගෙන උන්නේ මේ නොඉදුල් මල නැකත් බලා ඉඳුල් කරන්නටය. මුතුව දකින දකින වාරයක් පාසා කාංචන දැවුණේය. "දවසක මට උඹව ලැබෙනවනේ..." ඔහු හැමදාම සිතුවේ එහෙමය. කාංචනගේ හදවතේ වූයේ මුතුගේ සුන්දර රුව ගැන පුදුමාකාර පෙරේත හැඟීමකි. එහෙත් ඒ රුව යට වූ අහිංසක කෙල්ලගේ හදවත ඔහු කවදාවත් දුටුවේ නැත.

"උඹ ඉන්නේ පත්තිනි අම්මා වගේ... මැස්සෙක් වත් වහලා නැති ගාණට උඹේ කතාව... අතින් ඇල්ලුවොත් අත ගසනවා... එහෙම උඹ අද කොල්ලෙක්ව ත්‍රීවිල් එකට නග්ගගෙන ගියා... උඹ මේ කොහේ හරි ඇති..."

කාංචන පාර අයිනේ වාහනය නතර කරගෙන සිතුවේය.

"බැන්ද දවසක උඹට ගෙදරින් හෙලවෙන්න දෙන්නෑ..." කාංචන සිතුවේ දැවෙමිනි.

24

අනුෂ්කාට කෙල්ල ගැන පුදුමය. කෙල්ල මේ පරල වී ඇත්තේ ආශාවකින් නොවේ. ආදරයෙනි. ආශාවෙන් පරල වෙනවා නම් මුතු පසුපස ආ කොල්ලන් සමඟ ඇය යන්නට පුළුවන් වැඩිම දුර ගොස්ය. එහෙත් මුතු එහෙම කෙල්ලෙක් නොවන බව අනුෂ්කා දනී.

අද ඇය කරන හැම දෙයක්ම පිටුපස ඇත්තේ ආදරයේ ගින්දරය. "මට මධුවන්ත අයියා නැතුව ඉන්න බෑ අනූ..." ඊයේ කෙල්ල කියූ කතාව අනුෂ්කාට මතකය.

එක ආත්මයකදී ගෑණියෙක් එකම වරක් එහෙම ගින්දරකින් දැවෙයි. ඒ ගින්දරෙන් දැවෙද්දී කෙල්ලෙක් පුංචි කාලි මාතාවක් බඳුය.

ඇය සටන් කරන්නට යන්නේ ලේසි පාසු කුණාටුවකට විරුද්ධව

Elegantlk.com

නොවේ. එහෙත් කෙල්ල දැන් සටන පටන්ගෙන හමාරය.

අද කෙල්ල ලෝකය කියා දකින්නේ අර චූටි දූගේ මේ අහිංසක තාත්තාගේ මුහුණුය. එයට විරුද්ධව යමක් කියන්නට අනුෂ්කාට සිතෙන්නේ නැත.

සමහර විට ඇයට මේ යන මාවතේදී හැමෝටම වඩා සතුටක් ලැබෙනු ඇත. කොහොමත් සැනසීම ලැබෙන්නේ එහෙම අහිංසක පාරවල්වල යන අයට මිස හයි වේ වල යන අයට නොවේ.

මුතු ත්‍රීවීලරයෙන් බැස්සාය. මධුවන්ත ත්‍රීවීලරයට මුදල් ගෙව්වේය.

"ය..න් අ..යියේ..."

මුතු කතා කළේ බිම බලාගෙනය. මෙහෙම ගමනක් ඔහු සමඟ ආවාට ඔහු තමා ගැන නරකක් නොහිතන බව මුතු දනී.

අනුෂ්කා දෙන්නාවම පිළිගත්තේ සිනාබරවය.

"එ..න්..න අයියේ... අද දුව ආවේ නෑ..."

"නෑ නංගී... දුව අක්කා ළඟ..."

"අපරාදේ මං දුව එයි කියලා හිතලා චොකලට් කේකුත් ගෙනාවා... යද්දී අයියා අරන් යන්න දූට දෙන්න..."

මුතු උන්නේ බිම බලාගෙනය.

"අයියා එක්ක උඩට පලයන්... මං තේ අරන් එන්නම්..."

"ම්..."

මුතු ඔහු දෙස බැලුවාය.

"ය..න් අයියේ..."

මුතු ඉස්සර වූවාය. පිරිමියෙක් සමඟ මෙහෙම ගමනක් ආවේ ජීවිතයේ ප්‍රථම වතාවටය. මුතුගේ සිතට ආවේ බියක් නොවේ. රසබර බවකි. උඩ තිබුණේ කාමර දෙකක් පමණි. මුතු ගියේ අනුෂ්කාගේ කාමරයටය.

"ම..ට.. ස..මා..වෙ..න්..න.. එ..ළියෙදි හ..ම්බ වෙ..න්..න ම..ට

බ..ය..යි..."

මුතු බිම බලාගෙන කීවාය.

"මං දන්නවා නංගී..."

"මෙ..හෙ..ම ග..ම..න..ක් ඇවිත් නෑ..."

"ඒකත් මං දන්නවා..."

මුතුගේ සිතට නිවනක් දැනුණි.

"ඉඳගන්න අයියා..."

මධුවන්ත බර වූයේ ඇඳ අද්දරම තිබූ වේවැල් පුටුවටය. මුතු ඇඳ මතින් ඉඳගත්තාය. කාමරයේ ඇර තිබූ ජනේලයෙන් පෙනෙන්නේ එහා පැත්තේ වූ රබර් ඉඩමය. තවමත් උදේ නිසා ඒ පැත්තේ සිට එන සුළඟ සනීපය.

මේ කතාව කොහෙන් කොහොම පටන් ගන්නදැයි මුතුට තේරෙන්නේ නැත. එහෙත් මේ ජීවිතයේ උදාවූ වැදගත්ම මොහොතයි. සියල්ල තීරණය වන්නේ මේ ගෙවන පැය දෙක තුනට පසුය.

මුතු ටික වේලාවක් බිම බලාගෙන ඉඳ හිස ඔසවා ඔහු දෙස බලා සිනාසුණේය. ඒ සිනහව පපුව හරහා කැපුම් තුවාලයක් මැව්වා වැනිය. "අද ඔයාව කවදාටත් වඩා ලස්සනට මට පේනවා..." මධුවන්ත සිතින් කීවේය.

"ම.. ම..ට පි..ස්..සු කියලා අ..යියා හිතනවා ඇ..ති..."

මුතු කීවේ තොල් පට විකමිනි.

"එ..හෙ..ම හි..ත..න්..න ත..ර..ම් ම..ට පිස්සු නෑ නංගී..."

"මට දෙය..ක් කියන්න තියෙනවා... ඒක අයියට අද කිව්වේ නැත්නම් සමහර විට ම..ට කියන්න කවදාවත් ලැබෙන එකක් නෑ... ම..ට එ..හෙම දෙයක් එකපාරක් සිද්ධ වුණා..."

"මො..ක..ක්ද නංගී..."

"කෙනෙක්ට කියන්න නිබ්බ දෙයක් කිව්වේ නෑ... ඒකෙන්

Elegantlk.com

ගොඩාක් දේවල් සිද්ධ උනා..."

ඇය මොනවා කියනවාදැයි මධුවන්තට සිතාගත නොහැකි විය.

"ම..ම..."

මුතු කියන්න ගිය දේ නැවැත්වූයේ අනුෂ්කා තේ රැගෙන කාමරයට ආ නිසාය.

"සොරි කෙල්ලේ... ආයෙත් ඩිස්ටර්බ් කරන්නෑ... තේ බීලා කතා කරපන්... මං ලන්ච් හදන්නද..."

"අ..නේ එපා අනූ..."

"කතාව දිගට ගියොත් ලන්ච් හදන්නම්... මං අහන්න එන්නෑ නොදේ..."

"ම්..."

"එහෙනම් කේක් කාලා තේ බොන්න අයියේ..."

අනුෂ්කා ගියේ කාමරයේ දොර වසාගෙනමය. "දැන් ඔයයි මායි විතරයි... ජීවිතේම උනත් ඔයා ඉල්ලන්න මං දැන් දෙන්නම්..." මුතුට එසේ කියන්නට සිතුණි.

"ක..න්..න අයියේ... මොනවත් කාලා නෙමේනේ ආවේ නේද..."

"මං හිතුවේ මැක්ඩොනල්ඩ් එකෙන් නංගි එක්කම කන්න... සිංගප්පූරුවෙදින් සමහර දාට උදේට කන්නේ මැක්ඩොනල්ඩ් එකෙන්..."

"එහෙත් නි..යෙ..න..ව..ද..."

"ම්.. බලන බලන තැන..."

"ඉනින්.. දුවාවත් අරගෙනම ඇවිත් කනවා..."

"ගො..ඩ..ක් වෙ..ලාවට එ..හෙම තමා නංගී..."

මධුවන්ත බිම බලාගෙන සිටියේය.

"රෑට කන්නේ..."

"අපි හිටියේ සිංගප්පූරුවේ ලිට්ල් ඉන්ඩියා කියන පැත්තේ..."

"ම්..."

"ඒ වටේම ඉන්දියන් රෙස්ටොරන්ට් තියෙනවා... උණු උණුවේ ඉදිආප්ප තෝසේ පරාට එහෙම තියෙනවා..."

"ගෙනත් කනවා..."

"ඔව්... සමහර දාට යන්න කම්මැලියි... දුවාට නූඩ්ල්ස් එකක් කවලා මං කෝපි එකක් බොනවා..."

"දැ..නු..ත් එ..හෙම..නේ..."

මුතු උගුරෙන් මෙන් කීවාය. මධුවන්ත බිම බලාගෙන සිනාසුණේය. "ඔයා මගේ ජීවිතේ දිහා බලාගෙන ඉඳලා..." මධුවන්තට සිතුණි.

මධුවන්ත හිස් කෝප්පය තබා කෙල්ල දෙස බැලුවේය.

"මං මධුවන්ත අයියේ... මේ කියන කතාව සමහර විට අයියා විශ්වාස කරන එකක් නෑ..."

මධුවන්ත ඒ දෑස් දෙස බලාගෙනම උන්නේය.

"මං න..ංගි..ව අවිශ්වාස කරන්නේ ඇයි..."

එහෙම කියද්දී මුතු ඔහු දෙස බලාගෙනම උන්නාය. විශ්වාසවන්ත පිරිමියෙකුට දෙයක් කියන්නට ගැණියෙක් දෙවරක් සිතන්නේ නැත.

නොහිතූ ලෙස පරිසරයම අඳුරු වී ගියේය.

"ව..හි..න්..න වගේ..."

ජනේලයෙන් රබර් වත්ත දෙස බැලූ මුතු කීවාය. පරිසරයේ තිබූ අඳුර එහෙමම කාමරයටද වැටිණ.

"ම්..."

"අයියා ලංකාවට එද්දී... මොනාද හිතාගෙන ආවේ..."

"මං දුවගෙන ආවේ ලොකු කරදරයකින් ගැළවෙන්න නංගී...

Elegantta.com

හරි අස්සිරිය හිතෙන දේවල් මං දැක්කා... මං දුවම අරගෙන එන්න හිතුවා... එහෙනොට හිතේ හිමිදෙම හරි හිස් තේරුණ්... අපි දෙන්නා තනිවෙලා උන්නේ... නැගිටින්න හිතනවා... ඒත් නාම එහනමයි... හිතන්න මින...

"මොං..නා..වත්ම හිතෙත් නැද්ද..."

"දුවාට දැනක් නොදී මලාගන්න මින... හදාගන්න ලෝකේ එහෙමම තඩාගෙන වැටුණා... මං ආවේ හැම දෙයක්ම දාලා... ඉස්සර... හිටපු තැන... දැන් මුල ඉඳලා පටන් ගන්න මින...

"මොං..නා..වත්ම හිතත් නැද්ද..."

"ලං..කා..ව..ට ආ..වාම... න..ව අස..ර..ණ උ..හා නේ..ද..."

"එකපාර නැගිටින්න අමාරුයි නංගී... මාත් තනිවෙච්ච හිතිහෙක්නේ... එකපාරක් වැටිච්ච හිතිහෙක් දෙවෙනි පාර නැගිටින්න ටිකක් අමාරුයි..."

පිදු ඒ ප්‍රශ්නය ඇහුවේ ගොත ගහමින් මෙනි.

"ම..ටයි තෙද්දවයි මෙහෙම නොදියි නංගී... ටිකක් කල් යයි ඒත් පාරක් පෙනෙයි..."

ඇය මේවා හෙමින් අහන්නේ ඇයි...

"ඒ..යි..නේ අලා..සු යි..ර..ණ..යා..ක් ග..න්..න කැ..ලි..න් මං කියන දේ..වු..ට..ක් අහනවද..."

"ම.. අහන්න තමා ආවේ නංගී..."

"සිංහේපුරට යන්න කලින් දවස් මෙහාද..."

"ම..ට හොඳට මතකයි..."

"හොඳ..ට..."

"ඔ..ව් හොඳටම මතකයි..."

මධුවන්ත වචන බර් කර් කීවේය.

"අපේ ගෙදරට ආපු මුල් දවස..."

"මතකයි... උස්සහ වුට් කෙල්ලෙක් ඇවිත් වට දොහම් ඇල්ලුවා... දම්පාට සායක් ඇඳගෙන හිටියේ..."

මුහුට පුදුමය.

"ප..ස්..සේ..."

"මං දැක්කේ හැණු ළමයෙක් නෙමේ... ලංචි සුරංගනාවියක්... බෝඩිමට ගිහිල්ලත් හිතුවේ ඒ සුරනලේ..."

"ප..ස්..සේ..."

"ඊට පස්සේ එම සී එකේදී නම්බ උනා... ඇදුම් ගන්න අස්නා එක්ක ආවා... අපි ෆුඩ් කොට එකේ අයිස් කෝපි බිව්වා..."

"ප..ස්සේ..."

"ඊට පස්සේ නම්බවෙන හැම වෙලාවෙම මං ඔදන් හිටියා..."

"මං බැ..ලූ..ව ම..ත..ක නෑ..."

"මතකයි... මං හිඟන්නෙක් වගේ හිටියේ... කතා කරන්න බය හිතුණා... පස්සේ අයියගේ වෙඩින් එක හිමිනා..."

"ම..."

"මට වෙඩින් එකේ මොහොතක් මතක නෑ..."

"මොං..නා..ව..ද මතක..."

"මේ මු..ණ ත..මා..."

මධුවන්ත අවංකවම කීවේය. වැහි අන්ධකාරය හිලූ කාමරයේ නිහඬ සීනල මේ සියල්ල කියන්නට බල කළේය.

Elegant

"ළ..ඟ ඉ..දලයෙන ෆොටෝ ගත්තා මතක නෑ..."

"මතකයි... සාරි පොට කෙට්ටු එකේ බොත්තමක පැටලුනෙත්..."

"ඔ..ක්..කොම මතකයි..."

"ඔ..වී නංගී..."

"ඒත් ඔ..යා එ..ක දෙ..ය..ක් දැ..කලා නෑ..."

"මොකක්ද..."

මුතු මොහොතක් බිම බලාගෙනම උත්තරය.

"මේ ඇ..ස්..වල මොකවත් දැක්මක් නැද්ද එදා..."

මුතු තනතනියේ මෙත් ඇසුවාය. මධුවන්ත කිසිවක් අදහාගත නොහැකිව බලා උත්තරය. මුතු හෑන්ඩ් බෑගයේ රෝල් කරගෙන දමාගෙන ආ පිත්තූරය පිටතට ගත්තාය. ඒ පිත්තූරයේ උත්තේ මධුවන්තයි මුතුයි. එය ගත්තේ තිම්මිගේත් ප්‍රියමන්තගේත් වෙඩිත් එක දාය. ඒ පිත්තූරයට යටින් රතු පාට ප්ලැටින්නම් එකකින් අයි ලව් යූ මධුවන්ත කියා ලියා ඇත. මුතු එය නොපෙනෙන ලෙස තැවිළුණාය.

"මේ..ක..."

මධුවන්ත එය දෙසම බලා උත්තේය. ඔහු බැලුවේ පිත්තූරයේ උත් තමා දෙස නොවේ. මුතු දෙසය.

"ම.. මං ළඟ..ක් මේ පි..ත්තූරේ තියෙනවා..."

"මේ පිත්තූරේ ලැබිච්ච දවසේ ඒ..ම්ං ඒක යටින් දෙයක් ලිව්වා... අදුරුද සතරකට කලින්... දන්නවද ඒ මොකක්ද කියලා..."

මධුවන්ත කුතා නොකරම බලා උත්තේය. මුතු පිත්තූරයේ තැලී කෙඳිස දිග හැරියාය.

"කි..යැ..ව්..ත්..න... මේ අ..ද ලියපු එකක් නෙ..මේ ම..ධුවන්ත අයියේ..."

මුතු පිත්තූරය පැවේ ඇඳෙත් රුවා විත් ඔහු ළඟ දණ ගබාගෙන මෙනි. මධුවන්තට මේ කිසිවක් අදහාගත නොහැක. මේ පුංචි

සුරංගනාවිය එදා තමාට ආදරේ කළා යැයි කොහොම කියන්නද...

"වි..ස්..වා..ස කැ..රැ..නැ..ද් ඒක ලි..ව්වේ අ..ව්..රුද්ද කෙනෙකුට කලින කියලා... මි... ම..ට මගේ ආදරේ ගැ..න තියෙන එකම සාක්ෂිය මෙච්චරයි... මේ දුප්පත් ෆොටෝ එක විතරයි... ඔ..යා විශ්වාස කරනවද මධුවන්ත..."

මුතු ඇසුවේ ඔහුගේ දෙපාවලට අත කනිා අවලීත් මෙනි. ඇත්තටම කෙල්ලගේ දෑසින් අලුත් කඳුළු පාරවල් තුන තෙරක්ම පැන්නේය.

"කි..ය..න්..න... ඔය කියන සුරංගනාව ඔයාට එදා ආදරේ කළා... ඒ ම..ගේ පැ..ළැවෙනි ආදරේ... මේ තියෙන්නේ ඒ ආදරේ එකම සාක්ෂිය..."

මධුවන්තගේ අත එහෙම්ම කෙල්ලගේ හිස මතට වැටිණ. දැන් මොනවා හංගෙන්නද...

"ඔ..යා ළඟ සාක්ෂි තියෙ..නවා ඒ ආදරේට... මං ළඟ සාක්ෂි නෑ නංගී... ඒත් ම..ම..."

"ම..ට ආදරේ කළා... මං දන්නවා... තුවරදී ඔයා රවී අයියලට කියනවා මං අතගෙන... මං දන්නවා..."

මුතු ඒ දෙදණට මුහුණ තිබ්බාය.

"ම..ට ඒ ආ..දරේ කියා..ග..න්..න දැ..න් ද..න්..නෑ... ඇයි ඔයා එ..හෙම් ක..ළේ මධුවන්ත අයියේ..."

"මං කොහොමද එහෙම කරන්නේ... ම..ට අ..ද..ත්..."

"එක දවසක රෑ ආවා... මහ රෑ... නදිස්සියේ... හරියට පිස්සෙක් වගේ... ඇවිත් අයියලට කිව්වා සිංගප්පූ යනවා කියලා... මං ළඟට ඇවිත් කිව්වා යන්නම් නංගී කියලා... එව්වරයි ඔයා ගියා..."

මුතු ඒ දෙදණ බදාගෙන අඩමින් කිවාය.

"දැ..න් මට හැමදේම තේරෙනවා..."

"ඒ අ..වුරුදු තුනට ඔයාව කොච්චර මතක් උනාද... ම..ට එකපාරක් ක..තා කළේ නෑ... එක පාරක්... එක දවසක් කතා කරලා අයියලට කියල බැන්දා කියලා... එදා මම තනියම ඇඬුවා..."

"ම..ට සමාවෙන්න..."

"නෑ මධුවන්ත... මං සමාව දෙන්නෑ... ඒ දීපු දුකට ම..ට වන්දි ඕන..."

මුතු හිස ඔසවා කීවාය. මධුවන්ත ඒ තෙත මුහුණ දෙස බලා උන්නේ පුදුමයෙනි.

කෙල්ල ඉකි ගසන වේගය ඇගේ දෙදරන පිටෙන් පෙනෙයි. මධුවන්ත ඔහුගේ දෙදණ මත තිබූ ඒ හිසට සුරත තැබුවේ වෙව්ලමින් මෙනි. අතම ගින්දරකින් මෙන් දැවීගෙන ගියේය.

"ඉ..ල්..ලා..න්..න... නංගී... මේ දුප්පත් අයියගෙන් මොා..නා..ද ඕන..."

මධුවන්ත කීවේ ගොරෝද හඬකිනි.

"ම..ට.. අ..යි..යේ..."

කියන්නට හිතනා දේ කියවෙන්නේ නැත. ඒ තරමටම පපුව දෙදරයි.

"කි..ය..න්..න නංගී... මං වන්දි ගෙවන්නම්..."

"ම..ට දෙ..න..ව..ද ඉ..ල්ලන දෙයක්..."

"මේ හිඟන්නට කවුරුවත් ආදරේ කළේ නෑ..."

"තාමත් එ..හෙමද හිතන්නේ..."

"නෑ.. එක්කෙනෙක් මේ ලෝකෙ ඉඳලා... අපරාදේ..."

"ම.. අපරාදේ තමයි..."

මුතු බිඳුණු හඬින් කීවාය.

"ම..ට දෙ..ය..ක් ඕ..න..."

"මොා..නා..ද ඔන... මං ජී..වි..තේ..ම හ..රි දෙ..න්..න..මි..."

"ඒකම තමා ඔන..."

"මොා..නා..ද..."

"ජී..වි..තේ..ම..."

මුතු ඔහුගේ දණ මඬලින් හිස ඔසවා කීවාය. ඔවුන්ගේ දෙනෙත් එකතැන රැඳී නතර වී තිබුණි. ඒ දැසින් කඳුළු කැට දෙකක් ගලා ගියේ මධුවන්ත බලා සිටිද්දීමය.

"දෙ..න..ව..ද... ම්.. ආ මධුවන්ත අයියේ..."

"මේ දුප්පත් ජීවිතේ තා..ම ව..ටි..න..ව..ද..."

"ඔ..ව් ගොඩක්... දූගෙයි තාත්තගෙයි දෙන්නගෙම ජීවිතේ ම..ට වටිනවා... ගොඩක්..."

පුදුමය. මේ සුරංගනාවිය මෙහෙම ජීවිතය ඉල්ලනවා කියා හිතද්දීත් පුදුමය. ජීවිතයේ බිංදුවටම වැටුණු මිනිහෙකුගෙන් ජීවිතය ඉල්ලන එකම කෙල්ල ඇය විය යුතුය.

"මං.. තා..ම.. මේ තා..ත්..නි..ට හ..රි ආ..දරෙයි..."

මුතු අඬමින් කීවාය. මධුවන්ත එහෙමම ඇයව ළං කර ගත්තේය. ඔහුගේ පපුවට හිස තබද්දී මුතුට ජීවිතයේ කෙදිනකවත් නොඇතුණු සැනසීමක් දැනුණි.

"මං.. නං..ගී..."

"ම..ට මෙ..හෙ..ම ටි..ක..ක් ඉ..න්..න දෙ..න්..න මධුවන්..ත වු..ට්..ටක්..."

මුතු ඉන්නේ ඔහුව පුදුමාකාර ලෙස බදාගෙනය. මධුවන්තගේ දෙතොල් අද්දර වූයේ ඒ හිස් මුදුනය. ඔහු ඒ හිසට දෙතොල් තද කරගෙන දැස් පියා ගත්තේය.

ආදරය මෙහෙම පපුවට දැනෙන්නේ ප්‍රථම වතාවටය. ආදරය මේ තරම් රසබර සුන්දර හැඟීමක් බව මධුවන්ත දන්නේ අදය.

Elegantlk.com

පපුවෙන් ගලන හැම ලේ බිංදුවකම ඒ ආදර රස්නය තැවරී ඇතැයි ඔහුට සිතෙයි.

ජීවිතයේ කවදාක වත් ආදරයක් ලබා නැති බව හදවත පවා දන්නේ දැන්ය. මේ රස්නය ලබද්දීය.

ඔවුන් දෙදෙනා කොපමණ වෙලා එහෙම තුරුල් වී උන්නාදැයි දෙන්නාම දන්නේ නැත. අවට මහ වැසි වැටෙද්දී ඒ වැහි සීතල දෙදෙනාටම නොදැනුණේ දෙදෙනාගේම පපුවලින් ආ රස්නය දැඩිව දැනුණු නිසාය.

මට දැන් මුළු ලෝකෙම නැති උනත් කමක් නෑ. ඔයා දැන් මට ඉන්නවා... මට මේ සැනසීම ඇති මධුවන්ත... මෙච්චරයි මට ඕන. මුතු සිනින් කිවාය.

"නංගී..."

"ම්..."

මුතු කතා කළේ මධුවන්තගේ පපුවෙන් හිස නොගෙනමය. හදවත අද බොළඳ වන්නේ පුදුමාකාර ලෙසිනි. ඒ හදවතට ඔහේ යන්නට ඇය ඉඩ දුන්නාය.

"මං ක..සා..ද බැ..දපු දරුවෙක් ඉ..න්..න තාත්ත කෙනෙක්..."

"ම්..."

"ඔයාගේ ජීවිතේ ව..ටි..න ජීවිතයක්..."

"ඉ..ති..න්..."

"මං.. නංගී..."

"මා..ව..ත් දැ..ව..ව ව..ගේ හ..දා ග..න්..න බැ..රි..ද..."

මුතු ඇසුවේ ඔහුගේ පපුවෙන් මුහුණ ගෙන ඒ මුහුණ දෙසම බලාගෙනය. මධුවන්ත ඒ හිසට අත තැබුවේ පුදුමාකාර ආදරයකිනි. දැස් බොඳව යන තරම් ආදරයකින් මධුවන්තගේ පපුව ඇවිලිණි.

"මා.. එ..ක්..ක එ..නවද..."

"ම්.. කි..ය..න ඕ..න තැ..න..ක..ට එ..න්..නම් ර..ත්..ත..ර..න්..."

මධුවන්ත දැනම ඒ සුදු මුහුණ වැසෙන්නට තැබුවේය.

"සුරංගනාවියක් මාත් එක්ක එනවා කියලා හිතන්නේ කො..හො..ම..ද..."

"මේ සුරංගනාවි ආදරේ ඔයාට මධුවන්ත..."

මධුවන්ත ඇඟිලි තුඩුවලින් ඒ කම්මුල් වල තිබූ කදුළු පිස දැම්මේය.

"සුරංගනාවියෝ අඬන්නෑ..."

"ම..ට ආ..ද..රේ..ද..."

"මං.. කො..හො..ම කියන්..න..ද..."

"ඇ..යි..."

"මං ආදරේ දැක්ක මිනිහෙක් නෙමේ නංගී..."

"දැන්..."

"අදයි දන්නේ ආදරේ මෙච්චර..."

"මා..ත්..."

මධුවන්ත කෙල්ලව ඇඳ මතින් ඉන්දවා ඒ ළඟම ඉදගත්තේය.

"අ..ද මගේ හිත හරි නිදහස්..."

මුතු කීවේ සැහැල්ලුවෙනි. ඒ සැහැල්ලුව ඇගේ හිත පුරාමය.

"මං මගේ පපුව නිදහස් කරගෙන ඒ බර අයියගේ පපුවට දැම්මා නේද..."

මධුවන්ත සිනාසුණේ අහිංසකවය.

"ඒ බ..ර..ට මං ආදරෙයි නංගී... ඒත්..."

"ඇ..යි ම්..."

මුතු කතා කළේ ඔහුගේ උරතලය මත දැන් තබා ඒ මත නිකට තබාය. දැන් මේ ජීවිතය තමාගේය. කෙල්ලෝ අල්ලන්නේ තමන්ගේ දේවල් පමණි.

Elegantbooks.com

"හිතාගන්න බෑ..."

ඔහු අසරණව සිනාසී කීවේය.

"හි..ත..න්..න..ම වෙනවා තාත්තිට..."

මුතු කීවේ සිනාසීය.

"දැ..න් තාත්තිට දුවලා දෙන්නෙක් ඉන්නවා බලාගන්න... බ..ලාග..න්..න..ව..ද ම්..."

මධුවන්ත සිනාසුණේය. සමහර විට මේ අවුරුදු හතර පහටම ඔහු සිනාසුණේ දැන් විය යුතුය.

"අ..ක්..කා මේ..ක ද..න්..න..වද නංගී..."

"ම්.. එයා දන්නවා මං එයාගේ මස්සිනා පොඩ්ඩට හරි ආදරෙයි කියලා... ඒත් අයියා දන්නෑ..."

මුතු මධුවන්තගේ අත ගෙන ඇගේ අතැඟිලි හා පටලා ගත්තාය.

"ම්..."

"මා..ව කොං..හේ හ..රි එ..ක්..කං ය..න්..න... තවත් ගෙදර ඉන්න බෑ..."

"මං දන්නවා... මං කොහොමත් ජීවිතේ තීරණයක් ගන්න ඕන..."

"ඒ..කට මා..ව බ..ර..ක්..ද..."

"අ..ද..යි දැ..නෙ..න්..නේ ජිවත් වෙනවා කියලා... මේ කාමරේදී... මං මැරිලා හිටපු මිනිහෙක් නංගී..."

මධුවන්ත එහෙමම ඔහුගේ වම් ඇලයට ඇයව ළං කර ගත්තේය. ඔහුගේ වමත ඇගේ ගෙළ වටා ගියේ ඉබේටමය.

"අ..පි අපි තු..න්..දෙනා වි..ත..ර..ක් ඉ..න්..න ව්..ටි ලෝකයක් හදාගමු අයියේ... මං දුවට අම්මා කෙනෙක් වෙ..න්..න..ම්..."

"දු..ක නැ..ද්..ද..."

"ම..ට ඇයි දුක..."

"මං ව..ගේ කඩා වැටිච්ච මිනිහෙක් ඒ..ක්..ක..."

මධුවන්ත කියන්නට ගිය දේ ඔහුට කියන්නට මුතු ඉඩ දුන්නේ නැත.

"තා..ම කියන්නේ කඩා වැටිලා කියලද..."

"නෑ.. මං..."

"මං ජීවිතේ ළඟින්ම ඉ..න්..න..මි.. ම..ට මෝ..නවත් එපා... ලොකු සැප සම්පත්..."

මධුවන්ත ඒ හිස අතගාමින් රබර් යායට වහින අයුරු බලා උන්නේය.

"මෝ..නා..ද හි..ත..න්..නේ මටත් කි..ය..න්..න..කෝ..."

"අ..ර කිව්..ව පුං..චි ලෝ..කේ හ..දන හැ..ටි..."

"මං ප්‍ර..ශ්..න වල හි..ර ක..ළාද..."

මධුවන්ත මුතු දෙසට හැරුණේ ආදරණීය සිනහවක් මුව තබාගෙනය.

"නෑ... හිරවෙලා හිටපු හිඟන්නට ය..න්..න පාරක් පෙන්..නුවා... මා..ව දා..ලා ය..න්..නෑ නේ..ද..."

එහෙම අහද්දීම මුතුගේ දෑස් පෙඟිණි.

"ඇ..යි මා..ත් එ..යා ව..ගේ කියලා හිත..න්..නේ..."

"එයාට සම කරන්න හිතන්නෙවත් නෑ..."

"මං දා..ලා කොහේ ය..න්..න..ද.. ම්... තාත්තියි දූයි ළඟට එන්නේ ය..න්..න නෙමේ..."

"මං ද..න්..න..වා..."

"හැ..ම දේ..ම හි..යෙ..න්..නේ මේ අත්..දෙක උඩ අයියේ..."

මුතු ඒ දෑත් අල්ලාගෙන කිවාය.

"ම..ට ස..තිය..ක් දෙ..න්..න මං හැ..ම..දේම හිතන්..න..ම්..."

මධුවන්ත කීවේ පුදුමාකාර ධෛර්යකිනි. මුතු එහෙමම ඇඳ පාමුළ වැටී ඒ දෙදණ මත දෑත් තැබුවාය.

"ඔ..ය ඇ..ත්..ත..ම..ද අ..යියේ..."

"ම්..."

"මගේ හොඳ ම..හ..ත්..තයා... ම..ම දැ..න් හ..රි නිදහස්... හ..රිම නිදහස්..."

ඒ සතුටට මුතුට ඇඬුණි. පුදුමය. මේ ජීවිතයට පැටලෙන එක ඒ තරම් නිදහසක්ද... මධුවන්ත සිතුවේ ඒ දෑස් දෙස බලාගෙනමය.

"මං මො..න තීරණේ ගත්තත් කමක් නැද්ද..."

"ක..ම..ක් නෑ..."

"කොහේ යන්න කතා කළත් කමක් නැද්ද..."

"කමක් නෑ..."

මධුවන්තගේ මුවට සුන්දර සිනහවක් ආවේය.

"මං හැ..ම..දේම ලෑස්ති ක..ර..න්..න..ම්..."

"ම්.. ම..ගේ ප..පු..ව මෙ..හෙම නිදහස් කළාට පි..න්..."

"මට ජීවිතයක් දු..න්..න..ට මං පින් දෙන්නේ කාටද එතකොට..."

"ඇයි ම..ට..."

කෙල්ල කීවේ පුදුමාකාර සිනහවකිනි. මධුවන්ත පහත් වී ඒ හිස සිපගත්තේ පපුවෙන් පිටාර ගැලූ ආදරයටය. "ඔයා මට කොච්චර ආදරේද කියලා මං දන්නවා..." මුතු ඒ දෙතොල් පහස විඳිමින් සිතුවාය.

"දූ ගැන හි..ත..න්..නෙපා... මං එයාට අම්මා කෙනෙක් වෙනවා... මං ඒකිට හරි ආදරෙයි..."

"එයාට කවදාවත් අම්මා කෙනෙක් උන්නෑ..."

"තාත්තිට නෝන කෙනෙක් උන්නෑ..."

"නෑ... එයාට කවදාවත් එ..හෙම වෙන්න බැරි උනා..."

"මං අඩුවක් කරන්නෑ... මාව ගන්නකෝ ඔයාලා ළඟට..."

"තාමත් ම..ට පුදුමයි..."

"දැ..න් එ..හෙ..ම හි..ත..න්..නෙපා..."

"නෑ... ඇන්ටියි අන්කලුයි..."

"ඒවා හිතන්නෙපා... එයාලා මගේ ජීවිතයට හොඳක් නෙමේ කරන්නේ..."

"ඔ..ක්..කො..ම දා..ලා..."

"මං ගන්නේ හරි තීරණයක්.. නේ..ද..."

"ම්..."

"කවදහරි එයාලා තේරුම් ගනී... මං දන්නවා..."

මධුවන්ත මුතුගේ හිස පිරිමදිමින් සෑහෙන වෙලාවක් උන්නේය.

"ම..ට..ත් එ..න්..න වෙ..න්..නේ හිස් අතින්..."

"ම..ට මො..න..ව..ත් එපා... මේ ආදරේ ඇති..."

"මා..ත් ඕ..න දු..ක..ක් විඳින්..න..ම්..."

"මං එහෙම දුක් විඳින්න එ..ක්කං යන්නෑ..."

මධුවන්ත රබර් යාය දෙස බලාගෙන සිනාසුණේය. ඔහු සිනාසුණේ අතීතයටය.

"අක්කටයි අයියටයි කවුද කියන්නේ..."

"මං කි..ය..න්..න..ම්..."

"අයියා පුදුම වෙයි..."

"ම්.. එයා මං ගැන දන්නවා... මල්ලිගේ හොඳ අයියනේ..."

මුතු තුන් හතර පාරක් ඒ දණ හඬල සිප ගත්තාය.

"ම..ධු..ව..න්..ත අ..යි..යේ..."

Elegantlk.com

"ම..."

"මට ගොඩ දවසක් ගෙදර ඉන්න බෑ..."

"මං දැන්නවා..."

"මං අද ආවාම කියනවා කාංචනව මැරි කරන්න බෑ කියලා... එයාලා පරල වෙනවා... බලෙන් හරි බන්දලා දෙන්න යයි..."

"එහෙම උනොත්..."

"මං.. ගෙදරින් යන්නවා..."

"මං ඉක්මන් කරන්නම්..."

"පව්... දුවාවත් තියාගෙන අමාරුයි නේද..."

"කෙල්ල බරක් නෑ නංගී..."

මුතු දේව පිළිමයක් දෙස බලා ඉන්නාක් බඳුව ඔහු දෙස බලා උන්නාය.

"හෙට ඉඳලා හම්බවෙන්න බැරි වෙයි..."

"මං කතා කරන්නම්..."

"මොබයිල් එකට ගන්න..."

"ම.. මං අදම තුවර යනවා..."

"අඳම්..."

"ඔව්.. රවී එක්ක කතා කරන්න ඕන නංගී... ඌ විතරයි උදව්වක් ඉල්ලන්න ඉන්නේ..."

"කමක් නෑ... යන්න... බලන් ඉන්නත් බෑනේ... මේ ගෙදර අර කාමරේ හිරවෙලා ඉන්න බෑනේ... කොහොමත් මේ ගෙදර හෙට අතිද්දට පුපුරයි..."

මුතු කීවේ වෙන දේ දැනගෙනය.

"තිබහද..ම්..."

"නංගිට තිබහයි නේද..."

"ම... දුවලා මොනා හරි අරන් එන්නම්..."

මුතු කාමරයෙන් පිටතට දිව්වේ නැගිට ඒ තළලතද සිපගෙනය. අද හිත දඟකාර වී ඇත්තේ පුදුමාකාර ලෙසිනි.

කෙල්ල දුවගෙන එන විදිහෙන්ම අනුෂ්කා බොහෝ දේ තේරුම් ගත්තාය.

"මු..තු..."

"මං දින්නා අනූ..."

මුතු කීවේ එපමණකි. ඇය පුදුමාකාර සතුටකින් අනුෂ්කාව වැළඳ ගත්තාය.

"අ..යියා මොනාද කිව්වේ කෙල්ලේ..."

"ම..ට මේ ලෝකේ ඉන්න හොඳම කෙනා ලැබුණා අනූ..."

"එ..හෙ..නම් එ..ච්..චරයි..."

"මං එ..යා එ..ක්..ක ය..නවා... ම..ගේ හිත හරි නිදහස් ඇන් අනූ..."

"ඒක උඹේ මූණෙන් පේනවා කෙල්ලේ..."

"අපට තිබහයි..."

"එච්චරටම කතා කළාද..."

"ම.. ජීවිතේ කවදාකවත් කතා නොකරපු තරම් කතා කළා..."

"මං දොඩම් දෙකක් හදන් උන්නේ... උඩට එන්න ඉනින් බෑනේ..."

"අපි වල් වැඩ කළේ නෑ... කතා කළා විතරයි..."

"මං එහෙම කිව්වයෑ..."

මුතු කීවේ රවමිනි. කෙල්ල කොතරම් සතුටින් ඉන්නවාදැයි දැන් කිව හැක. පසුගිය දවස්වල ඒ මුහුණ ගන්නට දෙයක් තිබ්බේ

Elegantbooks.com

නැත. දැන් එසේ නොවේ. මුතු පාට මුහුණට වැටී ඇත්තේ දැන්ය.

"ලන්ච් හදන්නද කෙල්ලේ..."

"එපා කෙල්ලේ... බඩගිනි නම් නෑ..."

"හිත පිරිලනේ..."

"උඹ කර ගත්තේ ලොකු පින්කමක්... මං දුවලා එන්නම් හොඳේ..."

මුතු දොඩම් දෙකද රැගෙන උඩට ආවාය. ඔහු උන්නේ කවුළුවෙන් රබර් යාය දිහා බලාගෙනය. මුතු දොඩම් දෙක මේසය මත තබා එහෙමම ගොස් ඔහුගේ පිටට බර වූවාය.

කෙල්ලගේ පියයුරු වල රස්නය එහෙමම ඔහුගේ පිටට දැනුණි. බඩ හරහා ආ මුතුගේ දෑත් ඔහුගේ කුස මතුපිටදී යළි හමුවිය.

මේ ජීවිතයේ මෙහෙම පිරිමියෙක්ට ළං වූවාමය.

"කා..ට..වත් මෙහෙම ළං වෙලා ඉඳලා නෑ..."

"ඉඳලා ඉඳලා ළංවුණේ හිඟන්නෙක්ට නේ..ද..."

කෙල්ල ඔහුගේ පිටට ගැසුවාය.

"හිඟන්නෙක් උනත් මගේ... එහෙම බැලුවාම මාත් හිඟන්නී..."

"එහෙම හිඟන්නියෙක් කරන්නෑ..."

"සල්ලි නෙමේ රත්තරන් ජීවිතේ..."

"එ..හෙම මාත් හිතන්නෑ... හිතේ සතුට තමා ඕනේ..."

"දැන් සතුටු නෑ..."

"තාම පපුව හිරිවැටිලා නේ..."

"මගෙත්..."

මුතු එහෙමම ඒ පිටට කම්මුල් තැබුවාය. තබා දෑස් පියා ගත්තාය.

මධුවන්ත එහෙමම ඇගේ අත් වළල්ල මැද අනිත් පැත්තට හැරුණාය. කෙල්ලගේ මුහුණ දැන් දෙනෙත් අද්දරය.

"ඇ..යි ම්..."

"දෙයියෝ දෙන්න තියෙන දුක් සේරම දීලා දීලා හිතාගන්න බැරි දෙයක් දෙනවලු..."

"මො..නා..ද දුන්නේ.. ම්..."

ඇය ඇසුවේ හිරවූ උගුරිනි.

"මේ තියෙන්නේ..."

"මං දෙයියොද දුන්නේ..."

"දෙයියෝ දුන්නා වගේ තමා... දැන් ඉතින් පණ වගේ බලාගන්න ඕන..."

"දුවවත් තියාගෙන වැටිලා ඉන්න හදලා දෙන්න..."

"මං හැමදේම ලෑස්ති කරනවා කිව්වනේ..."

"ඉ..ක්..ම..න..ට හොඳේ..."

මධුවන්තට ඇයව සිපගන්නට පවා ලෝබය. ඔහු සිපගත්තේ ඒ නළලතය. මුතු රහසින් මෙන් ඒ හාදුව දරාගත්තාය.

"දොඩම් බොමු..."

"ම්..."

සීතල දොඩම් උගුර දිගේ පහළට ගියේ උගුර සනසාගෙන මෙනි.

"සිංගප්පූරුවේ සුපර් මාර්කට් එකක් තියෙනවා... කෙයා ෆෝ කියලා..."

"ම්..."

"ඒකේ අලුත් දොඩම් ඒ වෙලාවෙම මැෂින් එකකින් මිරිකලා බෝතල් වලට දාලා දෙනවා..."

"ම්..."

Elegantlk.com

"හ..රිම රහයි..."

"ඉ..තින්..."

"මං ගියාම බෝතල් තුනක් විතර ගේනවා..."

මුතු ඔහුගේ කට දෙසම බලා උන්නාය. තමාව එක්කාගෙන යන්නේ කොහාටදැයි අසන්නට මුතුට සිතුණි. එහෙත් ඇය ඇසුවේ නැත. දැන් ජීවිතය ගැන තීරණ ගත යුත්තේ ඔහුය. ඔහු සිංගප්පූරුවට යන්නට කතා කළද තිස්සමහාරාමයට යන්නට කතා කළද ප්‍රශ්නයක් නැත. මුතු උන්නේ ඔහු කතා කරන තැනකට යන්නටය. ඔහු ඉන්න තැනක ලෝකයම ඇතැයි දැන් ඇයට සිතෙයි.

මුතු උන්නේ ඇඳේ ඔහු ළඟම ඉඳගෙනය. ඇය හිමිහිට ඒ උරතලයට බර වූවාය.

"දැ..න් ඉඳලා ම..ගේ නේ..ද..."

"මායි එ..හෙම අහන්න ඕන..."

"ඕන් නම් දැන්මම එන්නම්..."

ඇය සිනාසී කිවාය.

"මං පිළිවෙලට එක්කං යන්නම්..."

"ලොකු පිළිවෙලක් ඕන නෑ... අපි තුන්දෙනා එකතුවෙලා පිළිවෙලක් හදාග..මු.. මි..."

"මං රෑට ගන්නම්..."

"ව..හ..ලා තිබ්බොත් ගෙදර ප්‍රශ්නයක් නිසා... හොඳද... මං ෆ්‍රී උන ගමන් ගන්නම්..."

"ම..."

"බස් එකේ නුවර යන්නෙපා... දුවත් එක්ක අමාරුයි... වාහනයක් කතා කරගෙන යන්න..."

"හා..."

"අපට ලොකු කාලයක් නෑ මධුවන්ත අයියේ..."

"මං දන්නවා..."

යමක් සිහිවී මුතු සිනාසුණාය.

"ඇයි හිනාවුණේ..."

"මාත් නුවර ආවනම් එක්කෙනෙක්ට කියලා නාවගන්න තිබ්බා..."

ඒ හඬ හුරතල්ය.

"ඒ නෑව්වමයි..."

"බොරු..."

"මාව විශ්වාස කරන්න..."

"මං ඒවා හිතන්නෑ..."

"ඒකම තමා මට පුදුමත්..."

"දැන් ඒවා අමතකම කරලා දාන්න... අපි අලුත් ජීවිතේකටනේ යන්නේ..."

"මං කොහොමත් අමතක කරලා උන්නේ... ඒ ජීවිතේ හිතන්න තරම් දෙයක් නෑ... දුක විතරයි..."

"දැන් අපි ගැන හිතන්න... හා..."

"හා..."

"හොං..ද තාත්ති..."

මුතු ඒ උරතලය වැළඳගෙන මෙන් කිවාය.

"මං ය..න්..නෝ..න..."

මුතු කීවේ දුකෙනි. දෙන්නාම නැගිට්ටේ කතා කරගත් ලෙසිනි.

"ම..ධු..වන්ත අයියේ..."

ඔහු බලාගෙනම උන්නේය.

"මේ ය..න්..නේ හ..රි සැනසීමකින්... ඒ සැනසීම කවදාවත් නැති

Elegantlks.com

කරන්නෙපා..."

"මං පොරොන්දු වෙනවා..."

මුතු ඇගේ හිස මත තිබූ ඒ අත ගෙන සිප ගත්තාය.

"මට ඔයාගෙන් පොරොන්දු එපා ර..ත්ත..ර..න්..."

කෙල්ල එහෙමම ඔහුව වැළඳ ගත්තාය.

"හැ..ම දෙයක්ම දැ..න් ඔ..යාගේ අ..තේ... මං බලා ඉන්නවා..."

"මං කතා කරන්නම්..."

"මි.. ප..රි..ස්..ස..මින් හොඳේ... නුවර යන්න කලින් මට මූණ චුට්ටක් පෙන්නලා යන්න..."

මුතුගේ දෙතොල් තිබුණේ ඔහුගේ දෙතොල් අද්දරමය. ඇය බලා උන්නේ ජීවිතයේ ප්‍රථම හාද්ද ගන්නට මෙනි. කෙල්ල තොල් පට තද කරගෙන සිනාසුණාය. මධුවන්ත එහෙමම ඒ මුහුණට බර විය.

ඇගේ දෑස් අඩවන්ව රත් පැහැව දිස් විය. මුතු එහෙමම දෑස් පියාගෙන ජීවිතයේ විඳින ප්‍රථම ලවන් රසය විඳගත්තාය.

25

මුතු නිම්මිව බදාගෙන ඇඬුවාය. කෙල්ල අඬන්නේ දුකට නොවන බව නිම්මි ඉවෙන් මෙන් තේරුම් ගත්තාය. ඒ තරමටම ඇය ඇගේ එකම සොයුරියව තේරුම් ගෙන උන්නාය.

"වෙ..ච්..ච දේ කියපන් ර..ත්..තරන්... උඹ අඬනවනේ..."

මුතු සිනාසුණේ ඇඬුම් මැදය. ගෑණියෙක්ගේ මුහුණකට එවන් සිතහවක් එන්නේ කලාතුරකිනි. සමහර විට ජීවිතයේ එකම එක වතාවකටය.

"එ..යා දැ..න් ම..ගේ අ..ක්..කේ..."

මුතු කීවාය. නිම්මිට පුදුම නැත. සමහර ජීවිත මවා ඇත්තේ සමහරුන්ටමය. දෙවියන් වැරැද්දක් කළද ඒ වැරැද්ද ඉක්මනින්ම හදා ගනී.

Elegantalks.com

"කො..ල්ලා මො..නාද කිව්වේ..."

"එයා ම..ට හ..රි ආදරෙයි අක්කේ..."

"මං ඒක දන්නවා චූටි..."

"අපි දැන් දෙන්නෙක් නෙමේ අක්කේ... එ..ක්කෙ..නෙ..ක්..."

නිම්මි ඒ මුහුණ දෙස බලාගෙනම උන්නාය. කෙල්ල එන්නට ඇත්තේ මුළු ජීවිතයේම තීරණ රැගෙන බව නිම්මි දනී.

"මං එ..යා එ..ක්..ක යනවා අයියේ... ඔයාගේ මල්ලී එක්ක යනවා..."

"තීරණයක් ගත්තනම් ඒ තීරණේම ඉඳපන් චූටි..."

"මේ තීරණේ වෙනස් වෙන්නෑ අක්කේ... මං මීට පස්සේ ජීවිතේ තීරණ ගන්නෑ... එයාට මේ ජීවිතේම බාර දෙනවා..."

නිම්මි ඒ හිස පිරිමැද්දාය.

"අද රෑ අම්මලා එනවා..."

"මං දන්නවා... මට දැන් බයක් නෑ... එයා හරි සතුටින් අක්කේ ඉන්නේ... හ..රිම සතුටින්... මාව තුරුල් කරගෙන ඉම්බා... අපට උදව් කරන්න අක්කේ..."

"උඹටයි කොල්ලටයි උදව් නොකර කාට උදව් කරන්නද චූටියේ..."

"එයා අද නුවර යනවා... රවී අයියා එක්ක කතා කරන්න... මොනවා හරි හිතල කියයි... මං එතකල් ඉන්නවා... ඊට පස්සේ... එ..යා එ..ක්ක යනවා..."

නිම්මි කිසිවක් කීවේ නැත. ඒ ගමන මෙහෙමම යෙදෙන බව ඇය දැන උන්නාය.

"මට ම..ගේ ලෝකය ලැබුණා... ම..ට ඒ ඇ..ති... දැන් මට නිදහසේ

මේවා අත් අරින්න පුළුවන්... මේ මොන දේ නැති උනත් මාව එයා බලාගන්නවා..."

ගැණියෙක්ට ඕනත් එච්චරම බව නිම්මි දනී.

"මං අයියට මේවා කියන්නද..."

"ම්.. ඒ අයියයි මල්ලියි මේ අක්කයි නංගිටයිම අයිති උනා..."

මුතු කීවේ සතුටිනි. මුතු ඇඳේ නිදාගෙන උන් දුවාව ඇඳේ පෙරළී වැළඳ ගත්තේ පුදුමාකාර ආදරයකිනි.

"මං මේකිව ඇස් දෙක වගේ බලාගන්නවා අක්කේ... දැන් දිදී නෙමේ... මං එයාගේ අම්මා..."

මුතු කීවේ කෙල්ලගේ චූටි දෙපා සිප ගනිමිනි. දෙවය කරන්නේ මහා පුදුමාකාර දේවල් යැයි නිම්මිට සිතුණි.

"ඇයි අක්කේ..."

නිම්මි කල්පනා කරද්දී මුතු ඇගේ අත අල්ලාගෙන ඇසුවාය.

"උඹට දුකක් විඳින්න වෙන එකක් නෑ චූටි..."

"මං දන්නවා අක්කේ..."

"මේවා අපි රහසක් විදිහටම තියාගමු..."

"ම්..."

"දැනගත්තොත් කොල්ලව ඉතුරු කරන එකක් නෑ... කාංචනත් හොඳ මිනිහෙක් නෙමේ..."

"ම්.. එයා ඉක්මනට පිළිවෙලක් හදයි..."

"කරන්න පුළුවන් හැමදේම අපි කරන්නම්... අයියත් උඹට පණ වගේ... කොල්ලටත් දෙයක් කරන්න බැරි වුණා කිය කිය ඉන්නේ..."

"දැන් අපි දෙන්නා වෙනුවෙන්ම උදව්වක් කරන්න..."

"ම්.. දැන් සතුටින් ඉඳපං..."

Elegantta

"ඒ සතුට ටික ටික විඳින්නේ... ජීවිතේ සතුටුම දවස අද..."

මුතු කීවේ ඇඳේ පෙරළීය.

මධුවන්ත උන්නේ මේ ලෝකයේ නොවේ. අමුතුම ලෝකයකය. අර පුංචි කාමරයේදී සිදුවූ සියල්ල තවමත් ඔහුට හීනයක් මෙන්ය. එහෙත් දැන් හීනය ජීවිතයම බව මධුවන්ත දනී. කෙල්ල කියූ වචනයක් වචනයක් පාසා මේ පපුවේ අලුත් නහරයකින් ලේ ගැලුවා සේය.

දැන් ඉන්නේ අර පරණ මධුවන්ත සේනාසිංහ නොවේ. ඒ මධුවන්ත අද උදෑසන මිය ගියේය. දුක්බර ජරාජීර්ණ අප්‍රසන්න අඳුරු අතීතයක් සමඟම ඒ මධුවන්ත අද ආදාහනය විය. දැන් ඉන්නේ අලුත් මධුවන්ත කෙනෙකි.

ඒ මධුවන්ත ඉපදුනේ ඒ ආදරයෙනි. ඒ සෙනෙහසිනි. දැන් මේ ජීවිතය අයිති ඇයටමය. ආදරය කියලා දෙයක් අද උදේ වෙනතුරු දැකලාවත් තිබුණේ නැති බව මධුවන්ත දන්නේ අදය. අද උදෑසනය. අර පුංචි කාමරයේදීය.

අර තරම් දුක් විඳ ඇත්තේ ආදරයක් වෙනුවෙන් නොවේ. ජීවිතයේ මැවුණු විකෘති බැඳීමක් වෙනුවෙනි. ආදරය දැක්කේ අදය. එය මේ තරම් ලොව්තුරු සුවයක් බව මධුවන්ත දන්නේ අදය.

පපුවට මේ තරම් සහනයක් දැනෙන්නේ ඒකය. පුදුමය. පපුවට දැනෙන්නේ වළාකුළු අතර පාවෙන්නාක් බඳු මන්මත් බවකි.

දැන් මේ ජීවිතය වෙනුවෙන් කප්පරක් දුක් විඳිය හැක. ඒ දුක විඳින්නට මේ පපුව දැන් සූදානම්ය. ආදරය ජීවිතයේ කරන උතුම්ම පරිත්‍යාගයකින් පුරවන්නට දැන් මධුවන්ත සූදානම්ය.

තමාට ඒ සුරංගනාවියව ලැබුණා යැයි තවමත් සිතාගන්නට මධුවන්තට අමාරුය. එහෙත් අද උදෑසන මේ දෙදණ මත හිස තබාගෙන ඇඬුවේ ඒ සුරංගනාවියමය.

මේ පපුවට දුන් සැනසීමට මධුවන්ත තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන් වහන්සේලාටම පින් දුන්නේය. වංකගිරියක අතරමංව යා යුතු අතක් නොම දැන අනාථව අසරණව දුවවද වඩාගෙන ගිය තමාට ජීවිතයට යන පාර පෙන්නුවේ ඇයය.

හැමදාමත් හීනයක් සේ දුටු ඇයම ජීවිතයේ එකම හීනය වේයැයි කොහොම සිතන්නද... අවසානයට වූවේත් එයමය.

"මාවත් දු.ව..ව ව..ගේ හ..දාගන්න බැරිද..."

ගොත ගසමින් ඇය ඇසූ අයුරු මධුවන්තට සිහිවෙයි. කුමාරිකාවක් මේ අසරණ හිඟන්නාගෙන් එහෙම ජීවිතයක් ඉල්ලුවා කියා හිතද්දී පුදුමය.

එහෙත් දැන් සියල්ල සිදුව හමාරය. ජීවිතයේ ලස්සනම වරුවක් ගෙවී ගියේ හීනයක් මෙනි. දැන් ජීවිතයට යන මඟ වෙනස් විය.

හිතාගෙන උන්නේ මේ ජීවිතයේ කවදාවත් යුගල් නොවී ඉන්නටය. ජීවිතයම හුදෙකලාවේ ගෙවන්නටය. එක්කෙනෙක් ජීවිතයම විනාශ කළාය. ඒ විනාශ වූ ජීවිතයේ නටබුන් මැද සුන්බුන් මැද මල් පිපේයැයි මධුවන්ත කවදාවත් සිතුවේ නැත. එහෙත් එයම සිදු විය.

දැන් මේ පපුවේ උන්නේ දුවත් ඇයත් පමණි. දෙන්නාවම එක වාගේ හදා වඩා ගන්නට රැකබලා ගන්නට මධුවන්තට ආසය.

"මට සතියක් දෙන්න... මං හැමදේම ලෑස්ති කරන්නම්..."

ඇයට එහෙම පොරොන්දු වූ බව මධුවන්ත දනී. දැන් ඒ පොරොන්දුව ජීවිතයෙන්ම ඔප්පු කළ යුතුය. ජීවිතයේ අරමුණක් වත් හදාගන්නට බැරුව අගුපිලකට වැටුණු තමා සතියකින් හැමදේම සූදානම් කරන බව කීවේ කොහොමද කියා මධුවන්ත සිතුවේය.

ආදරය පපුවට එන්නේ දස මහ යෝධයෙකුගේ ශක්තිය ගෙනය. ආදරය පංචායුධයක් මෙන්ය. එය පපුවේ තිබෙද්දී ජීවිතයට බය නැත. කරදරවලට බය නැත.

"මං අපි තුන්දෙනාට ඉන්න පුංචි ලෝකයක් ගොඩ නගනවා..."

මධුවන්ත ඇත්තටම සිතුවේය. ඉන් මෙහා ඇති කරදර සියල්ල මධුවන්ත අමතක කළේය. අච්චර දේවල් පරිත්‍යාග කර ඇය මේ හිඟන්නා ළඟට ඒ තරම් සතුටින් එනවානම් ඇය වෙනුවෙන් ලෝකයක් හදා තබන්නට බැරි ඇයි...

Elegant

"එයා එන්නේ මට විතරක් ජීවිතයක් අරගෙන නෙමේ... දුවාටත් අලුත් ජීවිතයක් අරගෙන... එයා වගේ කෙනෙක් අතින් කවදාවත් මගේ දුවට වෙනසක් වෙන්නෑ... දුවට මටත් වඩා ආදරෙයි..."

හාෂිණී ජීවිතයට අරම කළ පසු හැමදේකටම බය වූ අයුරු මධුවන්තට සිහිවිය. ඇය විනාශ කළේ ජීවිතයේ සතුට පමණක් නොවේ. සැනසීම පමණක් නොවේ. ජීවිතයේ තිබූ ආත්ම ශක්තියද නැති කළාය.

දැන් යළිත් ජීවත් වන්නට පටන් ගත යුතුය. තනිවම නොවේ. රෝස මල් දෙකක් සමඟය. ඒ අලුත් ජීවිතයට කාගෙන්වත් ඇස්වහක් කටවහක් නොවදිනු ඇත.

මධුවන්ත ජීවිතය ගැන අලුත් බලාපොරොත්තුවකින් උන්නේය.

නිමි.

"ආදරය යනු නීතියෙන්
ජීවිතය මත හදනා බැඳීමක් නොවේ
දෙවියන් තමන්ට වඩාත්ම සමීප
හදවත් මත මවනා හාස්කමකි..."

Elibrary

සුජීව ප්‍රසන්න ආරච්චි ලියූ

අලුත්ම නවකතාව

කරු

ළඟදීම පිටවේ...